ශ්‍රී ලංකා රේගුව

# වාර්ෂික කාර්යසාධන වාර්තාව

# 2015

---

සැකසුම

ප්‍රතිපත්ති,සැලසුම් හා පර්යේෂණ අංශය

# වාර්ෂික කාර්යසාධන වාර්තාව 2015

පටුන


| | |
|---|---|
| ශ්‍රී ලංකා රේගුව - හැඳින්වීම | 05 |
| ශ්‍රී ලංකා රේගුවේ සංවිධාන ව්‍යුහය | 07 |
| ප්‍රධාන නිලධාරි | 09 |
| සමස්ත කාර්යසාධනය 2015 | 11 |
| ***නීති බලාත්මක කිරීමේ පර්ෂදය*** | |
| නිවාරණ අංශය | 23 |
| සමාජ ආරක්ෂණ අංශය | 27 |
| මධ්‍යම විමර්ශන අංශය | 43 |
| නීති කටයුතු අංශය | 49 |
| මධ්‍යම බුද්ධි තොරතුරු අංශය | 51 |
| ***ආදායම් හා සේවා පර්ෂදය*** | |
| ප්‍රකාශන අංශය | 57 |
| කර්මාන්ත හා සේවා අංශය | 67 |
| භාණ්ඩ පරීක්ෂණ අංශය | 71 |
| මගී සේවා අංශය (කොළඹ ) | 79 |
| අපනයන අංශය | 83 |
| ***ආයතනික පර්ෂදය*** | |
| ප්‍රතිපත්ති,සැළසුම් හා පර්යේෂණ අංශය | 89 |
| අනුගතවීමේ සහ පහසුකම් සැපයීමේ අංශය | 97 |
| තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ අංශය | 107 |
| මධ්‍යම මිල පිරික්සුම් අංශය | 109 |
| විශේෂිත සේවා අංශය | 113 |
| ***මානව සම්පත් පර්ෂදය*** | |
| මානව සම්පත් කළමනාකරණ අංශය | 123 |
| මානව සම්පත් සංවර්ධන අංශය | 127 |
| කාර්ය මණ්ඩල සේවා අංශය | 131 |
| සැපයුම් අංශය | 133 |
| ***ප්‍රාදේශීය පර්ෂදය*** | |
| මගී සේවා අංශය (කටුනායක) | 137 |
| ආදායම් හා සේවා ( කටුනායක) | 143 |
| ආදායම් හා සේවා ( ප්‍රාදේශීය) | 145 |
| මගී සේවා ( ප්‍රාදේශීය) | 147 |
| ***රේගු අධ්‍යක්ෂ ජනරාල් යටතේ ඇති අංශය*** | |
| පද්ධති, ක්‍රියාපටිපාටි, අනුකූලතා විගණන අංශය | 151 |
| මූල්‍ය අංශය | 153 |
| විශේෂ කාර්ය හා සුපරීක්ෂණ අංශ | 159 |
| නිෂ්පාදන බදු (විශේෂ විධි විධාන) අංශය | 161 |
| අභියාචනා අංශය | 163 |
| ***ඇමුණුම්*** | 165 |

# ශ්‍රී ලංකා රේගුව - හැඳින්වීම

## දැක්ම

ශ්‍රී ලංකාවේ සුරක්ෂිතභාවය සහ සශ්‍රිකත්වය නංවන්නා වූ රේගු පරිපාලන කටයුතු මෙහෙයවන ආසියාවේ විශිෂ්ඨතම ආයතනය බවට පත්වීම.

## මෙහෙවර

ජාතික හා ජාත්‍යන්තර රේගු ප්‍රමිති යථා යෝග්‍ය ලෙස පිළිගනිමින් නීත්‍යානුකූල වෙළඳාම, ප්‍රවාහනය හා කර්මාන්ත සඳහා පහසුකම් සලසාලමින්, ආදායම, සාමාජීය හා පාරිසරික සුරක්ෂිතතාවට අදාළ රේගු නීති සහ අනෙකුත් අදාළ නීතිවලට අනුකූලවීම බලාත්මක කිරීම සහ වැඩිදියුණු කිරීම උදෙසා කැපවීම.

## පරමාර්ථ

- රටේ තීරුබදු, වෙළඳ සහ සමාජ ආරක්ෂණ නීති, දේශසීමාව තුළ විධිමත්ව බලාත්මක කිරීම තහවුරු කිරීම.
- රජය වෙනුවෙන් බාධාවකින් තොරව ආදායම් උත්පාදනයකිරිම, ලැබියයුතු ආදායම් එකතු කිරීම සහ එම ආදායම් කාලානුරූපව සහ විධිමත්ව ගණනය කිරීමට වගබලාගැනීම.
- රටේ දේශ සීමා ආරක්ෂා කිරීම සහ අභ්‍යන්තර ආරක්ෂාව ශක්තිමත් කිරීම පිණිස ත්‍රස්තවාදයට එරෙහි ආරක්ෂණ පියවර ගනු ලබන ලෝකයේ අනෙකුත් රටවල් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම.
- නීත්‍යානුකූල වෙළඳාමට බාධාවක් නොවන පරිදි මත්ද්‍රව්‍ය ප්‍රවාහනය සහ අයථා ලෙස ඉපයූ මුදල් වසන් කරමින් ප්‍රවාහනය කිරීම වලක්වාලමින් ආදායම් සහ සමාජ ආරක්ෂණය සුරක්ෂිත කිරීම.
- ලෝක වෙළඳ සංවිධානය මගින් වෙළඳ කටයුතුවලට පහසුකම් සලසනුවස් ඇති කරගන්නා ලද වෙළඳ ගිවිසුම්, වෙළඳ කටයුතුවලදී විධිමත් පරිදි අර්ථ නිරූපනය කිරීම සහ අදාළ කරගැනීම සහතික කිරීම.
- දේශසීමාව තුළ ක්‍රියාත්මක කළයුතු රටේ ආදායම් හා වෙළඳ ප්‍රතිපත්ති නිර්ණය කිරීමේදී උපදේශක ආයතනයක් වශයෙන් කටයුතු කිරීම.
- රේගු සහ අනෙකුත් අදාළ නීතිවලට අනුකූලව කටයුතු කිරීම සහතික කරමින් දේශසීමාව තුළ මගීන් සංසරණය, භාණ්ඩ සහ අදාළ ප්‍රවාහන ක්‍රම සඳහා පහසුකම් සැලසීම.
- ලෝක රේගු සංවිධානය විසින් ක්‍රමානුකූලව සකස් කර හඳුන්වා දෙන ලද මෙවලම් සහ උපකරණ මෙන්ම ක්‍රියාමාර්ග සහ අභිලාශයන් භාවිතා කරමින් දේශ සීමාවලදී රේගු මෙහෙයුම් කටයුතු වැඩිදියුණු කිරීම.
- මගීන් සංසරණය, භාණ්ඩ හා අදාළ ප්‍රවාහන ක්‍රම ; තොරතුරු සහ අනෙකුත් කටයුතුවලට අදාළ ජාත්‍යන්තර බැඳීම්වලට අනුකූලව කටයුතු කිරීම.
- තොරතුරු ප්‍රචලිත කිරීම සහ රජයට මෙන්ම සාමාන්‍ය ජනතාවට අවශ්‍ය වෙළඳ සංඛ්‍යාලේඛන තොරතුරු ලබාදීම.
- රජයේ සියලු ප්‍රයත්නවලදී "ප්‍රගතියේ සහකරුවකු" වීම ; විශේෂඥ දැනුම සහ වෘත්තිමය සේවා ලබාදීමේදී සුහදශීලි සේවාදායකයකු වීමට කටයුතු කිරීම.

## ප්‍රධාන කාර්යයන්

- තීරුබදු, වෙළඳ සහ සමාජ ආරක්ෂණ නීතිවලට අදාල රජයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම.
- ආනයනය හා අපනයන රේගු බදු තක්සේරු කිරීම සහ එකතු කිරීම.
- අනෙකුත් පනත් සහ රාජ්‍ය ආයතන වෙනුවෙන් තීරුබදු / බදු සහ අනෙකුත් අයබදු තක්සේරු කිරීම සහ එකතු කිරීම.
- තීරුබදු (බදු) ඉවත් කිරීම්, නිදහස් කිරීම්, බදු සහන (ලබාදීම)ක්‍රියාත්මක කිරීම.
- තීරුබදු සහ අනෙකුත් අයබදු සුරක්ෂිත කිරීම සහ ඒවා ගණනය කිරීම.
- රේගු බදු ආපසු ගෙවීම්, බදු සහන සහ වට්ටම් ලබාදීම.
- හොර බඩු ජාවරම, වාණිජ වංචා, මත්ද්‍රව්‍ය ප්‍රවාහනය හසුකරගැනීම හා නිවාරණය.
- තහනම් කරන ලද සහ සීමා කරනලද භාණ්ඩවලට අදාළ නීති බලාත්මක කිරීම.
- රේගු නීති සහ අනෙකුත් අදාල නීති යටතේ සිදුකරනු ලබන වැරදි විමර්ශනය කිරීම හා පරීක්ෂණ පැවැත්වීම.
- වැරදිකරුවන්ගෙන් දඩ අයකරගැනීම / භාණ්ඩ රාජසන්තක කිරීම.
- රාජසන්තක කරන ලද භාණ්ඩ අපහරණය කිරීම.
- ආනයන අපනයන භාණ්ඩ නිෂ්කාශනය කිරීම.
- මගීන් සහ මගී ගමන් මලු නිෂ්කාශනය කිරීම.
- භාණ්ඩ සහ මගීන් නිෂ්කාශන ක්‍රියාපටිපාටි පරිගණකගත කිරීම.
- දේශීය කර්මාන්ත සහ කෘෂි නිෂ්පාදන සුරක්ෂිත කිරීම සඳහා රජය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම.
- අපනයන සඳහා පහසුකම් සැලසීමේ වැඩසටහන් කළමනාකරණය කිරීම.
- භාණ්ඩ ගුදම්ගත කිරීම කළමනාකරණය කිරීම (බැඳුම්කර සැලසුම්).
- අපනයන පාදක කර්මාන්ත සැලසුම් අධීක්ෂණය කිරීම.
- ග්‍රන්ථ සම්පාදනය සහ වෙළඳ සංඛ්‍යාලේඛන නිකුත් කිරීම.
- තොරතුරු / වර්ගීකරණ කිරීමේ රීති යනාදිය සැපයීම.
- වෙළඳ මණ්ඩල-නිෂ්කාශන නියෝජිතවරුන් සමඟ නිරතුරුව කටයුතු කිරීම
- පුහුණු / දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම
- නාමකරණය, වර්ගීකරණය, තක්සේරු කිරීම, ශිල්පීය ක්‍රම බලාත්මක කිරීමට අදාල කාරණා පිළිබඳ ලෝක රේගු සංවිධානය සමඟ අඛණ්ඩව තොරතුරු හුවමාරු කරගැනීම.
- තොරතුරු හුවමාරු කරගැනීම සඳහා රේඛිය ආයතන, රජයේ දෙපාර්තමේන්තු සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම : මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, අපනයන සංවර්ධන මණ්ඩලය, සුරාබදු දෙපාර්තමේන්තුව යනාදිය.

# ශ්‍රී ලංකා රේගුවේ සංවිධාන සැලැස්ම




අ.රේ.අ.ජ. - අතිරේක රේගු අධ්‍යක්ෂ ජනරාල්

ප්‍ර.මූ.නි. - ප්‍රධාන මූල්‍ය නිලධාරී

# ශ්‍රී ලංකා රේගුව
## 2015
## ප්‍රධාන නිලධාරීන්

**ඩබ්.ඒ.චූලානන්ද පෙරේරා මහතා**
රේගු අධ්‍යක්ෂ ජනරාල්
**ඒ.සේනානායක මහතා**
අතිරේක රේගු අධ්‍යක්ෂ ජනරාල් (මානව සම්පත්)
**ආර්.පී.ඩී.ටී.සෙනෙවිරත්න මහතා**
අතිරේක රේගු අධ්‍යක්ෂ ජනරාල් (ප්‍රාදේශික )
**ඒ.කුලේන්ද්‍රන් මහතා**
අතිරේක රේගු අධ්‍යක්ෂ ජනරාල් (නීති බලාත්මක කිරීම)
**ඩී.ඒ.අයි.දරණගම**
අතිරේක රේගු අධ්‍යක්ෂ ජනරාල් (ආදායම් හා සේවා)
**එස්.රාජේන්ද්‍රන් මහතා**
අතිරේක රේගු අධ්‍යක්ෂ ජනරාල් (සහය සේවා)
**ඩී.යූ.එස්.වික්‍රමාරච්චි**
ප්‍රධාන මූල්‍ය නිලධාරි
**කේ.ඒ.ඩී.ආර්.ක්‍රිස්ටි මහතා**
රේගු අධ්‍යක්ෂ (නිවාරණ)
**එම්.පාස්කරන් මහතා**
රේගු අධ්‍යක්ෂ (සමාජ ආරක්ෂණ)
**කේ.ඒ.ධර්මසේන මහතා**
රේගු අධ්‍යක්ෂ (පශ්චාත් නිශ්කාශන විගණන)
**එච්.ඩී.ඒ.ඒ.කේ.සුභසිංහ මහතා**
රේගු අධ්‍යක්ෂ (මධ්‍යම විමර්ශන)
**ජේ.පී.චන්ද්‍රරත්න මහතා**
රේගු අධ්‍යක්ෂ (නීති කටයුතු)
**යූ.ලියනගේ මහතා**
රේගු අධ්‍යක්ෂ (මධ්‍යම බුද්ධි)
**එස්.පීරිස් මහතා**
රේගු අධ්‍යක්ෂ (ප්‍රකාශන)
**එම්.අශෝකන් මහතා**
රේගු අධ්‍යක්ෂ (කර්මාන්ත හා සේවා)
**ජී.ඒ.එල්.ගාමිණී මහතා**
රේගු අධ්‍යක්ෂ (අපනයන)
**ටී.ඒ.එල්.වීරසිංහ මහතා**
රේගු අධ්‍යක්ෂ (භාණ්ඩ පරීක්ෂණ)
**පී.කේ.පන්දුල මහතා**
රේගු අධ්‍යක්ෂ (මගී සේවා-කොළඹ)
**ඩී.යූ,එන්.ආර්.උඩුවාවල මහතා**
රේගු අධ්‍යක්ෂ (මගී සේවා-කටුනායක)
**ඩී.යූ.එල්.පීරිස් මහතා**
රේගු අධ්‍යක්ෂ (මගී සේවා-කටුනායක)
**එම්.රවීන්ද්‍රකුමාර් මහතා**
රේගු අධ්‍යක්ෂ (ප්‍රතිපත්ති,සැළසුම් හා පර්යේෂණ)
**ටී.නන්දසිරි මහතා**
රේගු අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ)
**ටී.ඩබ්.ඒ.සේනානායක මහතා**
රේගු අධ්‍යක්ෂ (මධ්‍යම මිල පිරික්සුම්)
**ආර්.ලමාහේවා මහතා**
රේගු අධ්‍යක්ෂ (විශේෂ සේවා)
**එස්.එම්.පියතිස්ස මහතා**
රේගු අධ්‍යක්ෂ (සැපයුම් අංශය)

**කේ.ජී.පී.පුෂ්පකුමාර මහතා**
රේගු අධ්‍යක්ෂ (මානව සම්පත් කළමනාකරණ)
**ටී.ඒ.රත්තසීල මහතා**
රේගු අධ්‍යක්ෂ (මානව සම්පත් සංවර්ධන)
**රම්‍යකාන්ති මිය**
රේගු අධ්‍යක්ෂ (කාර්ය මණ්ඩල සේවා)
**කේ.ඩී.නිකොලොස් මහතා**
රේගු අධ්‍යක්ෂ (විශේෂ කාර්ය හා සුපරීක්ෂක)
**එන්.වාසලතිලක මහතා**
රේගු අධ්‍යක්ෂ (ආදායම් හා සේවා - ප්‍රාදේශීය)
**ම්.ආර්.රාජ්මොහාන් මහතා**
රේගු අධ්‍යක්ෂ (මගී සේවා-ප්‍රාදේශීය)
**එස්.මහේෂන් මහතා**
රේගු අධ්‍යක්ෂ (අභියාචනා)
**එන්.එම්.ඩී.නවරත්න මහතා**
ප්‍රධාන ගණකාධිකාරී
**ටී.රත්නසීල මහතා**
නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ (නිෂ්පාදන බදු)
**නලීන් ඕෂන් මහතා**
රේගු අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන)
**යූ.එස්.වනපුෂ්ප මහතා**
නියෝජ්‍ය අධක්ෂ (සංඛ්‍යාලේඛන)

# සමස්ත කාර්ය සාධනය
# 2015

# ආදායම් එකතු කිරීම - 2015
## ජාතික බදු ආදායමේ ප්‍රතිලාභයක් වශයෙන්

ආදායම් එකතු කිරීම - **2015**




* තාවකාලික දත්ත
* මහ බැංකු වාර්ෂික වාර්තාව-*2015*

### ආනයන ආදායම් එකතු කිරීම – 2015 බදු සංයුතිය

| කාණ්ඩය | රු.මිලියන | එකතුවේ ප්‍රතිශතයක් වශයෙන් |
|---|---|---|
| | | |
| එකතු කළඅගය මත බද්ද (වැට්) ආනයන | 83,726 | 12% |
| රේගු ආනයන තීරු බද්ද | 108,116 | 15% |
| ආනයන සෙස් බද්ද | 42,467 | 6% |
| වරාය හා ගුවන්තොටුපළ සංවර්ධන බද්ද **(PAL)** | 56,733 | 8% |
| නිෂ්පාදන බද්ද | 352,298 | 50% |
| විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද **(SCL)** | 52,276 | 7% |
| ජාතිය ගොඩනැගීමේ බද්ද **(NBT)** | 15,895 | 2% |
| අනෙකුත් | 2,747 | 0% |



# ශ්‍රී ලංකා රේගු ආදායම් එකතුව - 2015

| ආදායම් ශීර්ෂය | විස්තරය | ප්‍රතිශෝධිත ඉලක්කය (රුපියල් මිලියන) | 2015 ජනවාරි 01 සිට 2015 දෙසැම්බර් 31 දක්වා කාර්යධනය (රුපියල් මිලියන) | | | | 2014 හා 2015 ජනවාරි සිට දෙසැම්බර් දක්වා සංසන්දනය (රුපියල් මිලියන) | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | ඉලක්කය | තථ්‍ය | වෙනස | % | 2014 | 2015 | වෙනස | % |
| ජාත්‍යන්තර වෙළඳාම මත බදු | | | | | | | | | | |
| **1001.01.00** | ආනයන බද්ද | 92,000 | 96,000 | 108,116 | 16,116 | 118 | 77,726 | 108,116 | 30,390 | 139 |
| **1001.02.00** | අපනයන බද්ද | 60 | 25 | 33 | -27 | 56 | 24 | 33 | 9 | 139 |
| **1001.04.00** | වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බද්ද | 95,000 | 55,000 | 56,733 | -38,267 | 60 | 68,646 | 56,733 | -11,913 | 83 |
| **1001.05.01** | සෙස් බද්ද - ආනයන | 42,000 | 50,000 | 42,467 | 467 | 101 | 35,622 | 42,467 | 6,845 | 119 |
| **1001.05.02** | සෙස් බද්ද - අපනයන | 3,400 | 4,000 | 2,713 | -687 | 80 | 3,085 | 2,713 | -371 | 88 |
| **1001.08.00** | විශේෂ භාණ්ඩ බද්ද | 56,000 | 80,000 | 52,276 | -3,724 | 93 | 47,953 | 52,276 | 4,323 | 109 |
| ජාත්‍යන්තර වෙළඳාම මත මුළු බද්ද | | **288,460** | **285,025** | **262,339** | **-26,121** | **91** | **233,057** | **262,339** | **29,282** | **113** |
| නිෂ්පාදන බද්ද | | | | | | | | | | |
| **1002.05.01** | නිෂ්පාදන බද්ද -සිගරට් | 80,000 | 75,000 | 79,981 | -19 | 100 | 57,204 | 79,981 | 22,776 | 140 |
| **1002.05.02** | නිෂ්පාදන බද්ද - මත්පැන් | | | 0 | 0 | | 12 | 0 | -12 | 0 |
| **1002.05.03** | නිෂ්පාදන බද්ද -ඛණිජ තෙල් | 34,000 | 50,000 | 45,092 | 11,092 | 133 | 28,732 | 45,092 | 16,360 | 157 |
| **1002.05.04** | නිෂ්පාදන බද්ද මෝටර් රථ | 240,000 | 125,000 | 223,414 | -16,586 | 93 | 76,435 | 223,414 | 146,979 | 292 |
| **1002.05.99** | නිෂ්පාදන බද්ද අනෙකුත් | 10,000 | 7,800 | 3,812 | -6,188 | 38 | 3,087 | 3,812 | 725 | 123 |
| මුළු නිෂ්පාදන බදු ආදායම | | **364,000** | **257,800** | **352,298** | **-11,702** | **97** | **165,471** | **352,298** | **186,827** | **213** |
| අනෙකුත් දේශීය බදු | | | | | | | | | | |
| **1002.01.04** | ආනයන මත වැට් බද්ද | 90,000 | 145,000 | 83,726 | -6,274 | 93 | 102,281 | 83,726 | -18,554 | 82 |
| **1002.12.03** | ජාතිය ගොඩනැගීමේ බද්ද | 18,000 | 20,000 | 15,895 | -2,105 | 88 | 16,089 | 15,895 | -194 | 99 |
| මුළු දේශීය බදු | | **108,000** | **165,000** | **99,621** | **-8,379** | **92** | **118,370** | **99,621** | **-18,749** | **84** |
| බදු නොවන ආදායම් | | | | | | | | | | |
| **2003.02.17** | ඇගළුම් අලෙවිය | 95 | 95 | 122 | **27** | 128 | 89 | 122 | 32 | 136 |
| **2003.02.99** | අනෙකුත් ලැබීම් | | | | | | | | | |
| **2003.99.00** | විවිධ | | | | | | | | | |
| **2003.03.00** | දඩ සහ රාජ්‍යසන්තක කිරීම් | 3,000 | 3,000 | 1,129 | **-1871** | 38 | | 1,129 | 1,129 | |
| මුළු බදු නොවන ආදායම් | | **3,095** | **3,100** | **1,251** | **-1,844** | **40** | **89** | **1,251** | **1,162** | **1,401** |
| මුළු බදු ආදායම් | | **760,460** | **707,825** | **714,258** | **-46,202** | **94** | **516,897** | **714,258** | **197,361** | **138** |
| | | | | | | | | | | |
| මුළු ආදායම් | | **763,555** | **710,925** | **715,509** | **-48,046** | **94** | **516,987** | **715,509** | **198,523** | **138** |

* තාවකාලික සංඛ්‍යා

* දත්ත මූලාශ්‍ර – ගිණුම් අංශය - ශ්‍රී ලංකා රේගුව

## ඉහළ බදු ආදායම් උපදවන භාණ්ඩ වර්ග පනහ (HS පරිච්ඡේද අනුව)

| පෙළගැස්ම | HS ඡේද | විස්තරය | මුළු බදු ආදායම |
|---|---|---|---|
| 1 | 87 | මෝටර් වාහන | 244,522,216,021 |
| 2 | 27 | ඛණිජ තෙල් හා ඉන්ධන | 89,435,791,212 |
| 3 | 84 | යන්ත්‍රෝපකරණ | 22,323,081,250 |
| 4 | 15 | පාම් තෙල්, පාම් ස්ටියරින් සහ මාගරීන් | 20,222,147,308 |
| 5 | 04 | කිරි නිෂ්පාදන | 18,968,870,390 |
| 6 | 25 | සිමෙන්ති හා ක්ලින්කර් | 18,721,309,924 |
| 7 | 39 | ප්ලාස්ටික් සහ ප්ලාස්ටික්වලින් නිම කළ භාණ්ඩ | 16,739,331,694 |
| 8 | 85 | විද්‍යුත් යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 15,527,881,085 |
| 9 | 17 | සීනි සහ රසකැවිලි | 13,281,278,411 |
| 10 | 72 | යකඩ හා වානේ | 12,170,602,285 |
| 11 | 22 | පාන වර්ග | 11,666,825,086 |
| 12 | 69 | පිඟන්මැටි නිෂ්පාදන | 10,305,078,195 |
| 13 | 07 | කෑමට ගත හැකි එළවළු සහ අල | 10,246,656,207 |
| 14 | 48 | කඩදාසි සහ කඩදාසි බෝඩ් | 9,404,934,323 |
| 15 | 40 | රබර් සහ ඒවායින් නිමකල භාණ්ඩ | 9,133,697,410 |
| 16 | 73 | යකඩ සහ වානේවලින් නිමකල භාණ්ඩ | 7,890,990,161 |
| 17 | 10 | ධාන්‍ය | 5,399,912,506 |
| 18 | 38 | විවිධ රසායනික නිෂ්පාදන | 5,266,888,021 |
| 19 | 08 | කෑමට ගත හැකි පළතුරු හා ඇට වර්ග | 4,081,298,348 |
| 20 | 62 | නොගෙතූ ඇඟලුම් හා රෙදිපිළි අයිතමයන් | 3,940,608,723 |
| 21 | 33 | සුගන්ධ තෙල් රෙසිනොයිඩ් වර්ග | 3,843,670,114 |
| 22 | 19 | පිළියෙළ කල ධාන්‍ය පිටි | 3,195,912,456 |
| 23 | 55 | කෘතිම මූලික කෙඳි වර්ග | 3,099,542,359 |
| 24 | 70 | වීදුරු හා වීදුරු භාණ්ඩ | 2,995,269,899 |
| 25 | 32 | සම්පදම් සහ සායම් පෙවීමට ගන්නා සාරක | 2,990,550,628 |
| 26 | 09 | කෝපි තේ මේඩ් සහ කුළුබඩු වර්ග | 2,804,201,659 |
| 27 | 52 | කපු | 2,679,941,347 |
| 28 | 16 | මස් වලින්, මාළුවලින් හා කවචයින්ගෙන් කරනු ලබන පිළියෙළ කිරීම. | 2,621,403,559 |
| 29 | 76 | ඇලුමිනියම් හා ඒවායින් සෑදූ භාණ්ඩ | 2,527,687,591 |
| 30 | 23 | ආහාර නිෂ්පාදනයේ ඉවත දමනයන් හා අවශේෂයන් | 2,516,608,685 |
| 31 | 94 | ගෘහ භාණ්ඩ ,කලින් සකස් කරන ලද ගොඩනැගිලි | 2,507,622,092 |
| 32 | 83 | ලෝහ වලින් නිමවූ විවිධ භාණ්ඩ | 2,434,524,455 |
| 33 | 29 | කාබනික රසායනික ද්‍රව්‍ය | 2,373,925,086 |
| 34 | 21 | කෑමට යෝග්‍ය සංයෝජන | 2,364,370,652 |
| 35 | 03 | මත්ස්‍යයන් සහ කවචයන් | 2,218,104,408 |
| 36 | 20 | එළවළු, පළතුරු, බීජ හෝ වෙනත් දේවලින් කල පිළියෙල කිරීම් | 2,204,832,186 |
| 37 | 31 | පොහොර | 1,983,912,342 |
| 38 | 34 | සබන්, කාබනික පෘෂ්ඨ කාරක වර්ග | 1,861,753,020 |
| 39 | 44 | දැව හා දැවයෙන් නිමකල භාණ්ඩ | 1,797,338,722 |
| 40 | 68 | ගලින්, බදාමෙන්, සිමෙන්තිවලින් නිමවූ ද්‍රව්‍ය | 1,778,987,781 |
| 41 | 96 | විවිධ නිෂ්පාදන ද්‍රව්‍ය | 1,766,297,066 |
| 42 | 28 | අකාබනික රසායන ද්‍රව්‍ය | 1,724,546,798 |
| 43 | 90 | ඡායාරූපකරණ හා සිනමාකරණයේදී ගන්නා උපකාරක ද්‍රව්‍ය | 1,676,844,590 |
| 44 | 74 | තඹ හා එයින් සෑදූ භාණ්ඩ | 1,486,275,914 |
| 45 | 18 | කොකෝවා සහ කොකෝවා නිෂ්පාදන | 1,280,136,131 |
| 46 | 82 | ආයුධ හැඳි ගෑරුප්පු ආදිය | 1,218,826,800 |
| 47 | 60 | ගෙතූ හෝ ක්‍රෝෂේ රෙදි | 1,217,397,948 |
| 48 | 64 | පාවහන් සහ ඊට සමාන වෙනත් දෑ | 1,178,029,290 |
| 49 | 61 | ඇඟලුම් අයිතමයන් සහ රෙදිපිළි උපාංග | 1,001,089,307 |
| 50 | 11 | විදුම් කර්මාන්ත නිෂ්පාදන | 994,977,365 |

## සැලකිය යුතු ආදායම් උපයන භාණ්ඩ අවරෝහණ පිළිවෙලට - 2015

| විස්තරය | මුළු ආදායම | මුළු ආදායම ප්‍රතිශතයක් ලෙස (%) |
|---|---|---|
| මෝටර් වාහන | 244,522,216,021 | 39% |
| ඛනිජ තෙල් හා ඉන්ධන | 89,435,791,212 | 14% |
| යන්ත්‍රෝපකරණ | 22,323,081,250 | 4% |
| පාම් ඔයිල් , Palm Stearin සහ මාගරින් | 20,222,147,308 | 3% |
| කිරි නිෂ්පාදන | 18,968,870,390 | 3% |
| සිමෙන්ති හා සිමෙන්ති ක්ලින්කර් | 18,721,309,924 | 3% |
| ප්ලාස්ටික් හා ආශ්‍රිත භාණ්ඩ | 16,739,331,694 | 3% |
| විදුලි යන්ත්‍රෝපකරණ | 15,527,881,085 | 2% |
| සීනි සහ රස කැවිලි | 13,281,278,411 | 2% |
| යකඩ සහ වානේ | 12,170,602,285 | 2% |
| අනෙකුත් | 153,465,518,387 | 25% |



# බදු ආදායම් සංසන්දනය - 2014 සහ 2015

(රු. මිලියන )

| කාණ්ඩය | 2014 | 2015 | වෙනස |
|---|---|---|---|
| **ජාත්‍යන්තර වෙළඳාම මත බදු** | | | |
| ආනයන බද්ද | 77,726 | 108,116 | 30,390 |
| අපනයන බද්ද | 24 | 33 | 9 |
| වරාය හා ගුවත් තොටුපල සංවර්ධන බද්ද | 68,646 | 56,733 | -11,913 |
| සෙස් බද්ද - ආනයන | 35,622 | 42,467 | 6,845 |
| සෙස් බද්ද - අපනයන | 3,085 | 2,713 | -371 |
| විශේෂ භාණ්ඩ බද්ද | 47,953 | 52,276 | 4,323 |
| ජාත්‍යන්තර වෙළඳාම මත මුළු බද්ද | 233,056 | 262,338 | 29,283 |
| **නිෂ්පාදන බදු** | | | |
| නිෂ්පාදන බදු - සිගරට් | 57,204 | 79,981 | 22,776 |
| නිෂ්පාදන බදු - මත්පැන් | 12 | 0 | -12 |
| නිෂ්පාදන බදු - පෙට්‍රෝලියම් | 28,732 | 45,092 | 16,360 |
| නිෂ්පාදන බදු - මෝටර් වාහන | 76,435 | 223,414 | 146,979 |
| නිෂ්පාදන බදු - වෙනත් | 3,087 | 3,812 | 725 |
| මුළු නිෂ්පාදන බදු ආදායම | 165,471 | 352,298 | 186,827 |
| **ආනයන මත අනෙකුත් බදු** | | | |
| එකතු කල අගය මත බද්ද ( VAT) ආනයන | 102,281 | 83,726 | -18,554 |
| ජාතිය ගොඩනැගීමේ බද්ද | 16,089 | 15,895 | -194 |
| ආනයන මත අනෙකුත් මුළු බදු | 118,370 | 99,621 | -18,749 |
| **බදු නොවන ආදායම** | | | |
| ඇගළුම් අලෙවිය | 89 | 122 | 32 |
| විවිධ | | | |
| දඩ සහ රාජසන්තක කිරීම් | | 1,129 | 1,129 |
| **මුළු බදු නොවන ආදායම** | 89 | 1,251 | 1,162 |
| **මුළු බදු ආදායම** | 516,897 | 714,258 | 197,361 |
| **මුළු ආදායම** | 516,987 | 715,509 | 198,523 |

**බදු ආදායම් සංසන්දනය - 2014 සහ 2015**



# මෝටර් වාහන ආනයන

## බදු ආදායම

| | ආදායම (රු.මිලියන) | | |
|---|---|---|---|
| | **2013** | **2014** | **2015** |
| ජනවාරි | 6,110 | 4,809 | 13,405 |
| පෙබරවාරි | 3,900 | 4,159 | 11,481 |
| මාර්තු | 5,778 | 5,558 | 23,138 |
| අප්‍රේල් | 6,648 | 6,577 | 17,466 |
| මැයි | 6,821 | 3,291 | 19,213 |
| ජුනි | 6,985 | 7,916 | 23,508 |
| ජූලි | 9,300 | 6,070 | 23,825 |
| අගෝස්තු | 9,302 | 5,521 | 26,387 |
| සැප්තැම්බර් | 7,464 | 7,384 | 22,380 |
| ඔක්තෝබර් | 8,433 | 7,410 | 27,211 |
| නොවැම්බර් | 7,029 | 12,545 | 20,887 |
| දෙසැම්බර් | 6,515 | 21,080 | 15,282 |
| එකතුව | **84,285** | **92,320** | **244183** |



# නීති බලාත්මක කිරීමේ පර්ෂදය

# නිවාරණ අංශය

## හැඳින්වීම

ශ්‍රී ලංකා රේගුවේ සියලුම අංශවල විශේෂයෙන් වරායන්, තොටුපල, ජලමාර්ග හා මුහුදු කලාප, අන්තර්ජතික ගුවන් තොටුපල, නිදහස් වෙළඳ කලාප, අපනයන ප්‍රවර්ධන කලාප, භාණ්ඩ පරීක්ෂණ හා අංගන, අභ්‍යන්තර නිශ්කාශන ඒකකවල නිරීක්ෂණ කටයුතු සිදුකරන්නා වූ ශ්‍රී ලංකා රේගුවේ නීති බලාත්මක කරන ප්‍රධාන අංශය වන්නේ නිවාරණ අංශයයි.
නිවාරණ අංශය අංශ කිහිපයකින් එනම්, පරිපාලනය, ජී. අංශය, මෙහෙයුම්, විමර්ශන, සමුද්‍ර, ප්‍රධාන වරාය විමර්ශන, අලෙවි, මධ්‍යම අපහරණ ඒකකය සහ උපාය මාර්ගිකව පිහිටා ඇති වෙරළ ආසන්න නගරවල රට වටා ස්ථාපිත කර ඇති උපනිවාරණ කාර්යාලවලින්ද සමන්විතවේ.

**ප්‍රධාන කාර්යයන්.**

1. නීති විරෝධී ලෙස රටට භාණ්ඩ ගෙන ඒම, මත්ද්‍රව්‍ය ප්‍රවාහනය හා වාණිජ වංචා නිවාරණය කිරිම.
2. රේගු වැරදි සම්බන්ධ තොරතුරු ලබා ගැනීම, ඒ සම්බන්ධ ක්‍රියා මාර්ග ගැනීම.
3. රේගු වැරදි හසුකර ගැනීම, රේගු බදු නොගෙවූ භාණ්ඩ අත් අඩංගුවට ගැනීම, රේගු විමර්ශන හා පරීක්ෂණ පැවැත්වීම, නඩු කටයුතු මෙහෙය වීම.
4. රජයට ලැබීමට නියමිත ආදායම් ලැබෙන බවට සහතික වීම.
5. රටේ සමාජ ආර්ථික, සංස්කෘතික හා පාරිසරික අවශ්‍යතාවයන් සුරක්ෂිත කිරීම හා එම ක්ෂේත්‍රයේ නීති හා රෙගුලාසි බලාත්මක කිරිම.
6. කොළඹ වරාය ඇතුළු අනෙකුත් වරායන්, බණ්ඩාරනායක අන්තර්ජාතික ගුවන් තොටුපළ හා මත්තල මහින්ද රාජපක්ෂ අන්තර් ජාතික ගුවන්තොටුපළ ආවේක්ෂණ කටයුතු.
7. මුහුදු යාත්‍රා සංචලනය පාලනය කිරීම හා වෙරළ ආරක්ෂිත මෙහෙයුම් කටයුතු.
8. ශ්‍රී ලංකා රේගුව මගින් රාජසන්තක කරනු ලැබූ භාණ්ඩ විධිමත් ලෙස බැහැර කිරීම.

## 1. නීති විරෝධී ලෙස රටට ගෙන එන භාණ්ඩ, වාණිජ වංචා හා මත්ද්‍රව්‍ය වැරදි වැළැක්වීම;

කොටුව ප්‍රධාන නිවාරණ කාර්යාලය පිහිටි ස්ථානය වෙනස් වූ අතර ප්‍රධාන ශාඛා 3ක් කොළඹ වරායෙන් ඇතුළත හා පිටත ස්ථාන වෙත මාරු කරන ලදී. වර්තමානයේ පාලන ශාඛාව සහ රේගු අධ්‍යක්ෂ(නිවාරණ) ගේ කාර්යාලය රේගු ප්‍රධාන මූලස්ථානයේ පිහිටා තිබේ. ටයිම්ස් ගොඩනැගිල්ලේ පිහිටා තිබූ මධ්‍යම බැහැර කිරීමේ ඒකකයද රේගු මූලස්ථාන ගොඩනැගිල්ල තුළට ගෙන ගොස් ඇත. මීට අමතරව රේගු උප නිවාරණ කාර්යාල ප්‍රධාන මුහුදුබඩ නගරවල පිහිටා ඇත. ඒවා නම්, ත්‍රිකුණාමලය, ගාල්ල, කොග්ගල, මීගමුව හා සින්නපාඩු වේ.

රට තුළට හා ඉන් පිටත සිදුවන නීති විරෝධී භාණ්ඩ ප්‍රවාහනය, වෙළඳ වංචා හා මත්ද්‍රව්‍ය වැරදි වැළැක්වීම සඳහා මෙම කාර්යාලවලට අනුයුක්ත කරන ලද නිවාරණ නිලධාරීන් ක්‍රියාකාරීව හා කාර්යක්ෂමව පියවර ගෙන ඇත. මීට අමතරව, නිදහස් වෙළඳ කලාප තුළ පිහිටි නිවාරණ කාර්යාලවලට අනුයුක්ත කරන ලද නිලධාරීන් විසින් සිදුකරනු ලැබූ මෙහෙයුම් මගින් රේගු බදු අයවිය යුතු භාණ්ඩ මෙම කලාපවලින් බැහැරව යෑම වැළැක්වීමට කටයුතු කර ඇත.

රටේ සාමය ස්ථාපිත කිරීමෙන් පසු යාපනයේ සහ මන්නාරමේ රේගු නිවාරණ උප කාර්යාල නැවත ආරම්භ කිරීමට දෙපාර්තමේන්තුව පියවර ගෙන ඇත. එසේ වුවත්, මුහුදේ යාත්‍රා කිරීමට සුදුසු මුර යාත්‍රා හා පුහුණු නිලධාරීන්ගේ අඩුපාඩු නිසා සමුද්‍ර නීති බලාත්මක කිරීම නැවත ආරම්භ කිරීමට දෙපාර්තමේන්තුවට නොහැකි වී ඇත. කෙසේ හෝ මේ පිළිබඳව සලකා බැලීමට කමිටුවක් පත් කර ඇති අතර අදාල වාර්තාව මේ වනවිටත් ඉදිරිපත් කර ඇත.
හම්බන්තොට වරායේ හා මහින්ද රාජපක්ෂ අන්තර්ජාතික ගුවන් තොටුපලේ රේගු නිවාරණ කටයුතු ද මේ වන විට ක්‍රියාත්මකව පවතී.

## 2. අත්අඩංගුවට ගැනීම්, තහනම් කිරීම්, විමර්ශනය හා නඩු මෙහෙයුම්.

රේගු නිවාරණ අංශය විසින් ප්‍රධාන වශයෙන් පහත සඳහන් පරිදි රේගු නීති උල්ලංඝනය කිරීම්, හොරබඩු ජාවාරම්, වෙළඳ වංචා, මත්ද්‍රව්‍ය වැරදි සම්බන්ධයෙන් තොරතුරු ලබාගනී:

(අ) නිවාරණ අංශයට අනුයුක්ත කරන ලද නිවාරණ නිලධාරීන්ගේ පුද්ගලික ඔත්තුකරුවන් මඟින්.
(ආ) මහජනතාවගෙන් ලබා ගන්නා ඔත්තු මඟින්.

මීට අමතරව, නැව් බඩු ලේඛන හා ආනයන නිෂ්කාශන ලේඛන උපයෝගී කර ගෙන නිවාරණ නිලධාරීන් විසින් රේගු වංචා රැසක් අනාවරණය කර ගැනීමට සමත්ව ඇත. එසැනින් පරිගණක ගත කළ තොරතුරු ඇසුරෙන් වංචා සහගත ආනයනකරුවන් හසු කරගැනීමේ ප්‍රවණතාව නැව් බඩු ලේඛන හා ආනයන සටහන් කර ඇසුරෙන් කරන වැටලීම්වලට වඩා ඉහළ මට්ටමක පවතී.

සොයාගත් තොරතුරු ආශ්‍රයෙන් කළ වැටලීම් මගින් හොරබඩු ලෙස හෝ රේගුවට ප්‍රකාශ නොකර ආනයනය කළ රේගු තීරු ගාස්තු නොගෙවූ භාණ්ඩ විශාල ප්‍රමාණයක් අත්අඩංගුවට ගැනීමට, රේගු නිවාරණ අංශය සමත් විය. අදාළ විර්ශන කටයුතු හා රේගු නීති සම්බන්ධ කටයුතු නිවාරණ නිලධාරීන් විසින්ම සිදුකරන ලදී.

රේගු නීති බලාත්මක කිරීමේ අංශයන්හි අඩුපාඩුවක්ව පවතින මානව සම්පත්වල කාර්ය සාධනය ඉහළ නැංවීමට හැකිවන පරිදි විධිමත් අවදානම් කළමනාකරණ වැඩසටහනක් දියුණු කිරිම සඳහා තාක්ෂණ සහාය ලබාගැනීමට ඉල්ලීම් කළ යුතුව ඇත. තවද නීති බලාත්මක කිරීමට අදාල කාර්යයන් හා රාජකාරි කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් නිවාරණ නිලධාරින් සඳහා හැකියා වර්ධනය කිරීමේ වැඩසටහන් පැවැත්විය යුතුව ඇත.

## 3. නියමිත පරිදි රාජ්‍ය ආදායම එකතු කරන බවට වගබලා ගැනීම.

ආනයන හා අපනයන මගින් ලැබෙන රාජ්‍ය ආදායම එකතු කිරීම රේගුවේ ප්‍රධාන අරමුණුවලින් එකකි. රේගු දෙපාර්තමේන්තුව මගින් අව්‍යාජ වෙළඳුන් වෙනුවෙන් පහසුකම් සැලසීම සඳහා හඳුන්වා දෙනු ලැබූ විශාල වශයෙන් ප්‍රතිඵල ගෙන දෙන්නා වූ පහසුකම් සැලසීමේ ක්‍රියාමාර්ග රාජ්‍ය ආදායම වංචා කිරීමට නැඹුරුවක් ඇති අයට රේගු දැලෙන් රිංගා යාමට සුළු ඉඩක් ලැබී ඇත. බහුතරයක් වෙළඳුන් ස්වේච්ඡාවෙන්ම නීතියට අනුකූලව කටයුතු කරන අතර, සුලුතරයක් වැරදි කිරීමට නැඹුරුවක් ඇත. සුළුතරයක් වෙළඳුන් ආනයනික භාණ්ඩ සඳහා වැරදි වර්ගීකරණය, මිල අඩුවෙන් සඳහන් කිරීම, හා භාණ්ඩ රේගුවට ප්‍රකාශ නොකර සිටීම වැනි රේගු වැරදිවලට යොමු වේ.

2015 වසර තුළ දී නිවාරණ අංශය මගින් මෙහෙයවනු ලැබූ රේගු පරීක්ෂණ පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | |
|---|---|
| ලියාපදිංචි වූ පරීක්ෂණ සංඛ්‍යාව | 5234 |
| සම්පූර්ණ කළ පරීක්ෂණ සංඛ්‍යාව | 4809 |
| වැරදි තහවුරු කර අභිමි කිරීම්/ දඩ නියම කළ පරීක්ෂණ සංඛ්‍යාව | 234 |
| දඩ හා අභිමි කිරීම් මගින් අය කළ මුලු මුදල | රු.මිලි. 518 |
| අමතර සටහන්කර ( A/E) මගින් එකතු කළ මුලු මුදල | රු.මිලි. 69 |
| රාජසන්තක කළ භාණ්ඩ විකිණීම් මගින් අයකරගත් මුලු මුදල | රු.මිලි. 29 |
| මුලු අලෙවි ඉපයුම් මුදල | රු.මිලි. 763 |
| සම්පූර්ණ අයකරගත් මුදල මිලියන | රු.මිලි. 1,379 |

## 4. රටේ සමාජ ආර්ථික, සංස්කෘතික, පරිසර විද්‍යාත්මක හා පාරිසරික වැදගත්කමක් ඇති දෑ ආරක්ෂණය සහ අදාළ නීති, රෙගුලාසි බලාත්මක කිරීම.

ස්වකීය මෙහෙයුම් මඟින් රටේ පවතින සමාජ ආර්ථික, සංස්කෘතික, පරිසර විද්‍යාත්මක හා පාරිසරික වශයෙන් වැදගත්කමක් දක්වන දෑ ආරක්ෂා කිරීමට නිවාරණ අංශයට හැකි වී ඇත.

රේගු ආඥා පනත යටතේ එන රෙගුලාසිවලට අමතරව, නිවාරණ අංශයේ නිලධාරීන් විසින් වෙනත් නීති රෙගුලාසි ක්‍රියාත්මක කිරීම සහතික කරනු ලබයි.

උදා-

1. ගිණි අවි සහ පතරොම් පනත
2. වන සත්ත්ව සහ ශාක පිළිබඳ පනත
3. ආනයන සහ අපනයන පාලක පනත
4. ඖෂධ සුවඳ විලවුන් හා උපකරණ පනත

5. විදුලි සංදේශ නියාමන කොමිෂන් පනත
6. ආහාර හා ඖෂධ පනත
7. විනිමය පාලන පනත
8. බුද්ධිමය දේපළ පනත

## 5. කොළඹ වරාය අනෙකුත් වරායන්, නිදහස් වෙළෙඳ කලාප සහ බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ සුපිරික්සුම

කොළඹ වරායේ සුපරීක්ෂාව නිවාරණ අංශයට අයත් කොටුව නිවාරණ කාර්යාලය හා කොච්චිකඩේ නිවාරණ කාර්යාලය මගින් සිදු කරන අතර, කොටුව ප්‍රදේශයේ හා කොච්චිකඩේ ප්‍රදේශයේ සුපරීක්ෂාව පිළිවෙලින් ඉහත කාර්යාල වෙත පැවරී ඇත. දිනපතා පැය 24 පුරාම මෙම කාර්යාල විවෘතව පවතින අතර, ඒ ඒ කාර්යාල සඳහා වෙන වෙනම ගොඩබිම රාජකාරි භාර නිලධාරියෙක් හැම මොහොතකම රාජකාරියේ නියුතු වෙයි. මෙම නිලධාරීන් තමන්ට අදාළ ගේට්ටු නිල පිරික්සුමට භාජනය කරන අතර, එමගින් එම අදාළ ස්ථානවල නියමිත නිලධාරීන් සේවයේ යෙදී සිටින බවට තහවුරු කර ගනී.

බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළේ සහ කටුනායක නිදහස් වෙළඳ කලාපයේ කටයුතු අධීක්ෂණය කරනු ලබන්නේ නයිකන්දේ පිහිටි උප නිවාරණ කාර්යාලයෙනි. එලෙසම බියගම පිහිටි උප නිවාරණ කාර්යාලය මගින් බියගම නිදහස් වෙළඳ කලාපයේ කටයුතු අධීක්ෂණය කෙරේ.

කෙසේ වුවත්, පල්ලෙකැලේ, හොරණ, මීරිගම යනාදී අපනයන සැකසුම් කලාප නිවාරණ අංශයේ සුපරීක්ෂණය යටතේ නොපවතී. එනිසා එම කලාප ආශ්‍රිතව උප නිවාරණ කාර්යාල පිහිටුවීම හෝ එම කලාපවලට උප නිවාරණ කාර්යාලවලින් නිලධාරීන් පත් කිරීම රේගු කටයුතු සිදු කිරීමට මහත් වූ අවශ්‍යතාවයකි.

එසේවුනත් වර්තමානයේ දික්ඕවිට මත්ස්‍ය වරායේ ක්‍රියාකාරකම් ආරම්භ වූ හෙයින් ඒ කාර්යාල හා නවාතැන් පහසුකම් අවශ්‍යතා සම්බන්ධ තොරතුරු ප්‍රධාන කාර්යාලයට දැනුම් දී ඇති අතර මේ දක්වා එම පහසුකම් සලසා දී නොමැත. එම නිසා නිවාරණ අංශයේ ක්‍රියාකාරකම් දික්ඕවිට මත්ස්‍ය වරායේ ආරම්භ කර නොමැත.

## 6. නාවික යාත්‍රා මෙහෙයුම් පාලනය සහ දේශ සීමා මෙහෙයුම්

ප්‍රධාන වරායන් හතරෙහි (හම්බන්තොට වරාය ද ඇතුළුව) නාවික යාත්‍රා මෙහෙයුම් පාලනය නිවාරණ අංශය සතු වගකීමකි. කොටුව නිවාරණ කාර්යාලය මගින් කොළඹ වරායේ එම රාජකාරි සිදු කරන අතර, ගාල්ල, ත්‍රිකුණාමලය හා හම්බන්තොට වරායන්වල දී අදාළ ස්ථානවල උප නිවාරණ කාර්යාල මගින් එම රාජකාරි සිදු කරනු ලැබේ.

කොටුව නිවාරණ කාර්යාලය මගින් දවසේ පැය 24 පුරා වරාය භාර නිලධාරීවරයෙකු (**HDO**) නාවික යාත්‍රා මෙහෙයුම් කටයුතු ඉටු කිරීම සඳහා යොදවනු ලැබේ. ඔහු වරායට සේන්දු වන නැව්වලට ගොඩවන අතර, එහිදී කොළඹ වරායට සේන්දු වන නැව් අවසන්වරට පිටත් වූ වරායෙන් නිකුත් කෙරුණු නික්ම යාමේ අවසර පත්‍රය තිබේදැයි තහවුරු කරග නි. තවද ඔහු **IMO Crew** ප්‍රකාශන පරීක්ෂා කරයි. භාරදීම කොළඹ වරායට සේන්දු වන එක් එක් නැවක ආනයන බඩු ලේඛනය, නැවෙන් නැවට මාරු කරන භාණ්ඩ ලේඛනය හා නැවෙහි කැටුව රැගෙන යන භාණ්ඩ ලේඛන රේගුවට ප්‍රකාශ කර භාරදීම දේශීය නියෝජිතයා ගේ ( අදාළ නැවේ කපිතාන්ගේ නියෝජිතයන් වශයෙන් කටයුතු කරමින් ) වගකීමකි.

දේශීය නියෝජිත විසින් අදාළ සියලු රාජකාරිමය අවශ්‍යතාවයන් සම්පූර්ණ කළ බවට සෑහීමකට පත්වීමෙන් පසු සෑම නැවක් සඳහාම පිටත්වීමේ නිෂ්කාශන අවසර පත්‍රය (**Outward Clearance**) වරාය රාජකාරි භාර නිලධාරියා විසින් නිකුත් කරනු ලබයි.

දැනට නැවේ දේශීය නියෝජිත විසින් අපනයන නැව් බඩු ලේඛනය නිවාරණ කාර්යාලයට භාර නොදෙන බැවින් පිටත්වීමේ අවසරය ලබා දෙන නිලධාරියාට අදාළ නික්ම යන නැවේ ඇති අපනයන භාණ්ඩ දත්ත පිළිබඳ වැටහීමක් නැත.

## 7. ශ්‍රී ලංකා රේගුව මගින් රාජසන්තක කරන ලද භාණ්ඩ බැහැර කිරීම

මුලු දෙපාර්තමේන්තුවට අයත් විවිධ අංශ හා ශාඛා මගින් තහනම් කරන ලද හා රාජසන්තක කරන ලද භාණ්ඩ සුදුස්සක් කිරීමේ බලය මධ්‍යම විකුණුම් අංශය වෙත පවරා ඇත. රාජසන්තක කරන ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසි මගින් විකිණීම සම්බන්ධ ප්‍රතිපාදන රේගු ආඥා පනත මගින් සලසා ඇති අතර මූල්‍ය රෙගුලාසි යටතේ ස්ථාපිත කර ඇති ටෙන්ඩර් අලෙවි ක්‍රියාපටිපාටිය එවැනි වෙන්දේසිවලදී අනුගමනය කෙරේ. රජයේ මුදල් රෙගුලාසි යටතේ ස්ථාපිත කර ඇති ටෙන්ඩර් මගින් විකිණීමේ පටිපාටිය එම වෙන්දේසිවලදී අනුගමනය කරනු ලැබේ.

# සමාජ ආරක්ෂණ අංශය

## හැඳින්වීම

සමාජ ආරක්ෂණය තහවුරු කිරීම සඳහා මෙතෙක් රේගුවේ විවිධ අංශ යටතේ ක්‍රියාත්මක වූ ශාඛා කීපයක් සම්බන්ධ කරමින් සමාජ ආරක්ෂණ ක්‍රියාකාරකම් සඳහා වෙනමම අංශයක් ස්ථාපිත කරන ලදී. රේගු නීතිය හා අනෙකුත් සම්බන්ධිත නීති දැඩිවම බලාත්මක කිරීම පිණිස මත්ද්‍රව්‍ය නිවාරණ අංශය, වරාය පාලන අංශය, පාරිභෝගික හා පාරිසරික ආරක්ෂණ අංශය ජෛව විවිධත්ව, සංස්කෘතික හා ජාතික උරුම ආරක්ෂණ අංශය යන අංශ හඳුනාගෙන ඇත.

**ප්‍රධාන කාර්ය භාරයන්**

රේගු කාර්යාල තුළ දී වෙළඳාම සඳහා පහසුකම් සැලසීමත්, පවතින නීති බලාත්මක කිරීම තුළින් නියමිත බදු ආදායම එකතු කිරීම සහතික කරන අතරම නීති විරෝධී ලෙස මෙරටට ඇතුලුවන හෝ පිටව යන මත්ද්‍රව්‍ය අවමානසික තත්ත්ව කෙරෙහි බලපාන ද්‍රව්‍ය වැළැක්වීම / තහනම් කිරීමත් පාරිසරික, ජෛව විවිධත්ව, සංස්කෘතික, ජාතික උරුමයන් හා පාරිභෝගික අයිතීන් ආරක්ෂා කිරීම මෙම අංශයේ කාර්ය භාරය වේ..

## මත් ද්‍රව්‍ය පාලන අංශය

සමාජ ආර්ථික, සෞඛ්‍ය හා සංස්කෘතික උරුමයන් ආරක්ෂා කරන අතරම, ආනයන අපනයන, තැපැල් තෑගි පාර්සල් කුරියර් සේවය මගීන් හා මගීන්ගේ ගමන් බඩු ආදිය මගින් සිදු විය හැකි මත් ද්‍රව්‍ය හා අවමානසික තත්ත්ව කෙරෙහි බලපාන ද්‍රව්‍ය නීති විරෝධී සංසරණය රේගු හා අනෙකුත් සම්බන්ධිත නීති බලාත්මක කිරීම තුළින් වැළැක්වීම පිණිස මත් ද්‍රව්‍ය නිවාරණ අංශය ස්ථාපිත කරන ලදී.

### ප්‍රධාන කාර්ය භාරයන්

1. ගුවන් තොටුපළේ පැය 24 පුරා සුපරීක්ෂාව.
2. ගුවන් බඩු මුහුදු බඩු, තැපැල් හා කුරියර් අංශවල අනඹු සුපරීක්ෂාව
3. ගුවන් හා මුහුදු මගින් සිදුවන වාණිජමය ආනයන හා අපනයන හරහා සිදුවිය හැකි මත්ද්‍රව්‍ය හා අවමානසික තත්ත්ව කෙරෙහි බලපාන ද්‍රව්‍ය නීති විරෝධී සංසරණ හඳුනා ගැනීම හා වැළැක්වීම.
4. විශ්වාසනීය ඔත්තු විමර්ශනය කිරීම
5. දැනුවත් කිරීමේ හා පුහුණු වැඩසටහන් පැවැත්වීම
6. රසායන ද්‍රව්‍ය ආනයන, භාණ්ඩ නැවෙන් නැවට මාරුකිරීම සහ අපනයන අධීක්ෂණය කිරීම

| ප්‍රධාන ක්‍රියාකාරකම | ඉලක්කය | තත්‍යය | ඉටු නොකරන ලද්දේ නම් ඊට හේතු |
|---|---|---|---|
| (1) මගීන් විසින් ගමන් මළුවල සඟවා රැගෙන එන මත්ද්‍රව්‍ය හා මාදක ද්‍රව්‍ය සොයා ගැනීම | | | |
| 1. සැක කටයුතු ගුවන් මාර්ග හා මගීන් ඉලක්ක කිරීම | 100% | 100% | |

| | | | |
|---|---|---|---|
| 2. මගී ගමන් මළුවල සඟවා ඇති මත්ද්‍රව්‍ය පරීක්ෂා කිරීම සඳහා සුදුසු යන්ත්‍රයක් මිලදී ගැනීම | 100% | 0% | පරිලෝකන යන්ත්‍රය තවම සාකච්ඡා මට්ටමේ පවතී. |
| 3. බ.ජා.ගු සේවා මුරවලට මත්ද්‍රව්‍ය අංශයේ සහකාර රේගු අධිකාරීන් යෙදවීමට අතිරේකව මත්ද්‍රව්‍ය අංශයේ අනෙකුත් නිලධාරීන් විසින් නිරන්තර සෝදිසි කිරීම් හා කණ්ඩායම් සෝදිසි පිළිබඳ වාර්තා ඉදිරිපත් කිරීම | 100% | 100% | |
| (2) කුරියර් සේවා හා පාර්සල් තැපැල් මගින් ජාවාරම් කෙරෙන මත්ද්‍රව්‍ය හා මාදක ද්‍රව්‍ය සොයා ගැනීම | | | |
| 1. රට තුළට ගෙන එනු ලබන පාර්සල් නිරන්තර පරීක්ෂාවට භාජනය කිරීම හා එම පරීක්ෂාවන් පිළිබඳ වාර්තා ඉදිරිපත්කිරීම | 100% | 100% | |
| (3) UNODC හා WCO හි මාර්ගෝපදේශකය මත පරිගණක පාලන වැඩසටහන් ස්ථාපිත කිරීම | | | *** දැනට මෙම කාර්යය ඉටු කරනු ලබන්නේ වරාය පාලන ඒකකය විසිනි. |
| 1. බහාලුම් ගමන් මාර්ග ලුහුබැඳීමේ පද්ධතිය ක්‍රියාත්මක කිරීම | 100% | 0% | |
| 2. වාණිජ බහාලුම්වල සඟවා රැගෙන එන මත්ද්‍රව්‍ය සොයාගැනීම සඳහා අවශ්‍ය උපකරණ මිලදී ගැනීම | 100% | 0% | |
| 3. සැක කටයුතු මුහුදු ගමන් මාර්ග හා ආනයනකරුවන් ඉලක්ක කිරීම | 100% | 0% | |
| 4. සැක කටයුතු බහාලුම් පරීක්ෂා කිරීම සඳහා රඳවා ගැනීම | 100% | 0% | |
| (4) වෙරළ තීරය ඔස්සේ සිදුවන මත්ද්‍රව්‍ය ජාවාරම් පරීක්ෂාවට ලක් කිරීම හා ඒවා වැලැක්වීමට අවශ්‍ය පියවර ගැනීම | | | |
| 1. දේශ සීමා හරහා මත්ද්‍රව්‍ය ජාවාරමේ නියැලෙන අපරාධකරුවන් භාවිතා කරනු ලබන නව උපක්‍රම අවබෝධ කර ගැනීම | 100% | 100% | |
| 2. විවෘත මුහුදු මාර්ග ඔස්සේ මෙරටට පැමිණෙන මත්ද්‍රව්‍යවල බලපෑම අධ්‍යයනය කිරීම | 100% | 100% | |
| (5) දැනුවත් කිරීම් හා පුහුණු වැඩසටහන් | | | |
| 1. ඉල්ලුම පහළ දැමීම පිළිබඳ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | 100% | 100% | |
| 2. NDDCB හා මානව සම්පත් අංශයේ සහාය මත රේගු කාර්ය මණ්ඩල පුහුණු කිරීම | 100% | 100% | |
| (6) අනෙකුත් ආයතන සමඟ සහයෝගිතාවය ගොඩනැගීම | | | |
| 1. NDDCB, PNB, වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව හා වෙනත් ආයතන සමග එක්ව මත්ද්‍රව්‍ය ජාවාරම් කිරීමේ තත්ත්වයන් පිළිබඳ සාකච්ඡා හා රැස්වීම් පැවැත්වීම | 100% | 100% | |

## ජෛව විවිධත්ව, සංස්කෘතික හා ජාතික උරුමයන් ආරක්ෂණ අංශය

### ජෛව විවිධත්ව ආරක්ෂණය

සමාජය සහ එහි උරුමය ආරක්ෂා කිරීම රේගු දෙපාර්තමේන්තුවේ එක් අරමුණක් වේ. පරිසරය ආරක්ෂා කිරීම මෙම කටයුත්තේ වැදගත් කාර්යයකි. බොහෝ ජාත්‍යන්තර මෙන්ම ජාතික ආයතන මීට සම්බන්ධ වී සිටින අතර, මෙම ප්‍රයත්නයේදී ශ්‍රී ලංකා රේගුව සමඟ ඉතා සමීපව කටයුතු කරයි. ආනයනය කිරීමේ දී හා අපනයනය කිරීමේදී ජෛව විවිධත්වයට අදාල විවිධ නීති බලාත්මක කිරීමට ශ්‍රී ලංකා රේගුව බැඳී සිටී.

සර්ම කලාපීය රටක් වශයෙන් පවතින ශ්‍රී ලංකාව ශාක හා සත්ත්වයින්ගෙන් ආඪ්‍යය වන අතර ජෛව විවිධත්වය ඇති පොහොසත් රටවලින් එකක් මෙන් ම ජෛව විවිධත්ව උණුසුම් ප්‍රධාන රටවල් අතරින් එකක් ලෙස සැලකේ. එහි ප්‍රතිඵලක් වශයෙන් සතුන් විශාල ප්‍රමාණයක් හා පර්යේෂණ සඳහා සතුන් එකතුකරන්නන් ආකර්ෂණය කර ඇති අපගේ විශේෂ සඳහා ලෝකය පුරා ඉතා ඉහළ ඉල්ලුමක් ජනිත වී ඇත. ඒකදේශිකතාව ඉහළ ප්‍රතිශතය, දුර්ලභ විශේෂ, විසිතුරු බවට ඇති වටිනාකම්, අපගේ විශේෂවල ඇති සුවිශේෂී රටාව හා ගුණය ද මෙම ඉහළ උපයෝජනය වැඩිකිරීමට හේතු වී ඇත. මේ අතර නීති විරෝධීව රට තුළට ගෙන ඒමේ කටයුතුවලදී නූතන තාක්ෂණය සහ සූක්ෂ්ම ක්‍රමවේද හඳුන්වා දීම ජෛව විවිධත්වයන්ට අදාල අයිතමයන් නීති විරෝධීව බැහැර කිරීම අධීක්ෂණය කිරීමේදී හා අල්ලා ගැනීමේදී ශ්‍රී ලංකා රේගුවට ප්‍රබල අභියෝගවලට මුහුණ පෑමට සිදු වී ඇත.

මෙම අභිමතාර්ථය සාක්ෂාත් කරගැනීමේ අවශ්‍යතාවය සැලකිල්ලට ගෙන ජෛව විවිධත්ව ආරක්ෂණ ඒකකය ස්ථාපිත කරන ලදී. පවතින තොරතුරුවලට අනුව මෙය ලෝකයේ ප්‍රථම රේගු ජෛව විවිධත්ව ආරක්ෂණ ඒකකය වේ.

**සංස්කෘතිය හා ජාතික උරුමය ආරක්ෂා කිරීම**

වසර දෙදහස් පන්සීයයකට වැඩි ලිඛිත ඉතිහාසයක් හා තවත් වසර දෙදහස් පන්සීයයකට වැඩි ප්‍රාග් ඓතිහාසික සාධක සහිතව වසර සියදහසක් ඈතට දිවයන අනර්ඝ සංස්කෘතියක් හා ජාතික උරුමයක් ශ්‍රී ලංකාවට හිමි වේ.

රටේ මිල කළ නොහැකි උරුමයන් සුරක්ෂිත කිරීම සහ එම උරුමයන්වලට අයත් වංචල කෞතුක භාණ්ඩ නීති විරෝධීව අපහරණ කිරීම වැලැක්වීම රේගු දෙපාර්තමේන්තුවේ එක් අභිමතාර්ථයක් වේ.

2010 වර්ෂයේ රේගු ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය තුළ දී ජෛව විවිධත්ව, සංස්කෘතික හා ජාතික උරුමයන් ආරක්ෂණ අංශය (BCNP) නිර්මාණය කර සමාජ ආරක්ෂණ අංශය යටතේ ස්ථානගත කරන ලදී. එබැවින් සංස්කෘතික හා ජාතික උරුමයන් පිළිබඳ කටයුතුවලට ඉඩකඩ පහසුකම් සලසා දීම සඳහා ජෛව විවිධත්ව ඒකකයේ විෂය පථය ද වැඩි දියුණු කරන ලදී.

ප්‍රධාන කාර්යභාරයන්:

1. දේශසීමා අතරේ ජෛව විවිධත්ව ගණයට අයත් භාණ්ඩ සංචලනයේදී අදාල ජාතික හා ජාත්‍යන්තර නීති බලාත්මක කිරීම.
2. සියළුම ජෛව විවිධත්ව සම්බන්ධකම් ඇති ආනයන හා අපනයනවල විස්තර වර්ගීකරණ හා මිල සෝදිසි කිරීම.
3. වනසත්ව හා වෘක්ෂලතා සම්බන්ධ ආනයන හා අපනයන් පාලනය සඳහා වන බලපත්‍ර අවශ්‍යතාවයන් සෝදිසි කිරීම හා එවැනි ආනයන හා අපනයනවල අවිධිමත්භාවය නිසා රේගු ක්‍රියාදාමයන්ට වන බලපෑම සොයා බැලීම.
4. ජීව විද්‍යාත්මක සමතුලිතතාවයට හානි නොවන ආකාරය, අප රටේ සංවර්ධන ව්‍යාපෘති සඳහා

## වැදගත් හසුකර ගැනීම්

### තහනම් කරන ලද ජලජ සතුන් නීති විරෝධීව රටින් පිටමන් කිරීමට තැත් කිරීම අනාවරණ කර ගැනීම.

ජෛව විවිධත්ව, සංස්කෘතික හා ජාතික උරුමයන් ආරක්ෂණ අංශයට අනුයුක්තව සේවය කරන නිලධාරීන් විසින් 2015 පෙබරවාරි 28 වන දින තහනම් කරන ලද පණ ඇති මිරිදිය මසුන් තොගයක් නීති විරෝධීව රටින් පිටමං කිරීමට තැත් කිරීමේදී අනාවරණය කර ගන්නා ලදී. මෙම නැව් බඩු තොගයට පණ ඇති ඒකදේශික මසුන් - දෙපුල්ලියක්(Puntius cumingii) 180 දෙනෙක් ඇතුලත්වන අතර එම ජලජ ජීවීන් දකුණු අප්‍රිකාවට අපනයනය කිරීමට සැලසුම් කර තිබුණි. එම මත්ස්‍යයන් රාජ්‍ය සන්තක කරනු ලැබූ අතර වරදකාර සමාගමට දඩුවම් දෙන ලදී. රාජසන්තක කරන ලද පණ ඇති මත්ස්‍යයන් ජාතික සත්ත්ව උද්‍යානයට බාර දෙන ලදී.

මෙය 1996 අංක 02 දරණ ධීවර හා ජලජ සම්පත් පනත සමඟ කියවෙන රේගු ආඥා පනත (අධිකාරය 235) උල්ලංඝනය කිරීමකි .



**පණ ඇති ඉබ්බන් හසුකර ගැනීම.**

2015 ජුලි මස 08 වැනි දින බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළේ ගුවන් භාණ්ඩ අංගනය හරහා නීති විරෝධීව රටින් පිටමන් කරමින් තිබුණු කුඩා ඉබ්බන් 488 දෙනෙක් අල්ලා ගන්නා ලදී. එම මාසයේම එය දෙවැනි අල්ලා ගැනීම විය. "පණ ඇති කකුළුවන් "වශයෙන් සලකුණු කර තිබූ ඇසුරුමක් පරීක්ෂා කිරීමේ දී පොලිතින්වලින් ඔතන ලද කුඩා ඝන කටු රේගුව විසින් සොයා ගන්නා ලදී . ඇසුරුම තුළ පණ ඇති ඉබ්බන් සඟවා තිබූණු බව පෙන්වමින් මෙම සමහර කටුවලින් හිස මතු වීම සමීප දසුනකින් අනාවරණය විය. මැලේසියාවේ ක්වාලා ලාම්පූර්වලට යැවීම සඳහා එවැනි ඇසුරුම් 7ක් පමණ තිබුණි.

2015.06.03 දින කුඩා ඉබ්බන් 124 දෙනෙකු නීති විරෝධීව රටින් පිටමන් කිරීමට යන අවස්ථාවේදී ඒ ආකාරයෙන්ම අල්ලා ගන්නා ලදී. මෙම ඉබ්බන් ශ්‍රී ලාංකික මගියෙකුගේ ගමන් බඩු බෑගයේ සඟවා තිබුණි. ඔහු ගුවන් තොටුපල පිටවීමේ මගී විවේකාගාරය තුළ දී අත් අඩංගුවට ගන්නා ලදී. මෙම ඉබ්බන් ද මැලේසියාවේ ක්වාලා ලාම්පූර්වලට යැවීම සඳහා සූදානම් කර තිබුණි. මෙය සත්ත්ව හා ශාක සංරක්ෂණ ආඥා පනත සමඟ කියවෙන රේගු ආඥා පනත (අධිකාරය 235) උල්ලංඝනය කිරීමකි.





**වටිනා ඒකදේශීක දැව - වල්ලාපට්ටා (Gyrinops walla) හසු කර ගැනීම්**

වල්ලාපට්ටා (Gyrinops walla) කිලෝග්‍රෑම් 4.6ක් ශ්‍රී ලාංකික ජාතිකයකු විසින් ඉන්දියාවට නිති විරෝධීව පිටමන් කිරීමට තැත්කිරීමේදී 2015 මාර්තු 10 වන දින බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලේ මගීන් පිටත්වන අංගනයේ දී හසු කර ගන්නා ලදී.
වල්ලාපට්ට (Gyrinops walla) දැව කැබලි 23.3ක් ශ්‍රී ලාංකිකයකු විසින් සාජාවලට නීති විරෝධීව පිටමන් කිරීමට තැත් කරන අවස්ථාවේදී බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලේ මගීන් පිටවීමේ අංගනයේදී 2015 ඔක්තෝම්බර් 13 දින හසු ගන්නා ලදී.
වල්ලාපට්ටා (*Gyrinops walla*) ඒකදේශීක ශාකයක් වන අතර සුවඳ විලවුන් වශයෙන් එහි වටිනාකම ඉතා මෑත දී හඳුනාගන්නා ලදී. එය සුවඳ විලවුන් නිෂ්පාදනය සඳහා භාවිතා කරන බැවින්, අනෙකුත් රටවල දී ඉහළ මිලක් ලබා දෙන දුම්මල සහිත ද්‍රව්‍යයක් එමඟින් නිපදවේ. වල්ලාපට්ටා වනාන්තර නිෂ්පානයක් සේ සැලකේ. එබැවින් ආනයනය කිරීම තහනම් කර ඇත. වලංගු වන බලපත්‍රයක් රහිතව ආනයනය කිරීම වනන්තර ආඥා පනත සමඟ කියවෙන රේගු ආඥා පනත (අධිකාරය 235) උල්ලංඝනය කිරීමකි.



### සඳුන් දර හසු කර ගැනීම්

සඳුන් දර (Santalum album පාකිස්ථාන ජාතිකයෙකු විසින් බුලත් කොළ තුළ සඟවා පාකිස්ථානයට නීති විරෝධීව පිටමන් කිරීමට තැත් කිරීමේ දී 2015 මාර්තු 11 වන දින බණ්ඩාරනායක අන්තර්ජාතික ගුවන් තොටුපලේ මගී පර්යන්තයේදී නිලධාරීන් විසින් අත්අඩංගුවට ගන්නා ලදී.





### ගුවන් භාණ්ඩ තුළ සඳුන් දර (*Santalum album*) තෙල් අත්අඩංගුවට ගැනීම.

2015 පෙබරවාරි 07 වන දින කුරියර් සේවා සපයන සමාගමක් විසින් ගුවන් භාණ්ඩ පර්යන්තය හරහා සඳුන් තෙල් කිලෝග්‍රෑම් 25ක් අඩංගු ඇලුමිනියම් බැරල් ඕස්ට්‍රේලියාවට අපනයනය කිරීමට යන අවස්ථාවේදී අත් අඩංගුවට ගන්නා ලදී. මෙම භාණ්ඩ කුරුඳු පොතු තෙල් වශයෙන් ප්‍රකාශයට පත් කර තිබුණි.

සඳුන් දැව (Santalum album) සත්ත්ව හා ශාක ආරක්ෂණ ආඥාපනතේ සුරක්ෂිත කරන ලද ශාකයක් බැවින් සඳුන් දරවල කිසියම් වූ කොටසක් ආනයනය කිරීම තහනම් වේ. සඳුන් දරවල යම් නිෂ්පාදනයක් ආනයනය කිරීම වනාන්තර ආඥාපනත හා රේගු අඥාපනත (අධිකාරය 235) උල්ලංඝනය කිරීම.

### වියළි මුහුදු අශ්වයන් අත්අඩංගුවට ගැනීම.

චීන ජාතිකයන් දෙදෙනෙකු (2) විසින් වියළි මුහුදු අශ්වයන් කිලෝග්‍රෑම් 60ක් 2015.04.27 දින චීනයට නීති විරෝධීව පිටමන් කිරීමට තැත්කරන අවස්ථාවේදී බණ්ඩාරනායක ජාත්‍යාන්තර ගුවන් තොටුපලේ මගීන් පිටවීමේ පර්යන්තයේ දී අත්අඩංගුවට ගන්නා ලදී.

වියළන ලද මුහුදු අශ්වයන් කාම ශක්තිය නංවන උත්තේජකයක් වශයෙන් චීන ඖෂධවල භාවිතා කෙරේ. එමනිසා මෙම විශේෂය සඳහා චීනයේ, තායිවානයේ සහ පිලිපීනයේ විශාල ඉල්ලුමක් පවතී. වඳ වී යන වන සත්ත්ව හා ශාක විශේෂයන් ජාත්‍යාන්තර වෙළඳාම පිළිබඳ සම්මුතිය (CITES) පරිශිෂ්ටය 2 මගින් මුහුදු අශ්වයන් වෙළඳාම නියාමනය කර ඇත. මුහුදු අශ්වයන් අපනයනය කිරීම රේගු අඥාපනත (අධිකාරය 235) උල්ලංඝනය කිරීම.



### පණ ඇති පොකිරිස්සන් අත්අඩංගුවට ගැනීම.

පොකිරිස්සන් අපනයනය තහනම් කර ඇති කාලපරිච්ඡේදය තුළ ශීත කළ කූනිස්සන් වශයෙන රේගුවට ප්‍රකාශ කරමින් ශීත කළ පොකිරිස්සන් කිලෝග්‍රෑම් 737.3ක තොගයක් 2015 පෙබරවාරි 28 වන දින ගුවන් භාණ්ඩ පර්යන්තයේ දී (BIA) අත්අඩංගුවට ගන්නා ලදී.
පණ ඇති පොකිරිස්සන් (සම්මිත ප්‍රමාණයට වඩා විශාලත්වයෙන් අඩු ) 683 දෙනෙක් කෑමට ගත හැකි මත්ස්‍යයන් ලෙස රේගුවට ප්‍රකාශ කරමින් 2015 ජූලි 08 වන දින තායිවානයට අපනයනය කිරීමට තැත් කිරීමේදී ගුවන් භාණ්ඩ පර්යන්තයේ දී (BIA) අත්අඩංගුවට ගන්නා ලදී. සම්මිත ප්‍රමාණයට වඩා විශාලත්වයෙන් අඩු පොකිරිස්සන් ආනයනය කිරීම තහනම් වේ.
ධීවර හා ජලජ සම්පත් පනතේ සහ රේගු ආඥා පනතේ (අධිකාරය 235) නියම කර ඇති රෙගුලාසිවලට අනුව රාජසන්තක කරන ලද පොකිරිස්සන් මුහුදට නිදහස් කරන ලදී.



### වන ගත උඩවැඩියා අත්අඩංගුවට ගැනීම.

2015 වර්ෂය තුළදී චීන මහීන් විසින් වනගත දේශිය උඩවැඩියා පැළ සහ ඒවායේ වියළන ලද කොටස් නීති විරෝධී ලෙස මෙරටින් පිටමන් කරන ලද අවස්ථා කිහිපයක දී බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලේ පිටත්වීමේ පර්යන්තයේදී BCNP නිලධාරීන් විසින් අත් අඩංගුවට ගෙන ඇත.





උඩවැඩියා සොබාදහමේ ඉතාමත් ආකර්ශනීය මල් පිපෙන පැළ කාණ්ඩයක් වේ. උඩවැඩියා මූලික වශයෙන් විසිතුරු මල් වශයෙන් වගා කරනු ලැබුවත් බොහෝ අය ඒවා ඖෂධීය බෙහෙතක් වශයෙන් ආහාර හා වෙනත් කටයුතු සඳහා භාවිතා කරන අතර ලෝකයේ විවිධ ප්‍රදේශවල විවිධ සංස්කෘතීන් හා ගෝත්‍ර තුළ ඒවාට සංස්කෘතික වටිනාකමක් ඇත. ඈත අතීතයේ සිටම උඩවැඩියා ශාක ලෝකයේ බොහෝ ප්‍රදේශවල සාම්ප්‍රදායික සුව කිරීමේ ක්‍රමයක් මෙන්ම රෝග කිහිපයකම ප්‍රතිකාර ක්‍රමයක් වශයෙන් භාවිතා කර ඇත. ස්වභාවික භූමිය නැති වීම නිසා බොහෝ ශ්‍රී ලාංකික උඩවැඩියා පැළෑටි ඇඩි වඳ වී යාමේ තර්ජනයකට මුහුණපා සිටී.

1937 අංක 02 දරණ සත්ත්ව හා ශාක සංරක්ෂණ ආඥා පනතේ උඩවැඩියා සංරක්ෂිත වශයෙන් ලැයිස්තු ගත කර ඇත. සත්ත්ව හා ශාක සංරක්ෂණ ආඥා පනත සහ වනාන්තර ආඥා පනත සමඟ කියවෙන රේගු ආඥාපනත (අධිකාරය 235)ප්‍රකාරව වන ගත උඩවැඩියා අපනයනය කිරීම වරදකි.

## බෞද්ධ බුද්ධ ප්‍රතිමා 2ක් අත්තඩංගුවට ගැනීම.

මහනුවර යුගයට අයත් පුරාවිද්‍යා වටිනාකමක් ඇති බවට සැක කෙරෙන පෞරාණික බුද්ධ ප්‍රතිමා දෙකක් 2015.04.28 වෙනි දින වලංගු බලපත්‍රයක් නොමැතිව නීති විරෝධීව රටින් පිටමන් කිරීමට තැත් කිරීමේදී බණ්ඩාරනායක ගුවන් තොටුපලේදී අත්තඩංගුවට ගන්නා ලදී. චීන මගියෙකුගේ ගමන් මල්ලක අනෙකුත් පෞද්ගලික භාණ්ඩ අතර සඟවා තිබියදී මෙම ප්‍රතිමා සොයා ගන්නා ලදී.

මෙම ප්‍රතිමා කෞතුක වස්තූන් බව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව තහවුරු කර ඇත. පසුව මෙම භාණ්ඩ රාජ්‍ය සන්තක කරන ලදී. පුරාවිද්‍යා කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලබන බලපත්‍රය/අවසර පත්‍රය නොමැතිව පුරාවස්තු අපනයනය කිරීම පුරාවස්තු අඥාපනත සමග කියවෙන රේගු අඥාපනත (අධිකාරය 235) විධිවිධාන ප්‍රකාරව වරදකි.



## ජෛව විවිධත්ව, සංස්කෘතික හා ජාතික උරුමයන් ආරක්ෂණ අංශයේ නිලධාරීන් විසින් 2015 වසරේදී හසු කරගන්නා ලද හා අවසන් කරන ලද සිද්ධීන්.

| දිනය | විස්තරය | නඩු අංකය | වටිනාකම | දඩය | සටහන් |
|---|---|---|---|---|---|
| **08.01.2015** | වල්ලපට්ට(*Gyrinops walla*)- කිලෝ ග්‍රෑම් 34.5 | ENSP/BPU/01/2015 | 882000 | 100,000.00 | භාණ්ඩ රාජ්‍ය සන්තක කරන ලදී. |

| | | | | | |
|---|---|---|---|---|---|
| **07.02.2015** | හඳුන් දර තෙල් - 20kgs | ENSP/BPU/02/2015 | 4,859,655.50 | | විභාග වෙමින් පවතී. |
| **25.02.2015** | දෙපුල්ලියා පණ ඇති ඒක දේශික මත්ස්‍යන්-(*Puntius cumingii)* - 180 Nos | ENSP/BPU/03/2015 | 7225 | 10,000.00 | ජාතික සත්ව උද්‍යානවලට භාර දෙන ලදී. |
| **28.02.2015** | සීත කළ පොකිරිස්සන් - කි.ග්‍රෑ 737.3 | ENSP/BPU/04/2015 | 1695790 | 1,795,790.00 | භාණ්ඩ රාජ සන්තක කරන ලදී. |
| **03.03.2015** | වියළන ලද මුහුදු අශ්වයන් -කි.ග්‍රෑ 8 | ENSP/BPU/05/2015 | | 200,000.00 | භාණ්ඩ රාජ සන්තක කරන ලදී.අළවියෙන් රු.2,200,000/- අය කර ගන්නා ලදී. |
| **10.03.2015** | වල්ලපට්ට(*Gyrinops walla*)- කිලෝ ග්‍රෑම් 34.5 | ENSP/BPU/08/2015 | 2990000 | 60,000.00 | භාණ්ඩ රාජ සන්තක කරන ලදී. |
| **11.03.2015** | සඳුන් දර කොට-කි.ග්‍රෑ 54.0 | ENSP/BPU/06/2015 | | | භාණ්ඩ රාජ සන්තක කරන ලදී. |
| **04.04.2015** | වල්ලපට්ට (*Gyrinops walla*)- කි.ග්‍රෑ 19.7 | ENSP/BPU/07/2015 ,(BIA/D/Case/46/2015) | 9615000 | 150,000.00 | භාණ්ඩ රාජ සන්තක කරන ලදී.අලවියෙන් රු.3,500,000/-අය කැගන්නා ලදී. |
| **26.04.2015** | වියළන ලද මුහුදු අශ්වයන් | ENSP/BPU/09/2015 | 1,170,000.00 | | භාණ්ඩ රාජ සන්තක කරන ලදී. |
| **26.04.2015** | වියළන ලද මුහුදු අශ්වයන් | ENSP/BPU/10/2015 | 1,170,000.00 | | භාණ්ඩ රාජ සන්තක කරන ලදී. |
| **28.04.2015** | පෞරාණික බුද්ධ ප්‍රතිමා ( ප්‍රමාණය-02) | ENSP/BPU/11/2015 | | | භාණ්ඩ රාජ සන්තක කරන ලදී. |
| **30.04.2015** | තිරුවානා ගල් හා ගිණිගල් කුට්ටි (මෙ.ටෝ.92 ) | ENSP/BPU/12/2015 | 2601405 | 200,000.00 | භාණ්ඩ රාජ සන්තක කරන ලදී. |
| **14.05.2015** | කොතල හිඹුටු(Salacia reticulata) භාජන | ENSP/BPU/13/2015 | 12,000.00 | | භාණ්ඩ රාජ සන්තක කරන ලදී. |
| **20.05.2015** | වල්ලපට්ට (Gyrinops walla)- කි.ග්‍රෑ10 | ENSP/BPU/14/2015 | 7,000,000.00 | 200,000.00 | භාණ්ඩ රාජ සන්තක කරන ලදී. |
| **30.05.2015** | සඳුන් දර කොට (කි.ග්‍රෑ 192.4 ) | ENSP/BPU/15/2015 ,(BIA/D/Case/46/2015) | 384000 | 400,000.00 | භාණ්ඩ රාජ සන්තක කරන ලදී. |
| **19.06.2015** | වල්ලපට්ට (Gyrinops walla) - කි.ග්‍රෑ 23.6 | ENSP/BPU/19/2015 ,(BIA/D/Case/99/2015) | 472000 | 100,000.00 | භාණ්ඩ රාජ සන්තක කරන ලදී.අලවියෙන් රු.100,000/-අය කර ගන්නා ලදී /- |
| **දිනය** | **විස්තරය** | **නඩු අංකය** | **වටිනාකම** | **දඩය** | **සටහන්** |
| **02.07.2015** | පණ ඇති ඉබ්බන් (124 Nos) | ENSP/BPU/16/2015 ,(BIA/D/Case/113/2015) | 930000 | 300,000.00 | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට භාර දෙන ලදී |
| **08.07.2015** | පණ ඇති පොකිරිස්සන් (683 nos) | ENSP/BPU/17/2015 | 1409000 | 400,000.00 | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට භාර දෙන ලදී |
| **10.07.2015** | ජීව ශාක (කි.ග්‍රෑ 15) | ENSP/BPU/21/2015 | | | භාණ්ඩ රාජ සන්තක කර ජාතික සත්ව උද්‍යානයට භාර දෙන ලදී. |

| | | | | | |
|---|---|---|---|---|---|
| **28.07.2015** | පණ ඇති ඉබ්බන් 488 Nos | ENSP/BPU/20/2015 | 498000 | 548,500.00 | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට භාර දෙන ලදී. |
| **28.07.2015** | ජීව ශාක (533 Nos) | ENSP/BPU/22/2015 | | 45,000.00 | භාණ්ඩ රාජ සන්තක කර ජාතික සත්ව උද්‍යානයට භාර දෙන ලදී. |
| **01.09.2015** | සර්ප වයින් බෝතල් | ENSP/BPU/23/2015 | | | භාණ්ඩ රාජ සන්තක කරන ලදී. |
| **17.09.2015** | කෑමට ගත හැකි කුරුලු කූඩු (300g) | ENSP/BPU/26/2015 (BIA/D/Case/185/2015) | 300000 | 50,000.00 | භාණ්ඩ රාජ සන්තක කරන ලදී. |
| **21.09.2015** | හඳුන් දර කුඩු ( මි.ලි300),හඳුන් දර කොට ( කි.ග්‍රෑ.43) | ENSP/BPU/27/2015 (BIA/D/Case/189/2015) | 5000 | 5,000.00 | භාණ්ඩ රාජ සන්තක කරන ලදී. |
| **04.10.2015** | කහ වර්ණයෙන් යුත් මුහුණු සහිත love brieds (ප්‍රමාණය-20) | ENSP/BPU/24/2015 | | | විමර්ශන සිදු වෙමින් පවතී. |
| **19.10.2015** | කැපූ රෝස අතු (30 පැකේජ්/පෙට්ටි) | ENSP/BPU/25/2015 | | | විමර්ශන සිදු වෙමින් පවතී. |
| | | එකතුව | **14,211,655.50** | **4,564,290.00** | |

## 2015 වර්ෂයේ සිද්ධි පිළිබඳ සංෂිප්තය

| | | |
|---|---|---|
| **1** | ලියාපදිංචි කරන ලද සිද්ධි සංඛ්‍යාව | 27 |
| **2** | සම්පූර්ණ කරන ලද සිද්ධි සංඛ්‍යාව | **23** |
| **3** | වැරදි බවට තහවුරු කරන ලද, රාජ සන්තක කරන ලද සහ දඩ නියම කරන ලද සිද්ධි | **22** |
| **4** | දඩ නියම කිරීමෙන් රාජ සන්තක කිරීමෙන් රැස් කරපන් ලැබූ මුලු මුදල | **4,564,290.00** |
| **5** | භාණ්ඩ රාජ සන්තක කිරීමේ මුලු වටිනාකම. | **14,211,655.50** |
| **7** | අලවියෙන්උපයන ලැබූ මුදල. | **6,400,009.00** |
| **8** | අසම්පූර්ණ ලිපි ගොනු සංඛ්‍යාව | **4** |

**1993 සිට 2015 දක්වා ජෛව විවිධත්ව, සංස්කෘතික හා ජාතික උරුමයන් ආරක්ෂණ අංශයේ සිද්ධි**




| | 1992 | 1993 | 1994 | 1995 | 1996 | 1997 | 1998 | 1999 | 2000 | 2001 | 2002 | 2003 | 2004 | 2005 | 2006 | 2007 | 2008 | 2009 | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ANTIQUES | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 3 | 4 | 0 | 1 | 0 | 0 | 0 | 1 | 2 | 1 | 4 | 6 | 0 | 1 |
| BIODIVERSITY | 1 | 7 | 19 | 12 | 14 | 10 | 8 | 26 | 36 | 23 | 20 | 9 | 14 | 18 | 4 | 5 | 13 | 9 | 12 | 9 | 26 | 32 | 19 | 29 |

**2015 වර්ෂයේදී සංවිධානය කරන ලද හා සහභාගී වූ විශේෂ කාර්යයන්**

| සහභාගී වූ කාණ්ඩය | විස්තරය |
|---|---|
| රැස්වීම් | • කොළඹ 01 ලෝක වෙළඳ මධ්‍යස්ථානයේදී ආයෝජන මණ්ඩලයේ දී 2015.01.29 දින පවත්වන ලද කාර්මික පළිබෝධනාශක උප කමිටුවේ 18 වන රැස්වීම. |
| | • 2015.02.18 වන දින ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේදී පවත්වන ලද ධීවර රෙගුලාසි පිළිබඳ රැස්වීම. |
| | • මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ දී 2015.02.19 පවත්වන ලද ශ්‍රී ලංකාවේ මදුරු උවදුර පිළිබඳ රැස්වීම. |
| | • ජාතික විද්‍යා පදනම් ශ්‍රවනාගාරයේදී 2015 .02.24 දින HCFC පිළිබඳව පැවති රැස්වීම . |
| | • පාරිසරික හා පුනර්ජනනීය අමාත්‍යාංශයේ දී 2015.02.02 දින හා 2015.02.06 දින පවත්වන ලද ශ්‍රී ලංකාවේ ව්‍යාප්ත වීමට ප්‍රවණතාවයක් ඇති අන්‍ය දේශික විශේෂ හඳුන්වා දීම හා ව්‍යාප්ත වීම පාලනය කිරීම සඳහා වන හැකියාව ශක්තිමත් පිළිබඳ රැස්වීම |
| | • පරිසර රාජ්‍ය අමත්‍යාංශයේදී 2015.05.15 දින පවත්වන ලද ජෛව ආරක්ෂාව පිළිබඳ කටේජනා ප්‍රොටෝකෝලයට අනුව ජාතික ජෛව ආරක්ෂක රාමුවක් ක්‍රියාත්මක කිරීම පිළිබඳ PPG |
| | • පරිසර රාජ්‍ය අමත්‍යාංශයේදී 2015.07.27 දින පවත්වන ලද ජෛව ආරක්ෂාව පිළිබඳ කටේජනා ක්‍රොටකෝලයට අනුව ජාතික ජෛව ආරක්ෂක රාමුවක් ක්‍රියාත්මක කිරීම පිළිබඳ රැස්වීම. |
| | • රේගු මූලස්ථානයේ දී 2015.07.28 දින පවත්වන ලද ජෛව ආරක්ෂාව පිළිබඳ කටේජනා ක්‍රොටකෝලයට අනුව ජාතික ජෛව ආරක්ෂක රාමුවක් ක්‍රියාත්මක කිරීම පිළිබඳ ව්‍යාපෘති ලේඛණ ප්‍රවර්ධන කිරීමේ ජාත්‍යන්තර උපදේශකවරයෙක් වන විහා අහුජා සමඟ පැවති රැස්වීම. |
| | • පරිසර අමාත්‍යාංශයේදී 2015.08.25 වන දින චිරස්තායි කාබනික දූෂිත ද්‍රව්‍ය පිළිබඳ ස්ටොක්හෝම් ප්‍රඥප්තිය සඳහා වන ජාතික ක්‍රියාත්මත කිරීමේ වැඩසටහන සමාලෝචනය කිරීම හා යාවත්කාලීන කිරීම උදෙසා අවශ්‍ය වන ක්‍රියාමාර්ග පිළිබඳ රැස්වීම. |
| | • ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේදී 2015.08.31 දින පවත්වන ලද නීති විරෝධී, අප්‍රකාශිත සහ නියාමනය නොකරන ලද මසුන් ඇල්ලීම සඳහා වන ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම පිළිබඳ රැස්වීම |
| | • පරිසර අමාත්‍යාංශයේදී 2015.09.10 දින පැවති ගෝලීය සංයෝජිත සංකේත අංක ක්‍රමය (GHS සංකේතාංක) පිළිබඳ රැස්වීම |
| | • මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ දී 2015.10.13 දින පවත්වන ලද චිරස්තායි කාබනික දූෂිත ද්‍රව්‍ය පිළිබඳ ස්ටොක්හෝම් ප්‍රඥප්තිය සඳහා වන ජාතික ක්‍රියාත්මත කිරීමේ වැඩසටහන සමාලෝචනය කිරීම හා යාවත්කාලීන කිරීම උදෙසා අවශ්‍ය වන ක්‍රියාමාර්ග පිළිබඳ ව්‍යාපෘතියේ 06 වන ජාතික මෙහෙයුම් කමිටු රැස්වීම |
| | • මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ දී 2015.11.17 දින පවත්වන ලද බෙසල් රොටඩෑම් ස්ටොක්හෝම් ප්‍රඥප්තිය පිළිබඳ ජාතික සම්බන්ධිකරණ කමිටු රැස්වීම. |
| | • වන අඩවි දෙපාර්තමේන්තුවේ දී 2015.11.26 දින පවත්වන ලද ලංකාවේ ව්‍යාප්ත වීමට ප්‍රවණතාවයක් ඇති අන්‍ය දේශික විශේෂ හඳුන්වා දීම හා ව්‍යාප්ත වීම පාලනය කිරීම සඳහා වන හැකියාව ශක්තිමත් කිරීම පිළිබඳ රැස්වීම. |
| | • සම්පත් පරිසර මන්දිරයේදී 2015.12.18 දින පවත්වන ලද හරිතගණනය පිළිබඳ ධීවර අංශයේ ක්‍රියාකාරි කණ්ඩායමේ රැස්වීම. |
| | • රාජගිරිය බැංකුකරණ අධ්‍යයන මධ්‍යස්ථානයේ දී 2015.12.22 දින පවත්වන ලද ජෛව ආරක්ෂාව අදාළව කටේජෙනා ප්‍රොටකෝලය ක්‍රියාත්මක කිරීම පිළිබඳ තුන්වන ජාතික වාර්තාව ඉදිරිපත් කිරීම - ජෛව ආරක්ෂාව පිළිබඳ ජාතික සම්බන්ධීකරණ කමිටුව |
| | • මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේදී 2015.12.30 දින පවත්වන ලද, භාවිත කරනු ලැබූ - යල් පැන ගිය රසායනික ද්‍රව්‍ය සහ විශ්ව විද්‍යාලවල විද්‍යාගාරවලින් මුදා හරින රසායනික අපද්‍රව්‍ය අපවහනය කිරීමේ පාරිසරික මනා කළමණාකරනය සහ බැහැර කිරීම පිළිබඳ රැස්වීම සහ සුදුසු ක්‍රියාකාරී සැලැස්මක්/ව්‍යාපෘති යෝජනාවක් සකස් කිරීම. |
| | • ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේදී 2015.12.30 දින පවත්වන ලද නීති විරෝධී,අප්‍රකාශිත සහ නියාමනය නොකරන ලද මසුන් ඇල්ලීම සඳහා වන ජාතික ක්‍රියාකාරි සැලැස්ම පිළිබඳ කමිටු රැස්වීම සම්බන්ධීකරණය කිරීම. |

| | |
|---|---|
| | • ධිවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේදී 2015.12.30 දින මෝර මත්සයන් සංරක්ෂණය කිරීම හා කළමනාකරණය කිරීම සඳහා වන ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රියාකාරී සැලැස්ම. |
| වැඩමුළු පුහුණු | 2015.01.12 සහ 2015.01.16 දින සත්ව සහ ශාක, පුරාවස්තු, සත්තු සහ පැළ නිරෝධායනය සහ පරිසරය පිළිබඳ අලුතින් පත් කරන ලද සහකාර නිවාරණ නිලධාරීන් /සහකාර රේගු සඳහා පුහුණු වැඩසටහන |
| | • නුවරඑළිය හෝටන්තැන්නේදී 2015.02.15 දින සිට 2015.02.17 දින දක්වා පවත්වන ලද රේගු නිලධාරීන් සඳහා වන අති විශාල පක්ෂීන් හා කෘමීන්ගේ ජෛව විවිධත්වය පිළිබඳ ක්ෂේත්‍ර පුහුණු වැඩමුළු. |
| | • බත්තරමුල්ල ග්‍රෑනඩ් මොනාච් හෝටලයේ දී , 2015.03.03 දින පැවති ශ්‍රී ලංකාවේ "ZZX මදුරු වසංගතය පාලනය කිරීම සඳහා නව විකල්ප ක්‍රම සොයා බැලීම" පිළිබඳ වැඩමුළුව |
| | • කටුනායක ටැමරින් හෝටලයේදී 2015.04.09-2015.04.11 දක්වා පවත්වන ලද ධිවර කළමනාකරණය පිළිබඳ වැඩමුළුව |
| | • කෝට්ටේ බැංකුකරණ අධ්‍යයන මධ්‍යස්ථානයේ දී 2015.05.08 දින පවත්වන ලද මහවැලි සංවර්ධන සහ පරිසර අමාත්‍යාංශය විසින් සංවර්ධනය කරන ලද ජාතික හරිත ප්‍රසම්පාදන ප්‍රතිපත්තිය හා මාර්ගෝපදේශ වැඩමුළුව. |
| | • කොළඹ ටාජ් සමුද්‍ර හෝටලයේදී පවත්වන ලද "ජෛව ආරක්ෂාව පිළිබඳ කාටජෙනා ප්‍රොටකෝලයට අදාළව ජාතික ජෛව ආරක්ෂක රාමුවක් ක්‍රියාත්මක කිරීම" පිළිබඳ ව්‍යාපතියක් සම්පාදනය කිරීම සඳහා වන සමාරම්භක වැඩමුළුව |
| | • කටුනායක ටැමරින් ට්‍රී හෝටලයේදී 2015.05.11 දින සිට 2015.05.12 දක්වා පවත්වන ලද ජාතික ක්‍රියාක්මක කිරීමේ සැලස්ම පිළිබඳ වැඩමුළුව |
| | • පරිසර අමාත්‍යාංශය විසින් සංවිධානය කරනු ලැබූ ගලදාරි හෝටලයේ දී 2015.06.16 දින පවත්වන ලද ශ්‍රී ලංකාව තුළ බහු ක්ලෝරීන් කෘත සංයෝග සහ ඒවායින් දූෂිත උපකරණ පරිසරයට සුදුසු ආකාරයට මනා ලෙස කළමණාකරණය කිරීම හා අපහරණය කිරීම පිළිබඳ වැඩමුළුව |
| | • සංයෝජක සංකේතාංක (WCO 2012) සහ ඕසෝන් තරණයට හානි වන ද්‍රව්‍ය නීති විරෝධීව වෙළඳාම් කිරීම නිවාරණය කිරීම පිළිබඳ 2015.07.12 දින සිට 2015.07.13 වන දින දක්වා පවත්වන ලද ශක්‍යතා වර්ධනය කිරීමේ වැඩමුළුව |
| | • පරිසර අමාත්‍යාංශයේ ජෛව විවිධත්ව ලේකම් කාර්යාල විසින් සංවිධානය කරන ලද බත්තරමුල්ල වෝටර්ජ් එජ්හි 2015.08.24 දින පවත්වන ලද ශ්‍රී ලංකාවේ ව්‍යාප්ත වීමට ප්‍රවණතාවයක් ඇති අන්‍ය දේශික විශේෂ හඳුන්වා දීම හා ව්‍යාප්ත වීම පාලනය කිරීම සඳහා වන හැකියාව ශක්තිමත් කිරීම පිළිබඳ වැඩමුළුව |
| | • 2015.08.25 දින සිට 2015.08.28 දක්වා තායිලන්තයේදී රසායනික අවි සම්මුතියේ රෙගුලාසිවල තාක්ෂණික අංග පිළිබඳ ආසියාවේ රටවල්වල රේගු බලධාරීන් සඳහා වන කලාපීය පුහුණු පාඨමාලාව පැවැත්වීම |
| | • ජෛව විවිධත්ව සංස්කෘතික හා ජාතික උරුමයන් නිවාරණ අංශයේ කාර්යය මණ්ඩලය හා ජෛව විවිධත්ව කාර්යය සාධන බලකාය සඳහා මානව සම්පත් සංවර්ධන ශ්‍රවනාගාරයේ දී 2015.08.07 2015.08.13 ,2015.08.20 ,2015.08.28 ශ්‍රවනාගාරයේදී පවත්වන ලද එලදායි පුහුණු වැඩසටහන |
| | • රාජ්‍ය පරිසර අමාත්‍යාංශය විසින් සංවිධානය කරනු ලබන 2015.09.29 වන දින වෝටර්ජ් ඒජ්හි පවත්වන ලද කාටේජනා ප්‍රොටකෝලයට අනුව ජාතික ජෛව ආරක්ෂක රාමුව ක්‍රියාත්මක කිරීම පිළිබඳ ව්‍යාපෘතිය සඳහා වැදගත් වැඩමුළු . |
| | • රාජගිරිය ඕපියුලන් ෆේස් හෝටලයේදී 2015.09.30 දින පවත්වන ලද , ශ්‍රී ලංකාවේ ව්‍යාප්ත වීමට ප්‍රවණතාවයක් ඇති අන්‍ය දේශික විශේෂ හඳුන්වා දීම හා ව්‍යාප්ත වීම පාලනය කිරීමේ හැකියාව ශක්තිමත් කිරීම පිළිබඳ ව්‍යාපෘතියට අදාළව ජාතික උපාය මාර්ගික/ක්‍රියාකාරී සැලැස්ම සමාලෝචනය කිරීමේ වැඩමුළුව. |
| | • මධ්‍යම අපහරණ ශ්‍රවනාගාරයේදී ජෛව විවිධත්ව සංස්කෘතික හා ජාතික උරුමයන් නිවාරණ අංශයේ කාර්ය මණ්ඩලය හා ජෛව විවිධත්ව කාර්යසාධන බලකාය සඳහා 2015.09.07 දින පවත්වන ලද රේගු ජෛව විවිධත්ව සංරක්ෂණ කාර්යභාරය සහ ජාන කොල්ලකෑම පිළිබඳ එලදායි පුහුණු වැඩසටහන |
| | • මධ්‍යම අපහරණ ශ්‍රවනාගාරයේදී ජෛව විවිධත්ව සංස්කෘතික හා ජාතික උරුමයන් නිවාරණ අංශයේ කාර්ය මණ්ඩලය හා ජෛව විවිධත්ව කාර්යසාධන බලකාය සඳහා සත්ව හා ශාක ප්‍රවාහනය කිරීම් පාලනය කරන නීති සහ ශ්‍රී ලංකාව විසින් අත්සන් තබන ලද බහු පාර්ශික පාරිසරික ගිවිසුම් පිළිබඳ 2015.09.07 දින පවත්වන ලද එලදායි පුහුණු වැඩසටහන. |

| | |
|---|---|
| | මධ්‍යම අපහරණ ශ්‍රවනාගාරයේදී ජෛව විවිධත්ව සංස්කෘතික හා ජාතික උරුමයන් නිවාරණ අංශයේ කාර්ය මණ්ඩලය හා ජෛව විවිධත්ව කාර්යසාධන බලකාය සඳහා කෞතුක වස්තු හඳුනා ගැනීම පිළිබඳ 2015.09.14 දින පවත්වන ලද ඵලදායි පුහුණු වැඩසටහන. |
| | • මාදු ගඟේදී ජෛව විවිධත්ව සංස්කෘතික හා ජාතික උරුමයන් නිවාරණ අංශයේ කාර්ය මණ්ඩලය හා ජෛව විවිධත්ව කාර්යසාධන බලකාය සඳහා පවත්වන ලද තෙත් බිම් පරිසර පද්ධති පිළිබඳ ක්ෂේත්‍ර පුහුණු වැඩමුළුව |
| | • මධ්‍යම අපහරණ ශ්‍රවනාගාරයේදී ජෛව විවිධත්ව සංස්කෘතික හා ජාතික උරුමයන් නිවාරණ අංශයේ කාර්ය මණ්ඩලය හා ජෛව විවිධත්ව කාර්යසාධන බලකාය සඳහා 2015.09.29 දින පවත්වන ලද නිෂ්පාදන මුද්‍රා තැබීමේ ක්‍රියා පටිපාටිය හා විද්‍යුත් අපද්‍රව්‍ය පිළිබඳ දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන |
| | • SPS ගැටළු පිළිබඳ දැනුම් දීම දියුණු කිරීමේ ව්‍යාපාරික දැක්ම සහ ජාත්‍යන්තර SPS ප්‍රමිතීන් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් රමාඩා හෝටලයේදී පවත්වන ලද WTO SPS ගිවිසුම පිළිබඳ වැඩමුළුව |
| | • මානව සම්පත් ශ්‍රවනාගාරයේදී 2015.10.19 වන දින පවත්වන ලද ව්‍යාජානුකරණය සහ කොල්ලකෑමට (ක්‍රියාමාර්ගය-IPR A/P) එරෙහිව ඒකාබද්ධව ක්‍රියාමාර්ග බලාත්මක කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන |
| | • ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකුකරණ අධ්‍යයන ආයතනයේ 2015.10.29 දින පවත්වන ලද නිෂ්පාදකයාගේ විස්තීරණ වගකීම් මගින් විද්‍යුත් සහ විද්‍යුත් අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා වන ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම පිළිබද වැඩමුළුව |
| | • 2015.11.10 දින සිට 2015.11.13 දක්වා කොරියාවේ පැවති ආසියා ශාන්තිකර හරිත රේගු අභිලාශයන් පිළිබඳ වැඩමුළුව |
| | • කොළඹ හිල්ටන් හෝටලයේදී 2015.11.19 දින පවත්වන ලද ජාත්‍යන්තර වෙළඳ සැපයුම් දාමය තුළ ව්‍යාජ භාණ්ඩ හඳුනා ගැනීම පිළිබඳ ප්‍රායෝගික වැඩමුළුව. |
| | • ජාත්‍යන්තර පොලීසිය විසින් සංවිධානය කරනු ලැබූ 2015.11.16 දින සිට 2015.11.18 දින දක්වා සිංගප්පූරුවේදී පවත්වන ලද වනජීවි අපරාධ මැඩ පැවැත්වීම පිළිබඳ වැඩමුළුව |
| | • කොළඹ රමාඩා හෝටලයේදී 2015.12.02 දින පවත්වන ලද "වංචා වැලැක්වීම" පිළිබඳ රේගු නිලධාරීන් සඳහා වන හැකියා වර්ධන වැඩමුළුව . |

## විශේෂ කාර්යයන්

### රේගු මූලස්ථාන ගොඩනැගිල්ලේ විද්‍යුත් අපද්‍රව්‍ය කළමනාකරණ සතිය

මීට පෙර සිදුකරන ලද අඛණ්ඩ පාරිසරික ආරක්ෂණ හා සංරක්ෂණවල කොටසක් වශයෙන් ජෛව විවිධත්ව සංස්කෘතික හා ජාතික උරුමයන් නිවාරණ ශාඛාව විසින් 2015.12.09 සිට 2015.12.21 කාලපරිච්ඡේදය තුළ රේගු මූලස්ථාන පරිශ්‍රයේදී විද්‍යුත් අපද්‍රව්‍ය එකතු කිරීමේ වැඩසටහනක් සංවිධානය කරන ලදි . මෙම කාලපරිච්ඡේදය තුළදී එකතු කරන ලද බඳුන් බිම් මහලේ සහ පහත මාලයේ සෝපානය අසල තබනු ලැබූ අතර, අත්පත්‍රිකා බෙදා හැරීම හා නිවේදන මගින් නිලධාරීන් දැනුවත් කරන ලදී. එකතු කරන ලද විද්‍යුත් උපකරණ චක්‍රීකරණය සඳහා යවන ලදී.






**පුස්කොළ අත් පිටපත් ජාතික ලේඛණ ආරක්ෂක දෙපාර්තමේන්තුවට පරිත්‍යාග කිරීම.**

වටිනා පුස්කොළ එනම්, වෙදකම බෞද්ධ සූත්‍ර ,මන්තර ශාස්ත්‍රය, මහා බ්‍රහ්මජාග සූත්‍රය, අංගුත්තර ටීකා, වෙදකම ( විමාණ වස්තු ප්‍රකරණය), බෞද්ධ සාහිත්‍ය, වෙදකම සහ හානියට පත් පුස්කොළ සහිත පිටපත් අඩංගු බෑගයක් ඇතුලුව පුස්කොළ අත් පිටපත් 23කට වැඩි සංඛ්‍යාවක් ශ්‍රී ලංකා රේගුව විසින් 2015.03.04 වන දින ජාතික ලේඛණාරක්ෂක දෙපාර්තමේන්තුවට බාර දෙන ලදී.





## පාරිභෝගික හා පාරිසරික ආරක්ෂණ අංශය

දැනට රටේ බලපැවැත්වෙන රෙගුලාසි හා ප්‍රමිතිවලට අනුකූලව ආනයනික භාණ්ඩවල තත්ත්වය පාලනය හා අධීක්ෂණය කිරීමේ අදහසින් 2011 දී පාරිභෝගික හා පාරිසරික ආරක්ෂණ අංශය ස්ථාපිත කරන ලදී. ආනයනික හා අපනයනික භාණ්ඩවල බුද්ධිමය දේපල අයිතීන් සම්බන්ධ නීති බලාත්මක කරන ශ්‍රී ලංකා රේගුවේ කේන්ද්‍රීය ස්ථානය ලෙස පාරිභෝගික හා පාරිසරික ආරක්ෂණ අංශය ක්‍රියාත්මක වේ. ජාත්‍යන්තර සම්මේලනවලදී ගන්නා තීන්දු හා තීරණ මත නීති හා බලාත්මක කිරීම තුළින් වෙනත් සම්බන්ධිත ආයතනවල සහයෝගීතාවය හරහා පරිසරය ආරක්ෂා කිරීමට ද පාරිභෝගික හා පාරිසරික ආරක්ෂණ අංශය දායක වේ.

### ප්‍රධාන කාර්ය භාරයන්

1. යම් උල්ලංඝනයවීම් හෝ වංචා වළක්වා ගැනීම පිණිස බුද්ධිමය දේපළ අයිතාවාසිකම් පනත (IPR), ශ්‍රී ලංකා ප්‍රමිති ආයතන පනත(SLSI) , ජාතික ඖෂධ නියාමන පනත (NMRA) , පරමාණු බලශක්ති අධිකාරී පනත (AEA) , පාරිභෝගික කටයුතු අධිකරී පනත(CAA) , පරිසර අමාත්‍යාංශය , සෞඛ්‍ය දෙපාර්තමේන්තුව සහ ආරක්ෂක අමාත්‍යාංශය නියම කර ඇති රේගුවට සම්බන්ධ නීති, අණපනත්වල අවශ්‍යතාවයන් බලාත්මක කිරීම. ඉහත අධිකාරී බලයන්ගෙන් ආවරණය වන සියළුම ආනයන රේගුවෙන් නිදහස් කර ගැනීමට පෙර පාරිභෝගික හා පාරිසරික ආරක්ෂණ අංශය (CPU) වෙත යොමු කිරීම අවශ්‍ය වී ඇත.
2. මෙම අරමුණ උදෙසා ඉහත සඳහන් අධිකාරී ආයතන වෙනුවෙන් සකස් කරන ලද ඇපකර එක් එක් ආනයනකරු වෙනුවෙන් ලියාපදිංචි කිරීම සඳහා ලේඛණ පවත්වා ගෙන යෑම.
3. අදාළ අධිකාරී ආයතනවලින් පැනවූ රෙගුලාසි ක්‍රියාත්මක වන පරිදි රේගු පටිපාටි යාවත්කාලීන කිරීම.
4. අවශ්‍යතාවයන් පැන නැගුණ විට භාණ්ඩ පරීක්ෂණ අංගන සඳහා පාරිභෝගික හා පාරිසරික ආරක්ෂණ අංශයේ නිලධාරීන් අනුයුක්ත කිරීම.
5. මෙතෙක් හඳුනාගෙන ඇති රේගු නීතියට සම්බන්ධ වෙනත් අණ පනත්වල සඳහන් රෙගුලාසි සමාලෝචනය කිරීම
6. ඉහත ක්‍රියාකාරකම්වලට අදාළ වෙනත් අණ පනත් සමග කියවෙන රේගු ආඥා පනත ප්‍රකාර නීති බලාත්මක කිරීම.
7. බුද්ධිමය දේපල අයිතිවාසිකම්පනතේ සන්නම් නාම ලියාපදිංචි කිරීම.
8. බුද්ධිම දේපල අයිතිවාසිකම්පනත කඩ කිරීම වෙනුවෙන් ඉදිරිපත් වන ඉල්ලීම් වෙනුවෙන් ගන්නා ක්‍රියාමාර්ග සඳහා ප්‍රතිචාර දැක්වීම.
9. බුද්ධිම දේපල අයිතිවාසිකම්පනත සමබන්ධයෙන් වැඩමුළු සහ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

| ප්‍රධාන කාර්යයන් | ඉලක්කය (අදාල වේ නම්) | 2014.11.30 දිනට ප්‍රගතිය | විශේෂ සටහන් |
|---|---|---|---|
| (1) මොන්ට්‍රියල් සංධානය යටතේ ගැනෙන ඕසෝන් ස්ථරයට හානි විය හැකි දේ ආනයනය කිරීමට අදාල රෙගුලාසි ක්‍රියාවට නැංවීමේ කාර්යක්ෂමතාවය ඉහළ දැමීම | ජාතික ඕසෝන් ඒකකය හා එක්ව ඕසෝන් ස්ථරයට හානි විය හැකි දේ ආනයනය කිරීම සම්පූර්ණයෙන්ම පාලනය කොට ඇත. | 100% | |
| (2) බේසල් සම්මුතිය මගින් ආවරණය වන හානිකර අපද්‍රව්‍ය දේශසීමා හරහා සංක්‍රමණය වීමට අදාල රෙගුලාසි ක්‍රියාත්මක කිරීමේ කාර්යක්ෂමතාවය ඉහළ දැමීම | | 20% | අදාල රෙගුලාසි පිළිබඳව පරිසර අමාත්‍යාංශය සමග නිරන්තර සාකච්ඡා පවත්වා ඇත. |
| (3) ස්ටොක්හෝම් සම්මුතිය මගින් අවාරනය කෙරෙන දිගුකල් පවතින කාබනික දූෂණ ආනයනයට අදාල රෙගුලාසි බලාත්මක කිරීමේ කාර්යක්ෂමතාවය ඉහළ දැමීම | | 60% | අදාල රෙගුලාසි පිළිබඳව පරිසර අමාත්‍යාංශය සමග නිරන්තර සාකච්ඡා පවත්වා ඇත. |

| | | | |
|---|---|---|---|
| (4) රොටර්ඩෑම් සම්මුතිය මගින් ආවරණය කෙරෙන (පූර්ව දැනුම්දීම් අනුමැතිය) ක්‍රියාවලිය බලාත්මක කිරීමේ කාර්යක්ෂමතාවය ඉහළ දැමීම | | 20% | තව කාර්යමණ්ඩලය අවශ්‍යය |
| (5) රසායනික අවි සම්මුතිය (රසායනික අවි නිෂ්පාදනය, ගබඩා කිරීම හා සංවර්ධනය තහනම් කිරීමේ හා ඒවා විනාශ කිරීමේ සම්මුතිය) යටතේ ගැනෙන භාණ්ඩවලට අදාල රෙගුලාසි බලාත්මක කිරීමේ කාර්යක්ෂමතාවය ඉහළ දැමීම | | 10% | තව කාර්යමණ්ඩලය අවශ්‍යය |
| (6) බුද්ධිමය දේපල හිමිකම් යටතේ ගැනෙන භාණ්ඩවලට අදාල රෙගුලාසි බලාත්මක කිරීමේ කාර්යක්ෂමතාවය ඉහළ දැමීම | | 80% | බුද්ධිමය දේපල හිමිකම් පිළිබඳ සිද්ධි වාර්තාකරණය හා ඒවාට අදාල නඩු සඳහා පෙනී සිටීම |
| (7) ශ්‍රී ලංකා ප්‍රමිති යටතේ ගැනෙන භාණ්ඩවලට අදාල රෙගුලාසි බලාත්මක කිරීමේ කාර්යක්ෂමතාවය ඉහළ දැමීම | | 100% | |

## වරාය පාලන ඒකකය

දේශ සීමා හරහා සිදුවන අපරාධ මැඩපැවැත්වීමේ අදහසින් මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ ලෝක රේගු සංවිධානය එක්සත් ජාතීන්ගේ සංවිධානයෙන් බහලුන් පාලන වැඩසටහන් යටතේ ශ්‍රී ලංකා රේගුවේ වාරය පාලන ඒකකය පිහිටුවන ලදී.දැනට මෙම ඒකකය මධ්‍යම විමර්ශණ යටතේ පාලනය වේ. එසේම, නැව් මෙහෙයුම්කරුවන්ගෙන් / භාණ්ඩ වාර්තාකරුවන්ගෙන් මෙම ඒකකයට පූර්ව භාණ්ඩ තොරතුරු ලැබෙන අතර, ගුවන් මෙහෙයුම්කරුවන්ගෙන් මගී තොරතුරු තබා ගැනීමටද, අපේක්ෂා කරනු ලබන අතර අවදානම් විශ්ලේෂණ සිදු කිරීම පදනම් කරගෙන විමර්ශණ සිදු කරන අතර ඒ අනුව සුදුසු ක්‍රියා මාර්ග ගනු ලැබේ.

**ප්‍රධාන කාර්යයන්**

1. ගුවන් සහ මුහුදු කටයුතු වලට අදාළ පූර්ව විද්‍යුත් නැව් භාණ්ඩ ලේඛණ ලබා ගැනීම සහ විධිමත් කිරීම මෙන්ම වරාය කටයුතු පාලනය සහ අධීක්ෂණය කිරීම.
2. අදාළ ගුවන්යනා මෙහෙවන්නන්ගෙන් පූර්ව මගී තොරතුරු ලබා ගැනීම.
3. විද්‍යුත් නැව් භාණ්ඩ ලේඛණ භාවිත කරමින් බහාලුම්, අනෙකුත් නැව් භාණ්ඩ හඳුනා ගැනීම සහ වරාය පාලන ඒකකයේ ඇති මෙවලම් මගින් ඒවා විශ්ලේෂණය කිරීම සහ තවදුරටත් විමර්ෂණය කිරීම සහ භෞතිකව පරික්ෂා කිරීම සඳහා ඉහල අවදානමක් ඇති බවට සලකනු ලබන ඒවා පරික්ෂා කිරීම.
4. පූර්ව මගී තොරතුරු භාවිත කරමින් රේගු අවධානම් මගී හඳුනා ගැනීම එවැනි මගීන් සහ ගමන් මලු පරික්ෂා කිරීම අවශ්‍ය අවස්ථාවලදී තවදුරටත් විමර්ෂණ කටයුතු සිදු කිරීම.
5. ලෝක රේගු සංවිධානය මගින් සපයන ලද භාණ්ඩ ඉලක්ක ගත පද්ධතිය අධීක්ෂණය කිරීම සහ නඩත්තු කිරීම.
6. අනෙකුත් නියෝජන ආයතන සමඟ සහයෝගය පවත්වාගෙන යාම.

**ප්‍රගති වාර්තා**

1. කල්තියා විද්‍යුත් නැව් භාණ්ඩ ලේඛණගත කිරීමට පෙළඹවීම. (CTS/ACASYCUDA)

භාණ්ඩ ඉලක්ක ගත පද්ධතිය මත නැව් ඒජන්තවරු/AVOCC මෙහෙයුම්කරුවන්/ නැව් භාණ්ඩ ඉදිරිපත් කරන්නන් පිළිබඳ තොරතුරු හඳුන්වා දී යාවත්කාලීන කරන ලදී. මීට අදාළව භාණ්ඩ වාර්තාකරුවන් 325 දෙනෙක් භාණ්ඩ ඉලක්කගත පද්ධතිය යටතේ ලියාපදිංචි වී ඇත. මේ සඳහා ලෝක රේගු සංවිධානය / මත්ද්‍රව්‍ය සහ අපරාධ සඳහා වන එක්සත් ජාතීන්ගේ සංවිධානය සහයෝගය දක්වන ලදී

2. මුහුදු භාණ්ඩ වාර්තාකරණයට අදාළ නීති බලාත්මක කිරීම.

රේගු දත්ත සඳහා වන ස්වයංක්‍රීය පද්ධතිය ( ASYCUDA) විද්‍යුත් නැව් භාණ්ඩ ලේඛණ යොමු කිරීම නියාමනය කිරීම සඳහා 2014.10.31 දිනැති අංක 18 /55 දරන ගැසට් පත්‍රය ( අති විශේෂ නිවේදනය ප්‍රකාශනයට පත් කරන ලදී.) විද්‍යුත් නාවික භාණ්ඩ ලේඛණ පිළිබඳව ශ්‍රී ලංකා රේගුවට වාර්තා කිරීමට අදාළව නැව් භාණ්ඩ වාර්තා කරුවන්ට උපදෙස් ලබාදුන් අතර, ඒ සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහනක්ද පවත්වන ලදී. ඒ අනුව ඊට අනුකූල නොවූ නැව් භාණ්ඩ වාර්තාකරුවන් දසදෙනෙකුට එරෙහිව නෛතික ක්‍රියා මාර්ග ගන්නා ලදී.

3. පූර්ව මගී තොරතුරුවලට අදාළ නීති බලාත්මක කිරීම.

2015.12.30 දිනැති අංක 1947/23 දරණ ගැසට් අති විශේෂ නිවේදනය යටතේ පූර්ව මගී තොරතුරු රෙගුලාසි පළ කරන ලදි. 2016.01.01 දින සිට ක්‍රියාත්මක විය යුතු වන මෙම නිවේදනය පිළිබඳව ගුවන් මෙහෙයුම් කරුවන් දැනුවත් කිරීම සඳහා වැඩසටහනක් පවත්වන ලදි.

4. සැක සහිත භාණ්ඩ විමර්ශණය කිරීම

වරාය පාලන ඒකකය 2015.04.10 (DOPL995) දින සිට ක්‍රියාක්මක වන පරිදි මධ්‍යම විමර්ශනය යටතට ගෙන එන අතර අතර, ඒ අනුව එම ඒකකය පහත සඳහන් සිද්ධි කිහිපයක් සාර්ථක ලෙස හසුකර ගන්නා ලදී. ඒ පිළිබඳ විස්තර පහත පරිදි වේ.

ලියාපදිංචි කරන ලද සිද්ධි සංඛ්‍යාව - 39
සම්පූර්ණ කරන ලද සිද්ධි සංඛ්‍යාව - 16
අසම්පූර්ණ කරන ලද සිද්ධි සංඛ්‍යාව - 23
පණවන ලද දණ්ඩන/ලිහිල් කරන ලද රාජසන්තක කරන ලද භාණ්ඩවල මුළු වටිනාකම - රු. 250,128,986/-

5. නිලධාරීන්ගේ වෘත්තීය මට්ටම ඉහළ නැංවීම

අ. ශ්‍රී ලංකා රේගුවේ සහයෝගීතාවයෙන් ඇමෙරිකා රේගු සහ දේශ සීමා ආරක්ෂණය මගින් සංවිධානය කරනු ලැබූ ජාත්‍යන්තර තොටුපොළ වැළැක්වීමේ පුහුණුව පිළිබඳ පස්දින වැඩමුළුවකට නිලධාරින් තිදෙනෙකු සහභාගී විය.

ආ. ශ්‍රී ලංකාවේ අන්තරායක ඖෂධ මණ්ඩලය විසින් පවත්වන ලද NPS පිළිබඳ දෙදින පුහුණු වැඩසටහන නිලධාරින් දෙදෙනෙකු සහභාගි විය.

ඇ. නෙදර්ලන්තයේ රොටඩෑම් වරාය නැරඹීම සඳහා එක් සතියක අධ්‍යයන චාරිකාවකට නිලධාරින් අට දෙනෙකු සහභාගි විය.

ඈ. නව දිල්ලියේ UNODC-ROSA විසින් සංවිධානය කරන ලද නව මනෝ ක්‍රියාකාරි ද්‍රව්‍යන් පිළිබඳ දෙදිනක පුහුණු වැඩමුළුව සඳහා එක් නිළධාරියෙකු සහභාගි විය.

ඉ. චීනයේදී දින දෙකක මත්ද්‍රව්‍ය පාලන පුහුණු වැඩසටහනකට එක් නිළධාරියෙකු සහභාගි විය.

ඊ. නිලධාරින් සඳහා ලෝක රේගු සංවිධානය -0COPES පිළිබඳ දින පහක වැඩමුළුවක් දින පහක කොළඹදී පවත්වන ලදී.

6. දැනුවත් කිරීමේ සහ පුහුණු වැඩසටහන්

අ. අදාළ පිරිස් /නියෝජිත ආයතන සඳහා CTS පිළිබඳ පුහුණු/දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදි.

ආ. CASA සහ SLFFA නිලධාරින් වෙනුවෙන් ඔවුන්ගේ යෝජනා ඉදිරිපත් කිරීම සඳහා රැස්වීම් පවත්වන ලදී.

# මධ්‍යම විමර්ශන අංශය

**හැඳින්වීම**

දෙපාර්තමේන්තුවේ 2010-2015 උපාය මාර්ගික සැලසුම් ප්‍රකාර, අනෙකුත් මෙහෙයුම් අංශයන් මගින් හඳුනා ගන්නා රේගු නීති හා වෙනත් රේගුලාසි උල්ලංඝණය කිරීම් පිළිබඳ විමර්ශනය කිරීම මධ්‍යම විමර්ශන අංශයේ වගකීම වේ. එසේම, මධ්‍යම නඩු වාර්තා ලේඛනය නඩත්තු කිරීමද වගකීමක් වේ.

එමනිසා,මෙම අංශයේ අරමුණ වන්නේ,

- සියළු රේගු විමර්ශන කටයුතු මධ්‍යගත කිරීම හා වෘත්තීමය ආකාරයට පැවැත්වීම,
- ඵලදායී හා කාර්යක්ෂම ආකාරයට මධ්‍යම නඩු වාර්තා ලේඛනය පවත්වා ගෙන යාම, සහ
- තෑගි මුදල බෙදීම මධ්‍යගත කිරීම හා විනිවිද පෙනෙන ආකාරයට පැවැත්වීම.

ඵලදායී ලෙස දෙපාර්තමේන්තු මෙහෙවර සඳහා සහයෝගය දීම.

## ප්‍රධාන කාර්යයන්

1. නව දෙපාර්තමේන්තු නියෝග නිකුත් කිරීම.
2. අවශ්‍ය නිලධාරීන් ලබාගැනීම.
3. විමර්ශනය කිරීම සඳහා අනෙකුත් අංශවල ඇති නඩු භාරගැනීම.
4. තෑගි මුදල් බෙදීම භාරගැනීම.
5. මධ්‍යම විමර්ශන කාර්යාංශයේ නඩු සම්බන්ධව විමර්ශනය කිරීම

| ප්‍රධාන කාර්යයන් 1 | ඉලක්කය | තථ්‍ය | ඉටු වී නොමැති නම් ඊට හේතු |
|---|---|---|---|
| මධ්‍යම විමර්ශන අංශය (CIB) සඳහා නව දෙපාර්තමේන්තු නියෝග (DOPL) නිකුත් කිරීම | 1 වන හා 2 වන කාර්තුවලදී සම්පූර්ණ කිරීම | ඉටු වී නොමැත | රේගු අධ්‍යක්ෂ ජනරාල් (DGC) විසින් දෙපාර්තමේන්තු නියෝග (DOPL) අනුමත නොකරන ලදී. |
| අවශ්‍ය කාර්ය මණ්ඩල බඳවා ගැනීම | 2 වන කාර්තුවේදී සම්පූර්ණ කිරීම | ඉටු වී නොමැත | දෙපාර්තමේන්තු නියෝග (DOPL) අනුමත නොකරන ලද අතර දෙපාර්තමේන්තුවට අවශ්‍ය කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට නොහැකි විය. |
| අනෙකුත් ඒකකවල ඇති නඩු පවරා ගැනීම | 2, 3 හා 4 වන කාර්තු වලදී සම්පූර්ණ කිරීම | ඉටු වී නොමැත | නව දෙපාර්තමේන්තු නියෝග (DOPL) නොමැතිව අවශ්‍ය කාර්ය මණ්ඩලය බඳවා ගත නොහැකිය |

| | | | |
|---|---|---|---|
| ත්‍යාග බෙදාහැරීම පවරා ගැනීම | වසරේ 2, 3 හා 4 වන කාර්තුවලදී සම්පූර්ණ කිරීම | ඉටු වි නොමැත | නව දෙපාර්තමේන්තු නියෝග (DOPL) නොමැතිව අවශ්‍ය කාර්ය මණ්ඩලය බඳවා ගත නොහැකිය |
| මධ්‍යම විමර්ශන අංශය(CIB) නඩු පිළිබඳ විමර්ශන කටයුතු සිදු කිරීම | ඉටු වී ඇත | ඉටු වී ඇත | ඉටු වී ඇත |
| **ප්‍රධාන ක්‍රියාකාරකම් 2.2**<br><br>මධ්‍යම නඩු ලේඛනය පරිගණකගත කිරීම | ඉලක්කය | තත්‍ය | ඉටු නොකරන ලද්දේ නම් ඊට හේතු |
| මෘදුකාංග සැකසීම | 1 වන කාර්තුව | ඉටු වී ඇත | |
| දෘඪාංග මිලදී ගැනීම | 2 වන කාර්තුව | ඉටු වී ඇත. | |
| පරික්ෂාව හා ක්‍රියාත්මක කිරීම | 2 වන කාර්තුව | ඉටු වී ඇත. | |
| පූර්ණ වශයෙන් ක්‍රියාවට නැංවීම | 3 වන කාර්තුව | ඉටු වී නොමැත | අවශ්‍ය දෘඪාංග නොමැති වීම හේතුවෙන් අංශ කිහිපයක ක්‍රියාත්මක කළ නොහැකි විය. |

**ප්‍රගතිය - 2015 ජනවාරි සිට දෙසැම්බර් දක්වා**

**මධ්‍යම විමර්ශන අංශය**

**අ. මධ්‍යම විමර්ශන අංශය විසින්(CIB)- 2015.01.01සිට2015.12.31 දක්වා සිදු කරන ලද විමර්ශන**

01. ලියාපදිංචි කරන ලද සිද්ධි සංඛ්‍යාව - 922

02. අවසන් වූ සිද්ධි සංඛ්‍යාව

අ. දඩ මුදල් /ලිහිල් කරන ලද රාජ සන්තක කිරීම් / තව දුරටත් රාජ සන්තක කිරීම් - රු.149,790,675/=

ආ. ආපසු අය කර ගත් මුදල - රු. 205,237,434/=

ඇ. අලෙවියෙන් ගත් මුදල - රු. 115, 628,024/=

03. මධ්‍යම සිද්ධි ලේඛණයේ ප්‍රගතිය

අ. මෙම ලේඛනයේ ලියාපදිංචි කළ ගොනු සංඛ්‍යාව - 10,436

ආ. ලේඛනයේ යාවත්කාලීන කළ ගොනු සංඛ්‍යාව - 3,984

### ආ. අනෙකුත් අංශ මගින් සිදු කරන විමර්ශන

1. එම කාලය තුළ අනෙකුත් ශාඛා මගින් විමර්ශනය සඳහා මෙම අංශය වෙත එවනු ලැබූ ලිපි ගොනු සංඛ්‍යාව.-20

2. විමර්ශනය සඳහා මෙම අංශයෙන් අනෙකුත් අංශ සඳහා යවන ලද ලිපි ගොනු සංඛ්‍යාව - 6

### ඇ. මධ්‍යම සිද්ධි ලේඛණය පවත්වාගෙන යාම

1. මධ්‍යම සිද්ධි ලේඛණයේ ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කරන ලිපි ගොනු ගණන - 10,436
2. මධ්‍යම සිද්ධි ලේඛනයේ යාවත් කාලීන කරන ලද සිද්ධි ගණන - 3,984
3. නිර්දේශ කරන ලද ත්‍යාග මුදල් ලැයිස්තු ගණන - 265

## ප්‍රගතිය - 2015 ජනවාරි සිට දෙසැම්බර් දක්වා

## මධ්‍යම විමර්ශන අංශය

### අ. මධ්‍යම විමර්ශන අංශය විසින් (CIB) - 2015.01.01 සිට 2015.12.31 දක්වා සිදු කරන ලද විමර්ශන

01. ලියාපදිංචි කරන ලද සිද්ධි සංඛ්‍යාව - 297

02. අවසන් වූ සිද්ධි සංඛ්‍යාව - 130

අ. දඩ මුදල් /ලිහිල් කරන ලද රාජ සන්තක කිරීම් / තව දුරටත් රාජ සන්තක කිරීම් - රු.210,634,031/=

ආ. ආපසු අය කර ගත් මුදල - රු.6,431,046/=

ඇ. අලෙවියෙන් පත් මුදල - රු. 57,564,690/=

03. මධ්‍යම නඩු ලේඛණයේ ප්‍රගතිය

අ. මෙම ලේඛනයේ ලියාපදිංචි කළ ගොනු සංඛ්‍යාව -9,532

ආ. ලේඛනයේ යාවත්කාලීන කළ ගොනු සංඛ්‍යාව -5,605

### ආ. අනෙකුත් අංශ මගින් සිදු කරන විමර්ශන

1. එම කාලය තුළ අනෙකුත් ශාඛා මගින් විමර්ශනය සඳහා මෙම අංශය වෙත එවනු ලැබූ ලිපි ගොනු සංඛ්‍යාව - 4
2. විමර්ශනය සඳහා මෙම අංශයෙන් අනෙකුත් අංශ සඳහා යවන ලද ලිපි ගොනු සංඛ්‍යාව - 19

### ඇ. මධ්‍යම සිද්ධි ලේඛණය පවත්වාගෙන යාම

1. මධ්‍යම සිද්ධි ලේඛණයේ ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කරන ලිපි ගොනු ගණන - 9,579
2. මධ්‍යම සිද්ධි ලේඛනයේ යාවත් කාලීන කරන ලද සිද්ධි ගණන - 5,605
3. නිර්දේශ කරන ලද ත්‍යාග මුදල් ලැයිස්තු ගණන - 221




### සුවිශේෂී සිද්ධි

**CIB/INV/036/2013 -** ආනයන පාලන රෙගුලාසි කඩ කරමින් ආනයනය කරන ලද ව්‍යුහාත්මක අංග උපෝගාංග සහිත **FCL** 13ක් මධ්‍යම විමර්ශන කාර්යාංශය නිලධාරින් විසින් අනාවරණය කරගන්නා අතර, අලවියෙන් ලත් මුදලින් රු.12,548,549/- අයකර ගන්නා ලදී.

**CIB/INV/297/2014 –** ආනයන පාලන බලපත්‍රයක් රහිතව ආනයනය කරන ලද මිට්සුබිෂී පෙජරෝ ජීප් රථයක් මධ්‍යම විමර්ශන කාර්යාංශය නිලධාරීන් විසින් අනාවරණය කර ගන්නා අතර, අළවියෙන් ලිහිල් කරන ලද රාජ සන්තක වටිනාකම වන රු.7,000,000 /=

**CIB/INV/029/2015 –** ආනයන පනතේ සහ රේගු ආඥා පනතේ පවත්නා නීතිරීතිවලට පටහැනිව ආනයනය කරන ලද බහාලුමක් මධ්‍යම විමර්ශන කාර්යාංශය නිලධාරීන් විසින් අනාවරණය කරගන්නා ලදි. ලිහිල් කරන ලද රාජ සන්තක කිරීම රු.400,000/=, ලිහිල් කරන ලද දඩ මුදල රු. 100,000/=, ලිහිල් කරන ලද රාජසන්තක කිරීම රු.9,500,000/=

### විමර්ශනය සඳහා මධ්‍යම විමර්ශන කාර්යංශයට යවන ලද සිද්ධි

**CIB/INV/119/2015 (BIA/A/CASE/33/2015)** - නිශ්කාශනය නොකරන ලද රත්‍රං තහඩු 16ක් (ග්‍රෑම් 1864) සම්බන්ධයෙන් වන විමර්ශන සාර්ථකව නිම කරන ලදි. තවදුරටත් රාජසන්තක කිරීම රු.1,200,000/-, අළවියෙන් ලත් මුදල රු.9,680,488/-

### මානව සම්පත් සංවර්ධනය

**පුහුණුව සහ වැඩමුළුව**

**අ. විදේශ**

| ක්ෂේත්‍රය | ස්ථානය | දින ගණන | නිළධාරින් ගණන |
|---|---|---|---|
| 1. බෙහෙත් ද්‍රව්‍ය වලින් කරන අපරාධ සහ ව්‍යාජ වෛද්‍ය උපකරණ පිළිබඳ වැඩමුලුව හා සමුළුව | ප්‍රංශයේ පැරිස් නගරයේ | 02 | 01 |
| 2. COPE සම්මන්ත්‍රණය/පවත්වන ලද්දේ ලෝ රේගු සංවිධානය විසිනි | හොන් කොන් | 02 | 01 |
| 3. මුද්දර බදු සංසදය | මියැම්-ඇමරිකා | 02 | 02 |
| 4. අන්තර් ජාතික ඔත්තු සේවා | එක්සත් රාජධානිය | 04 | 01 |

2014-2015 සංසන්දනය







ආ. දේශීය

| ක්ෂේත්‍රය | ස්ථානය | දින/මාස සංඛ්‍යාව | නිළධාරි සංඛ්‍යාව |
|---|---|---|---|
| 1. අලුතින් බඳවා ගන්නා ලද තක්සේරුකරුවන් වෙනුවෙන් දැනුවත් කිරීමේ වැඩසටහන | රේගු මූලස්ථානය | දින 7 | 3 |
| 2. OPERATION CATALYST | BIA, ගුවන් භාණ්ඩ සහ තැපැල් කුරිය සේවා,EMS AND PORTS | දින 21 | 2 |
| 3. WCO 2012 HS සංකේත සහ ඕසෝන් ස්ථරයට හානි කර ද්‍රව්‍ය නීතිරීති වෙළඳාම වැළැක්වීම පිළිබඳ සක්‍රයතා වර්ධනය කිරීමේ වැඩමුළුව. | රේගු මූලස්ථානය | දින 1 | 5 |
| 4.මත්ද්‍රව්‍ය පාලනය පිළිබඳ පුහුණුව | රේගු මූලස්ථානය | දින 2 | 3 |
| 5. ශ්‍රී ලංකා මැණික් විද්‍යාඥයන්ගේ සංගමය( GASL) විසින් පිරිනමන ලද ඩිප්ලෝමා පාඨමාලාව | රේගු මූලස්ථානය | මාස 7 | 1 |

**මානව සම්පත**

**වර්තමාන කාර්ය මණ්ඩලය, අවශ්‍ය කාර්ය මණ්ඩලය සහ හිඟය**

| තනතුර | වර්තමාන කාර්ය මණ්ඩලය | අවශ්‍ය කාර්ය මණ්ඩලය | හිඟය |
|---|---|---|---|
| රේගු අධ්‍යක්ෂක | 1 | 1 | 0 |
| නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂක | 2 | 2 | 0 |
| රේගු අධිකාරි | 8 | 11 | 3 |
| නියෝජ්‍ය රේගු අධිකාරි | 3 | 23 | 20 |
| සහකාර රේගු අධිකාරි | 20 | 54 | 34 |
| ප්‍රධාන රේගු පරීක්ෂක | 0 | 5 | 5 |
| රේගු පරීක්ෂක | 2 | 7 | 5 |
| රේගු නියාමක | 2 | 20 | 18 |
| රාජ්‍ය කළමණාකාර සහකාර | 2 | 5 | 3 |
| රියදුරු | 4 | 7 | 3 |
| කාර්යාල කාර්ය සහයක | 4 | 10 | 6 |

# නීති කටයුතු අංශය

## හැඳින්වීම

අධිකරණ නඩු හා සම්බන්ධ පරිපාලනය හා අධීක්ෂණය සහ නීතිපති දෙපාර්තමේන්තුව සමඟ ඒ සම්බන්ධයෙන් ලිපි ගනුදෙනු කිරීම නීති කටයුතු අංශයේ කාර්යභාරය වේ.

අධ්‍යක්ෂවරයෙකු යටතේ පාලනය වන මෙම අංශයට එක් නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙක්, රේගු අධිකාරිවරයෙක්, නියෝජ්‍ය රේගු අධිකාරිවරු දෙදෙනෙක් සහ සහකාර රේගු අධිකාරිවරුන් දෙදෙනෙකු අයත්ය.

### ප්‍රධාන කාර්යයන්

1.) අනෙකුත් අංශ වෙත නීති උපදෙස් ලබාදීම සහතික කිරීම.

2.) දෙපාර්තමේන්තුවේ සියළු නෛතික කටයුතු හා නඩු පැවරීමේ කටයුතු සම්බන්ධව සහභාගී වීම. සනාථ කිරීම

| ප්‍රධාන කාර්යයන් | ඉලක්කය. | ප්‍රගතිය | ඉටු කර නොමැති නම් හේතු |
|---|---|---|---|
| අධිකරණ නඩු කටයුතු පවත්වාගෙන යාමට පහසුකම් සැලසීම සහ නීති කටයුතු සම්බන්ධයෙන් උපදෙස් ලබාගැනීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව හා අනෙකුත් අදාල කාර්යාංශ සමග සම්බන්ධීකරණය ගොඩ නැගීම | නියමිත කාලසීමාව | ඉටු වී ඇත | -* |
| රේගු කටයුතුවලට අදාලව ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ පවතින සියළුම නඩු සඳහා නිලධාරීන් ඉදිරිපත් කරවීම. | උසාවි දිනවල | ඉටු වී ඇත | - |
| මූලික අධිකරණ (ම.අ./ දි.අ./ මහාධිකරණ) සඳහා නිලධාරීන් සහභාගි කරවීම | නියමිත කාලසීමාව | ඉටු වී ඇත | - |
| ශ්‍රී ලංකාව හා වෙනත් රටවල් අතර ඇති ගිවිසුම් හා කොන්ත්‍රාත් පිළිබඳව නෛතික තීරණ ලබා දීමේදී PP&R සහ අනෙකුත් අංශ වෙත නීති උපදෙස් ලබා දීම | සතියක කාලයක් ඇතුලත | ඉටු වී ඇත | - |
| රේගුවට අදාලව තීරණ ලබා දී ඇති නඩු සම්බන්ධයෙන් වන සඟරාවන් සකස් කොට පවත්වාගෙන යාම | වසරක් ඇතුලත | ඉටු වී ඇත | w |
| රේගු ආඥා පනත හා වෙනත් අදාල නීති හා රෙගුලාසි කලින් කලට සමාලෝචනයට ලක් කිරීම සඳහා වන කමිටුවක් ස්ථාපිත කර සහාය ලබා දීම | වසර දෙකක කාලයක් ඇතුලත | ඉටු වී නැත. | සීමිත නිළධාරින් සංඛ්‍යාවක් |

**ප්‍රගති වාර්තාව 2015**

| | |
|---|---|
| 2014 වර්ෂයේ සිට පවතින නඩු | 61 |
| 2015 වර්ෂයේදී ලියාපදිංචි කරන ලද නඩු | **40** |
| | **101** |
| උසාවි අයදුම්පත් 2015 | |
| **ශ්‍රේෂ්ඨාධිකරණ අයදුම්පත්** | 13 |
| **අභියාචනාධිකරණ අයදුම්පත්** | 26 |
| **වාණිජ මහා අධිකරණ** | 1 |
| **අවසන් කරන ලද අයදුම්පත්** | 7 |
| | |
| සිදු කරන ලද උපදෙස් ලබා දීම් සංඛ්‍යාව | **34** |
| ලියාපදංචි කර ඇති විවිධ ගැටළු සංඛ්‍යාව | **111** |

# මධ්‍යම බුද්ධි අංශය

**හැඳින්වීම.**

මධ්‍යම බුද්ධි අංශයේ වගකීම වනුයේ නිවැරදි කාලානුරූපී හා ඵලදායී බුද්ධි තොරතුරු මෙහෙයුම් ඒකකවලට හා ඉහළ කළමනාකාරිත්වයට ලබාදීම මගින් දෙපාර්තමේන්තුවේ පරමාර්ථ වන සමාජ ආරක්ෂණ අරමුණු ආදායම් අභිමිකර ගැනීමකින් තොරව ළඟාකර ගැනීමය.

මෙහි පරමාර්ථයන් පහත පරිදිවේ :

- ඉහළම තීරණ ගැනීමේ මට්ටම්වලට අවශ්‍ය බුද්ධි තොරතුරු සැපයීම.
- බුද්ධි තොරතුරු මත පදනම් වන භාණ්ඩ හා මගීන් නිෂ්කාශන පාලන ක්‍රම අවධාරණය සහ නියාමනයට අදාළ ක්‍රියාවලීන්ට බුද්ධි තොරතුරු සැපයීම.
- දේශසීමාවලදී කෙරෙන භාණ්ඩ හුවමාරුවේදී ජාතික ආරක්ෂාව සහතිකකිරීම.
- ජාතික හා ජාත්‍යන්තර බුද්ධි තොරතුරු එක්රැස් කිරීමේ හා බෙදා හැරීමේ මධ්‍යස්ථානයක් ලෙස කටයුතු කිරීම.

## ප්‍රධාන කාර්යයන්

1. තොරතුරු එක්රැස් කිරීම
2. පැය 24 පුරා ක්‍රියාත්මක මහජන තොරතුරු ලබාගැනීමේ ඒකකය පවත්වාගෙන යාම *(PIRD).*
3. දත්ත පද්ධති පවත්වාගෙන යාම හා භාවිතයට ගැනීම
4. බුද්ධි තොරතුරු වර්ධනය කිරීම හා විශ්ලේෂණය කිරීම
5. දේශීය වශයෙන් අංශ අතරත් ජාත්‍යන්තර වශයෙන් අනුමත නියම කරන ලද ආයතන සමගත් බුද්ධි තොරතුරු බෙදා හැරීම
6. ජාත්‍යන්තර රේගු තොරතුරු පද්ධති සම්බන්ධීකරණය කිරීම
7. ආසියා ශාන්තිකර කලාපයේ බුද්ධි තොරතුරු සම්බන්ධීකරණ කාර්යාලයේ කලාපීය ජාතික සම්බන්ධක ස්ථානය ලෙස ක්‍රියා කිරීම හා ජාත්‍යන්තර බලාත්මක කිරීමේ සම්බන්ධීකරණයේ මුඛ්‍ය ස්ථානය ලෙස කටයුතු කිරීම
8. ජාතික ආරක්ෂාව සම්බන්ධ කටයුතුවලදී සම්බන්ධිකරණ ඒකකය ලෙස කටයුතු කිරීම
9. කොළඹ වරායේ බහාලුම් ආරක්ෂක මුලපිරීමේ (Container Security Initiative) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම
10. දෙපාර්තමේන්තුවේ අවදානම් කළමනාකරණ කමිටුවේ සාමාජිකයෙකු ලෙස සහභාගි වීම
11. නැව් බඩු ලේඛන සමාලෝචනය හා බුද්ධි තොරතුරු පාදක කර ගනිමින් අධි අවදානම් භාණ්ඩ තොග අල්ලා ගැනීම හා විමර්ෂණ සිදු කිරීම
12. රේගු පරීක්ෂණ සිදුකිරීම හා වැරදිකරුවන්ට එරෙහිව නඩු පැවරීම
13. පෙර වැරදිකරුවන්ගේ දත්ත පද්ධතිය පවත්වාගෙන යාම (POD)
14. CEN දත්ත පද්ධතිය පවත්වාගෙන යාම
15. ලියාපදිංචියට පෙර ආනයනකරුවන්ගේ ඉල්ලුම්පත්‍ර පරික්ෂා කිරීම (2012 සිට)
16. CHA දත්ත පද්ධතිය පවත්වාගෙන යාමට හා CHA අයදුම්පත්‍ර ලියාපදිංචියට පෙර පරීක්ෂා කිරීම සඳහා නිෂ්කාශන ඒජන්තවරුන්ගේ තොරතුරු ඒකරාශී කිරීම.

**01 වගුව : ලැබුණු හා බෙදාදුන් තොරතුරු**

| | 2013 | 2014 | 2015 |
|---|---|---|---|
| PIRD හරහා ලබා ගත් තොරතුරු සංඛ්‍යාව | 45 | 30 | 26 |
| වෙනත් මූලාශ්‍ර මගින් (ෆැක්ස්, ලිපි, ප්‍රවෘත්ති) එකතුව | 05 | - | 02 |
| එකතුව | 50 | 30 | 28 |
| අවශ්‍ය පියවර ගැනීම සඳහා වෙනත් අංශ වෙත බෙදා හරින ලද තොරතුරු සංඛ්‍යාව. | 23 | 14 | 13 |

**2 වගුව : බෙදා හරින ලද බුද්ධි තොරතුරු**

| | 2013 | 2014 | 2015 |
|---|---|---|---|
| අනතුරු ඇඟවීම් | 17 | 19 | 13 |
| RILO, WCO, CEN අනතුරු ඇඟවීම් | NIL | 30L | 39 |

**3 වගුව : විවිධ අංශ වෙත ඉදිරිපත් කරන ලද පෙර වැරදිකරුවන්ගේ තොරතුරු සංඛ්‍යාව**

| | 2013 | 2014 | 2015 |
|---|---|---|---|
| විවිධ අංශ වෙත ඉදිරිපත් කරන ලද පෙර වැරදිකරුවන්ගේ තොරතුරු සංඛ්‍යාව | 397 | 143 | 55 |

**4 වන වගුව: CHA සහ VAT ලියාපදිංචි කිරීම් සංඛ්‍යාව**

| | 2013 | 2014 | 2015 |
|---|---|---|---|
| රේගු නියෝජිත ආයතන බලපත්‍ර අළුත් කිරීම් | 3500 | 3750 | 3700 |
| ශ්‍රී.ලං.ව.අ. වාජ්පු බලපත්‍ර (A) | 2000 | 2200 | 2570 |
| ආනයනකරුවන්ගේ VAT අංක ලියාපදිංචියට පෙර පරීක්ෂාවන් | 1442 | 1481 | 1460 |

**5 වන වගුව : බහාලුම් ආරක්ෂිත මූලික වැඩසටහන යටතේ පරිලෝකනය ( scanned) කරන ලද බහාලුම් ප්‍රමාණය**

| | 2015 |
|---|---|
| නැවකින් නැවකට මාරු කරන ලද බහාලුම් සංඛ්‍යාව | 204 |
| දේශීය අපනයන බහාලුම් සංඛ්‍යාව | **05** |
| මුලු බහාලුම් සංඛ්‍යාව | **209** |

**6 වන වගුව : දේශීය හා විදේශීය විමර්ශන සහ බුද්ධි නියෝජිත ආයතන සමග සම්බන්ධීකරණ කටයුතු**

| නියෝජිතායතනය | ඉල්ලීම් සංඛ්‍යාව | | | ලැබුණු පිළිතුරු සංඛ්‍යාව | | |
|---|---|---|---|---|---|---|
| | **2013** | **2014** | **2015** | **2013** | **2014** | **2015** |
| DRI- ඉන්දියාව | 04 | 08 | 08 | | | 02 |
| ජපානයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය | 08 | 62 | 35 | 06 | 58 | 32 |
| එක්සත් රාජධානියේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය | 04 | | 05 | | | 05 |
| HM Customs UK | | 02 | | | 01 | 1 |
| ඕස්ට්‍රේලියා | 09 | | | | | |
| සිංගප්පූරුවේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය | 01 | 01 | | | | |
| ජපාන රේගු දෙපාර්තමේන්තුව | | | | | | |
| මාලදිවයින් රේගුව | | | | | | |
| තායිලන්ත රේගුව | | | 03 | | 03 | 3 |
| මලයාසියා රේගුව | 01 | 01 | | | | |
| වියට්නාම් රේගුව | 01 | 01 | | | | |
| තායිලන්ත තානාපති කාර්යාලය | 04 | 04 | | | | |
| | | | | | | |
| RILO - කොරියාව | | | | | 01 | 01 |

**7 වන වගුව : නීති බලාත්මක කිරීමේ කාර්යය සාධනය**

| | 2014 |
|---|---|
| වර්ෂය තුළදී කාර්යය මණ්ඩලය විසින් ආරම්භ කරන ලද / සෝදිසි කරන ලද සිද්ධි සංඛ්‍යාව | 39 |
| වර්ෂය තුළදී අවසන් කරන ලද සිද්ධි සංඛ්‍යාව | 20 |
| අය කරගනු ලැබූ මුලු මුදල රු. | 73,709,749 |

**2015 වසරේ මෙම අංශයේ සත්කාරත්වයෙන් පවත්වන ලද සුවිශේෂ අවස්ථා.**

ඇමරිකා එක්සත් ජනපද රේගුව හා දේශසීමා ආරක්ෂණ ආයතනය මගින් පවත්වන ලද අන්තර් ජාතික නැව්තොටේදී තහනම් භාණ්ඩ අල්ලා ගැනීම පිළිබඳ පුහුණු වැඩසටහන



රේගු මෙහෙයුම් කාර්යය මණ්ඩලයේ ශක්‍යතා වර්ධන ක්‍රියාවලිය ඉහළ නැංවීමේ අපේක්ෂාවෙන් මධ්‍යම බුද්ධි අංශය විසින් ශ්‍රී ලංකාවේ ඇමරිකානු තානාපති කාර්යාලයේ සහ ශ්‍රී ලංකාවේ CSI කාර්යාලය සමඟ සම්බන්ධීකරණයෙන් අන්තර් ජාතික නැව්තොටේදී තහනම් භාණ්ඩ අල්ලා ගැනීම පිළිබඳ පුහුණු වැඩසටහන සංවිධානය කරනු ලැබූ අතර මෙම වැඩසටහන දී 2015 දී දෙසැම්බර් 7 සිට 8 දක්වා කොළඹ ටාජ් සමුද්‍රා හෝටලයේ දී පවත්වන ලදී. බෝහෝ රටවල රේගු පරිපාලනය සඳහා අන්තර් ජාතික පුහුණු වැඩසටහන් පවත්වමින් අත්දැකීම් ලබා ඇති ඇමරිකා එක්සත් ජනපද රේගුව හා දේශ සීමා ආරක්ෂණ ආයතනයේ රේගු නිලධාරින් දෙදෙනෙකු විසින් මෙම පස්දින පුහුණු වැඩසටහන පවත්වන ලදී. රේගු අධිකාරිවරුන්, නියෝජ්‍ය අධිකාරිවරුන් සහ සහකාර රේගු අධිකාරිවරුන්ගෙන් සමන්විත නිලධාරින් 25 දෙනෙකුට නෞකා පරික්ෂා කිරීම , වෙළඳ භාණ්ඩ හඳුනා ගැනීම බහාලුම් හා බහාලුම් මුද්‍රා හඳුනා ගැනීම යන අංශ ඉලක්ක කරමින් පුළුල් දැනුමක් ලබා ගැනීමේ අවස්ථාව හිමි විය. පුහුණුකරුවන් විසින් විස්තර කොට දක්වන ලද අනවසර ඇතුල්වීම් රහිත උපකරණ භාවිතය පිළිබඳ පුළුල් අත්දැකීමක්ද මෙම පුහුණුව සහභාගිවූවන්ට ලබාගත හැකිවිය.

වරායේ වෙළඳ නැවක් තුළ නෞකා පරික්ෂා කිරීමේ මෙහෙයුමක් පිළිබඳ ප්‍රායෝගික අභ්‍යාසයක් ද මෙම පුහුණු සැසිය මගින් ලබා දී ඇත. පසු දින මෙම පුහුණු සැසිය අවසානයේදී ශ්‍රී ලංකාවේ ඇමරිකා එක්සත් ජනපද තානාපති ගරු අතුල් කේෂැප් මහතාගෙන් පුහුණුව සඳහා සහභාගි වූවන්ට සහතික පත් ලැබුණි.

මෙම වැඩසටහන අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා ඉදිරියේදි තවත් පුහුණු සැසි 2ක් ශ්‍රී ලංකා රේගුවට ලබා දීමට පොරොන්දු වී ඇත. පසුගිය වසර 10 තුළ කොළඹ වරායේදී සිදුකරන ලද බහාලුම් ආරක්ෂණ අනුකාරක මෙහෙයුමයේ දී ශ්‍රී ලංකා රේගුව හා ඇමෙරිකාවේ රේගුව අතර දක්නා ලද සහයෝගීතාවය තානාපතිවරයා විසින් අවධාරණය කළ අතර, එය ඇගයිමටද ලක් කලේය. ජාත්‍යන්තර රේගු පරිපාලනය සමඟ මෙම අංශය විසින් පවත්වාගෙන යනු ලබන ජාත්‍යන්තර සහයෝගීතාවයේ ප්‍රගතියටද මෙම කටයුත්ත වැදගත් විය.

රේගු ජංගම පරිලෝකන යන්ත්‍ර (SCANES) මෙගා වරාය මෙහෙයුම් සහ CSI කාර්යාලීය විසින් සිදුකරන බහාලුම් පරිලෝකන කිරීම අධීක්ෂණය කිරීම සඳහා කොළඹ වරාය නැරඹීමට පැමිණි ඇමරිකානු තානාපතිවරයාට අවශ්‍ය කටයුතු සලසාලමින් මෙම අංශය විසින් මූලිකත්වය ගෙන කටයුතු කරන ලදි.

2015 වර්ෂය තුළ තොරතුරු හා අන්තර් නියෝජිත ආයතන සහයෝගය හුවමාරු කරගැනීම ශක්තිමත් කිරීමේ අරමුණින් බෙල්ජියමේ පවත්වන ලද ලෝක රේගු සංගමය බලාත්මක කිරීමේ කමිටු රැස්වීම, ඉන්දියාවේ පවත්වන ලද කලාපීය රේගු බලවත් කිරිම හා DRI රැස්වීම මෙන්ම ඉන්දුනිසියාවේ පැවති RILO ජාතික සම්බන්ධීකරණ මධ්‍යස්ථාන රැස්වීමට මධ්‍යම බුද්ධි අංශයේ අධ්‍යක්ෂවරයා සහභාගි වී ඇත.

**වෙනත් විස්තර**

වංචා කිරීම ඉහළ යෑම් පාලනය කිරීම සඳහා බුද්ධිමය විශ්ලේෂණය පිළිබඳ වැඩි වැඩියෙන් පුහුණු අවස්ථා අවශ්‍ය වේ. ඵලදායි විශ්ලේෂණයක් කිරීම සඳහා මෙම අංශයේ කාර්යය මණ්ඩල මට්ටම වැඩිකළ යුතු අතර වඩා සූක්ෂම යටිතල පහසුකම් අවශ්‍ය වේ. මෙම අංශයේ වැදගත්කම දෙපාර්තමේන්තුවට අවබෝධ විය යුතු අතර, මෙම අංශයට අනුයුක්තව සේවය කරන නිලධාරින්ගේ චිත්ත ධෛර්යය නංවාලිය යුතුව ඇත.

# ආදායම් හා සේවා පර්ෂදය

# ප්‍රකාශන අංශය

### හැඳින්වීම

"ප්‍රකාශක " යනුවෙන් හඳුන්වන්නා වූ ආනයනකරුවන්ගේ නියෝජිතයින් විසින් මුහුදෙන් ප්‍රවාහනය කරන සියළුම භාණ්ඩ සම්බන්ධයෙන් වන රේගු ප්‍රකාශන ඉදිරිපත් කරනු ලබන්නේ ප්‍රකාශන අංශය වෙත වේ. මෝටර් වාහන සඳහා ඉදිරිපත් කරන රේගු ප්‍රකාශ සම්බන්ධයෙන් කටයුතු කිරීමේ වගකීම මේ වනවිටත් මුළුමනින්ම පවරා ඇත්තේ මෙම අංශය යටතේ ඇති මෝටර් රථ වාහන අංශය වෙතයි.

A) "D" අංශය
B) දිගු කාමරය
C) මෝටර් රථ ඒකකය
D) කර්මාන්ත හා සේවා ලේඛන සැකසුම් ඒකකය
E) ලේඛණ (DOC) මධ්‍යස්ථානය

නව ප්‍රතිසංවිධාන සැලැස්ම පරිදි ආදායම් හා සේවා (කොළඹ) පර්ෂදය යටතේ මෙම සියලු අංශයන් ක්‍රියාත්මක වේ.

### ප්‍රධාන කාර්යයන්

1. රේගු රෙගුලාසි හා අනෙකුත් ආශ්‍රිත ආඥා පනත් යටතේ රේගු ප්‍රකාශන සකස් කිරීම.
2. ආනයන හා අපනයන භාණ්ඩ සම්බන්ධයෙන් නියමිත ආදායම තක්සේරු කිරීම හා එකතු කිරීම.
3. වෙළඳාමේ, කර්මාන්තයේ හා පොදු මහජනතාවගේ යහපත වෙනුවෙන් රජයේ ප්‍රතිපත්ති යටතේ බදු විරාමයන් / නිදහස් කිරීම් ප්‍රදානය කිරීම හා තීරු බදු හා බදු අත්හිටුවීම
4. ආනයන හා අපනයනයවලට අදාල සියළු නෛතික අවශ්‍යතා සමග ස්වේච්ඡා අනුගත වීම, තහවුරු කිරිම
5. වේගවත් නිෂ්කාශන ක්‍රියාවලී හරහා නීත්‍යානුකූල ආනයනකරුවන් / අපනයනකරුවන්ට අවශ්‍ය පහසුකම සපයා දීම

### අංශයේ විෂය ක්ෂේත්‍රය

මෙම අංශයේ ප්‍රධාන විෂය ක්ෂේත්‍රය වන්නේ ආනයනික හා ගුදම්ගත කෙරෙන භාණ්ඩ සඳහා ප්‍රකාශන පහසුකම් සැපයීම. මෙය සපුරා ගැනීම සඳහා මෙම අංශය මගින් පහත පහසුකම් සපයා ඇත.

i. DT1 මගින් රේගු සටහන්කර ලබාගැනීම.
ii. රේගු සටහන්කරයේ ඇති තීරුබදු සහ අනෙකුත් බදු ගෙවීම් යාවත්කාලීන කරගැනීම හා නැව් බඩු ලේඛන අවලංගු කිරිම.
iii. තෝරාගත් ආනයනකරුවන්ට ඉක්මන් නිශ්කාෂණ පහසුකම සපයාදීම.
iv. රේගු අධිකාරි/තක්සේරුකරු විසින් රේගු සටහන්කර අනුමත කිරීම.
v. FCL බහාලුම් SLPA SAGT,CICTඅංගනයෙන් එළියට ගෙන යාමට අභ්‍යන්තර අවසර පත්‍ර නිකුත් කිරිම.
vi. FCL භාණ්ඩ බහාලුම් මධ්‍යස්ථානවලදීත් LCI භාණ්ඩ ගුදම්වලදීත් නිශ්කාෂණය කිරිම
vii. "**Asycuda World**" මගින් සම්පූර්ණ ස්වයංක්‍රියකරණය ක්‍රියාත්මක වන අතර, එමගින් ආනයනකරුවන්ට පහසුවෙන් හා අප්‍රමාදව රේගු සටහන්කර කටයුතු කර ගත හැකි වේ. දැන් 2 වන මහලේ දිගු කාමරයේදී "**Asycuda**" පද්ධතිය මගින් රේගු සටහන්කරවල සියලු කටයුතු ඉටු කරන අතර DTI පහසුකම මගින් පරිහරණය කරන්නන්ට තමාගේ කාර්යාලයේ සිටම රේගු සටහන්කර ඇතුලත් කර හැක.
viii. භාණ්ඩ වර්ගීකරණය සම්බන්ධ කටයුතු පමණක් දැනුමැති රේගු අධිකාරී හා තක්සේරුකරුවන්ගෙන් සමන්විත නිලධාරීන් මඩුල්ලක් අතින් සිදු කරයි.

### කාර්යාංශයේ අරමුණු

i. ආනයනය භාණ්ඩ නිශ්කාෂණය පහසුකිරිම.
ii. භාණ්ඩ ගුදම් ගත කිරීමට පහසුකම් සැලසීම.
iii. භාණ්ඩ වර්ගීකරණ කටයුතු හරහා ආදායම් අඩුවීම් හා විදේශ විනිමය අහිමි වීම අවම කිරිම.
iv. D අංශය හරහා රේගු ආඥා පනත හා අදාළ නීති බලාත්මක කිරීම.
v. ආනයන භාණ්ඩ මත පනවන බදු ආදායම නියමිත පරිදි ගණනය හා එකතු කිරීම.
vi. මුදල් අමාත්‍යාංශය අනුමැතිය ඇති ව්‍යාපෘති භාණ්ඩ නිශ්කාෂණවලට බදු සහන ලබාදීමෙන් පහසුකම සැලසීම.
vii. බලපත්‍ර හිමියන්ට/ නීත්‍යානුකූල ආනයනකරුවන්ට තම වාහන / භාණ්ඩ ඉතා ඉක්මනින් නිදහස් කර ගෙන යාමට පහසුකම් සැලසීම.
viii. විවිධ රාජ්‍ය දෙපාර්තමේන්තු/අනෙකුත් සංවිධාන/සාමාන්‍ය මහජනයාට තාවකාලික රේගු සටහන්කර හරහා භාණ්ඩ නිදහස් කර ගැනීමට සැලසීම. රජයේ ප්‍රතිපත්ති මත තීරු බදු අඩු කිරීම/ අත්හැර දැමීම හා ප්‍රමාද කිරීම ක්‍රියාත්මක කිරීම.
ix. තහනම් හා සීමා කරන ලද භාණ්ඩ සඳහා බලාත්මක කිරීම් සිදු කිරීම.

### මෙම අංශයේ නිලධාරීන්ගේ වගකීම

ආනයනික භාණ්ඩ සඳහා රේගු සටහන්කර ක්‍රියා පරිපාටිය අයුතු පමාවකින් තොරව ඉක්මනින් සිදු කිරීමටත් රජයට නියමිත බදු ආදායම එකතු කර දීමටත් දිගු කාමරයේ නිලධාරීන් සහතික වෙයි. ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව, ආහාර හා බෙහෙත් වර්ග සඳහා වූ අධිකාරිය, සීනි පර්යේෂණ ආයතනය, සුවඳ විලවුන් උපාංග හා බෙහෙත් වර්ග සඳහා වූ අධිකාරිය, ශ්‍රී ලංකා ප්‍රමිති කාර්යාංශය, පරමාණුක ශක්ති අධිකාරිය, විදුලි සංදේශ නියාමක කොමිෂම වැනි ආයතනවල අධිකාරියට යටත්ව ගෙන්වන භාණ්ඩ සඳහා එම බලපත්‍ර ලබාගෙන තිබේදැයි සහ තනාපති, තීරු බදු නිදහස්, ශාක නිරෝධායතන සහතිකය, දූම් ගැස්සීමේ සහතිකය, කුළුබඩු මණ්ඩල සහතික සහ පූර්ණ නැව් ගතකිරීමේ වාර්තාව යනාදි සහතිකයන් අපනයන කරන ලද රටවලින් නිකුත් කරන්නේ දැයි අවධානයෙන් සිටීමට මෙම නිලධාරීන් වග බලා ගනී. තවද පහත අවශ්‍යතා ආනයනකරුවන් සම්පූර්ණ කර තිබේදැයි සලකා බලයි.

- භාණ්ඩ නිදහස් කරගැනීම සඳහා භාණ්ඩ ප්‍රවාහකයාගේ අනුමැතිය.
- පරිගණක පද්ධතියේ ඇති නියමිත කේත යොදා ගනිමින් භාණ්ඩවල සම්පූර්ණ විස්තරකර තිබීම.
- සංයෝජිත භාණ්ඩ වර්ගීකරණ නාමාවලිය පදනම් කර සැදූ ආනයන තීරුබදු නාමාවලියට අදාලව භාණ්ඩ වර්ගීකරණය නිවැරදිව සිදු කිරීම.
- භාණ්ඩවල සත්‍ය හුවමාරු වටිනාකම ප්‍රකාශ කිරීම කිරීම.
- නියමිත විදේශ විනිමය අනුපාතය හා අදාළ මුදල් වර්ගය යොදා ගනිමින් භාණ්ඩවල වටිනාකම ප්‍රකාශ කිරීම
- භාණ්ඩ සඳහා අනුමත බැංකුවකින් විදේශ විනිමය හුවමාරුව සිදුවී ඇත්ද යන බව
- අවශ්‍ය පරිදි අදාළ අනුමැති, සහතික, බලපත්‍ර අමුණා තිබීම.

ඉහත සියලුම කරුණු නිසි පරිදි සම්පූර්ණ කර ඇත්නම්, අදාළ නිලධාරීන් භාණ්ඩ නිදහස් කරගැනීම සඳහා රේගු සටහන්කර අනුමත කිරීම සිදු කරයි.
ඉහත සඳහන් කර ඇති පරිදි මෙම කාර්යාංශය යටතේ ඇති කාර්යයන්ට අනුකූලව මෙහි ප්‍රධාන ඒකක පහකි.

## “D” ශාඛාව

“D” ශාඛාව කාර්යාංශයේ ලේකම් කාර්යාලය ලෙස සැලකිය හැකිය. ඓතිහාසික වශයෙන් වසර 200කට පමණ පෙර රේගු පාලක, ජනරාල්වරයා පත් කිරීමේදී ඔහු යටතේ සේවයේ නියුතු ‘A’ විෂයය, ‘B’ විෂයය යනාදී ලෙස විෂයයන් සම්බන්ධයෙන් කටයුතු කිරිම සඳහා ලිපිකරුවන් 4 දෙනෙකු සේවයේ යෙදී සිට ඇත. පසු කාලයේදී ‘A’ විෂයය දැනට පවතින මානව සම්පත් කළමනාකරණ කාර්යාංශය ලෙස (මීන් පෙර පරිපාලන ශාඛාව) විකාශය විය. “C” ලිපිකරු වරාය රාජකාරි ඉටු කළ අතර, පසුව එය ශ්‍රී ලංකා වරාය අධිකාරිය නමින් වෙනමම ආයතනයක් ලෙසින් ස්ථාපිත විය. ඓතිහාසික වශයෙන් භාණ්ඩාගාරය හා රේගුව අතර සම්බන්ධීකරණ කටයුතු සිදු කළ, බදු විරාමයක් / නිදහස් ලබා දුන් හා නැව් භාණ්ඩ ලේඛන භාරගත් පැරණි “D” ශාඛාව තවමත් එම කාර්යයන්ට සමාන කාර්යභාරයක් ඉටු කරන අතර තවමත් ඒ නමින්ම හැඳින්වේ.

ආනයනකරුවන්/සාමාන්‍ය මහජනයාට පහසුකම් සැලසීම සඳහා "D" ශාඛාව සතුව අංශ කීපයක් පවතී.

- DRA අංශය
- බැංකු ඇපකර අංශය
- තීරුබදු සහන අංශය
- තොග භාණ්ඩ අංශය
- Carnet අංශය
- නැව් බඩු ලේඛන අංශය
- විමර්ශන අංශය
- නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ (D) යටතේ ඇති මෝටර් රථ බලපත්‍ර පරීක්ෂා කිරීමේ හා අවලංගු කිරීමේ අංශය

**“D” ශාඛාව විසින් පාලනය කරනු ලබන වැදගත් හා මුඛ්‍ය කාර්යයන් කිහිපයක් පහත දැක්වේ.**

1. මුදල් අමාත්‍යාංශය මගින් ලබාදෙන තීරුබදු සහන ලියාපදිංචි කිරීම මගින් නිශ්කාෂණයට පහසුකම් ලබාදීම.
2. පාර්ලිමේන්තුවෙන් පනවන ආදායම් සංරක්ෂණ වාර්තාව අනුව තීරුබදු සහන හා නිදහස් කිරීම් ලබාදීම.
3. විදේශ කටයුතු අමාත්‍යාංශය ලබාදුන් අනුමැතිය ප්‍රකාරව තානාපති කාර්යාල සේවකයන්ගේ පුද්ගලික භාණ්ඩ හා තානාපති සේවා භාණ්ඩ නිශ්කාෂණයට අවසර දීම.
4. විවිධ වෙළඳ ගිවිසුම් යටතේ ආනයනය කරන භාණ්ඩ සඳහා නිදහස් තීරුබදු හෝ වරණීය තීරුබදු අනුපාත ලබාදීම.
5. මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ උපදේශකත්වය යටතේ රාජ්‍ය ආයතන සඳහා වූ භාණ්ඩ නිශ්කාෂණයේදී පසුව ගෙවීම් කොන්දේසි ලබාදී පහසුකම් සැලසීම.
6. භාණ්ඩ නිශ්කාෂණය සඳහා විවිධ හේතු මත රේගු සටහන්කර ඉක්මණින් ඉදිරිපත් කිරීමට නොහැකි අවස්ථාවේදී හා තාවකාලික ප්‍රකාශපත්‍ර (Provisional Basis ) ක්‍රමය යටතේ යම් කාර්යයක් සඳහා ආනයනය කර ප්‍රතිඅපනයනය සිදුකරන අවස්ථාවේදී ඒ සඳහා පහසුකම් සැලසීම.
7. මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ තීරණය මත ප්‍රතිආනයනය කිරීමට අවශ්‍ය ව්‍යාපෘති භාණ්ඩ ලියාපදිංචිය හා අධීක්ෂණය කිරීම.
8. නාවික නියෝජිතයන් විසින් ඉදිරිපත් කරනු ලබන නැව් බඩු ලේඛන හා ඒවායේ සංශෝධන භාර ගැනීම.
9. රේගු අධ්‍යක්ෂ (ප්‍රකාශන) ගේ තීරණ පරිදි තාවකාලික රේගු සටහන්කර හා අනෙකුත් කාරණා සම්බන්ධයෙන් බැංකු ඇපකර හෝ ආයතනික ඇපකර ලබාගැනීම.
10. CPD Carnet or ATA Carnet මත තාවකාලිකව ආනයනය කරන ලද වාහන සහ උපකරණ අධීක්ෂණය සඳහා ලියාපදිංචි කිරීම.
11. තොග භාණ්ඩ ආනයනය කිරීම, අධීක්ෂණය කිරීම හා අවශ්‍ය විටකදී අමතර අයකිරීම් ලබාගැනීම.
12. තීරු බදු සහන ලබාදුන් භාණ්ඩ පිළිබඳ වාර්තා සකස් කිරීම හා ඒවා මුදල් අමාත්‍යාංශයට ඉදිරිපත් කිරීම.
13. එතනෝල් වැටලීම් හා වාහන කැබලි අත්අඩංගුවට ගැනීම වැනි විවධ ආනයනය පාලන නීති රේගු නීති කඩකිරීම් හසු කරගැනීම හා ඒ සම්බන්ධයෙන් රේගු ආඥා පනත යටතේ ක්‍රියා කිරීම.
14. රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන සමඟ සහයෝගීව කටයුතු කිරීම.

### දිගු කාමරය

ඓතිහාසික වශයෙන් ගත් කළ රේගු පරිපාලනයේදී දිගු කාමරය සැබැවින්ම දිගු කාමරයක් වූ අතර, අදටත් එය දැකිය හැක්කේ දිගු කාමරයක් ලෙසය. මෙය බ්‍රිතාන්‍යයේ යටත්විජිත ලෙස පැවති බොහෝ ආසියාතික රටවල හා යුරෝපයේ ඉතා පැරණි රේගු සංවිධාන පැවති සමහර රටවල (උදා; ඩෙන්මාර්කය හා නෙදර්ලන්තය) දැකිය හැකි පොදු ලක්ෂණයකි. රේගුව ප්‍රධාන වශයෙන් රාජ්‍ය ආදායම කේන්ද්‍ර කොට ගත් රජයේ ආයතනයක් බැවින් මෙම දිගු කාමරයේ වැදගත්කම සුළු කොට තැකිය නොහැකිය. එවකට පැවති විශාල ප්‍රමාණයේ ඉලක්කයන් කාලය ගත වීමත් සමඟ සමාජ ආරක්ෂණ බැඳීම් බවට පරිමානය වී ඇති නමුත් ආදායම එකතු කිරීම නම් වූ මූලික ප්‍රමුඛතාවයේ වෙනසක් සිදුව නොමැත.

රේගු ආඥාපනතේ 10 වන වගන්තිය රේගු බදු හා වෙනත් ගාස්තු අය කිරීමට රේගුවට බලය පවරන අතර එහි 47 වන වගන්තිය අනුව භාණ්ඩ ආනයනය කරනු ලබන තැනැත්තා විසින් ඒ පිළිබඳ සැබෑ ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතු අතර එම භාණ්ඩ සම්බන්ධයෙන් ගෙවිය යුතු සියළු බදු (තීරු බදු ඇතුළුව) ගෙවිය යුතුය.

රේගුව විසින් රේගු බදුවලට අමතරව පහත දැක්වෙන බදු වර්ගද අය කරනු ලැබේ.

- අගය එකතු කිරීමේ බද්ද (VAT)
- වරාය හා ගුවන්තොටුපොල සංවර්ධන බද්ද (PAL)
- ජාතිය ගොඩනැගීමේ බද්ද (NBT)
- විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද (SCL)
- නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන)
- අනෙකුත් රජයේ ආයතන වෙනුවෙන් සෙස් බද්ද(Cess)

පහසුවෙන් අධීක්ෂණ හා මෙහෙයවීම සඳහා සංයෝජිත වර්ගීකරණ ක්‍රමයේ (HS) ඡේද අනුව අංශ 5ක් යටතේ රේගු සටහන් කර අනුමත කිරීම සිදු කෙරේ. එම අංශය පහත දැක්වෙ

- A අංශය - සංයෝජිත වර්ගීකරණ ඡේද 01-44
- B අංශය - සංයෝජිත වර්ගීකරණ ඡේද 45-73
- C අංශය - සංයෝජිත වර්ගීකරණ ඡේද 74-84
- D අංශය - සංයෝජිත වර්ගීකරණ ඡේද 85-97 (මෝටර්රථ නොමැතිව)
- E අංශය - කෑම වර්ග, බෙහෙත්, තොග භාණ්ඩ, ඉක්මණින් විනාශ වන භාණ්ඩ.

### රේගු සටහන්කර ඉදිරිපත් කිරීම.

CusDec යනු රේගු සටහන්කරය යනු ඉංග්‍රීසි යෙදුමේ කෙටි යෙදුමයි. රේගු ආඥා පනතේ 47 වන පරිච්ඡේදය යටතේ නිකුත් කරන ලද ගැසට් නිවේදනය අනුව රේගු සටහන්කර ඉදිරිපත් කරන අවස්ථාවේදී ආනයනකරුවන් විසින් (වොරන්ට් පිටපත, බාරදීමේ පිටපත, භාරදීමේ පිටපත, විනිමය පිටපත හා පාර්ශවකරුගේ පිටපත) ලෙස සටහන්කරය පිටපත් හතරකින් ඉදිරිපත් කලයුතුව ඇත. තවද එම පිටපත් සමග පහත ලියකියවිලි ද ඉදිරිපත් කල යුතුව ඇත.

- ✓ නැව් භාර පත්‍රය
- ✓ භාර දීමේ නියෝගය
- ✓ විදේශ විනිමය අදාළ නොවන භාණ්ඩ ආනයනයකදී හැර බැංකුව විසින් අත්සන් කර සහතික කරන ලද ඉන්වොයිස් පත්‍රය
- ✓ ඇසුරුම් ලේඛනය
- ✓ HS හඳුනා ගැනීමට අදාළ තාක්ෂණික තොරතුරු
- ✓ නිෂ්පාදිත රට තහවුරු කිරීමට අදාළ ලියවිලි
- ✓ ආනයන භාණ්ඩ, සීමා කල භාණ්ඩ නම් ඊට අදාළ ආනයන බලපත්‍ර, ප්‍රමිති කාර්යාංශ සහතික ආදී බලපත්‍ර
- ✓ නිවැරදිව පුරවන ලද වටිනාකම ප්‍රකාශ කිරීමේ ආකෘති පත්‍ර දෙකක්
- ✓ ණයවර ලිපි, විදුලි සංදේශ හුවමාරු වැනි විනිමය සංසරණ ක්‍රමය ගැන ඔප්පු කිරීම.
- ✓ වෙනත් විශේෂ ලේඛන (තානාපති, තීරු බදු සහන, ශාක සනීපාරක්ෂක සහතිකය, දුම් ගැස්සීමේ සහතිකය, කුළුබඩු මණ්ඩල සහතිකය, නැවේ භාණ්ඩ පැටවීම සඳහා මිණුම් වාර්තාව සහ සීනි පර්යේෂණ ආයතනය)

එක් රේගු සටහන්කරයක භාණ්ඩ කිහිපයක් විවිධ වර්ගීකරණ කේත HS අංක යටතේ ඇති විට වැඩිම තීරුබදු ප්‍රමාණයක් ගෙවීමට ඇති භාණ්ඩය අඩංගු ඒකකය අදාළ ඒකකය ලෙස තෝරා ගැනේ.

ආඥා පනතේ 12, 43 වගන්තිය හා 'ආ' යටතේ රේගුව බලාත්මක කර ඇති උපලේඛනයට අනුව භාණ්ඩ ආනයනය කරන අවස්ථාවේදී රේගුව විසින් වෙනත් ඕනෑම නීතියකින් සීමාවන් හා තහනම් පැනවිය යුතුය. මෙම ඉතා පුලුල් විධිවිධානයට අනුව දැනට ක්‍රියාත්මකව පවතින පනත්, ආඥාපනත් හා රෙගුලාසි 33කට අධික සංඛ්‍යාවක් ක්‍රියාත්මක කිරීම රේගුවට සිදු වේ. මින් ප්‍රධානතම පනත වන්නේ 1969 අංක 01 දරණ ආනයන හා අපනයන පාලන පනතයි.

### රථ වාහන අංශය

AsyCuda World' මෘදුකාංගය හා ඇඳුනු ACCESS ජාලය හා සම්බන්ධ වීමෙන් රේගුවට බැංකු සමඟ සම්බන්ධ වී වාහන ආනයනයේදී ප්‍රේෂණය කෙරෙන විදේශ විනිමය පරික්ෂා කර බැලිය හැක. ආනයනය කරනු ලබන වාහන ලියාපදිංචිය පහසු කරවාගැනීමට මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව සමඟද සම්බන්ධ කර ඇත. එමගින් රේගු බදු නොගෙවන ලද වාහන ලියාපදිංචිය වැලැක්විය හැකිය.

රේගු සටහන්කර පිළියෙල කිරීමේදී පහත කරුණු පිළිබඳ අවධානය යොමු කෙරේ.

- ✓ ත්‍යාග හා පරණ වාහන සඳහා ආනයන පාලන බලපත්‍ර
- ✓ තීරුබදු සහන යටතේ රාජ්‍ය සේවකයන්ට පාර්ලිමේන්තු නියෝජිතයන්ට හා ආයෝජන ප්‍රවර්ධන අධිකාරී බලපත්‍ර
- ✓ රාජ්‍ය තාන්ත්‍රිකයන්ට හා රාජ්‍ය නොවන සංවිධානවලට විදේශ කටයුතු අමාත්‍යාංශ ප්‍රධානීන්ට තීරුබදු රහිත බලපත්‍ර ලබාදීම.
- ✓ ව්‍යාපෘති සඳහා ආනයනය කරන ලද වාහන සඳහා තාවකාලික රේගු සටහන් කර පිළියෙල කිරීම.

ඊට අමතරව රේගු සටහන් කර පිළියෙල කිරීමේදී පහත සඳහන් තොරතුරුවල නිරවද්‍යතාව පරීක්ෂා කරනු ලැබේ,

- පහත සඳහන් ලේඛනවල ප්‍රකාර භාණ්ඩ විස්තර නිවැරදි දැයි පරීක්ෂා කර බැලීම.
  - ලියාපදිංචි කිරීමේ සහතිකය
  - පරීක්ෂා කිරීමේ සහතිකය
  - ඉන්වොයිසිය
  - අංගනයේ සිටින තක්සේරුකරු විසින් ලබාදුන් වාහනය පරීක්ෂා කිරීමේ වාර්තාව.
- වාහනයේ වයස නිවැරදිව ගණනය කිරීම.
- වාහනයට ලැබෙන රේගු වටිනාකම නිවැරදිද යන වග
- ඉන්වොයිස් පත්‍රය අනුව ඇති මුදල් වර්ගය නිවැරදිව සටහන් කර තිබීම නිවැරදිදැයි බැලීම.
- නිෂ්පාදිත නැව් ගාස්තු නිවැරදිව ප්‍රකාශ කර ඇත්ද,
- පරීක්ෂා කිරීමේ සහතිකය සමඟ ඇති අමතර උපාංග ගැලපීම.
- සහනදායී ආනයන සඳහා අදාළ බලපත්‍ර අනුමත කිරීම, වාහනයේ නිශ්කාෂණය කිරීම රථවාහන අංශයේ නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ අනුමත කල යුතුය.

## කර්මාන්ත හා සේවා ලේඛන සකස් කිරීමේ ඒකකය

මෙම ඒකකයේ ප්‍රධාන කාර්යය වන්නේ ගුදම් ගතකිරීමේ ( To - Bond)- ගුදමෙන් නිදහස් කිරීමේ (Ex- Bond) සටහන් කර අනුමත කිරීම වන අතර ප්‍රතිව්‍යුහගත කිරීමට පෙර මෙය බැඳුම්කර ඒකකයේ කොටසක්ව පැවතිණ. කර්මාන්ත හා සේවා සඳහා වෙනම කාර්යාංශයක් තිබුණද, අදාල රේගු සටහන්කර අනුමත කිරිම සිදුකරනුයේ ප්‍රකාශන කාර්යාංශය විසිනි.

## ලේඛණගත කිරිමේ මධ්‍යස්ථානය

මෙම මධ්‍යස්ථානය පිහිටා ඇත්තේ වාර්ෆ්ස් තොටුමළුවේ වන අතර ඉදිරියේදී එය නව මූලස්ථාන කාර්යාලයේ දෙවන මහළෙහි වන රේගු දිගු කාමරය සමගින් ඒකාබද්ධ කිරීමට අපේක්ෂිතය. මෙම මධ්‍යස්ථානයේ ප්‍රධාන කාර්යභාරය පහත පරිදි වේ.

- ✓ සියළුම තොග සඳහා (අභ්‍යන්තර) රේගු ගේට්ටු අවසරපත් නිකුත් කිරීම (ආනයන, ආයෝජන මණ්ඩල, NRFC, බැඳුම්කර, UPD, කැටුව නොඑන පුද්ගලික බඩු ද ඇතුළුව විවිධ ශාඛා විසින් රඳවා තබාගත් කන්ටේනර්)

- ✓ කන්ටේනර් ඒවායෙහි (අපනයනය සඳහා වන තාවකාලික ආනයන) පර්යන්තවලින් ඉවත් කිරීම සඳහා SLPA/SAGT/CICT ගේට්ටු අවසරපත් නිකුත් කිරීම පිණිස නියෝග නිකුත් කිරීම

- ✓ **ලේඛනගත කිරීමේ මධ්‍යස්ථානයට ලැබෙන ලේඛන**

    - රේගු දිගු කාමරයේ සහ බැඳුම්කර අංශයේ ඇති සුපරීක්ෂණ ඒකක මගින් පරීක්ෂා කර යොමු කරනු ලබන රේගු ප්‍රකාශනවලට අදාළව අභ්‍යන්තර රේගු ගේට්ටු අවසරපත් නිකුත් කිරීම සඳහා ඒවා ලේඛනගත කිරීමේ මධ්‍යස්ථානයට යොමු කරනු ලැබේ.

    - SLPA/SAGT/CICT ට අදාළ පර්යන්තවලින් කන්ටේනර් ඉවත් කිරීම සඳහා ගේට්ටු අවසරපත් අදාළ පර්යන්තවලින් කන්ටේනර් ඉවත් කිරීම සඳහා ගේට්ටු අවසරපත් නිකුත් කිරීමට අනුමැතිය ලබාදීමට SC – DOC හට හැකිවනු පිණිස ඉන්වොයිසිය සහ නැව් භාර පත්‍රය සමඟින් භාරදීමේ ඇණවුමෙහි රෝස පැහැති පිටපත SC – DOC වෙත ඉදිරිපත් කරනු ලැබේ. භාරදීමේ ඇණවුමෙහි මෙකී රෝස පැහැති පිටපත ප්‍රථම වරට රේගුවට භාරදෙනු ලබන්නේ මෙම ලේඛනගත කිරීමේ මධ්‍යස්ථානයේදී වේ. (එකී පිටපතෙහි රේගුව විසින් සිදුකළ කිසිදු පිටසනක් සඳහන් නොවන බැවින් එය ප්‍රකාශ අංශයේදී රේගු පරික්ෂණාගාරයේදී භාරගන්නා ලේඛන කට්ටලයට ඇතුළත් නොකරනු ලැබේ.)

- ✓ **ලේඛනගත කිරීමේ මධ්‍යස්ථානයේදී අනුගමනය කරනු ලබන කාර්යපටිපාටිය**

    - පරික්ෂාවට ලක් කළ රේගු ප්‍රකාශයේ රෝස පැහැති පිටපත සහ භාරදීමේ නියෝගයෙහි රෝස පැහැති පිටපත ලේඛනගත කිරීමේ මධ්‍යස්ථානයේ ලියාපදිංචි කරනු ලැබේ. (ICC I විසිනි)

    - ලියාපදිංචි කළ ලේඛන SC (Doc Centre-වෙත ඉදිරිපත් කෙරේ)

    - SC (Doc Centre-විසින් ලේඛන සහතික කළ පසු,

        - පද්ධතියට තොරතුරු ඇතුළත් කර, කන්ටේනරය පර්යන්තයෙන් ඉවත් කිරීම සඳහා ගේට්ටු අවසරපතක් ලබාගැනීම සඳහා භාරදීමේ ඇණවුමෙහි රෝස පැහැති පිටපත SLPA/SAGT/CICT වෙත ඉදිරිපත් කරනු ලැබේ.

- පද්ධතියට තොරතුරු ඇතුළත් කර ASC (Doc Centre) විසින් නිකුත් කරන අභ්‍යන්තර ගේට්ටු අවසරපත ලබාගැනීම සඳහා, SLPA/SAGAT/CICT ගේට්ටු අවසරපත සමඟින් රේගු ප්‍රකාශයේ භාරදීමේ පිටපත ASC (Doc Centre) වෙත යොමු කරනු ලැබේ.

- රේගු ගේට්ටු අවසරපත නිකුත් කිරීමෙන් අනතුරුව, CICC (Doc Centre) විසින් අදාල රේගු ප්‍රකාශයේ භාරදීමේ පිටපතෙහි ඡායා පිටපත් සහ වාප්පු ලිපිකරුගේ අවසරපත මෙන්ම රේගු අභ්‍යන්තර ගේට්ටු අවසරපතේ කොල පැහැති පිටපත ගොනුගත කර ලියාපදිංචි කරනු ලැබේ.

- මෙකී ගේට්ටු අවසරපත් දෙක (SLPA/SAGT/CICT සහ රේගු අභ්‍යන්තර ගේට්ටු අවසරපත) ලබාගත් පසු කන්ටේනර් එම කන්ටේනර් පර්යන්තවලින් ඉවත් කරගෙන නව කන්ටේනර් ගේට්ටුව (New Container Gate) දක්වා රැගෙන ඒමට අවසර ලැබෙන අතර, එහිදි රේගු බාහිර අවසරපත නිකුත් කර කන්ටේනරය වරාය පරිශ්‍රයෙන් ඉවතට ගෙන යාමට අවසර ලබාදෙනු ලැබේ.

- නව කන්ටේනර් ගේට්ටුවේදී එකී කන්ටේනරයෙහි රේගුවේ කන්ටේනර් මුද්‍රාව තබන අතර, එම මුද්‍රා අංකය රේගු ගේට්ටු අවසරපතෙහි මුද්‍රණය කරනු ලැබේ.

## Carnet (බදු ගෙවීමෙන් තොරව දේශ සීමා හරහා භාණ්ඩ ගෙන යාමට රේගුවෙන් ලබාදෙන අවසරපත්‍ර)

1. බදු ගෙවීමෙන් තොරව දේශ සීමා හරහා භාණ්ඩ ගෙන යාමට ලබාදෙන රේගු අවසරපත්‍ර වර්ග දෙකකි. ඒවා ATA සහ CPD නම් වේ.

2. ATA අවසරපත්‍ර - “ATA” යනු “Admission Temporaire / Temporary Admission” ප්‍රංශ සහ ඉංග්‍රීසි වචනවල මුල අකුරු එකතු කර සකස් කරන ලද කෙටි නාමයකි.

3. වාණිජ භාණ්ඩ සාම්පල, ප්‍රදර්ශන භාණ්ඩ සහ වෘත්තීයවේදී උපකරණ තාවකාලිකව රටක් තුළට ආනයනය කිරීම ATA අවසරපත්‍ර මගින් ආවරණය කෙරේ.

4. CPD අවසරපත්‍ර - මෝටර් වාහන සහ ට්‍රේලර් සඳහා “Carnet De Passages En Douane”

5. Triptique – යතුරුපැදි සඳහා

6. 1992 වර්ෂයේදී සංශෝධනය කරන ලද පෞද්ගලික මහාමාර්ග වාහන තාවකාලිකව ආනයනය කිරීම (1954) සහ වාණිජ මහාමාර්ග වාහන තාවකාලිකව ආනයනය කිරීම (1956) පිළිබඳව වන රේගු සම්මුතීන්හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව සකස් කරන ලද මෙම බදු ගෙවීමෙන් තොරව භාණ්ඩ ගෙන ඒමට ලබාදෙන රේගු අවසර පත්‍රය ලැයිස්තුගත රටවල රේගු දේශභූමි තුළ භාවිතා කළ හැක.

7. ආනයනය කරන ලද ස්වභාවයෙන්ම ප්‍රතිඅපනයනය කිරීමට ඇති භාණ්ඩ ඇතුළත් වන ඕනෑම තාවකාලික කාර්යකරණයකට.T.A. ක්‍රියාපටිපාටිය උපයෝගී කර ගත හැක.

8. නියම කර ඇති වලංගු කාලසීමාව තුළ අවසර පත්‍රය හිමිකරු විසින් වාහනය ප්‍රතිඅපනයනය කරන බවට සහ තාවකාලික මෝටර් වාහන බලපත්‍රවලට අදාළ රේගු නීති සහ නියමයන්ට අනුකූල විය යුතු බවට වන කොන්දේසි මත එය නිකුත් කරනු ලැබේ.

9. 'A.T.A. අවසරපත්‍රයක් පිළිගනු ලැබූ විටෙකදී එය නියම කරනු ලබන වෙනත් කිසිදු අපනයන ලිපිලේඛනයකට (විනිමය පාලන අවසරපත්‍රයට හෝ අපනයන බලපත්‍රයකට) හිලව් කළ නොහැක. එවැනි අවශ්‍යතාවයන් වෙනමම සම්පූර්ණ කළයුතුවේ.

10. Carnet අවසරපත්‍රය නිවැරදිව නිදහස් කිරීමට නම්, ඇතුළත්වීමේදී රේගුව විසින් මුද්‍රා තබනලද ආනයන වවුචරයට අනුරූප අපනයන වවුචරය වාහනය රටින් පිටවන අවස්ථාවේදී රේගුව විසින් මුද්‍රා තැබිය යුතුය.

11. Carnet අවසරපත්‍රයක් සඳහා ඉල්ලුම් කිරීමේදී අවසර පත්‍රකරු එම අවසර පත්‍රය භාවිතා කිරීම සඳහාදී ඇති නියමයන්ට අනුව එම අවසර පත්‍ර නිකුත් කිරීමේ අදාළ අධිකාරය සමඟ ප්‍රකාශයක් සහ ගිවිසුමක් අත්සන් කළයුතු වේ.

12. සම්මුතියේ සඳහන් කිසියම් විධිවිධානයක් කඩ කිරීමක්, කිසියම් ආදේශ කිරීමක්, සාවද්‍ය ප්‍රකාශයක් හෝ ක්‍රියාවක් සිදුකර ඇත්නම්, එම වරද සිදුකරනු ලැබ ඇති රටෙහි ඇති නීති මගින් නියම කර ඇති දඩුවම්වලට යටත්ව එම වරද සිදුකරන ලද පුද්ගලයා ඒ සඳහා වගකිව යුතු වේ.

13. රේගු අධිකාරීන් A.T.A. Carnet අවසරපත්‍ර සම්මුතියට අමතරව පහත සඳහන් සම්මුතීන්ටද ගිවිසුම්කාර පාර්ශවයන් වන්නේ නම් පමණක් පහත සඳහන් කාර්යකරණයන් සඳහා A.T.A. Carnet අවසරපත්‍රය භාවිතා කළ හැක.

- 13.1 වෘත්තීයවේදී උපකරණ සම්මුතිය
- 13.2 ප්‍රදර්ශන සහ සල්පිල් සම්මුතිය
- 13.3 වෙළඳ සාම්පල සම්මුතිය
- 13.4 ඇසුරුම් සම්මුතිය
- 13.5 මුහුදු ප්‍රවාහන සම්මුතිය
- 13.6 විද්‍යාත්මක උපකරණ සම්මුතිය
- 13.7 අධ්‍යාපනික ආධාරක ද්‍රව්‍ය සම්මුතිය
- 13.8 පෞද්ගලික මහාමාර්ග සහ වෙළඳ මහාමාර්ග වාහන සම්මුතිය
- 13.9 අහස්යානා සහ විනෝද බෝට්ටු සමුම්තිය

## Carnet De Passage අවසරපත්‍ර ක්‍රියාපටිපාටිය

**1.** මෙම අවසරපත්‍රය පිට කවරයකින් සහ අවසරපත්‍රය මගින් ආවරණය වන භාණ්ඩවල එක් එක් ගමන සඳහා අවශ්‍ය වන පිටුවලින් සමන්විත වේ. පිටකවරයේ ඉදිරිපස කොටසින් පහත සඳහන් තොරතුරු සපයා දෙයි.

- 1.1 නිකුත් කිරීමේ සංගමය
- 1.2 අභ්‍යන්තර ඇප පත්‍රදාමය
- 1.3 හිමිකරුගේ නම
- 1.4 වලංගු කාලසීමාව
- 1.5 එය වලංගු වන රටවල් සහ එම රටවල අනුරූප ඇපවීමේ සංගම් සහ
- 1.6 හිමිකරුගේ නියෝජිතයෙකු විසින් අවසර පත්‍රය භාවිතා කරන්නේ නම් එම නියෝජිතයාගේ නම

2. භාණ්ඩ යොදාගැනීමට අපේක්ෂා කරනු ලබන කාර්යය ඉදිරිපස පිටකවරයේ සඳහන් කර ඇත. (උදාහරණ : ප්‍රදර්ශනය සඳහා සාම්පල ආදි වශයෙනි) Carnet අවසරපත්‍රයෙන් ආවරණය කිරීමට නියමිත සියලුම භාණ්ඩ පිළිබඳ සම්පූර්ණ විස්තරය පිටකවරයේ පිටුපස ඇති පොදු ලැයිස්තුවට ඇතුළත් කර ඇත. මෙම අවසර පත්‍රයෙන් ආවරණය කිරීමට නියමිත සියලුම භාණ්ඩ පිළිබඳ විස්තර ඇතුළත් කිරීම සඳහා පිටකවරයේ සහ අනෙකුත් පිටුවල ඇති ඉඩකඩ ප්‍රමාණවත් නොවන අවස්ථාවල අමතර පිටු ඇතුළත් කරනු ලැබිය හැක. අවශ්‍ය කරන තොරතුරු වන්නේ විස්තර කිරීම්, සළකුණු සහ අංක (තිබේ නම්) අවසර පත්‍රය නිකුත් කරනු ලබන රටෙහිදි භාණ්ඩයේ වටිනාකම සහ නිෂ්පාදනය කරනු ලැබූ රට ආදිය වේ. පැහැදිලි හඳුනාගැනීමේ අංක භාණ්ඩවල සඳහන් නොවේ නම්, රේගුව විසින් හඳුනා ගැනීමේ සළකුණු ඇලවිය හැක.

3. Carnet අවසරපත්‍රය කාර්යගත කිරීම රේගු අධ්‍යක්ෂ (DC) විසින් අනුමත කර වලංගු කාලසීමාව තීරණය කරනු ලබයි.

4. එම අවසර පත්‍රය ලියාපදිංචි කිරීමට ‘D’අංශයේ රේගු අධිකාරිවරයාට (SC) නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂක විසින් උපදෙස් දෙනු ලබයි

5 අවසරපත්‍රය ලියාපදිංචි කිරීමට සහ එම ලේඛනවල පිටපත් තබාගන්නා ලෙස රේගු අධිකාරි විසින් සහකාර රේගු අධිකාරි වෙත උපදෙස් දෙනු ලබයි.

6. සහකාර රේගු අධිකාරී විසින් අවසරපත්‍රය ලියාපදිංචි කර මෝටර් වාහන අංශයේදී රේගු ප්‍රකාශන ක්‍රියාවලිගත කිරීමට භාණ්ඩ තොග ලබන්නාට අවසර දෙනු ලබයි.

7. ගොනුගත කර ඇති ආනයන ලියවිල්ලෙහි රේගු අධිකාරී විසින් අත්සන් කර මුද්‍රාව තබා, එම අවසර පත්‍රය යටතේ ආනයනය කරනු ලබන එකී වාහනය මාස 03 ක කාලයක් ඇතුළත ප්‍රතිඅපනයනය කරන බවට සහතික වෙමින් රේගු අධ්‍යක්ෂ ඉදිරියේ ගිවිසුමක් (ප්‍රකාශයක් අත්සන් කරන ලෙසට ආනයනකරුවන් උපදෙස් දෙනු ලබයි.

8. පාලක ලේඛනය පවත්වාගෙන යනු ලබන අතර, වලංගු දිනය මත ලේබලයක් තබයි.

9. රේගු අධ්‍යක්ෂ විසින් එකී වාහනය නිදහස් කිරීමට අවසර ලබාදිය හැකිවන පරිදි රේගු ප්‍රකාශන සමඟ එම අවසරපත්‍රය ඉන්පසුව මෝටර් වාහන ඒකකය වෙත යවනු ලැබේ.

10. විදේශීය භාණ්ඩ විකිණීමේ අරමුණ ඇතිව පෞද්ගලික අභිමතාර්ථයන් සඳහා සාප්පුවල හෝ ව්‍යාපාරික ස්ථානවල සංවිධානය කරනු ලබන ප්‍රදර්ශන මෙම අවසර පත්‍රය මගින් ආවරණය කරනු නොලබයි.

10.1 වලංගු කාලය මාස 03 ට වඩා අඩු කාලයක් නොවන්නේ නම් මිස, තාවකාලික ඇතුලත්වීමේ අවසරය ලබාදී ඇති භාණ්ඩ මාස 03 ක කාලයක් ඇතුළත ප්‍රතිඅපනයනය කළ යුතුය.

10.2 ඇතුලත්වීමේ ස්ථානයන්හිදි Carnet අවසර පත්‍ර රේගුවට ඉදිරිපත් කරනු ලැබූ විටදී, රේගු නිලධාරින් විසින් අදාළ භාණ්ඩ අවසර පත්‍රයේදී ඇති පොදු භාණ්ඩ ලේඛනයෙහි සඳහන් භාණ්ඩවල නම් සමඟ සංසන්දනය කර බලා, හැකි නම් භාණ්ඩ මත හඳුනාගැනීමේ සළකුණු තබා, එම හඳුනා ගැනීමේ සළකුණු අවසර පත්‍රයේ උප පත්‍රිකාවෙහි සටහන් කර, ආනයන වවුචරයේ රේගුව සඳහා ඇති කොටස රඳවා තබාගත යුතුය. අවශ්‍ය විස්තර රේගුව විසින් උපපත්‍රිකාව පිටපැත්තෙහි ලියනු ඇත. අදාළ භාණ්ඩ ප්‍රතිඅපනයනය කරන විටදී නැවත පරීක්ෂා කිරීම සඳහා වවුචරය ගොනු ගතකර ආරක්ෂිතව තබාගැනීම පිණිස එය 'D' ශාඛාව වෙත යැවිය යුතුවේ.

11. Carnet අවසර පත්‍රයක් මත ආනයනය කරන ලද භාණ්ඩ ප්‍රතිඅපනයනය කරන විටදී, එම භාණ්ඩ ආනයනය කිරීමට අදාළ විස්තර රේගුව විසින් පරීක්ෂා කර බලා ප්‍රතිඅපනයනය කිරීමේ වවුචරයේ රේගුව සඳහා ඇති කොටස වෙන් කරගෙන උපපත්‍රිකාවෙහි අවශ්‍ය පිටසන් යොදනු ලැබේ. ප්‍රතිඅපනයනය කිරීමේ වවුචරයේ වෙන්කරගන්නා ලද කොටස `D` ශාඛාව වෙත යවනු ලැබේ.

12. භාණ්ඩ ආනයනය කිරීම සහ/හෝ අපනයනය කිරීම සඳහා අවසරපත්‍ර භාවිතය රටෙහි ජාතික නීතිරීතිවලට යටත්වන්නේය.

13. අවසරපත්‍රයේ සඳහන් විධිවිධානයන්ට හෝ රටෙහි ජාතික නීතිවලට එරෙහි කිසිදු වංචාවක්, උල්ලංඝනය කිරීමක් හෝ අයුතු ලෙස යොදාගැනීමක් සිදුකරනු ලබන ඕනෑමඅවසරපත්‍ර හිමියෙකුට එරෙහිව ක්‍රියාකිරීමටත්, එවැනි උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් දණ්ඩනය කිරීමේ අයිතිය රේගුව සතුවේ.

## 2015 වසරේ ප්‍රකාශන කාර්යංශයේ කාර්යසාධනය

2015 වර්ෂයේදී කාර්යය සාධනය **සංක්ෂිප්තව රූප සටහන්** මගින් විමර්ශන සඳහා අමුණා ඇත.

| | | |
|---|---|---|
| i. | දිගු කාමරය සහ මෝටර් වාහන ඒකකය | ඇමුණුම අ,ආ |
| ii. | මෝටර් වාහන ඒකකය | ඇමුණුම ඇ, ඈ |
| iii. | වාරායේ සිට බාහාලුම් සංචලනය ප්‍රවාහනය 2015 | ඇමුණුම ඉ |
| iv. | භාණ්ඩ ලේඛණය සංසෝධන සහ ප්‍රමාද භාණ්ඩ ලේඛණ දඩ | ඇමුණුම ඊ |
| v. | දිගු කාමරය සහ මෝටර් වාහන ඒකකයේ අදායම් සංසන්දනය | ඇමුණුම උ |

.

# කර්මාන්ත හා සේවා අංශය

## හැඳින්වීම

ඓතිහාසිකව රේගු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යය වන්නේ ආනයන හා අපනයන බදුකරණයයි. යම් විශේෂ හේතූන් මත මෙම බදුකරණ ක්‍රියාවලිය 'බැඳුම්කර' ආකාරයෙන් සීමිත කාලයකට තාවකාලිකව නතර කරනු ලබන (අත්හිටුවන) අවස්ථා තිබේ. රේගු ව්‍යවහාරයේදී 'බැඳුම්කර' යන්නෙන් අදහස් කරනුයේ ආනයනය කරන ලද බදු අය කළ යුතු භාණ්ඩ එම කාර්යය සඳහාම වෙන් වූ 'බැඳුම්කර ගුදමක්' ලෙසින් හඳුන්වනු ලබන ගබඩාවක ආරක්ෂිතව තැබීමයි.

අතීතයේදී මෙම 'බැඳුම්කර' ක්‍රමවේදය යොදාගනු ලැබුවේ බදු ගෙවීමකින් තොරව සිය ආනයනික භාණ්ඩ නැවත අවශ්‍ය වන තෙක් 'රැජිනගේ ගබඩාවේ' තැන්පත් කොට තබන වෙළඳුන් හට අවශ්‍ය පහසුව සැපයීමයි. ඇතැම් අවස්ථාවල වෙළඳුන් මූල්‍ය හේතු මත භාණ්ඩ බැඳුම්කරණය කිරීමටද ඉදිරිපත් වී ඇත. පසු කාලයකදී මෙම ක්‍රමය වෙනස් වී නිෂ්පාදකයන් හට බදු ගෙවීමකින් තොරව අමුද්‍රව්‍ය ගබඩාකොට තැබීමටත් එම අමුද්‍රව්‍ය යොදාගනිමින් අපනයනය සඳහා භාණ්ඩ නිෂ්පාදනය කිරීමට ඉඩ දීම දක්වාත් විකාශනය විය. එමගින් ඔහුට බදු ගෙවීමට අවශ්‍යතාවයක් උදා නොවුනු නමුත් රටට අවශ්‍ය විදේශ විනිමය ඉපැයීමට එය හොඳ අවස්ථාවක් විය. මෙම මූලික සංකල්පයට විවිධ එකතුවීම් සිදුව ඇති අතර එමගින් විවිධ නව කර්මාන්තයන් හට ඉදිරියට ඒමට අවස්ථාව නිර්මාණය වී තිබේ. දැනට එය රටේ කර්මාන්ත හා ආර්ථික වර්ධනයට දිරිදීමේ ක්‍රමවේදයක් ලෙස ඉදිරියට පැමිණ ඇත. මෙහි වඩාත්ම වැදගත් කාර්යය වනුයේ එය අප රට ජාත්‍යන්තර වෙළඳාමේ කරලියට ගෙන ඒමයි.

කර්මාන්ත හා සේවා අංශය ආනයනය කරන ලද භාණ්ඩ, කර්මාන්ත හ වාණිජ අවශ්‍යතාවයන් පරිදි විශේෂිත ක්‍රියා පටිපාටි යටතේ නිෂ්කාශනය කිරීම සඳහා ආරක්ෂිත / බැඳුම්කර යටතේ තාවකාලිකව ගබඩා කර තැබීමට අදාල රේගු කටයුතු සිදු කරයි. එමෙන්ම රේඛීය ආයතන සම්බන්ධීකරණය කිරීම මගින් එනම්, විශේෂයෙන්ම ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග සම්බන්ධිකරණය මගින් නිෂ්පාදන / අපනයන කර්මාන්ත විවිධාංගීකරණ ප්‍රවණතාව ගවේෂණය කිරීමේ අරමුණින් කටයුතු කිරීම සඳහා එකී කර්මාන්ත ධෛර්යමත් කරයි.

**ප්රධාන කාර්යයන්**

වෙළඳාම පහසු කිරීමේ රජයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම / පරිපාලනය කිරීම මෙම කාර්යාංශය වෙත පවරා ඇති කාර්යභාරය වේ. කාර්යාංශයේ ප්‍රධාන කාර්යයන් පහත දැක්වේ.

1. රේගු බැඳුම්කර ගබඩා කළමනාකරණය කිරීම.
2. අපනයන සැකසුම් සඳහා වන තාවකාලික ආනයන හා තීරුබදු ප්‍රතිදාන පරිපාටි ආදී අපනයන පහසුකරවීමේ යෝජනා ක්‍රම කළමනාකරණය කිරීම.
3. තීරු බදු රහිත සාප්පුවල කටයුතු කළමනාකරණය කිරීම.
4. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල ව්‍යාපාරවලට අදාල භාණ්ඩ ආනයන / අපනයන කටයුතු කිරීමේදී එම ආයතනය සමග සම්බන්ධිකරණය කිරීම.
5. බඩු ගබඩා කිරීම, තොග පාලනය, නැව් බඩු පාලනය හා ආයෝජන මණ්ඩලයේ ආනයන/අපනයන සඳහා අවශ්‍ය තොරතුරු තාක්ෂණ පද්ධති පවත්වාගෙන යාම සඳහා ICT කාර්යාංශය සමඟ සම්බන්ධිකරණය කිරීම.
6. 'විලම්බන තන්ත්‍ර' රේගු සටහන්කර සකස් කිරීමේදී ප්‍රකාශන කාර්යාංශය සමඟ සම්බන්ධිකරණය කිරීම.

කර්මාන්ත හා සේවා කාර්යාංශයේ ප්‍රධාන ශාඛා

I. ලේඛන ශාඛාව
II. ව්‍යාපෘති ශාඛාව
III. නියාමන හා ආපසු ගෙවීමේ ශාඛාව
IV. ආයෝජන මණ්ඩල කර්මාන්ත සම්බන්ධීකරණ ඒකකය
V. තැපැල් තක්සේරු (කොළඹ) ශාඛාව

## ලේඛන ශාඛාව

සකස් කරන ලද රේගු සටහන්කර සංඛ්‍යාව

| | 2013 | 2014 | 2015 |
|---|---|---|---|
| (අ) ප්‍රධාන කාර්යාලයේ ඇති මුළු රේගු සටහන්කර සංඛ්‍යාව | 110,865 | 97,222 | 90,082 |
| (අ) ප්‍රධාන කාර්යාලයේ ඇති මුළු රේගු සටහන්කර සංඛ්‍යාව | 5,154 | 5,391 | 4,813 |




## අය කර ගැනීම්

| | **2013** | **2014** | **2015** |
|---|---|---|---|
| ආදායම් එකතුකර ගැනීම (රු. මිලියන) | 21,211.9 | 22,917 | 19,911.02 |
| පරීක්ෂණ ගාස්තු (රු. මිලියන) | 8.08 | 10.16 | 26.46 |






**ව්‍යාපෘති අංශය**

රේගු බැඳුම්කර ගුදම්වල වත්මන් තත්ත්වය (2015)

| | | පොදු බැඳුම්කර | පෞද්ගලික බැඳුම්කර | නිෂ්පාදන බැඳුම්කර | සීනි බැඳුම්කර | UPB බැඳුම්කර |
|---|---|---|---|---|---|---|
| i | වසර ආරම්භයේදී බැඳුම්කර සංඛ්‍යාව | 6 | 46 | 6 | 3 | 11 |
| ii | වසර තුළදී නව අනුමැති සංඛ්‍යාව | | | | | |
| iii | අවලංගු කිරීම් සංඛ්‍යාව | | | | | |
| iv | වසර අවසානයේදී බැඳුම්කර සංඛ්‍යාව | 6 | 46 | 6 | 3 | 11 |

| | | සේවා බැඳුම්කර | සැපයුම් බැඳුම්කර | තීරු බදු රහිත සාප්පු | බදු පාර්ශ්ව ගොනු කිරීම් | එකතුව |
|---|---|---|---|---|---|---|
| i | වසර ආරම්භයේදී බැඳුම්කර සංඛ්‍යාව | 10 | 51 | 51 | 3 | 187 |
| ii | වසර තුළදී නව අනුමැති සංඛ්‍යාව | 0 | 1 | 1 | 1 | 3 |
| iii | අවලංගු කිරීම් සංඛ්‍යාව | 1 | 0 | 0 | 0 | 1 |
| iv | වසර අවසානයේදී බැඳුම්කර සංඛ්‍යාව | 9 | 52 | 52 | 4 | 189 |

**බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපලේ තීරුබදු රහිත සාප්පුවල වෙළඳාම පිළිබඳ තොරතුරු**

| | 2013 | 2014 | 2015 |
|---|---|---|---|
| සී ට්‍රාන්ස් ඩියුටි ෆ්‍රී ෂොප් (ඇ.ඩො.) | 1,246,289.00 | - | 1,452,506.00 |
| STC ජෙනරල් ට්‍රේඩින් කොම්පැණි ලිමිටඩ් . (ඇ.ඩො ) | 1,588,401.00 | 1,643,397.00 | 2,698,885.00 |
| වින්ෂන් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට් ) ලිමිටඩ්. (ඇ.ඩො.) | Nil | 64,333.00 | 170,540.50 |
| එකතුව (ඇ.ඩො.) | 2,834,690.00 | 1,643,397.00 | 4,321,931.50 |

## TIEP1, TIEP 4 & IBG වැඩසටහන්වල වර්තමාන තත්ත්වය (2015)

1. මෙහෙයුම්කරුවන්

| | | TIEP 1 | TIEP 4 | IBG |
|---|---|---|---|---|
| i | වසර ආරම්භයේදී මෙහෙයුම්කරුවන් සංඛ්‍යාව. | 1055 | 534 | 240 |
| ii | වසර තුළදී එක් වූ මෙහෙයුම්කරුවන් සංඛ්‍යා | 57 | 25 | 12 |
| iii | වසර අවසානයේදී මෙහෙයුම්කරුවන් සංඛ්‍යාව. | 1112 | 559 | 252 |

## අධීක්ෂණ හා ආපසු ගෙවීම් අංශය

ලබාගත් ආදායම

| | ඇපකර සංඛ්‍යාව |
|---|---|
| පිළිගත් බැංකු ඇපකර | 2301 |
| ඉල්ලා සිටි බැංකු ඇපකර | 08 |
| පියවන ලද බැංකු ඇපකර | 1760 |
| පිළිගත් පුද්ගල ඇපකර හා ආයතනික ඇපකර | 145 |

## බැඳුම්කර විමර්ෂණ ඒකකය

අනාවරණය කරගත් උල්ලංඝනයකිරීම් සංඛ්‍යාව, අයකරගත් සංඛ්‍යාව හා අධිකරණයේ පවරන ලද සිද්ධි

| | 2013 | 2014 | 2015 |
|---|---|---|---|
| වසර මුලදී තිබූ නඩු සංඛ්‍යාව | 574 | 611 | 31 |
| වසර තුළදී මුල පුරන ලද නඩු සංඛ්‍යාව | 59 | 44 | 43 |
| වසර තුළදී අවසන් කරන ලද විමර්ෂණ සංඛ්‍යාව | 10 | 13 | 14 |
| විමර්ෂණ අවසන් නොමැති නඩු සංඛ්‍යාව | 611 | 31 | 26 |
| වසර අවසානයේදී අවසන්වන නොමැති විමර්ශණ සංඛ්‍යාව | 4 | - | 4 |
| අධිකරණයේ නඩු පවරන ලද සිද්ධි සංඛ්‍යාව (වසර අවසානයේදී) | Nil | Nil | 2 |
| දඩ/ රජසන්තක කිරීම් | 266,043,829 | 7,367,295 | 157,864,500 |
| | - | - | - |

## තැපැල් තක්සේරු අංශය

2015 වසරේදී එකතුකරගත් ආදායම

| කොළඹ රු. | නුවර රු. | ගාල්ල රු. | ත්‍රිකුණාමලය රු. | යාපනය රු. | එකතුව රු. |
|---|---|---|---|---|---|
| 59,586,105 | 6,129,608 | 5,117,614 | 1,807,609 | 4,019,118 | 76,660,054 |



# භාණ්ඩ පරීක්ෂණ අංශය

**හැඳින්වීම**

ආනයන හා අපනයන කටයුතුවලදි බදු එකතු කිරීම සමාජ, ජෛව විවිධත්වය, සංස්කෘතික උරුමය, බුද්ධිමය දේපළ ආරක්ෂා කිරීම, පරිසරය ආරක්ෂා කිරීම, වෙළඳාම සහ මගීන්ගේ අනුකලතාවය මෙන්ම සංඛ්‍යාලේඛන එකතු කිරීම රේගුවේ ප්‍රධාන වගකීම වේ. අනෙකුත් රජයේ නියෝජන ආයතන වෙනුවෙන් මේවායින් ඇතැම් අරමුණු ඉටු කරනු ලබන්නේ රේගුව විසිනි.

අතීතයේදි රේගුව විසින් යොදාගත් පාලන ක්‍රමය මගින් සම්ප්‍රදායික වශයෙන් හඳුන්වන දොරටු පාලන ක්‍රමය වන එනම්, නීතිය බලාත්මක කිරීමේ උපාය මාර්ග කෙරෙහි අවධානය යොමු කිරීම හේතුවෙන් සංවිධානයේ අරමුණු ඉටු කර ගැනිම සඳහා සියළුම ප්‍රවාහන භාණ්ඩ භෞතිකව පරික්ෂා කරන ලදී. කෙසේ වුවද, විශේෂයෙන් නාවුක බහාලුම්, මෙගා නැව් බාහාලුම් ප්‍රවාහන ක්‍රමය , මෙගා වරායන් , නූතන බාහාලුම්, පර්යන්ත පහසුකම්, විද්‍යුත් වෙළඳ කටයුතු, විශාල ගුවන්යානා ජාත්‍යන්තර , බහුපාර්ශික හෝ ද්විපාර්ශික, ගිවිසුම්වල සංකීර්ණතාවය ඇතිවීමත් සමඟ ජාත්‍යන්තරයව වෙළදාම් කිරීමේ පරිසරය සහ වෙළදාම් කිරිමේ සීඝ්‍ර වර්ධනය හේතුකොට ගෙන ඇති වූ වැඩ ප්‍රමාණයේ අනපේක්ෂිත ඉහළ යාම රේගුවට දැරිමට සිදු විය .

අවශ්‍ය අවස්ථාවලදී පාලන කටයුතුවලට යොදාගැනීමට අවශ්‍ය යැයි හැඟී යන නෛතික වෙළඳාමට පහසුකම් සැපයීමටත් රේගුවේ සියලුම කටයුතු සුදුසු මට්ටමකින් පහසුකම් සපයමින් පවත්වාගෙන යාමටත්, වේගයෙන් වර්ධනය වන ගෝලීය පරිසරය රේගුවට බලපාන ඇත. මේ සඳහා කාර්යයභාර්යන් හා මෙහෙයුම් ක්‍රමය නැවත ඇගයීමකට ලක් කිරීමකට අවශ්‍ය වූ අතර, එය භෞතික පාලනයේ සම්ප්‍රදායික දොරටු පාලක ක්‍රමයේ සිට අවධානම් කළමණාකරන ශිල්ප ක්‍රම පදනම් කරගෙන මෙහෙයුම් සිදු කිරීමේ ස්වරූපයක් දෙසට මාරු වීමේ පියවරක් විය.

අභියෝගයට මුහුණ දීම සඳහා රේගුව විසින් අවදානම් වර්ණියතාවය සහ ඉලක්ක ගත උපාය මාර්ගය ක්‍රියාත්මක කරන ලදී. එහි සියලුම සේවාදායකයන්ට ප්‍රවේශවීම සඳහා .'සියලුදෙනාට ගැළපෙන' එක ක්‍රමවේදයක් යොදා ගැනීමටත් අනුකූල නොවීම අවම කරගැනීම සඳහා අවදානම්වලට පිළියම් කිරීමටත්, රේගුවට සිදුවිය. කෙසේ වුවද පෞද්ගලික තත්වයන්, සේවාදායකයාගේ සුවිශේෂී ක්‍රියාකාලාපයන් අවබෝධ කරගැනීමටත් අවදානම් ලිහිල් කරගැනීම සඳහා විවිධ ප්‍රතිකර්ම ක්‍රමවේදයන් යොදාගැනීමටත් සිදු වී ඇත. සෑම අතින්ම පරිපූර්ණ අවදානම් පාදක අනුකූල කළමණාකරණ ප්‍රවේශයක් යොදාගැනීම මගින් ස්වකීය, පරමාර්ථ, ඉටු කරගැනීම සඳහා වඩා ඵලදායිව, කාර්යක්ෂමව සහ සාර්ථකව සම්පත් යොදා ගැනීමට අවස්ථාව සලසනු ඇත.

රේගුවේ සේවාදායකයන් පුළුල් ලෙස කාණ්ඩ 04කට බෙදා වෙන් කළ හැකිය.

1. ස්වේච්ඡාවෙන් අනුකූල වන සේවාදායකයන්
2. අනුකූල වීමට උත්සහ දරණ නමුත් නියත ලෙසම නිතරම සාර්ථක නොවන සේවාදායකයන්
3. අවස්ථාව ලද විට අනුකූලවීමෙන් වැලකෙන සේවාදායකයා
4. දැන දැනම අනුකූල නොවන සේවාදායකයා

අවධානම් පාදක අනුකූල කළමණාකරණ ප්‍රවේශය තුළ, ස්වේච්ඡාවෙන් එකඟ වන අයට දිරිගැන්වීම් සහ සරල කරන ලද රේගු ක්‍රියාපටිපාටින් පිරිනැමීම, අනුකූලවීමට උත්සහ දරන නමුත් නියත ලෙසම නිතරම සාර්ථක නොවන සේවාදායකයන්ට, අනුකූල වීමට සහයෝගය දැක්වීම. අවස්ථාව ලද විට අනුකූලවීමෙන් වැලකෙන සේවාදායකයන්ට අනුකූල විමට නියම කිරිම සහ දැන දැනම අනුකූල නොවන සේවාදායකයන්ට අනුකූල වීමට බලකර සිටීම. ඉහළ අවදානමක් ඇති සම්පත් කෙරෙහි අවධානය යොමු කරමින් අඩු අවදානම් සේවාදායක පදනම ඉහළ නංවීම සහ අනුකූල නොවන්නා හසු කරගැනීමට එයින් අපේක්ෂා කෙරේ.

මෙහෙයුම් මට්ටමේ දී අවදානම් පාදක අනුකූල කළමණාකරණය සාර්ථකව සිදු කිරීම සඳහා බුද්ධිමය තොරතුරුවලින් ලැබෙන සහයෝගීතාවය නිතරම උපයෝගී වේ.සම්පත් ඒකරාශී කර සුදුසු ආකාරයෙන් යොදාගැනීම සඳහා රේගුව පිළිබඳ තීරණ ගන්න අයට මෙය උපකාරී වේ. රේගුව විසින් පාලන කිරීම් සිදුකරන අතර, නිත්‍යානුකූල වෙළඳුන්ට සුදුසු මට්ටමකින් පහසුකම් සලසනු ලබන අතර,එමගින් නීත්‍යානුකූල වෙළඳාමේදී සිදුවන කඩාවැටීම් හා පිරිවැය අවම කරනු

ලබයි. සෑම අතින්ම පරිපූර්ණ අවදානම් පාදක අනුකූල කළමණාකරණ ප්‍රවේශයේ ප්‍රධාන ලක්ෂණය වන්නේ ස්වේච්ඡාවෙන් අනුකූලවීම කරා සේවාදායක පදනම ධෛර්යමත් කිරීම සහ හිතාමතාම අනුකූල නොවන්නන් දෙසට සම්පත් යොමු කිරීම වේ.

මෙහෙයුම් මට්ටමේදී අවධානම් පාදක පාලන කීරීම බුද්ධි හා නූතන තාක්ෂණයේ සහයෝගය ඇතිව යොදා ගනු ලැබේ. එයින් අපේක්ෂා කරන්නේ විශ්වාසනීය සේවාදායකයන් සහ අවදානම් අඩු ප්‍රවාහන භාණ්ඩ නිවැරදිව හඳුනා ගැනීමත් සහ රේගු සහ ඊට අදාළ නීති යටතේ කටයුතු කරන ඉහළ අවදානම් සේවාදාකයන් සහ ප්‍රවාහන භාණ්ඩවලට වඩා ඔවුන්ට ඉහළ පහසුකම් සහ පිළිගැනීමක් ලබා දීමයි. රේගුවේ අරමුණ වන්නේ ආනයන හා අපනයනවලින් ලැබියයුතු ආදායම් එකතු කිරීමත්, රේගු සහ ඊට අදාළ නිති බලාත්මක කිරිමත්, නිත්‍යානුකූල වෙළඳාමට සහ මගීන්ට කාර්යක්ෂම හා ඵළදායි ලෙස පහසුකම් සැපයීමත්ය.

## අරමුණු

- ආනයන කිරීමෙන් ලැබිය යුතු ආදායම් අයකර ගැනීමට වගබලා ගැනීම.
- රේගු සහ අදාළ නිති යටතේ සීමා කිරීම් සහ බලාත්මක කිරීම්
- නිත්‍යානුකූල වෙළදාමට පහසුකම් සැපයීම.

ප්‍රධාන කාර්යයන්:

(i) ආනයනකරුවන් විසින් ඉදිරිපත් කරනු ලබන ආනයන රේගු ප්‍රකාශන නිරවද්‍යභාවය සඳහා තවදුරටත් පරීක්ෂා කිරීම.

(ii) අවදානම් කළමණාකරණය පදනම් කරගෙන විවිධ පරීක්ෂණ මට්ටම් යටතේ විවිධ පරීක්ෂණ බහාලුම් අංගනවලදී පරීක්ෂා කිරීම සඳහා භාණ්ඩ තේරීම.

((iii) නියමිත ආදායම එකතු කරනු ලබන බව, භාණ්ඩ ප්‍රකාශන නිසි පරිදි ඉදිරිපත් නොකිරීම සහ අනෙකුත් නිතිරීතිවලට හිතාමතාම අනුකූල නොවීම, හසුකර ගැනීම සහ වළක්වා ගැනීම තහවුරු කිරීම සඳහා නිවසේ භාවිතයට TIEP සහ ආයෝජන මණ්ඩලය වෙනුවෙන් බහාලුම් භෞතිකව පරීක්ෂා කිරීම.

(iv) වේගවත් නිශ්කාශන කටයුතු පහසු කරන මෙවලමක් වශයෙන් සහවා ගෙන එන සහ ප්‍රකාශ නොකළ භාණ්ඩ හසුකර ගැනීම සඳහා එක්ස්රේ ස්කෑන් යන්ත්‍ර භාවිතා කිරීම.

(v) අනුකූලවීමේ මට්ටම මත තෝරා ගත් ආනයනකරුවන්ට සමූහ පරීක්ෂාව අනුමත කිරීම.

### (1) 2015 ක්‍රියාකාරී සැලසුමේ කාර්යසාධනය සැසඳීම

**ආදායම් අරමුණු යටතේ ප්‍රධාන කාර්යයන්**

| ප්‍රධාන ක්‍රියාකාරකම | | ඉලක්කය% | තත්‍ය % | ඉටු නොකරන ලද්දේ නම් ඊට හේතු |
|---|---|---|---|---|
| 1. | ලබා දී ඇති අකෘති පත්‍රයේ සඳහන් හසුකරගත් සියලුම සිද්ධීන් පිළිබඳ ප්‍රතිචාරය මාසිකව ලබා දෙන ලෙසට මෙම අංශයේ ශාඛාවල සියලුම ප්‍රධානින්ට දැනුම් දීම. | 100 | 100 | |
| 2. | දී ඇති ආකෘති පත්‍රෙය් සඳහන් මානව සම්පත් පර්ෂදයේ විභාගවල ප්‍රථිඵල පිළිබඳ ප්‍රතිචාරය මාසිකව ලබාදෙන ලෙසට නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂවරයාට ( HRC) දැනුම් දීම. | 100 | 100 | |
| 3. | මධ්‍යම බුද්ධි ඒකකයට අවශ්‍ය තොරතුරු ලබා දීම. | 100 | 100 | |
| 4. | අවදානම් කළමණාකරන කමිටුවට අවශ්‍ය තොරතුරු ලබා දීම. | 100 | 100 | |
| 5. | ප්‍රගතිය පිළිබඳ වාරික සමාලෝචනය. | 100 | 100 | |

## (2) පාලන අරමුණු යටතේ ප්‍රධාන කාර්යයන්

| ප්‍රධාන ක්‍රියාකාරකම | | ඉලක්කය % | තත්‍ය % | ඉටු නොකරන ලද්දේ නම් ඊට හේතු |
|---|---|---|---|---|
| 1. | ස්කෑන් කළ යුතු බහාලුම් පිළිබඳ සියලුම පරීක්ෂණ ස්ථානවලින් අදහස් ලබාගැනීම. | 100 | 100 | |
| 2. | මෙම අංශයේ නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂගේ රැස්වීමේදී එම තොරතුරු විශ්ලේෂණය කිරීම සඳහා නිර්නායකය සකස් කිරීම. | 100 | 100 | |
| 3. | පරීක්ෂා කිරීමේ ඒකකයට හා අවදානම් කළමණාකරනයට දැනුම් දීම | 100 | 100 | |
| 4. | ප්‍රගතිය පිළිබඳ වාරික සමාලෝචනය. | 100 | 100 | |

## (3) වෙළඳාම් සඳහා පහසුකම් සැලසීමේ අරමුණු යටතේ ප්‍රධාන කාර්යයන්

| ප්‍රධාන ක්‍රියාකාරකම | | ඉලක්කය % | තත්‍ය % | ඉටු නොකරන ලද්දේ නම් ඊට හේතු |
|---|---|---|---|---|
| 1. | විශාල බහාලුම් සංඛ්‍යාවක අඩු අවදානම් වෙළඳ භාණ්ඩ ආනයන කරන පිළිගත් ආනයනකරුවන් හඳුනා ගැනීම. | 100 | 100 | |
| 2. | සමූහ පරීක්ෂාව සඳහා ප්‍රවාහන භාණ්ඩ සඳහා අවසර දෙනු ලබන ප්‍රවාහන භාණ්ඩ සංඛ්‍යාව ඉහළ දැමීම. | 100 | 100 | |
| 3. | හරිත ග්‍රීන් චැනල් යටතේ අවසර දෙනු ලබන බහාලුම් සංඛ්‍යාව ඉහල දැමීම | 100 | x | ග්‍රීන් චැනල් සංකල්පය ශ්‍රී ලංකා රේගුව තුළ දැනට ක්‍රියාත්මක නොවේ . |
| 4. | ප්‍රගතිය පිළිබඳ වාරික සමාලෝචනය | 100 | 100 | |

## (4) අනෙකුත් අරමුණු යටතේ ප්‍රධාන කාර්යයන්

| ප්‍රධාන ක්‍රියාකාරකම | | ඉලක්කය % | තත්‍ය % | ඉටු නොකරන ලද්දේ නම් ඊට හේතු |
|---|---|---|---|---|
| 1. | මෙම අංශයේ සියලුම නිලධාරීන් වෙනුවෙන් දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම | 100 | 100 | |
| 2. | මෑතකදී මෙම අංශයට මාරුවී පැමිණි නිලධාරීන් ඇතුළත් කිරීම සඳහා දැනටමත් සකස් කර ඇති ගුණාත්මක කව තුළ වෙනස්කම් සිදු කිරීම | 100 | 100 | |
| 3. | සේවක සේවා අංශය තුළින් නියම කර ඇති සියලුම ශාඛා තුළ එළඳායි ප්‍රමිතීන් ක්‍රියාත්මක කිරීම | 100 | 100 | |
| 5. | ප්‍රගතිය පිළිබඳ වාරික සමාලෝචනය | 100 | 100 | |

| කාර්යය සාධනය 2015-භාණ්ඩ පරීක්ෂණ අංශය | | | |
|---|---|---|---|
| | | | |
| විස්තරය | | 2014 | 2015 |
| | | රේගු සටහන් කර සංඛ්‍යාව | |
| පරීක්ෂණ මධ්‍යස්ථානවලදී ලියාපදිංචි කරන ලද නිවාසවල භාවිතය සඳහා ආනයනය කිරීමට අදාළ රේගු ප්‍රකාශන. | | 192,559 | 247,380 |
| | | | |
| පරීක්ෂණ අංගනය | Gray Line I | | 11,662 |
| | Gray Line II | | 15,988 |
| | HRC | | 1,165 |
| | ICD NNR | | 35,578 |
| | JCT | | 16,747 |
| | BQ | | 43,555 |
| | G/Pier | | 949 |
| | කොච්චිකඩේ | | 17,178 |
| | PVQ | | 172 |
| | RCT | | 108,182 |
| | | | |
| තෝරාගත් පරීක්ෂණ මාදිලිය | Amber | 162,742 | 189,114 |
| | Detail | 19,556 | 13,344 |
| | HRC | 1,600 | 1,041 |
| | Red | 1,572 | 554 |
| | වෙනත් (InFac, TIEP, etc...) | 7,378 | 43,327 |
| | | බහාලුම් සංඛ්‍යාව | |
| නිශ්කාෂණය සඳහා (නිවාසවල භාවිතය සඳහා) | | 177,633 | 251,176 |
| ස්කෑන් කරන ලද බහාලුම් සංඛ්‍යාව | | 17,797 | 10,737 |
| | | | |
| හසුකරගත් සිද්ධි සංඛ්‍යාව | | 49 | 31 |
| | | ශ්‍රී ලංකා රු. මිලියන | |
| අයකරගත් දඩ මුදල් | අතිරේක රේගු සටහන් කර මගින් අයකරගත් මුදල | 115.2 | 682.5 |
| | දඩ මුදල් | 24.2 | 6.5 |
| | රාජ සන්තක කළ භාණ්ඩවල වටිනාකම | 4.2 | 0.1 |



පරීක්ෂණ ක්‍රම (නිවාසවල භාවිත කරන)
Amber
Detail
HRC
Red
Other (InFac, TIEP, etc...)
0.42%
5.39%
0.22%
17.51%
76.45%




පරීක්ෂණ ක්‍රම (නිවාසවල භාවිත කරන)
Amber
Detail
HRC
Red
Other (InFac, TIEP, etc...)
0.82%
0.83%
3.83%
10.14%
84.39%


පරීක්ෂණ ස්ථානවලදී 2015 වර්ෂයේ නිෂ්කාෂණය කරන ලද ආනයන භාණ්ඩ (නිවසේ භාවිත කරන ලද)
1,000,000
100,000
10,000
1,000
100
10
1
Gray Line I
Gray Line II
HRC
ICD NNR
JCT
BQ
G/Pier
Kochikade
PVQ
RCT
No of Cusdecs Registered for Home Use


2014 -2015 වර්ෂ වල රේගු ප්‍රකාශන සහ බහාලුම් සංසන්දනය කිරීම
300,000
250,000
200,000
150,000
100,000
50,000
0
2014
2015
No. of Imports CusDecs ( Home use-LCL & FCL ) registered at examination points
No. of Containers cleared ( Home use)







**වැඩි දියුණු කිරීම සඳහා වන යෝජනා**

- අවධානම් කළමණාකරන
- ස්වංක්‍රීය වරණීයතාවය ක්‍රියාත්මක කිරීම.
- RCT වලදී බහාලුම් සංචලන පද්ධතිය ක්‍රියාත්මක කිරීම
- පරීක්ෂණ ස්ථානවලදී රේගු දත්ත සඳහා වන ස්වංක්‍රීය පද්ධතිය තුළ පිටවීමේ සටහන ක්‍රියාත්මක කිරීම
- භාණ්ඩ පරීක්ෂණය පදනම් කර ගත් බුද්ධි තොරතුරු පිළිබඳ කාර්යය මණ්ඩලයට පුහුණුව ලබා දීම.

## අවසන් කිරීම

භාණ්ඩ නිෂ්කාශන ක්‍රියාපටිපාටියේ ඉතා වටිනා කාර්යභාර්යක් වන "භාණ්ඩ භෞතිකව පරීක්ෂා කිරීම" භාණ්ඩ පරීක්ෂණ අංශයට අනුයුක්තව සේවය කරන නිලධාරීන් විසින් සිදු කරනු ලබයි. ක්‍රියාපටිපාටිය හා නිලධාරීන්ගේ කාර්යක්ෂමතාවය හා ඵලදායිත්වය අවම නිෂ්කාශන කාලයක් සහ මෙම අංශය විසින් ඇති කරන ලද අරමුණු මුදුන් පමුණුවා ගැනීමට සඳහා මූලික වන්නේය.

2015 වර්ෂට සාපේක්ෂව 2014 වර්ෂයේදී පරීක්ෂණ සඳහා ලියාපදිංචි කරන ලද රේගු ප්‍රකාශන සංඛ්‍යාව සංසන්දනය කිරීමේදී රේගු ප්‍රකාශන සංඛ්‍යාව 54,821 කින් ඉහළ ගොස් ඇති බව එයින් පෙන්නුම් කරන අතර 2014 වර්ෂයට වඩා 2015 වර්ෂයේදී නිෂ්කාශනය කරන ලද බහාලුම් සංඛ්‍යාව 73,543 කින් ඉහළ ගොස් ඇත.

වර්තමානයේදී අතීත දොරටුපාල රැකියාවේ සිට ලෝක රේගු බලධාරීන්ගේගේ නැඹුරුව ක්‍රම ක්‍රමයෙන් පහසුකම් සපයන්නාගේ කාර්යභාර්යය දෙසට ගමන් කරන බැවින් අනුකූලව කටයුතු කරන අපනයනකරුවන්ට පහසුකම් සැපයීමට වඩාත් ඉඩකඩ සලසමින් 2015 වර්ෂය සඳහා මෙම අංශය විසින්ද ක්‍රියාකාරී සැලැස්මක් සකස් කරන ලදී. 2015-2014 වර්ෂය අතර නිෂ්කාශන දත්ත සංසන්දනය කිරීම මගින් මෙම තත්වය දැකගත හැකිය. භාණ්ඩ වරණීයතාවයට අදාළ තොරතුරු සැලකිල්ලට ගැනීමේදී 2014 වර්ෂයේදී පරීක්ෂණ AMBER CHANEL යටතේ පරීක්ෂණ 77%ක් සිදු කළද එම ප්‍රමාණය 2015 වර්ෂයේදී 88.39% දක්වා ඉහළ ගොස් ඇත. පහසුකම් සැපයීමේ සංකල්පය නංවාලීම මගින් සමූහ පරීක්ෂාවක් වශයෙන් භාණ්ඩ ලබාගන්නාගේ ප්‍රවාහනයේදී සැලකිය යුතු තෝරාගත් භාණ්ඩ ප්‍රමාණයක් AMBER CHANEL යටතේ පරීක්ෂා කරනු ලැබේ. මෙම පහසුකම ඔවුන්ගේ අනුකූලතා මට්ටම පදනම් කරගෙන සිදු වේ.

2015 වර්ෂයේ කාර්යසාධන සැලකිල්ලට ගැනීමේදී වර්ෂ අවසානයේදී ක්‍රියාකාරී සැලැස්මේ තෝරාගත් ඉලක්ක 99%ක් ඉටු කරනු ලැබ ඇත. භාණ්ඩ පරීක්ෂණය සඳහා ග්‍රීන් චැනල් සංකල්පය දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක නොකරන නිසා ක්‍රියාකාරී සැලැස්මේ "ග්‍රීන් චැනල් යටතේ අවසර ලබා දී ඇති බහාලුම් සංඛ්‍යාව ඉහළ දැමීම" යනුවෙන් විස්තර කරනු ලැබ ඇති ඉලක්ක සපුරාලීමට නොහැකි වී ඇත.

කෙසේ වුවද, මෙම අංශයේ ඵලදායිතාවය ඉහළ නැංවීම සහ නිත්‍යානුකූල ආනයනකරුවන්ට පහසුකම් සැපයීම සඳහා ඉහත දක්වා ඇති යෝජනා ක්‍රියාත්මක කිරීමට නිර්දේශ කරනු ලැබේ.

# මගී සේවා (කොළඹ) අංශය

**අරමුණ-:**

කොළඹ වරායේදී හා මගීන් හා කැටුව නොඑන භාණ්ඩ (UPB) ගබඩාවලදී මගීන් හා වෙනත් සම්බන්ධිත ආයතනවල භාණ්ඩ නිෂ්කාශනයේදී විදේශගත වූවන් හා මව්බිමට නැවත එන අය සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කරමින් ඔවුනට කාර්යක්ෂම හා ආචාරශීලී සේවාවක් සැපයීම.

ප්‍රධාන කාර්යයන්

1. රටින් බැහැරව හා රටට පැමිණෙන මගීන් හා භාණ්ඩ නිශ්කාෂනය පහසු කිරීම
2. ආදායම් සුරක්ෂිත කිරීම හා තහනම් කරන ලද හා සීමා කරන ලද භාණ්ඩ ආනයනය හා අපනයනය වැලැක්වීම
3. සමාජ ආර්ථික, සංස්කෘතික හා පාරිසරික අපේක්ෂාවන් ආරක්ෂා කිරීම
4. UPB ගබඩා පාලනය හා නියාමනය කිරීම

**මෙම අංශයේ කාර්ය සාධන - 2015**

| | මලු සංඛ්‍යාව | දඩමුදල් | අතිකාල | බදු හා අයබදු | එකතුව |
|---|---|---|---|---|---|
| BO (සමූහ පරීක්ෂණ) | 0 | 263000 | 0 | 10338481 | 10601481 |
| BO (කවුන්ටරය) | 0 | 0 | 0 | 0 | 0 |
| BO (විකුණුම්) | 0 | 0 | 0 | 1872064 | 1872064 |
| BO (NNR) | 58146 | 3119876 | 0 | 29017376 | 32137252 |
| ලක්සිරි සේවා | 72233 | 1880953 | 4570083 | 31600614 | 38051650 |
| ට්‍රාන්ස්කෝ | 78409 | 285500 | 3637952 | 21636313 | 25559765 |
| මිඩ්කෝ | 64067 | 624723 | 3317034 | 12247141 | 16188898 |
| ට්‍රයිකෝ(කොළඹ) | 89427 | 2829556 | 3663159 | 35579049 | 42071764 |
| CSL (කොළඹ) | 84576 | 2504370 | 3511314 | 41125508 | 47141192 |
| එකතුව | 446858 | 11507978 | 18699542 | 183416546 | 213624066 |

## 2014/ 2015 වර්ෂවල මූල්‍ය කාර්යසාධන සසඳා බැලීම (රු)

| | මලු සංඛ්‍යාව 2013 | මලු සංඛ්‍යාව 2014 | දඩ මුදල් 2013 | දඩ මුදල් 2014 | අතිකාල 2013 | අතිකාල 2014 | බදු 2013 | බදු 2014 |
|---|---|---|---|---|---|---|---|---|
| **BO (සමූහ පරීක්ෂණ)** | - | - | - | 263,000 | - | - | 3,077,309 | 10,338,481 |
| **BO (කවුන්ටරය)** | - | - | 12,165,014 | - | - | - | 25,388,899 | - |
| **BO (විකුණුම්)** | - | - | 2,842,008 | - | - | - | 8,088,600 | 1,872,064 |
| **BO (NNR)** | 16,685 | 58,146 | 1,256,520 | 3,119,876 | - | - | 29,548,856 | 29,017,376 |
| **ලක්සිරි සේවා** | 60,076 | 72,233 | 463,078 | 1,880,953 | 3,866,085 | 4,570,083 | 25,444,072 | 31,600,614 |
| **ට්‍රාන්ස්කෝ** | 71,171 | 78,409 | 998,600 | 285,500 | 2,588,493 | 3,637,952 | 22,457,618 | 21,636,313 |
| **මිඩ්කෝ** | 49,289 | 64,067 | 945,013 | 624,723 | 2,701,784 | 3,317,034 | 14,914,833 | 12,247,141 |
| **ට්‍රයිකෝ(කොළඹ)** | 85,119 | 89,427 | 883,771 | 2,829,556 | 3,318,279 | 3,663,159 | 32,107,656 | 35,579,049 |
| **CSL (කොළඹ)** | 83,776 | 84,576 | 1,703,337 | 2,504,370 | 2,887,315 | 3,511,314 | 47,186,782 | 41,125,508 |
| | 366,116 | 446,858 | 21,257,341 | 11,507,978 | 15,361,956 | 18,699,542 | 208,214,625 | 183,416,546 |

**2014/2015 වර්ෂවල ගමන් බඩු සංචලනය සසඳා බැලීම**

| | මලු සංඛ්‍යාව 2014 | මලු සංඛ්‍යාව 2015 |
|---|---|---|
| BO (සමූහ පරීක්ෂණ) | - | - |
| BO (කවුන්ටරය) | - | - |
| BO (විකුණුම්) | - | - |
| BO (NNR) | 16,685 | 58,146 |
| ලක්සිරි සේවා | 60,076 | 72,233 |
| ට්‍රාන්ස්කෝ | 71,171 | 78,409 |
| මිඩ්කෝ | 49,289 | 64,067 |
| ට්‍රයිකෝ(කොළඹ) | 85,119 | 89,427 |
| CSL (කොළඹ) | 83,776 | 84,576 |
| එකතුව | 366,116 | 446,858 |



## 2014/2015 වර්ෂවල දඩ මුදල් අයකර ගැනීම සසඳා බැලීම

| | 2014 | 2015 |
|---|---|---|
| BO (සභාව) | - | 263,000 |
| BO (කවුන්ටරය) | 12,165,014 | - |
| BO (විකුණුම්) | 2,842,008 | - |
| BO (NNR) | 1,256,520 | 3,119,876 |
| ලක්සිරි සේවා | 463,078 | 1,880,953 |
| ට්‍රාන්ස්කෝ | 998,600 | 285,500 |
| මිඩ්කෝ | 945,013 | 624,723 |
| ට්‍රයිකෝ(කොළඹ) | 883,771 | 2,829,556 |
| CSL (කොළඹ) | 1,703,337 | 2,504,370 |
| එකතුව | 21,257,341 | 11,507,978 |



## 2014/2015 වර්ෂවල අතිකාල අයකර ගැනීම සසඳා බැලීම

| | 2014 | 2015 |
|---|---|---|
| BO (සභාව) | - | - |
| BO (කවුන්ටරය) | - | - |
| BO (විකුණුම්) | - | - |
| BO (NNR) | - | - |
| ලක්සිරි සේවා | 3,866,085.00 | 4,570,083 |
| ට්‍රාන්ස්කෝ | 2,588,493.00 | 3,637,952 |
| මිඩ්කෝ | 2,701,784.00 | 3,317,034 |
| ට්‍රයිකෝ(කොළඹ) | 3,318,279.00 | 3,663,159 |
| CSL (කොළඹ) | 2,887,314.50 | 3,511,314 |
| එකතුව | 15,361,955.50 | 18,699,542 |




## 2014/2015 වර්ෂවල බදු අයකර ගැනීම සසඳා බැලීම

| | 2014 | 2015 |
|---|---|---|
| BO (සභාව) | 3,077,309 | 10,338,481 |
| BO (කවුන්ටරය) | 5,388,899 | - |
| BO (විකුණුම්) | 8,088,600 | 1,872,064 |
| BO (NNR) | 29,548,856 | 29,017,376 |
| ලක්සිරි සේවා | 25,444,072 | 31,600,614 |
| ට්‍රාන්ස්කෝ | 22,457,618 | 21,636,313 |
| මිඩ්කෝ | 14,914,833 | 12,247,141 |
| ට්‍රයිකෝ(කොළඹ) | 32,107,656 | 35,579,049 |
| CSL (කොළඹ) | 47,186,782 | 41,125,508 |
| එකතුව | 208,214,625 | 183,416,546 |

# අපනයන අංශය

## හැඳින්වීම

අපනයන අංශය ක්‍රියාපරිපාටිය සරල කිරීම තුලින් හා අපනයන රේගු ප්‍රකාශන විද්‍යුත් ක්‍රමය හඳුන්වා දීම මගින් නිත්‍යානුකූල අන්තර්ජාතික භාණ්ඩ සංචලනය ධෛර්යමත් කරන අතර, ඍජු අපනයන හා ප්‍රතිඅපනයන නිෂ්කාශනය කිරීමේ කටයුතුවලට අපනයන අංශය පහසුකම් සලසාලයි. එමෙන්ම මෙම අංශය රටේ සංස්කෘතික, පාරිසරික හා සමාජ අභිලාෂයන් ආරක්ෂා කිරීම පිළිබඳ වගකීමද දරනු ලබයි.

**ප්‍රධාන කාර්යයන්**

1. මෙම අංශය, වරාය මගින් හා ගුවන් මගින් කරනු ලබන අපනයන සම්බන්ධව සියලු කටයුතු සම්බන්ධයෙන් මෙම අංශය කටයුතු කරයි.
2. රටෙන් අපනයනය කරනු ලබන සියලු භාණ්ඩ සම්බන්ධ සෑම කරුණකටම දායක වේ.
3. අපනයන භාණ්ඩ රේගු අවශ්‍යතා සහ ආරක්ෂක අවශ්‍යතා සඳහා පරීක්ෂා කිරීම.
4. අපනයන බදු, සෙස් බදු, රාජ්‍ය භාග සියලු අපනයනය කරනු ලබන භාණ්ඩ සම්බන්ධයෙන් අය කිරීම.
5. කොළඹ හා තදාසන්න ප්‍රදේශවල බහාලුම් නවතන ස්ථාන කළමනාකරණය.
6. MCC තොග ගබඩාව පවත්වාගෙන යාම.
7. Carnet ක්‍රමය යටතේ තාවකාලික ආනයන/අපනයන පහසු කරවීම.
8. ආපසු ගෙවීම් ඉල්ලීම් අනුමත කිරීම.
9. නැව්ගත කිරීමේ සහතික නිකුත් කිරීම.
10. තීරුබදු ප්‍රතිදාන ලේඛන සහතික කිරීම.
11. නිදහස් ප්‍රතිඅපනයන සහතික ලියාපදිංචිය.
12. මූලික නිතිරීතිවලට අදාළව වෙළඳ දෙපාර්තමේන්තුව නැව්ගත කිරීම සහතික කිරීම.
13. ප්‍රතිනැව්ගත කිරීම් කටයුතු පහසු කරලීම.
14. ජාතික වෙළඳ සංඛ්‍යාත සැපයීම.
15. ජාතියේ සමාජ ආර්ථික, සංස්කෘතික හා පාරිසරික අවශ්‍යතා ආරක්ෂා කිරීම
16. පුද්ගලික අංශය, රාජ්‍ය ආයතන ඇතුළුව සියලු පාර්ශවකරුවන් සමඟ සහයෝගිතාවය ගොඩ නැගීම.
17. සියලු ව්‍යාපාරික ක්‍රියාවලීන්හි කාර්යක්ෂමතාවය හා ඵලදායිතාවය නිරන්තරයෙන් වර්ධනය කෙරෙන ආකාරයට පද්ධති හා ක්‍රියාපටිපාටි ක්‍රියාවට නැගීම.
18. අපනයන වෙළඳාම පහසු කිරීම සඳහා තොරතුරු තාක්ෂණය උපරිම ආකාරයට භාවිතයට ගැනීම .

## මෙම අංශයේ කාර්ය සාධන - 2015

<u>අපනයන ආදායම් සටහන්</u> – 2015

| | අපනයන කාර්යාලය කොළඹ සහ EFC 2015 (රු) | ගුවන් භාණ්ඩ අපනයන කාර්යාලය කටුනායක - 2015(රු) | එකතුව |
|---|---|---|---|
| **EEC** | 1,920,653,352/- | - | 1,920,653,352/- |
| අපනයන බද්ද **(CCBO)** | 18,555,815/- | - | 18,555,815/- |
| **සෙස් - රබර්** | 245,181/- | - | 245,181/- |
| **සෙස් - තේ** | 672,363,791/- | - | 672,363,791/- |
| **සෙස් - පොල්** | 92,487,099/- | 2,717/- | 92,489,816/- |
| පරීක්ෂණ ගාස්තු | 53,038,110/- | 19,918,355/- | 72,956,465/- |
| රාජ්‍ය භාගය | 36,545/- | - | 36,545/- |
| *ආනයන බදු **(1/10)** | 4,291,326/- | - | 4,291,326/- |
| *වරාය හා ගුවන් තොටුපල බද්ද **(1/10)** | 1,198,521/- | - | 1,198,521/- |
| වෙනත් | 28,287/- | - | 28,287/- |
| දඩ මුදල් | 31,794,790/- | 3,587,741/- | 35,382,531/- |
| රාජසන්තක කිරීම් | - | - | - |
| අතිකාල ගාස්තු | 21,749,300/- | 34,706,704/- | 56,456,004/- |
| නැව්ගත කිරීම සහතික කිරීමේ ගාස්තු | 110,750/- | - | 110,750/- |
| පරිගණක ගත කිරීමේ ගාස්තු | 21,930,000/- | 18,537,400/- | 40,467,400/- |
| එකතුව | **2,838,482,867** | **76,752,917** | **2,915,235,794** |

* නැවත අපනයනය කරන අවස්ථාවේදී අය කර ගන්නා ලදී.

**01.** <u>ඉදිරිපත් කරන ලද සහ සම්පූර්ණ කරන ලද රේගු සටහන්කර සංඛ්‍යාව</u>

| | | |
|---|---|---|
| අපනයන කාර්යාලය | - | 86,397 |
| ගුවන් බඩු කාර්යාලය | - | 72,780 |
| ශ්‍රී ලංකා ගුවන් බඩු කාර්යාලය | - | 1,190 |
| එකතුව | **-** | **160,367** |

**02.** <u>සමූහ පරීක්ෂණය</u>

පරීක්ෂණ සංඛ්‍යාව - 14,133

**03.** <u>එකතු කර ගන්නා ලද පරීක්ෂණ ගාස්තු</u>

| | | |
|---|---|---|
| අපනයන කාර්යාලය (O/E) | - | 53,038,110/- |
| ගුවන් බඩු කාර්යාලය (O/E) | - | 19,918,355/- |
| **එකතුව** | **-** | **72,956,465/-** |

**04.** <u>එකතු කර ගන්නා ලද පරිගණක ගාස්තු</u>

| | | |
|---|---|---|
| අපනයන කාර්යාලය | - | 21,930,000/- |
| ගුවන් බඩු කාර්යාලය | - | 17,398,900/- |
| ශ්‍රී ලංකා ගුවන් සේවය | - | 1,138,500/- |
| එකතුව | **-** | **20,730,400/-** |

**05.** <u>එකතු කර ගන්නා අපනයන බද්ද</u>

| | | |
|---|---|---|
| අපනයන බද්ද | - | 18,555,815/- |
| රාජ්‍ය භාගය(Royalty) | - | 36,545/- |
| සෙස්: a) CC1 | - | 92,489,816/- |
| b) TC1 | - | 671,777,321/- |
| c) TC2 | - | 586,470/- |
| d) RC1 | - | 242,556/- |
| e) RC4 | - | 2,625/- |
| f) EEC | - | 1,920,653,352/- |
| g) ආනයන බදු (1/10) | - | 4,291,326/- |
| h) PAL (1/10) | - | 1,198,521/- |
| වෙනත් | - | 28,287/- |

**06.** **<u>සෙස් බද්ද</u>**

| | | |
|---|---|---|
| a) CC1 | - | පොල් සංවර්ධන මණ්ඩලයේ සෙස් බද්ද |
| b) TC1 | - | තේ මණ්ඩල සෙස් බද්ද |
| c) TC2 | - | තේ වෛද්‍ය ආධාර - සෙස් බද්ද |
| d) RC1 | - | රබර් සෙස් බද්ද |
| e) RC4 | - | රබර් වෛද්‍ය සෙස් බද්ද |
| f) EEC | - | අපනයන ප්‍රවර්ධන මණ්ඩල සෙස් බද්ද |

**07.** **<u>අතිකාල ගෙවීම්</u> (රු)**

| | | |
|---|---|---|
| අපනයන කාර්යාලය | - | 1 ,248,750/- |
| ගුවන් බඩු කාර්යාලය | - | 33,827,444/- |
| ශ්‍රී ලංකා ගුවන් සේවය | - | 879,260/- |
| CFS අංගනය | - | 20,223,650/- |
| ශ්‍රී ලංකා ගුවන්භාණ්ඩ කාර්යාලය | - | 276,900/- |
| එකතුව | **-** | **56,456,004/-** |

**08.** <u>ජංගම ගිණුම්</u>

| | | |
|---|---|---|
| i. ජංගම ගිණුම් හිමිකරුවන්ගේ සංඛ්‍යාව | - | 46 |
| ii. සක්‍රීය ජංගම ගිණුම් සංඛ්‍යාව | - | 35 |
| iii. කාල පරාසය තුළදී තැම්පතු ප්‍රමාණය (රු.) | - | 292,005,692 |
| iv. කාල පරාසය තුළදී ගිණුමෙන් අඩු වූ ප්‍රමාණය | - | 1,467,013,298 |

**09.** <u>ඉල්ලීම මත නිකුත් කළ **FRIC** සංඛ්‍යාව</u> **-** **807**

**10.** <u>නිකුත් කරන ලද නැව් සහතික</u> **-** **443**

**11.** <u>නැව් සහතික නිකුත් කිරීමේ ගාස්තු එකතුව(රු)</u>

| | | |
|---|---|---|
| සහතික ගාස්තු | - | 110,750/- |

**12.** <u>**අයකර ගන්නා ලද** නැව් හා ගුවන් යානා සංශෝධන ගාස්තු</u>

| | | |
|---|---|---|
| අපනයන කාර්යාලය (දඩ) | - | 1,386,375/- |
| ගුවන් භාණ්ඩ කාර්යාලය (දඩ) | - | 3,587,741/- |
| අපනයන පහසු කිරීමේ මධ්‍යස්ථානය | - | 6,533,415/- |
| **එකතුව** | **-** | **11,507,531/-** |

**13.** <u>ප්‍රති නැව්ගත කිරීම්</u>

| | | |
|---|---|---|
| මුළු තැන්පතු සංඛ්‍යාව (නැව්) | - | 1,137,960 |
| නැව් ගත කරන ලද බාහාලුම් සංඛ්‍යාව | - | 1,395,566 |

**14.** **<u>රේගු වැරදි සදහා දඩ අයකර ගැනීම්</u> (රු)** - 23,875,000/-

**15.** **<u>අපනයනය කරන ලද මුළු බාහාලුම් සංඛ්‍යාව</u>** - 172,725

# සහය සේවා පර්ෂදය

# ප්‍රතිපත්ති, සැලසුම් හා පර්යේෂණ අංශය

## හැඳින්වීම

ප්‍රතිපත්ති, සැලසුම් හා පර්යේෂණ අංශය ප්‍රධාන වශයෙන්ම ප්‍රතිපත්තිමය ගැටළු, තීරුබදු ගැටළු හා අන්තර්ජාතික කටයුතු පිළිබඳ වගකීම දරයි. එම අංශයේ පුළුල් අරමුණු පහත දැක්වෙන පරිදි සංක්ෂිප්ත කොට දැක්විය හැකිය.:

1. දෙපාර්තමේන්තුවේ ප්‍රතිපත්තිමය කරුණු වැඩිදියුණු කිරීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයාට සහාය වීම හා එම ප්‍රතිපත්ති අදාළ අංශයන් මගින් ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියාපටිපාටි බවට පත් කිරීම, එකී තීරණ නිලධාරීන්ගේ දැන ගැනීමට හා අනුගත වීම සඳහා දැනුම් දීම.

2. රේඛීය අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ඉල්ලා සිටි විට,
   (i) ආර්ථික/වෙළඳ ප්‍රතිපත්ති වැඩි දියුණු කිරීම සහ
   (ii) එම ප්‍රතිපත්ති තීරුබදු උපාය මාර්ග බවට පත් කිරීම යන කටයුතුවලට සහාය වීම;

3. තීරුබදු උපාය මාර්ග මහජනතාවට හා නිලධාරීන්ට අවශ්‍ය පරිදි දැනගැනීමට හා ක්‍රියාත්මක කිරීම සඳහා සහාය ලබාදීම.

4. ජාතික රේගු තීරුබදු නිරතුරුවම යාවත්කාලීන ලෙස පවත්වාගෙනයාම සහතික වීම, සියලුම තීරුබදු සම්බන්ධ විමසුම්වලට අවශ්‍ය කටයුතු කිරීම, තීරුබදු සම්බන්ධ ආරවුල් නිරාකරණය කිරීම.

5. රේගු තොරතුරු මධ්‍යස්ථානය මගින් මහජනතාව වෙත ස්වයං අනුගතවීම සඳහා අවශ්‍ය තොරතුරු ලබාදීම.

6. ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව ලෝක රේගු සංවිධානයේදී හා එහි ප්‍රාදේශීය සංවිධානවලදී හා අනෙකුත් අන්තර්ජාතික සංවිධාන (ලෝක රේගු සංවිධානය හා බහුවිධ පාරිසරික ගිවිසුම්) හා ද්විපාර්ශවික හා බහු පාර්ශවික වෙළඳ සංවිධානවලදී නියෝජනය කිරීම.

7. දෙපාර්තමේන්තුවේ දක්ම ළඟා කරගනු පිණිස ලෝක රේගු සංවිධානයේ නිර්දේශ හා සාර්ථක අත්දැකීම් ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටි බවට පත් කිරීම මගින් එම සංවිධානයේ කටයුතුවලට අනුගත වීම.

**ප්‍රධාන කාර්යයන්:**

1. රේගු සම්බන්ධ තොරතුරු වහාම හා නිවැරදිව ඉදිරිපත්කිරීම.
2. දේශ සීමා නියෝජිතයන් සමඟ අඛණ්ඩ සම්බන්ධතා පැවැත්වීම.
3. ව්‍යාපාර ක්‍රියාවලි ප්‍රතිසංවිධානය.
4. උපාය මාර්ග සැලැස්ම සකස් කිරීම සඳහා රේගු අධ්‍යක්ෂ ජනරාල්/අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (ආයතන) සහයෝගය ලබාදීම.
5. වාර්ෂික කාර්ය සැලැස්ම සකස් කිරීම සඳහා රේගු අධ්‍යක්ෂ ජනරාල්/අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (ආයතන) සහයෝගය ලබාදීම.
6. රේගු ප්‍රතිපත්ති හා පටිපාටිය, බදු හා වෙළඳ පහසුකම් සම්බන්ධ අවස්ථාවලදී රේගු අධ්‍යක්ෂ ජනරාල්/අතිරේක අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට සහභාගීවීම.
7. ජාත්‍යන්තර රේගු දිනය සංවිධානය කිරීම හා සැමරීම.
8. දෙපාර්තමේන්තු නියෝග (DOPLs) නිසි පරිදි බෙදා හැරීමට කටයුතු කරන බවට සහතික කිරීම.
9. ජාතික රේගු නාමාවලිය බෙදා හැරීමට කටයුතු කරන බවට සහතික කිරීම.
10. රේගු තොරතුරු සම්බන්ධ පර්යේෂණයන් සිදු කිරීම.

| ප්‍රධාන ක්‍රියාකාරකම් | ඉලක්කය | තත්‍ය | ඉටු නොකරන ලද්දේ නම් ඊට හේතු |
|---|---|---|---|
| 2015 වසර සඳහා ජාතික තීරු බදු නාමාවලිය ප්‍රකාශනය | වසරේ 1 වන කාර්තුවේදී ප්‍රකාශනය කිරීම | 1 වන කාර්තුවේදී ප්‍රකාශනය කරන ලදී | - |
| ජාත්‍යන්තර රේගු දිනය සැමරුම සංවිධානය කිරිම | වසරේ 1 වන කාර්තුවේදී සංවිධානය කිරිම | 1 වන කාර්තුවේදී සංවිධානය කරන ලදී | - |

## රේගු තිරුබදු නාමාවලිය

ශ්‍රී ලංකා රේගුවට අන්තර්ජාතික වෙළඳාමේදී පනවා ඇති සියලු බදු රැස් කිරීම පිළිබඳ වගකීම පැවරී ඇත. 2015 වර්ෂය තුළ ආනයන භාණ්ඩ සම්බන්ධයෙන් රේගුව විසින් ආනයන බද්ද, නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බද්ද, ආනයන සෙස් බදු, වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බදු, එකතු කළ අගය මත බද්ද, ජාතිය ගොඩනැගීමේ බද්ද යන බදු මගින් ආදායම් රැස්කර ඇත. සමහර අපනයන භාණ්ඩ සම්බන්ධයෙන් අපනයන බදු හා අපනයන සෙස් බදු ගෙවිය යුතුවේ. මීට අමතරව ශ්‍රී ලංකාව හා ද්විපාර්ශ්වික හා බහු පාර්ශ්වික වෙළඳ ගිවිසුම් ඇති කරගත් රටවල නිෂ්පාදන භාණ්ඩ සඳහා අදාළ වන වරණීය සහ වරණීය තීරුබදු අනුපාත තෝරා ගත් භාණ්ඩවලට පනවා ඇත. භාණ්ඩ සඳහා අයවියයුතු රේගු බදු හා බදු අනුපාත තනි පොතකට අන්තර්ගත කරමින් රේගු දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික තීරුබදු නාමාවලියක් එළිදැක්වීමට කටයුතු යොදා ඇත

### ජාතික උප අංශ (NSD)

අයවැය යෝජනාවලට ඇතුළත් කළයුතු සංයෝජිත වෙළඳ භාණඩ විස්තර හා සංකේතාංක ක්‍රමයට අදාළ ජාතික උප අංශ පිළිබඳ යෝජනා ශ්‍රී ලංකා රේගුව විසින් වෙළඳ හා ආයෝජන දෙපාර්තමේන්තු වෙත ඉදිරිපත් කරනු ලබයි.

## දෙපාර්තමේන්තුමය චක්‍රලේඛ

ප්‍රතිපත්තිමය තීරණයක් සන්නිවේදනය කිරීමට අවශ්‍ය වූ විට දෙපාර්තමේන්තුමය චක්‍රලේඛ නිකුත් කරනු ලැබේ. එමෙන්ම පවත්නා ක්‍රියාපරිපාටින්හි වෙනසක් සිදු වූ විටද, නව ක්‍රියාපරිපාටි හඳුන්වාදීමට අවශ්‍ය වූ විටද, එසේ නැතහොත් ක්‍රියාපරිපාටි අත්පොතෙහි වෙනසක් සිදු වූ විටද මේ ආකාරයට දෙපාර්තමේන්තු චක්‍රලේඛ නිකුත් කරනු ලැබේ. එහි ප්‍රතිඵලයක් ලෙස දෙපාර්තමේන්තු චක්‍රලේඛ වැදගත් නිල ප්‍රවෘත්ති මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියා කරයි. අදාළ අංශයන්හි ප්‍රතිපත්ති පිළිබඳ සංකල්ප බිහිවන අතර ඒවා ප්‍රතිපත්ති සැලසුම් හා පර්යේෂණ අංශයට යොමු කෙරේ.පවත්නා චක්‍රලේඛ සමඟ අන්තර්ගතය හා ක්‍රියාපටිපාටි සසඳා නොගැලපීම් ඇත්දැයි පරීක්ෂා කොට අවසාන වශයෙන් එහි පෙළ සකස් කෙරේ. ඉන්පසු එම චක්‍රලේඛය නිල ස්වරූපයක් දරන අතර නියමිත ආකෘතියට අනුව සැකසේ. එය අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අනුමත කිරීමෙන් පසුව මුද්‍රණය කොට කාර්ය මණ්ඩලය අතර බෙදා හැරේ.

ආදායම් ආරක්ෂණ නියෝග තවත් චක්‍රලේඛ විශේෂයක් වන මෙමගින් බදු හා අය බදුවල වෙනස්කම් සන්නිවේදනය කරනු ලබන අතර, එමගින් නිලධාරීන්ට ඒවා බලාත්මක වන දිනයේ හා වේලාවේ සිටම නව අනුපාතයන්ට අනුව ආදායම් රැස්කරගැනීමට ඉඩ ලැබේ. මෙකී වෙනස්කම් මහා භාණ්ඩාගාරයෙන් නිකුත් වන අතර මෙම නියෝග බදුකරණයේදී අත්‍යවශ්‍ය කොටසක් ඉටු කරනු ලබයි.

## හුවමාරු අනුපාත චක්‍රලේඛ

බැංකු සහ මුදල් හුවමාරු කරන ආයතන භාවිතා කරන්නා වූ නිරන්තරයෙන්ම විචලනය වන (පාවෙන) විනිමය අනුපාතික වෙනුවට, ලංකා මහ බැංකුව විසින් නියම කර ඇති පරිදි ලංකා රේගුව භාවිතා කරන්නේ එක් වැඩකරන සතියක කාලයක් සඳහා අදාළ කරගත හැකි සාමාන්‍ය විනිමය අනුපාතියකි. සියළුම රේගු බදු මෙන්ම අනෙකුත් අය කිරීම් (235 අධිකාරිය) යටතේ ගෙවියයුතු අනෙකුත් සියළුම ගාස්තු, දඩ සහ අහිමි කිරීම් ගෙවීම සඳහා අදාල වන මෙම හුවමාරු අනුපාතය තීරණය කරනු ලබන්නේ රේගුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් වන අතර, එය සෑම සිකුරාදාවකම ප්‍රකාශයට පත් කර ප්‍රතිපත්ති, සැලසුම්කරණ සහ පර්යේෂණ අංශය විසින් රේගු ප්‍රකාශන ^CusDec& සම්බන්ධයෙන් කටයුතු කරන සියළුම ඒකකවලට සහ රේගු වෙබ් අඩවියේ පල කිරීම සඳහා තොරතුරු සන්නිවේදන තාක්ෂණ අංශය වෙත බෙදා හරනු ලැබේ. මෙම චක්‍රලේඛය සියළුම නිලධාරීන්ට මෙන්ම වෙළඳුන්ට ද අත්‍යාවශ්‍ය මාර්ගෝපදේශයකි.

## ජාත්‍යන්තර මට්ටමේ කටයුතු

රේගුව සම්බන්ධ ජාත්‍යන්තර සබඳතා පිළිබඳ වගකීම ද දරනු ලබන්නේ ප්‍රතිපත්ති, සැලසුම්කරණ සහ පර්යේෂණ අංශය විසිනි. රේගුවේ ජාත්‍යන්තර මට්ටමේ කටයුතු ශක්තිමත් කිරීම හා වඩාත් හොඳින් කළමනාකරණය කරගැනීමේ අදහස ඇතිව රේගු ජාත්‍යන්තර කටයුතු අංශය පිහිටුවා ඇත. ලෝක රේගු සංවිධානය හා එහි ආසියා පැසිෆික් කලාප කාර්යාලය, විදෙස් රටවල රේගු පරිපාලන ආයතන සහ අදාළ වන අනෙකුත් ජාත්‍යන්තර ආයතන සමඟින් රේගුව සම්බන්ධ ජාත්‍යන්තර කටයුතු පිළිබඳව සම්බන්ධීකරණය සහ සන්නිවේදනය කරමින් ඔවුන්ට රේගුව සමඟින් සම්බන්ධ විය හැකි කේන්ද්‍රයක් ලෙස කටයුතු කිරීම එහි කාර්යභාරයට ඇතුළත් වේ. ලෝක රේගු සංවිධානයෙන් නිරන්තරයෙන්ම විවිධ කරුණු පිළිබඳ සන්නිවේදනය කරන අතර මෙම අංශය මගින් ඊට නිසි ප්‍රතිචාර දක්වනු ලැබේ. වර්ගීකරණය පිළිබඳව වන ආරවුලක්, ලංකා රේගුවට නිරාකරණය කරගැනීමට නොහැකි වුවහොත් එමගින් එය ලෝක රේගු සංවිධානයට යොමු කරනු ලැබේ. සම්බන්ධීකරණය කරන ලද සංයෝජන නාමකරණ ක්‍රමවේදයෙහි ^Harmonized System Nomenclature) සිදුකර ඇති වෙනස්කම් පිළිබඳව ලෝක රේගු සංවිධානයෙන් දැනුම් දෙන අතර, ඒවා මෙම අංශය මගින් පිළිගනු ලැබේ. ඊට අමතරව, ද්වි පාර්ශවික සහ බහු පාර්ශවික වෙළඳ ගිවිසුම් සහ රේගු සහයෝගීතා ගිවිසුම් සම්බන්ධයෙන් වන අවබෝධතා ගිවිසුම් හා සම්බන්ධ කටයුතු සිදුකරන්නේ ද ප්‍රතිපත්ති, සැලසුම්කරණ සහ පර්යේෂණ අංශය විසින් වේ. ලංකාව, ඉන්දියාව සහ පාකිස්ථානය සමගින් ද්විපාර්ශවික ගිවිසුම් දෙකක් අත්සන් තබා ඇත. ඊට අමතරව මෙක්සිකෝව, තුර්කිය සමගින් ද අන්‍යෝන්‍ය පරිපාලන සහය සඳහා වන ගිවිසුම් අත්සන් කිරීමට නියමිතව ඇත.

### ජාත්‍යන්තර ගිවිසුම

ශ්‍රී ලංකා රේගුව පහත සඳහන් ජාත්‍යන්තර ගිවිසුම්වලට එළඹීමට කටයුතු කරමින් සිටි.

1. ශ්‍රී ලංකා රජය සහ මෙක්සිකෝ රජය අතර රේගු නීති නිසියාකාරව යොදා ගැනීම, රේගු වැරදි මැඩපැවැත්වීම, විමර්ශනය කිරීම, බලාත්මක කිරීම විමර්ශනය කිරිමට අදාළ අන්‍යෝන්‍ය පරිපාලන සහයෝගිතා ගිවිසුම.
2. ශ්‍රී ලංකාව සහ තුර්කිය අතර රේගු කටයුතු සම්බන්ධව සහයෝගය සහ අන්‍යෝන්‍ය සහයෝගීතා ගිවිසුම .

## සංවර්ධන වැඩසටහන්

**ශ්‍රී ලංකා රේගුව පහත දක්වා ඇති සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.**

1. කොරියානු රේගුව – රේගු නවීකරණය
2. **KOICA** අධ්‍යයන ආයතනයේ සහභාගිත්ව වැඩසටහන

## සැලසුම් කටයුතු

2014 වසරේ ශ්‍රී ලංකා රේගුවේ සියළු අංශයන්හි ප්‍රධාන කාර්යයන්වල ප්‍රගතිය සමලෝචනය කිරීම, අවසන් කරනු ලැබූ අතර 2014,වර්ෂය සඳහා වන කාර්යසාධන වාර්තාව ප්‍රකාශයට පත්කරන ලදී . 2015 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කර ඒ පිළිබඳ සියලුම අංශ වෙත දැනුම් දී ඇත.

## පර්යේෂණ කටයුතු

ආදායම් කාර්යසාධනය තුළ සැලකිය යුතු කරුණක් වන ආදායම් විශ්ලේෂණය මෙම අංශය විසින් සිදුකරනු ලබන පධාන කාර්යයක් වේ. සති දෙකකට වරක් අපනයන මගින් එකතු කරනු ලබන ආදායම පිළිබඳ විශ්ලේෂණයක් සිදුකර අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත වාර්තා කරනු ලබයි.

## ADB බදු පරිපාලන විශ්ලේෂණය :

### 2015 වර්ෂයේ කාර්යසාධනය

2015 වර්ෂය තුළ මෙම අංශය විනිමය අනුපාතවලට අදාළ චක්‍රලේඛ 52ක් හා දෙපාර්තමේන්තු නියෝග 95 ක් නිකුත් කර ඇත. බදු සංශෝධන පිළිබඳ 2015 වර්ෂය තුළදී නිකුත් කළ දෙපාර්තමේන්තු නියෝග පහත පරිදි වේ.

| | |
|---|---|
| වැට් සංශෝධන | 04 |
| නිෂ්පාදන බදු සංශෝධන | 07 |
| වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බදු සංශෝධන | 01 |
| විශේෂ වෙළඳ භාණ්ඩ බදු සංශෝධන | 24 |
| සෙස් බදු සංශෝධන | 05 |
| ආදායම් සංරක්ෂණ නියෝග | 08 |
| ජාතිය ගොඩනැගීමේ බදු සංශෝධන | 01 |

### 2015 වර්ෂය තුළ නිකුත් කළ දෙපාර්තමේන්තු චක්‍රලේඛ

| දෙපා . නියෝග අංකය | දිනය | අදාල අයිතමය | විස්තරය |
|---|---|---|---|
| **976** | 22.01.2015 | විශේෂ භාණ්ඩ බද්ද | සහල් මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද සංශෝධන |
| **977** | 29.01.2015 | බදු සහන | තිරිගු ධාන්‍ය මත බදු ඉවත් කිරීම |
| **978** | 29.01.2015 | ආදායම් සංරක්ෂණ නියෝග - 1/2015 | ආදායම් සංරක්ෂණ නියෝග - 1/2015 අයවැය 2015 |
| **979** | 29.01.2015 | නිෂ්පාදන | නිශ්පාදන ( විශේෂ විධිවිධාන) |
| **980** | 29.01.2015 | මෝටර් වාහන | මෝටර් වාහන පිළිබඳ රේගු තක්සේරු කිරිම. |
| **981** | 29.01.2015 | ආනයන පාලන බලපත්‍ර | ආනයන පාලනබලපත්‍ර |
| **982** | 29.01.2015 | විශේෂ භාණ්ඩ බද්ද | විශේෂ වෙළ ඳ භාණ්ඩ බද්ද සංශෝධනය |
| **982A** | 30.01.2015 | විශේෂ භාණ්ඩ බද්ද | දෙපාර්තමේන්තු නියෝග 982A නිවරදි කිරිම |
| **933A** | 05.02.2015 | දුම්කොළ | දුම්කොළ රෙගුලාසි ලේබල් කිරිම |
| **980A** | 11.02.2015 | මෝටර් වාහන | මෝටර් වාහන පිළිබඳ රේගු වටිනාකම |
| **978A** | 12.02.2015 | ආදායම් සංරක්ෂණ නියෝග | ආදායම් සංරක්ෂණ නියෝග - අයවැය 2015 |
| **983** | 16.02.2015 | විශේෂ භාණ්ඩ බද්ද | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද |
| **984** | 24.02.2015 | විශේෂ භාණ්ඩ බද්ද | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද |

| | | | |
|---|---|---|---|
| **985** | 27.02.2015 | ආදායම් සංරක්ෂණ නියෝග -2/2015 | ආදායම් සංරක්ෂණ නියෝග |
| **986** | 27.02.2015 | ආනයන පාලන බලපත්‍ර | ආනයන පාලන බලපත්‍ර |
| **987** | 27.02.2015 | නිෂ්පාදන | නිෂ්පාදන සංශෝධන |
| **988** | 27.02.2015 | තක්සේරු | ආනයන භාණ්ඩවල රේගු වටිනාකම |
| **989** | 06.03.2015 | වැට් ඉවත් කිරීම | NSDs මත වැට් ඉවත් කිරීම |
| **990** | 17.03.2015 | විශේෂ භාණ්ඩ බද්ද | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද |
| **991** | 25.03.2015 | විශේෂ භාණ්ඩ බද්ද | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද |
| **992** | 25.03.2015 | අපනයන ක්රියාපටිපාටි | EFC හිදී අපනයන ක්‍රියාපටිපාටිය |
| **993** | 01.04.2015 | විශේෂ භාණ්ඩ බද්ද | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද |
| **993A** | 07.04.2015 | විශේෂ භාණ්ඩ බද්ද | දෙපාර්තමේන්තු නියෝගDOPL 993 නිවැරදි කිරීම |
| **994** | 08.04.2015 | සෙස් බද්ද (MRP) | MRP මත සෙස් බද්ද |
| **995** | 10.04.2015 | පාලන | වරාය පාලන ඒකකය |
| **562F** | 15.04.2015 | NC | NC කමිටුව |
| **996** | 20.04.2015 | නිෂ්පාදන | Excise |
| **997** | 23.04.2015 | ප්‍රතිපත්ති සැලසුම් හා පර්යේෂන | අර්තාපල් සහ ලොකු ළූණු සඳහා විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද සංශෝධනය |
| **998** | 30.04.2015 | මෝටර් වාහන | M/V ගැටළු පිළිබඳ කමිටුව |
| **999** | 30.04.2015 | ආනයන අපනයන පනත | ආනයන හා අපනයන පාලන පනත |
| **1000** | 06.05.2015 | ආදායම් සංරක්ෂණ නියෝග -03/2015 | ආදායම් සංරක්ෂණ නියෝග |
| **1001** | 05.05.2015 | විශේෂ භාණ්ඩ බද්ද | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද ඉවත් කිරිම |
| **1002** | 06.05.2015 | අත්හිටුවීම | රේගු පහසුකම් අත්හිටුවීම |
| **1003** | 06.05.2015 | අත්හිටුවීම | රේගු පහසුකම් අත්හිටුවීම |
| **1004** | 06.05.2015 | අත්හිටුවීම | රේගු පහසුකම් අත්හිටුවීම |
| **1005** | 06.05.2015 | අත්හිටුවීම | රේගු පහසුකම් අත්හිටුවීම |
| **1006** | 15.05.2015 | ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය | ශ්‍රී ලංකා ප්‍රමිති රෙගුලාසි |
| **1007** | 22.05.2015 | ආනයන පාලන බලපත්‍ර | ආනයන පාලන බලපත්‍ර ගාස්තු |
| **1008** | 05.06.2015 | විශේෂ භාණ්ඩ බද්ද | ලොකු ළූණු මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද |
| **1009** | 16.06.2015 | ආනයන පාලන බලපත්‍ර | ග්ලයිෆෝෂෙට් තහනම් කිරීම ( Glyphosate ) |
| **1010** | 16.06.2015 | ආනයන පාලන බලපත්‍ර | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද සංශෝධනය |
| **1011** | 19.06.2015 | විශේෂ භාණ්ඩ බද්ද | පුවක් සඳහා ආනයන බලපත්‍ර |
| **1012** | 24.06.2015 | ආනයන පාලන බලපත්‍ර | පුවක් සඳහා ආනයන බලපත්‍ර |
| **1013** | 02.07.2015 | විශේෂ භාණ්ඩ බද්ද | බඩඉරිඟු සඳහා විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද සංශෝධනය |
| **118-Q** | 09.07.2015 | දෙපාර්තමේන්තු නියෝග සංශෝධනය118 | DSCs කොටස් ඉහල නැංවීම |
| **1014** | 04.07.2015 | තිරිඟු අපනයනය | බඩඉරිඟු ආනයන පිළිබඳ වාර්ෂික මිළ ගණන් කැඳවීම |
| **1015** | 20.07.2015 | විශේෂ භාණ්ඩ බද්ද | විශේෂ භාණ්ඩ බද්ද සංශෝධනය |
| **1015A** | 21.07.2015 | විශේෂ භාණ්ඩ බද්ද | 1015 ට අදාල නිවැරදි කිරීම |
| **1016** | 23.07.2015 | බදු සහන | කිරිපිටි සඳහා වන බදු සහන |
| **1017** | 07.08.2015 | බදු සහන | බදු ඉවත් කිරීම කිරිපිටි - |
| **861A** | 07.08.2015 | විමර්ශන | දෙපාර්තමේන්තු නියෝග සඳහා සංශෝධන 861 |
| **1018** | 13.08.2015 | CDDA (NMRA) | බෙහෙත් ද්‍රව්‍ය, වෛද්‍ය උපකරණ, සුවඳ විලවුන් නිෂ්කාශනය |
| **749C** | 14.08.2015 | තක්සේරු | තක්සේරු කමිටු |
| **1018A** | 27.08.2015 | CDDA (NMRA) | NMRA ආදර්ශ අත්සන |
| **1019** | 08.09.2015 | විශේෂ භාණ්ඩ බද්ද | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද සංශෝධන |
| **1020** | 08.09.2015 | බදු අත්හැරීම | කුකුල් කෑම මත වන වැට් බද්ද නිදහස් කිරීම |
| **1021** | 17.09.2015 | මෝටර් වාහන | මෝටර් වාහන බදු සහන |
| **1022** | 17.09.2015 | විශේෂ භාණ්ඩ බද්ද | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද සංශෝධන |
| **1023** | 17.09.2015 | | ආගමන විගමන දෙපාර්තමේන්තුවේ සහය ඇතිව රට ඇතුළත හා රටින් පිටවන මගින් නවතා පරික්ෂා කිරීම විධිමත් කිරීම |
| **1024** | 22.09.2015 | අධිභාරය | ලොකු ළූණු සඳහා අධි භාරය |
| **118( R)** | 23.09.2015 | දෙපාර්තමේන්තු නියෝග සංශෝධන 118 | මත් ද්‍රව්‍ය අංශය සහ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්ගේ සමස්ථ කාර්ය මණ්ඩලය ඇතුලත් කිරීම ,CIU අංශය ප්‍රතිපත්ති සැලසුම් අංශය තුළ තබා ගැනීමට අනුමැතිය |
| **1025** | 23.09.2015 | විශේෂ භාණ්ඩ බද්ද | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද සංශෝධන |
| **1026** | 28.09.2015 | මෝටර් වාහන | මෝටර් වාහන සඳහා රේගු තක්සේරුව |
| **1027** | 01.10.2015 | විශේෂ භාණ්ඩ බද්ද | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද සංශෝධන |

| | | | |
|---|---|---|---|
| **1028** | 05.10.2015 | නිශ්පාදන විශේෂ )<br>(විධිවිධාන | සුරාබදු සංශෝධනය සිගරට් |
| **1018(B)** | 05.10.2015 | | NMRA විෂය පථය තුලින් සුවඳ විලවුන් ඉවත් කිරීම |
| **1029** | 07.10.2015 | | වටිනාකම් තක්සේරු කිරීම සඳහා නෛතික මතය විමසීම (VDF) |
| **1027(A)** | 08.10.2015 | පොදු | දෙපාර්තමේන්තු නියෝග 1027 ට අදාළ නිවරදි කිරීම |
| **1030** | 08.10.2015 | විශේෂ භාණ්ඩ බද්ද | ලොකු ළූණු මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද |
| **1031** | 16.10.2015 | | ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද මත්ස්‍ය තොගය |
| **1026(A)** | 19.10.2015 | | දෙපාර්තමේන්තු නියෝග 1026 සංශෝධන කිරීම |
| **103220** | 20.10.2015 | | ජනතා ගාමන්ට් මැනිෆැක්චරස් ලිමිටඩ් හි රේගු පහසුකම් අත්හිටුවීම |
| **1033** | 28.10.2015 | විශේෂ භාණ්ඩ බද්ද | බඩඉරිඟු, සෝගම්, එළවලු මේද සහ තෙල් හා ඒවායේ කැබුනු කොටස් සඳහා විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද සංශෝධනය |
| **1021(A)** | 11.11.2015 | දෙපාර්තමේන්තු නියෝග සංශෝධන 1026 | මෝටර් වාහන නිෂ්කාශණ දිනය ඉවත් කිරීම |
| **1034** | 19.11.2015 | | රේගු කටයුතුවලට අදාළ 2004 අංක 40 දරන පරමාණුක බලශක්ති පනතේ විධිවිධාන. |
| **1035** | 20.11.2015 | අයවැය 2016 | ආදායම් සංරක්ෂණ නියෝග 04/2015 |
| **1036** | 20.11.2015 | අයවැය 2016 | විශේෂ භාණ්ඩ බද්ද සංශෝධනය |
| **1037** | 20.11.2015 | අයවැය 2016 | නිෂ්පාදන බදු සංශෝධන - 1989 අංක 13 දරන පනත යටතේ (නිෂ්පාදන බදු විශේෂ විධිවිධාන 3 වන වගන්තිය) සිදුකරන ලද නියෝග |
| **1038** | 20.11.2015 | අයවැය 2016 | 2011 අංක 17 දරන පනතින් අවසන්වරට සංශෝධනය කර ඇති පරිදි 1989 අංක 13 දරන නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බදු පනතේ 3(ඇ) වගන්තිය යටතේ සිදුකරනු ලබන නියෝග |
| **1039** | 24.11.2015 | අයවැය 2016 | ආනයන මත සෙස් බදු අනුපාත සංශෝධනය කිරීම අයවැය - 2016 |
| **1040** | 27.11.2015 | | මෝටර් රථ වාහන ආනයනය සඳහා වන සහනය අත්හිටුවීම |
| **118 S** | 27.11.2015 | | දෙපාර්තමේන්තු නියෝග 118(එෆ්) 06 (ර්) උපජේදය සංශෝධනය කිරීම |
| **1018 C** | 26.11.2015 | | Gym උපකරණ අදාලව (නිෂ්පාදන)NMRA |
| **1041** | 08.12.2015 | අයවැය 2016 | ආදායම් සංරක්ෂණ නියෝග 2015/4 සහ නිෂ්පාදන බදු වෙනස් කිරීම - 2016 අයවැය |
| **1042** | 09.12.2015 | අයවැය 2016 | ආදායම් සංරක්ෂණ නියෝග වෙනස් කිරීම 2015/4 |
| **1043** | 09.12.2015 | අයවැය 2016 | 1979 අංක 40 දරන අපනයන සංවර්ධන පනත යටතේ පලකරන ලද ගැසට් නිවේදනය |
| **1044** | 15.12.2015 | ආනයන සෙස් බද්ද | 1979 අංක 44 දරන අපනයන සංවර්ධන පනත යටතේ පලකරන ලද ගැසට් නිවේදනය |
| **1045** | 15.12.2015 | ආදායම් සංරක්ෂණ නියෝග | 2015 /04 ආර්පිඕ වලට සිදුකරන ලද වෙනස්කම් |
| **1044A** | 17.12.2015 | ආකයන සෙස් බද්ද | දෙපාර්තමේන්තු නියෝග නිවැරදි කිරීම 1044 |
| **1045A** | 17.12.2015 | ආදායම් සංරක්ෂණ නියෝග | දෙපාර්තමේන්තු නියෝග 1045 |
| **1046** | 17.12.2015 | | වරාය භාණ්ඩ ක්‍රියාපටිපාටිය විධිමත් කිරීම |
| **1044B** | 18.12.2015 | ආනයන සෙස් බද්ද | දෙපාර්තමේන්තු නියෝග 6406.10 - නිවැරදි කිරීම 1044හි දෝෂය |
| **1047** | 22.12.2015 | වැට් බද්ද | අර්ධ trailers සඳහා කෘෂිකාර්මික ට්‍රැක්ටර් හෝ මාර්ගට්‍රැක්ටර් ආනයනය කිරීම හා සැපයීම මත වැට් බද්ද -HS 8701.90.10 |
| **1048** | 23.12.2015 | | ශ්‍රී ලංකා ප්‍රමිති රේගුලාසි ප්‍රමිති මගින් පරීක්ෂා කිරීම සඳහා නියම කරනු ලබන FCL ටික් මාළු තොගය නිෂ්කාශනය කිරීම. |
| **1049** | 31.12.2015 | අයවැය 2016 | වැට්/PAL/ජාතිය ගොඩනැගිමේ බද්ද සංශෝධනය කිරීම |

## විවෘත කරන ලද දෙපාර්තමේන්තු විෂය ලිපිගොනු

| දිනය | ලිපිගොනු අංකය | විස්තරය |
|---|---|---|
| **23.01.2015** | 750 | පහසුකම් සැලසීම සහ කළමනාකරණ ක්‍රියාකිරි කණ්ඩායම් රැස්වීම යටතේ SASEC - |
| **27.01.2015** | 751 | ශ්‍රී ලංකාව හා වියට්නාමය අතර වෙළදාම )SCT) මත උප කමිටුව |
| **06.03.2015** | 752 | Importation of Standard Solutions (Chemicals) for an instrument calibration at Atomic Energy Authority |
| **21.04.2015** | 753 | ශ්‍රී ලංකාව හා රුසියාව අතර වෙළඳ ,ආර්ථික ,විද්‍යා සහ තාක්ෂණික සහයෝගිතාව පිළිබඳ අන්තර් රාජ්‍ය කොමිෂන් සභාව |
| **29.04.2015** | 754 | ආනයන පරික්ෂණ වැඩසටහන -SLSI |
| **30.04.2015** | 755 | මහනුවර ජලසම්පාදන ව්‍යාපෘතිය |
| **30.04.2015** | 756 | Non-Manipulation Certified Regulation |
| **08.06.2015** | 757 | ග්ලයිෆෝසෙට් සඳහා HS සංකේත අංක |
| **23.09.2015** | 758 | ජාතික වෛද්‍ය නියාමන අධිකාරිය |
| **29.12.2015** | 759 | ආනයන තීරුබදු නාමාවලිය - 2016 |

## ජාත්‍යන්තර කටයුතු අංශය - විවෘත කරන ලද ලිපිගොනු

| ලිපිගොනු අංකය | විස්තරය |
|---|---|
| **PP&R/CIAD/01/2015** | සාර්ක් රැස්වීම් කත්මන්දු - |
| **PP&R/CIAD/02/2015** | වීසා ලිපි |
| **PP&R/CIAD/03/2015** | කොරියානු රේගුව -රේගු නවීකරණය - |
| **PP&R/CIAD/04/2015** | කත්මන්දු රැස්වීම |
| **PP&R/CIAD/05/2015** | ශ්‍රී ලංකා බංගලාදේශ් |
| **PP&R/CIAD/06/2015** | ලෝක රේගු සංවිධානයේ අධ්‍යක්ෂ තනතුරු |
| **PP&R/CIAD/07/2015** | ලෝක රේගු සංවිධානයේ ආසියා කළමනාකරණ සම්බන්ධීකාරක මධ්‍යස්ථානය |
| **PP&R/CIAD/08/2015** | රේගු අභ්‍යන්තර කටයුතු අංශයේ ගෘහභාණ්ඩ |
| **PP&R/CIAD/09/2015** | රේගු සිහිවටන සකස් කිරීම |
| **PP&R/CIAD/10/2015** | KOICA අධ්‍යයන ආයතනයේ සහභාගීත්ව වැඩසටහන |
| **PP&R/CIAD/11/2015** | තුර්කිය අන්‍යොන්‍ය ගිවිසුම |
| **PP&R/CIAD/12/2015** | ADB : බදු පරිපාලන විශ්ලේෂණය |
| **PP&R/CIAD/13/2015** | මහ බැංකුව විසින් කාර්යසාධන ඇගයීම් පිළිබඳ තොරතුරු කැඳවීම |
| **PP&R/CIAD/14/2015** | මෙක්සිකෝ රජය හා ශ්‍රී ලංකා රජය අතර රේගු ගිවිසුම |
| **PP&R/CIAD/15/2015** | ලෝක රේගු සංවිධානයට ශ්‍රී ලංකාවේ වාර්ෂික සාමාජිකත්ව දායකත්වය |

### අධ්‍යක්ෂ / නියෝජ්‍ය අධ්‍යක්ෂ විසින් සහභාගි වූ සම්බන්ධීකරණ රැස්වීම

2015 වර්ෂය තුළ පහත සඳහන් ආයතනවල විවිධ වූ රැස්වීම් සඳහා සහභාගි විය.

1. වාණිජ දෙපාර්තමේන්තුව
2. ආනයන අපනයන පාලන දෙපාර්තමේන්තුව
3. විදේශ කටයුතු අමාත්‍යාංශය
4. පරිසර අධිකාරිය
5. මුදල් අමාත්‍යාංශය, පිස්කල්, වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති

### ප්‍රතිපත්ති සැළසුම් හා පර්යේෂණ අංශයේ සංවිධානය කරන ලද රැස්වීම්

**ජාත්‍යන්තර රේගු දින සැමරුම**

දිනය - 2015 ජනවාරි 26

ස්ථානය - රේගු මූලස්ථානය

තේමාව - සම්බන්ධීකරණය කරන ලද දේශ සීමා කළමනාකරණය -පාර්ශවකරුවන් සම්බන්ධීකරණය කිරීම සඳහා ඇතුළු වූ ප්‍රවේශය

# අනුගතවීමේ සහ පහසුකම් සැලසීමේ අංශය

## හැඳින්වීම

අනුගත වීමේ සහ පහසුකම් සැලසීමේ අංශය සහාය සේවා පර්ෂදය යටතේ ස්ථාපිත කර ඇත. මෙම අංශය යටතේ ඒකක තුනක් ක්‍රියාත්මක වේ. ඒවා නම් පශ්චාත් නිශ්කාශන විගණන අංශය ආපසු ගෙවීමේ අංශය හා අවදානම් කළමනාකරණ අංශය වේ. 2010 වර්ෂයේ අග භාගයේදී රේගු ප්‍රතිසංස්කරණ හා නවීකරණ වැඩසටහන යටතේ නව සංවිධාන ව්‍යුහය ක්‍රියාත්මක කිරීමත් සමඟ තක්සේරු අංශය යටතේ ක්‍රියාත්මක වූ පශ්චාත් නිශ්කාෂණ හා විගණන අංශය (**PCAB**) නීති බලාත්මක කිරීමේ පර්ශදය තුළ රේගු අධ්‍යක්ෂකවරයෙකු යටතේ උත්ශ්‍රේණිගත කර පශ්චාත් නිශ්කාෂණ විගණන අංශය (**PCA**) වශයෙන් හඳුන්වන ලදී. රේගු නිශ්කෂණ ක්‍රියාවලියේදී නිශ්කාෂණ රෙගුලාසිවලට අනුකූලව ක්‍රියා කරන වෙළඳුන්ට පහසුකම් සැලසීමේ අවශ්‍යතාවය සැලකිල්ලට ගෙන සහ ප්‍රමාද දෝෂ සහ වංචා පලනය කිරීම සඳහා රේගුව තුළ අවදානම් කළමනාකරණ ඒකකයක් (**RMU**) ස්ථාපිත කරමින් දැනට පවත්නා ක්‍රමවේදයන් වැඩිදියුණු කිරීමට තීරණය කර ඇත.

රේගු නිෂ්කාශන ක්‍රියාවලියේ වැඩසටහන්වලට පහසුකම් සැලසීම උදෙසා අවදානම් කළමනාකරණ මූලධර්ම සහ අනුකූලතා දැක්වීමේ මිනුම් ක්‍රියාත්මක කිරීම මෙන්ම ක්‍රියාපටිපාටි හඳුන්වා දීම, වෙළඳ ප්‍රජාව අතර අනුකූලව ක්‍රියාකිරීමේ මට්ටම වැඩිදියුණු කිරීම සඳහා දායකත්වය ලබාදෙන ඉතා වැදගත් සාධක බවට හඳුනා ගනිමින් පශ්චාත් නිශ්කාෂණ විගණනය සහ අවදානම් විගණන කාර්යයන් සහය සේවා පර්ශදය තුල එක අංශයක් ලෙස ගෙන ඒමට තීරණය කරන ලදී. මෙතැන් පටන් දෙපාර්තමේන්තු නියෝග 883 ට ((**DOPL**) අනුව 2013 සැප්තැම්බර් 26 දින සිට ක්‍රියාත්මක වන පරිදි "අනුගත වීමේ සහ පහසුකම් සැලසීමේ අංශය" වශයෙන් හැඳින්වෙන මෙම අංශය යටතේ ශාඛා දෙකක් වශයෙන් පශ්චාත් විගණන අංශය හා අවදානම් කළමනාකරණ අංශය ක්‍රියාත්මක වේ.

## පශ්චාත් නිෂ්කාශණ විගණන අංශය

අදාල ව්‍යාපාරිකයන් (තැනැත්තන්) සතුව ඇති පොත්පත්, වාර්තා, ව්‍යාපාර ක්‍රමවේද සහ වාණිජ දත්ත පරික්ෂා කිරීම මගින් රේගු ප්‍රකාශනවල නිරවද්‍යතාවය සහ නීත්‍යානුකූලභාවය පිළිබඳව රේගුව සෑහීමකට පත්වන්නා වූ මිනුම් ක්‍රම වශයෙන් පශ්චාත් නිෂ්කාශණ විගණන (**PCA**) හෝ විගණන පාදක කරගත් පාලන, සංශෝධිත කියෝතෝ ගිවිසුම මගින් අර්ථ නිරූපනය කරයි. අතිශයින් ගනුදෙනු පදනම් කරගත් පාලන පරිසරයක සිට වඩා ශක්තිමත් විගණනය පදනම් කරගත් පරිපාලනයත් දක්වා ගමන් කිරීම මගින් බහුවිධ ස්ථරවලදී අවදානම් පාදක කරගත් පාලන ප්‍රවේශයක් යොදා ගැනීමට පශ්චාත් නිශ්කාශන විගණනය රේගුවට ඉඩකඩ සලසන බැවින්, එය රේගුවට මෙන්ම අනෙකුත් දේශසීමා නියාමන අධිකාරීන් සඳහා ද ඉතා වැදගත් පාලන ක්‍රමවේදයක් වේ. භෞතික පරීක්ෂණය, වටිනාකම, භාණ්ඩවල ප්‍රභවය සහ වර්ගීකරණය සාම්පල සත්‍යාපනය කිරීම, බලපත්‍ර, අවසරපත්‍ර සත්‍යාපනය කිරීම යනාදිය වැනි දේශ සීමාව හරහා ගමන් කරන අවස්ථාවේදී යොදාගනු ලබන පාලන ක්‍රම ගනුදෙනුව පදනම් කරගත් පාලන ක්‍රම වේ. ( මූලාශය: ලෝක රේගු සංවිධානය)

භාණ්ඩ හා ව්‍යාපාරිකයන් පිළිබඳ අවදානම් විශ්ලේෂණය මත තෝරාගත් ඉලක්කගත මෙහෙයුම්කරුවන් කෙරෙහි අවධානය යොමු කරමින්, හෝ වාර්ෂික විගණන වැඩසටහන් යටතේ දක්වා ඇති විධිමත් සැලසුම්ගත ක්‍රමයක් මගින් පශ්චාත් නිශ්කාෂණ විගණන සිදුකළ හැකිය. එසේම ආර්ථිකය මෙහෙයවන්නන් හට අවශ්‍ය තොරතුරු පිරිනැමීමට නිර්නායකයන් වශයෙන් ද විගණනය භාවිතා කළ හැකිය.

පහත සඳහන් දෑ පශ්චාත් නිශ්කාෂණ විගණන අංශයේ මූලික අරමුණු වශයෙන් සලකනු ලැබිය හැකිය.

(අ) පසුගිය යම් කාලසීමාවක් තුළ රේගු සටහන්කරවල නීත්‍යානුකූලභාවය හා නිරවද්‍යතාව පරීක්ෂා කිරීම.

(ආ) වැරදි රේගු සටහන්කර සංශෝධනය කිරීම සඳහා විගණනලාභීන්ට නිර්දේශ ලබා දීම

(ඇ) විගණනලාභීන් රේගු නීතිය හා රෙගුලාසිවලට අනුගතවීම වැඩි කිරීමට පෙළඹවීම

(ඈ) අවදානම් කළමනාකරණ ක්‍රියාවලියට යෙදවුම් ලබාදීම

## පශ්වාත් නිශ්කාශණ විගණනය යටතේ පරීක්ෂා කළයුතු අයිතම

පහත වගුවේ දැක්වෙන ආනයන ප්‍රකාශන සඳහා වන සියළු අයිතමයන් යටතේ පසු නිශ්කාෂණ විගණන කළහැකි වේ.

| බදු මූල්‍ය සම්බන්ධ අයිතම | බදු අනුපාත සම්බන්ධ අයිතම | බදු ප්‍රමාණය සම්බන්ධ අයිතම | අනෙකුත් |
|---|---|---|---|
| • වටිනාකම<br>• ප්‍රමාණය<br>• මුදල් වර්ගය<br>• විනිමය අනුපාත | වර්ගීකරණය<br>සාමාන්‍ය බදු අනුපාත<br>වරණීය බදු අනුපාත | නිදහස් කිරීම්<br>යුක්ති සාධන ප්‍රමාණය<br>බදු ගණනය කිරීමේ නිරවද්‍යතාවය | සීමා කිරීම්<br>තහනම් කිරීම්<br>ආනයන බලපත්‍ර<br>IPR<br>CITES<br>රාජ්‍ය භාගය<br>විනිමය පාලන |

ඉහත දැක්වෙන අයිතම පශ්වාත් නිශ්කාශන විගණනයට පෙර නිශ්කාශන අවස්ථාවේ දී සහ/හෝ නිශ්කාෂණයට පෙර අවස්ථාවලදී රේගු පරීක්ෂාවට ලක් කළ හැකි බව සැලකියයුතුය අනවශ්‍ය ද්විගුනනනාවීම වලක්වා පශ්වාත් නිශ්කාෂණ විගණනයේ ප්‍රවේශය සාමාන්‍ය රේගු පරීක්ෂාවට (පූර්ව නිශ්කාෂණ සත්‍යාක්ෂණය) වඩා වෙනස් වියයුතු අතර, පශ්වාත් නිශ්කාෂණ විගණනය එහි යහගුණය වැඩි කිරීමටත්, දුර්ගුණය අවම කරගැනීමටත් සිදුකරනු ලබයි. රේගු නිශ්කාෂණයේ ලියකියවිලි පරීක්ෂාවට ලක් කිරීමට පශ්වාත් නිශ්කාෂණ විගණන නිලධාරීන්ට බලය පැවරෙනවා පමණක් නොව විගණන පරිශ්‍රයේදී ගිණුම් පොත්, වාර්තා හා අදාල පොත්පත් ද පරීක්ෂාවට ලක්කළ හැකිය.

### <u>පශ්වාත් නිෂ්කාශන විගණන ඒකකය</u>

### 2015 වර්ෂයේ කාර්ය සාධනය

| | 2015 |
|---|---|
| වසර තුළ ලියාපදිංචි කළ විගණන සංඛ්‍යාව | 133 |
| අවසන් කරන ලද විගණන සංඛ්‍යාව සංඛ්‍යාව (කලින් ලියාපදිංචි කරනු ලැබු සංඛ්‍යාව ද ඇතුලුව) | 67 |
| විගණන මගින් සොයාගත් වැරදි සහ නියම කල දඩ | 61 |
| අයකර ගන්නා ලද දඩ මුදල් ප්‍රමාණය | 759,460,609.00 |
| රාජසන්තක කළ භාණ්ඩවල විකුණුමෙන් ලත් වටිනාකම | 29,824,414.00 |
| අතිරේක සටහන්කර ලෙස එකතු කරගත් ප්‍රමාණය | 66,016,718.00 |

### 2013,2014 හා 201 5වර්ෂය තුළ වර්ෂයේ කාර්යසාධනය

| | 2013 | 2014 | 2015 |
|---|---|---|---|
| වසර තුළ ලියාපදිංචි කළ විගණන සංඛ්‍යාව | 93 | 98 | 133 |
| අවසන් කරන ලද විගණන සංඛ්‍යාව (කලින් ලියාපදිංචි කරනු ලැබු සංඛ්‍යාව ද ඇතුලුව) | 42 | 50 | 63 |
| විගණන මගින් සොයාගත් වැරදි සහ නියම කල දඩ | 42 | 50 | 63 |
| අයකර ගන්නා ලද දඩ මුදල් ප්‍රමාණය | 251,181,532 | 114,716,417 | 759,460,609 |
| රාජසන්තක කළ භාණ්ඩවල වටිනාකම | NIL | NIL | NIL |
| අතිරේක ආදායම් ලෙස එකතු කරගත් ප්‍රමාණය | NIL | 4,660,935 | 66,016,718 |

Comparison - Chart format - Year 2015




Comparison – Chart Format – Year 2013, 2014, and 2015




**2015 වසරේ පසු පශ්චාත් නිශ්කාෂන විගණන අංශයේ විශේෂ කාර්ය සාධනය**

**2015 වසරේ යෝජිත අවිනිශ්චිත උපලේඛනය**

| | ප්‍රධාන කාර්යයන් | කාලපරිච්ඡේදය තුළ සැලසුම්ගත කරන ලද |
|---|---|---|
| | රේගු නිලධාරීන්ට පැවැත්වීමට ඇති දෙපාර්තමේන්තු වැඩ මුලු දෙකක් | 2015 මැයි සිට නොවැම්බර් දක්වා කාලය තුල |
| | දෙපාර්තමේන්තුවට සම්බන්ධ අය සඳහා පැවැත්වෙන උපදේශක වැඩමුලු | 2015 මැයි සිය ජූනි දක්වා කාලය තුල |
| | රේගු වෙබ් අඩවිය හරහා මිල තක්සේරු | 2015 අගොස්තු මැද භාගය |

| | | |
|---|---|---|
| | තොරතුරු බෙදාහැරීම | |
| | C සහ F අංශයේ වෙබ් පිටුව නිර්මාණය කිරීම | ඔක්තෝබර් මාසයේ 2015 |
| | මිල තක්සේරු ක්‍රියාමාර්ග සම්බන්ධ පොත් පිංචක් නිකුත් කිරීම | 2015ඔක්තෝබර් මාසයේ |

ඉහත ලේඛනයට අනුව ප්‍රගති වාර්තාව

| | ප්‍රධාන කාර්යයන් | ළඟා කරගත් දේ |
|---|---|---|
| 1 | රේගු අධිකාරි, සහකාර රේගු අධිකාරි, නියෝජ්‍ය රේගු අධිකාරි සඳහා ලෝක වෙළඳ සංවිධානයේ මිල පිරික්සුම් කාර්ය පටිපාටිය හැඳින්වීම පිළිබඳ වැඩමුළු | 2015 ජනවාරි - කාලය පැය 3<br>2015 පෙබරවාරි - කාලය පැය 3<br>2015 මැයි - කාලය පැය 3<br>2015 ඔක්තෝබර් - කාලය පැය 3 |
| 2 | ලංකා වානිජ සංගමයේ පැවැත්වූ දෙපාර්තමේන්තුවේදී පාර්ශවකරුවන් සඳහා ලෝක වෙළඳ සංවිධානයේ මිල තක්සේරු පරිපාටිය හඳුන්වා දීමේ වැඩමුළුව | 2014 සැප්තැම්බර් - කාලය පැය 3 |
| 3 | මිල තක්සේරු තොරතුරු බෙදාහැරීම | නවතම සහ පාවිච්චි කරනලද මෝටර් රථ සඳහා රේගු තක්සේරු ප්‍රකාශනය |
| 4 | C සහ F අංශයේ වෙබ් පිටුව නිර්මාණය කිරීම | සම්පූර්ණයි. |
| 5 | තක්සේරු ක්‍රියාමාර්ග සම්බන්ධ ප්‍රකාශනයන් | අසම්පූර්ණයි. |

## ආපසු ගෙවීමේ අංශය

ආපසු ගෙවීම් හිමිකම් තත්ත්වය - 2015

| වසර | 2015 |
|---|---|
| අයදුම්පත්/හිමිකම් ලියාපදිංචි කළ | 80 |
| සම්පූර්ණ කළ ආපසු ගෙවීම් | 06 |
| අයදුම්පත්/හිමිකම් නිශ්ප්‍රභා කරන ලද | NIL |

ආපසු ගෙවීම් හිමිකම් තත්ත්වය - (2014 - 2012)

| වසර | 2012 | 2013 | 2014 | 2015 |
|---|---|---|---|---|
| අයදුම්පත්/හිමිකම් ලියාපදිංචි කළ | 186 | 165 | 141 | 80 |
| සම්පූර්ණ කළ ආපසු ගෙවීම් | 98 | 121 | 18 | 06 |
| අයදුම්පත්/හිමිකම් නිශ්ප්‍රභා කරන ලද | 01 | 02 | 02 | 01 |

සංසන්දනය (වර්ෂය 2012, 2013, 2014 සහ 2015)




සංසන්දනය (වර්ෂා 2012, 2013, 2014 සහ 2015)




### අවදානම් කළමනාකරණ ඒකකය

අවදානම් කළමනාකරණය යනු අවදානමට මුහුණදීම සඳහා රේගු දෙපාර්තමේන්තුවට වුවමනා කරන තොරතුරු ලබා දෙන්නා වූ කළමනාකරණ කාර්යපටිපාටි සහ පරිචයන් ක්‍රමානුකූලව යොදගැනීම වේ. අදාල ව්‍යවස්ථාපිත නියමයන්ට අනුකූල නොවීමට ඇති ඉඩකඩ සහ ප්‍රමාණවත් මට්ටමකින් පහසුකම් සැලසීමට අපොහොසත්වීම යන අවස්ථාවන් රේගු පරිපාලනය මුහුණ දෙන ප්‍රධාන අවදානම වේ.

නීත්‍යානුකූල ජාත්‍යන්තර වෙළඳාම, ලංකාව තුළ ප්‍රවර්ධනය කිරීම, ලංකා රජයේ ප්‍රතිපත්තිය වන අතර, භාණ්ඩ රට තුළට ගෙන ඒමත්, රටින් පිටතට රැගෙන යාමට පහසුකම් සැලසීම සම්බන්ධයෙන් වැඩි වැඩියෙන් අවධාරණය කෙරෙමින් පවතියි. එමනිසා මෙම නිෂ්කාශන ක්‍රියාවලියෙහි සහ කාර්ය පටිපාටියන්හි ඇති මනුෂ්‍ය මැදිහත්වීම් අවම කර පද්ධති පදනම් කරගත් පාලන හඳුන්වා දීමට රේගු දෙපාර්තමේන්තුවට සිදුව තිබේ.

ඉහත කී අභිමතාර්ථය සාක්ෂාත් කරගැනීමේ අරමුණ ඇතිව, පාලනය සහ පහසුකරණය අතර නිසි සමබරතාවය පවත්වාගෙන යාම සඳහා අවදානම් කළමනාකරණ මෙවලම් භාවිතා කරන්නා වූ අවදානම් කළමනාකරණ ඒකකයක් ඇති කිරීමට, ලංකා රේගුව විසින් කටයුතු කර තිබේ. ස්වයංක්‍රීය වරණීයතා පද්ධතිය අවදානම් කළමනාකරණ මෙවලම් භාවිතා කරන අතර, වියහැකි අවදානම් තක්සේරු කිරීම සඳහා අවදානම් දර්ශක ද භාවිතයට ගනු ලැබේ. ආසිකුඩා (Asycuda) පද්ධති තුළ ඇති ස්වයංක්‍රීය වරණීයතා වැඩසටහන හරහා මෙම අවදානම් කළමනාකරණ මෙවලම් ක්‍රියාතමක වන අතර, ඊට ඇතුළත් කරන ප්‍රකාශිත ආනයන දත්ත හඳුනාගත් අවදානම් පරාමිතීන් මත පදනම් වෙමින් විශ්ලේෂණයට භාජනය වනු ඇත. තෝරාගනු ලබන අවදානම් මට්ටම අනුව අදාළ බඩු තොගය වෙනස් නාලිකා කිහිපයක් ඔස්සේ රේගුවේ පරීක්ෂාව සඳහා යොමුවනු ඇත.

රේගු පරිපාලනය විසින් භාවිතා කරන අවදානම් මෙවලම් අතරින් තක්සේරු දත්ත පද්ධතිය, ආනයන භාණ්ඩ සඳහා ප්‍රකාශිත මිලෙහි සත්‍ය හා නිවැරදිභාවය තක්සේරු කිරීම සඳහා වැදගත් වන එක් අවදානම් කළමනාකරණ මෙවලමකි. මෙමගින් ප්‍රකාශිත මිල රේගුවේ සටහන්ව ඇති මිල සමඟ සසඳා බැලීමට අවස්ථාව ලැබේ. මෙම කාර්ය සාර්ථක කරගත හැක්කේ ආසිකුඩා (Asycuda) පද්ධතිය තුළ පවතින මිල තොරතුරු බුද්ධි තොරතුරු පද්ධති මගින් විශ්ලේෂණය කර ගොනු කිරීම මගින්, රේගු සටහන් මිල දත්ත පද්ධතියක් පිහිටුවීම හරහා වේ.

පාලනය සහ පහසුකරණය අතර නිසි සමබරතාව සාක්ෂාත් කරගැනීම සඳහා අවදානම් කළමනාකරණ මූලධර්ම යොදාගැනීම අවදානම් කළමනාකරණ ඒකකයේ ප්‍රධාන කාර්යභාරයයි.

## වැඩි අවදානම් භාණ්ඩ තේරීම

- 2014.01.08 දින සිට 2015.01.06 දක්වා අළුතින් ලියාපදිංචි කරන ලද සමාගම්වල ආනයන දත්ත වාර්තා සකස් කිරීම.
- භාණ්ඩ හිමිකරුවන් ආනයන ක්‍රම, ප්‍රකාශිත විස්තර, ආනයන භාණ්ඩ සහ ඒවායේ ප්‍රභවය යනාදිය නිසා වැඩි අවදානම් භාණ්ඩ ලැයිස්තුවට භාණ්ඩ හිමිකරුවන් තේරීම ඇතුළත් කළයුතුය.
- ඉහත නියම කරන ලද ක්‍රියාවලිය හරහා වැඩි අවදානම් ලැයිස්තුවට භාණ්ඩ හිමිකරුවන් 200 ක් ඇතුළත් කිරීම.
- පවත්නා වැඩි අවදානම් ලැයිස්තුවෙන් ඉවත් කළයුතු සමාගම් තේරීම. මෙම ක්‍රියාවලිය මගින් සමාගම් 172 ක් ඉවත් කරන ලදී.

- මධ්‍ය විමර්ශන ඒකකය මගින් එවන ලද නිවේදන හේතුවෙන් වැඩි ආදායම් ලැයිස්තුවට සමාගම් ඇතුළත් කිරීම.
- දැනට දිගු කාමරය හරහා නිශ්කාෂණය කරනු ලබන ආසන්න වශයෙන් 1.2% ක භාණ්ඩ ලේඛන දිනපතා වැඩි අවදානම් භාණ්ඩ ලැයිස්තුව මගින් වැඩි අවදානම් භාණ්ඩ පරීක්ෂාවට යටත්ව සිදුවේ.

## දිගු කාමරයේ සීඝ්‍ර මාර්ග ප්‍රලේඛන වැඩසටහන

- 2015 වර්ෂය අවසානයේදී සීඝ්‍ර මාර්ග ප්‍රලේඛන පහසුකම සමාගම් 218 කට ලබාදී ඇත.
- දිගු කාමරය හරහා නිශ්කාෂනය කරනු ලබන ආසන්න වශයෙන් FCL මුළු FCL භාණ්ඩවලින් 14% ක සීඝ්‍ර මාර්ග ප්‍රලේඛන වැඩසටහන මගින් පහසුකම් සපයනු ලබයි.
- අක්‍රමිකතා හඳුනාගැනීම සඳහා සීඝ්‍ර මාර්ග සමාගම්වල ආනයන දත්ත විශ්ලේෂණය කරන ලදී.

## වර්ණියතා නිර්නායක ඇති කිරීම

- ඕස්ට්‍රේලියාවේ හා ජෝරාදානයේ අධ්‍යයන සංචාරයෙන් රැස්කරගත් තොරතුරුවලට අනුව ස්වයංක්‍රීය වරණීයතාවය පදනම් කරගත් නිර්නායක වැඩිදියුණු කිරීම ආරම්භ කරන ලදී.
- පාකිස්ථානය, එක්සත් අරාබි එමීර් රාජ්‍ය, බංගලාදේශය, මැලේසියාවෙන් ආනයනය කරන භාණ්ඩ, මෙම රටවලින් ආනයනය කරන අසාමන්‍ය භාණ්ඩ ඉලක්ක කරගෙන නිර්නායකයක් ඇති කිරීම සඳහා විශ්ලේෂණය කරන ලදී.
- පොදුවේ අපනයනය කරනු ලබන භාණ්ඩ ප්‍රමාණය වාර ගණන සහ වටිනාකම විශ්ලේෂණය කිරීම මගින් ආනයන භාණ්ඩ හඳුනා ගන්නා ලදී.
- ඉහත සඳහන් රටවලින් ආනයනය කරන අසාමාන්‍ය භාණ්ඩ ඉලක්ක කරගෙන වරණියතා නිර්නායක 5 ක් වැඩිදියුණු කර, පරීක්ෂා කර ක්‍රියාත්මක කරන ලදී.
- මෙම නිර්නායක මගින් වැඩි අවදානම් පරීත්ෂණ සඳහා සියළුම FCL දිගු කාමරයේ භාණ්ඩවලින් 1.8% ක් දැනට යොමු කරනු ලබයි.
- නිතර දක්නට නොමැති සහ ප්‍රථම වතාවට ආනයනය කරන ආනයනකරුවන් ස්වයංක්‍රීයව ඉලක්කගත කිරීම සඳහා වරණිය නිර්ණායකයක් වැඩිදියුණු කිරීම සඳහා විශ්ලේෂණයක් ක්‍රියාත්මක කරන ලදී.

| දිගු කාමරය (CBH!Q1) භාණ්ඩ (FCL) | | | | |
|---|---|---|---|---|
| දිනය | සියළුම භාණ්ඩ | වැඩි අවදානම් භාණ්ඩ නිර්ණායකය | වැඩි අවදානම් භාණ්ඩ ලැයිස්තුව | සීඝ්‍ර මාර්ග |
| 31/01/2016 | 7 | 0 | 0 | 0 |
| 1/2/2016 | 468 | 9 | 3 | 66 |
| 2/2/2016 | 467 | 7 | 5 | 65 |
| 3/2/2016 | 371 | 8 | 7 | 61 |
| 4/2/2016 | 11 | 0 | 0 | 0 |
| 5/2/2016 | 464 | 10 | 4 | 70 |
| 6/2/2016 | 60 | 1 | 2 | 13 |
| 7/2/2016 | 12 | 0 | 0 | 0 |
| 8/2/2016 | 524 | 19 | 9 | 56 |
| 9/2/2016 | 524 | 18 | 6 | 74 |
| 10/2/2016 | 585 | 14 | 9 | 84 |
| 11/2/2016 | 492 | 9 | 4 | 58 |
| 12/2/2016 | 372 | 4 | 4 | 46 |
| 13/02/2016 | 63 | 0 | 0 | 12 |
| 14/02/2016 | 4 | 0 | 0 | 2 |
| මුළු එකතුව | **4424** | **99** | **53** | **607** |

**2015 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම (අවදානම් කළමනාකරණ ඒකකය)**

| කාර්යය | ක්‍රියාකාරීත්වය | 1 වන කාර්තුව | 2 වන කාර්තාව | 3 වන කාර්තුව | 4 වන කාර්තුව |
|---|---|---|---|---|---|
| දිගු කාමරයේ සීඝ්‍ර මාර්ග ප්‍රලේඛන වැඩසටහන | නීතිගරුක වීමට එකඟ වී ඇති ව්‍යාපාරිකයන් හඳුනාගැනීම | X | X | | |
| | ආයතන වෙත ගොස් බැලීම | X | X | X | |
| | සීඝ්‍ර මාර්ග භාණ්ඩ හිමිකරුවන්ගේ නාමලේඛණය නිසිපරිදි පවත්වාගෙන යාම සහ අධීක්ෂණය කිරීම (*) | X | X | X | X |
| වැඩි අවදානම් භාණ්ඩ තේරීම | වැඩි අවදානම් භාණ්ඩ හඳුනාගැනීම | X | X | | |
| | වැඩි අවදානම් ලේඛණය නිසිපරිදි පවත්වාගෙන යාම අධීක්ෂණය කිරීම (*) | X | X | X | X |
| | වැඩි අවදානම් ලේඛනය නිතර නිතර අළුත් කිරීම (*) | X | X | X | X |
| ස්වයංක්‍රීය වර්ණය වැඩසටහන | ලෝකයේ අධ්‍යයනය පිළිබඳ උදාහරණ | X | X | | |
| | ශක්‍යතා අධ්‍යයන පැවැත්වීම | X | X | | |
| | අවදානම් පරාමිතියෙන් හඳුනා ගැනීම | | X | X | |
| | අවදානම් මට්ටම් සැකසීම | | X | X | |
| | සුදුසු පර්යේෂණ දත්ත විශ්ලේෂණය කිරීම | | X | X | X |
| | පරීක්ෂණ පවත්වාගෙන යාම | | | X | X |
| මිල පිරික්සුම් දත්ත පද්ධතිය | ලෝකයේ අධ්‍යයනය පිළිබඳ උදාහරණ | X | | | |
| | ශක්‍යතා අධ්‍යයන පැවැත්වීම | X | X | | |
| | සුදුසු පර්යේෂණ දත්ත විශ්ලේෂණය කිරීම | X | X | | |
| | HS භාණ්ඩ සංකේත / අයිතම පොකුරු ගත කිරීම | X | X | X | |
| | පරීක්ෂණ පවත්වාගෙන යාම | | | X | X |

| කාර්යය | ක්‍රියාකාරීත්වය | ප්‍රතිඵලය |
|---|---|---|
| දිගු කාමරයේ සීඝ්‍ර මාර්ග ප්‍රලේඛන වැඩසටහන | නීතිගරුක වීමට එකඟ වී ඇති ව්‍යාපාරිකයන් හඳුනාගැනීම<br>ආයතන වෙත ගොස් බැලීම<br>සීඝ්‍ර මාර්ග භාණ්ඩ හිමිකරුවන්ගේ නාමලේඛණය නිසිපරිදි පවත්වාගෙන යාම සහ අධීක්ෂණය කිරීම (*) | සීඝ්‍ර මාර්ග ප්‍රලේඛන වැඩසටහන සඳහා භාණ්ඩ හිමිකරුවන් 208 දෙනෙකු හඳුනා ගෙන ඇත. වැඩසටහන තුළ අඛණ්ඩව සමාගමේ ආනයන දත්ත විශ්ලේෂණය කර ඇත. කාර්ය මණ්ඩලයේ හිඟය නිසා සියළුම සමාගම් අධීක්ෂණය කිරීම සිදු නොවිය. |
| වැඩි අවදානම් භාණ්ඩ තේරීම | වැඩි අවදානම් භාණ්ඩ හඳුනාගැනීම<br>වැඩි අවදානම් ලේඛණය නිසිපරිදි පවත්වාගෙන යාම අධීක්ෂණය කිරීම (*)<br>වැඩි අවදානම් ලේඛනය නිතර නිතර අළුත් කිරීම (*) | 2015 ජුනි මාසයේ දී වැඩි අවදානම් භාණ්ඩ සම්පූර්ණයෙන් සමාලෝචනය කරන ලදී. ලේඛනයට අමතරව විශ්ලේෂණ දත්තවලින් සහ CIU වාර්තාවලින් අඛණ්ඩව සමාලෝචනය සිදුකරනු ලබයි |

| | | |
|---|---|---|
| **ස්වයංක්‍රීය වර්ණීය වැඩසටහන** | ලෝකයේ අධ්‍යයනය පිළිබඳ උදාහරණ<br>ශක්‍යතා අධ්‍යයන පැවැත්වීම<br>අවදානම් පරාමිතියෙන් හඳුනා ගැනීම<br>අවදානම් මට්ටම් සැකසීම<br>සුදුසු පර්යේෂණ දත්ත විශ්ලේෂණය කිරීම<br>පරික්ෂණ පවත්වාගෙන යාම | ජෝර්දානයෙන් සහ ඕස්ට්‍රේලියාවෙන් රැස්කර ගත් දත්ත සහ පසුගිය වර්ෂවල ලබාගත් අත්දැකීම් මගින්, වරණීය නිර්නායකය වැඩිදියුණු කිරීම හා ක්‍රියාත්මක කිරීම සිදුකරන ලදී. අසාමාන්‍ය අපනයන වශයෙන් අවදානම් සාධක, ආනයනය කරන රට ආදිය සැලකිල්ලට ගන්නා ලදී. දිගු කාමරය මගින් ක්‍රියාවලි ගතකරන ලද සියළුම **FCL** භාණ්ඩවලින් තෝරාගනු ලැබූ 3% ක වැඩි අවදානම් භාණ්ඩ ලැයිස්තුව සමඟ ඒකාබද්ධ කරන ලද ස්වයංක්‍රීය වරණීය නිර්නායක 5 ක් ක්‍රියාත්මක කරන ලදී. |
| **මිල පිරික්සුම් දත්ත පද්ධතිය** | ගෝලීය අධ්‍යයනය පිළිබඳ උදාහරණ<br>ශක්‍යතා අධ්‍යයන පැවැත්වීම<br>සුදුසු පර්යේෂණ දත්ත විශ්ලේෂණය කිරීම<br>HS භාණ්ඩ සංකේත / අයිතම පොකුරු ගත කිරීම<br>පරික්ෂණ පවත්වාගෙන යාම | ඉන්දියාවේ භාවිතා කරන ලද මිල පිරික්සුම් දත්ත පද්ධතිය අධ්‍යයනය කිරීමෙන් පසු, රේගු ප්‍රකාශනවලට යාකළ යුතු විද්‍යුත් මිල පිරික්සුම් පත්‍රය වැඩිදියුණු කිරීම සඳහා තොරතුරු සහ තාක්ෂණ සන්නිවේදන අංශයට භාරදෙන ලදී. විද්‍යුත් මිල පිරික්සුම් පත්‍රය සකස් කර ඇති අතර, රේගු ප්‍රකාශන ඉදිරිපත් කරන විට එය ඉදිරිපත් කිරීමට අනිවාර්ය කළයුතුව ඇත. |

(* ක්‍රියාකාරකම අඛණ්ඩව සිදුකරයි.)

# තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය

**හැඳින්වීම**

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශයේ අරමුණ වන්නේ පැය විසිහතර පුරාම නිරන්තරයෙන් දෙපාර්තමේන්තුව වෙත රේගු සටහන්කර පිළිබඳ කටයුතු කිරීමට හා අන්තර්ජාල සේවාවන් පවත්වා ගෙන යාමට අවශ්‍ය තාක්ෂණ, සේවා පහසුකරණයන් ලබාදීමයි. රේගු සටහන්කර සම්බන්ධව කටයුතු කිරීමේ ක්‍රියාවලිය පූර්ණ වශයෙන් ස්වයංක්‍රීය කිරීමෙන් යහපත් රේගු පරිපාලනයක් සඳහා වේගවත්, ගුණාත්මක තොරතුරු ඵලදායී හා ප්‍රතිඵලදායී හා කාර්යක්ෂම ලෙස ලබාදීම තහවුරු කරයි. මෙම අංශය මේ වන විට ඵලදායී හා බිඳවැටීම් වලින් තොරතුරු තාක්ෂණපදනම් කරගත් පද්ධතා ස්ථාපිත කිරීමටත්, රේගු සටහන්කර හා ඊට අදාළ සහය ලියකියවිලි ඉලෙක්ට්‍රෝනිකව ඉදිරිපත් කිරීමටත් අවශ්‍ය කටයුතු කරමින සිටියි.

## ප්‍රධාන කාර්යයන්

1. ස්වයංක්‍රීයකරණය තුළින් ආයතනික අරමුණු ඉටු කර ගැනීමට සහය වීම.
2. පද්ධති ජාලය, පරිගණක හා දත්ත ගබඩා සාර්ථක ලෙස නඩත්තු කිරීම.
3. රේගු පාලනයට, අනෙක් රේගු අංශයන්ට, අනෙකුත් රජයේ ආයතනයන්ට හා සහයක ආයතනයන්ට අවශ්‍ය වේලාවට නිවැරදි තොරතුරු වාර්තා ලබාදීම.
4. ගෝලීය වැඩිදියුණු කිරීම්වලට සාරානුකූලව ඇගයීම් සිදුකිරීම හා පවත්නා පද්ධති යාවත්කාලීන කිරීම; ආසිකුඩා භාණ්ඩ පාලන පද්ධතිය, රථවාහන පාලන පද්ධතිය හා තිනෙත් පද්ධතිය .
5. අධීක්ෂණ මෙහෙයම් අරමුණු ඉටුකරගැනීම සඳහා මෙම අංශයේ කාර්ය මණ්ඩලයේ තොරතුරු තාක්ෂණ දැනුම සමඟ වෘත්තීය ගුණාත්මකභාවය වර්ධනය කිරීම.
6. දෙපාර්තමේන්තුව තුළ තොරතුරු තාක්ෂණ දැනුම හා ඒවායේ මෙහෙයුම්වලට අදාළ පුහුණු වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම.

**ප්‍රධාන කාර්යය**

1). ආදායම් අරමුණු යටතේ ප්‍රධාන කාර්යය

| ප්‍රධාන කාර්යය | | |
|---|---|---|
| ප්‍රධාන පියවර | **2015.12.31** දිනට ප්‍රගතිය | විශේෂ සටහන් |
| **1.ආදායම් අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා මුදල් අමාත්‍යාංශයට හා මහ බැංකුවට සංඛ්‍යාලේඛන වාර්තා සැපයීම.** | 100% | |
| **2.** ආදායම ඉහළ නැංවීමට අයවැයට යෝජනා ඉදිරිපත් කිරීම. | 100% | |
| **3.** වෙළඳ ගිවිසුම් ක්‍රියාත්මක කිරීම | 100% | |

2) පාලන අරමුණු යටතේ ප්‍රධාන කාර්යයන්

| ප්‍රධාන කාර්යය | | |
|---|---|---|
| ප්‍රධාන පියවර | | |
| **1. ආසිකුඩා ගෝලීය ක්‍රමය තුළ භාණ්ඩ පාලන ක්‍රමය හඳුන්වා දීම.** | 100% | |
| **2. ආසිකුඩා ගෝලීය ක්‍රමයේ වරණීය ලක්ෂණ හඳුන්වාදීම.** | ඉටුවී නැත | වරණීය මිනුම් දණ්ඩ තීරණය කිරීම සඳහා නිලධාරි කණ්ඩයමක් පත්කර ඇත. |
| **3. ආසිකුඩා ගෝලීය පද්ධතියට ආනයන පාලන දෙපාර්තමේන්තුව සම්බන්ධ කිරීම** | 100% | |
| **4. ආසිකුඩා ගෝලීය පද්ධතියට ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සම්බන්ධ කිරීම.** | 100% | |
| **5. විද්‍යුත් සිද්ධි ලේඛනයක් හඳුන්වාදීම** | 100% | |

### 3). වෙළඳ පහසුකම් සැලසීමේ අරමුණු යටතේ ප්‍රධාන කාර්යයන්

| ප්‍රධාන කාර්යය | | |
|---|---|---|
| ප්‍රධාන පියවර | | |
| 1. අනෙකුත් ආයතන සමග සන්නිවේදනය කිරීම සඳහා පණිවුඩ හුවමාරු ක්‍රමය ක්‍රියාත්මක කිරීම | 100% | මෙම අවශ්‍යතාවය සපුරාලීම සඳහා විකල්ප වෙබ් සේවාවක් හඳුන්වා දීම |
| 2. ආසිකුඩා ගෝලීය පද්ධතිය තුල පිටවීමේ සටහනක් ක්‍රියාත්මක කිරීම | ඉටුවී නැත | පරික්ෂණ අංගනවල පරිගණක සහ ඡාල සූදානම් කර නොමැත. |
| 3. CDN තොරතුරු ස්වයංක්‍රීයව පර්යන්ත මෙහෙයවන්නන් හට යැවීම | ඉටුවී නැත | රේගුව සූදානම් කර ඇත. |
| 4 වෙළඳ කටයුතු පහසු කිරීම සඳහා පරික්ෂා කිරීමේ අංගනවලට ආසිකුඩා ගෝලීය පද්ධතිය ලබාදීම. | ඉටුවී නැත | පරික්ෂණ අංගනවල පරිගණක සහ ඡාල සූදානම් කර නොමැත. |
| 5. ස්වයංක්‍රීයව ප්‍රකාශන ඉවත් කිරීම | ඉටුවී නැත | පරික්ෂණ සිදුකර ඇත. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය කටයුතු සූදානම් කර ඇත. ක්‍රියාත්මක කරන දිනය තීරණය කළයුතුව ඇත. |
| 6. විවෘත ගිණුම් හැසිරවීමේ පද්ධතියක් හඳුන්වාදීම | ඉටුවී නැත | වැඩසටහන සකස් කර ඇත. |
| 7. අනෙකුත් වාණිජ බැංකු රජයේ එක බැංකුවකට සම්බන්ධ කිරීම | ඉටුවී නැත | රේගුව විසින් කටයුතු සූදානම් කර ඇත ICTA හරහා බැංකු සම්බන්ධ කිරීම සූදානම් කර නැත. |

### 4). අනෙකුත් අරමුණු යටතේ ප්‍රධාන කාර්යයන්

| ප්‍රධාන ක්‍රියාකාරකම | | |
|---|---|---|
| ප්‍රධාන පියවර | | |
| 1. ආසිකුඩා ගෝලීය පද්ධතියෙන් නිලධාරීන්ගේ වාර්තා ලබාගැනීම. | ඉටුවී නැත | පරික්ෂණ අංගනවල පරිගණක සහ ඡාල සූදානම් කර නොමැත. |
| 2. දත්ත පද්ධතිය අධිලේඛනගත කිරීම | ඉටුවී නැත | මෙය තවදුරටත් අවශ්‍ය නොවන බව සලකනු ලබයි. |

# මධ්‍යම මිල පිරික්සුම් අංශය

## හැඳින්වීම

රේගු ආඥා පනතේ උපලේඛන ඉ හි වගන්තිවලට අනුව ආනයන භාණ්ඩවල ප්‍රකාශිත මිල සත්‍යෝක්ෂණය කිරීම සහ නිර්ණය කිරීමට අදාල කාර්යයන් මධ්‍යම මිල පිරික්සුම් අංශය විසින් ඉටුකරනු ලබයි. දෙපාර්තමේන්තුවේ අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා දායක වන, මිල පිරික්සුම් ක්‍රියාවලියට අදාල සමස්ත තීරණ රේගු ආඥා පනතේ 51 සහ 52 වගන්තිවල විධිවිධාන යටතේ ක්‍රියාත්මක කරනු ලැබේ.

## අරමුණු

- දෙපාර්තමේන්තු ඉලක්ක සඳහා දායක වන අතරම මිල පිරික්සුම් උපකරණ හා හැකියාවන් ගොඩනැගීම තුළින් කාර්යක්ෂමතාව හා ඵලදායීතාව වර්ධනය කිරීම.
- නීත්‍යානුකූල වෙළඳාමට විධිමත් පහසුකම් සැලසීම සඳහා දායකවීම.
- ලෝක රේගු සංවිධානය, ලෝක වෙළඳ සංවිධානය සහ අනෙකුත් ජාත්‍යන්තර මෙවලම් සහ උපකරණවලට අනුකූල වන වඩා උසස් පරිචයන් භාවිතා කරමින් පාර්ශවකරුවන්ට සහ කාර්ය මණ්ඩලයේ අනුකූල වීමේ මට්ටම වර්ධනය කිරීම.

## ප්‍රධාන කාර්යයන්

- රේගු ආඥා පනතේ 51 වන වගන්තිය මගින් බලාත්මක කරන ලද 1994 WTO GATT හි vii වගන්තියේ විධිවිධාන විධිමත් යොදා ගන්නා බවට සහතික වීම.
- රේගු මිල පිරික්සුම් පිළිබඳ ප්‍රතිපත්ති සම්බන්ධව මිල පිරික්සුම් කමිටුවට සහයෝගය දීම.
- පිරික්සුම් නීතිය ඵලදායිව හා ඒකාකාරීව යොදා ගැනීම සඳහා පිරික්සුම් මෙවලම් (එනම් පිරික්සුම් දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම, විටින් විට අනතුරු ඇඟවීම් නිකුත් කිරීම. ) උසස් පරිචයන් වර්ධනය කිරීම
- උපලේඛනයේ ඊ වගන්තියට අනුව ප්‍රකාශිත පිරික්සුම් මිල සත්‍යෝක්ෂණය කිරීම සහ ආනයන භාණ්ඩවල රේගු මිල නිර්ණය කිරීම.
- රේගු මිල පිරික්සුමට අදාල ප්‍රතිපත්ති කාරණා පිළිබඳ මිල පිරික්සුම් කමිටුවට සහයෝගය දැක්වීම
- මිල පිරික්සුම් ගැටළු නිරාකරණය සඳහා රාජ්‍ය පෞද්ගලික හවුල වර්ධනය කිරීම සහ මිල පිරික්සුම් පර්යේෂණ සඳහා මහජනතාවට ආරාධනා කිරීම.
- සංවේදී භාණ්ඩවල මිල ප්‍රවණතාව අධීක්ෂණය කිරීම, ආදායමට අදාල අවශ්‍ය පියවර ගැනීම සඳහා මිල පිරික්සුම් පරීක්ෂණ, පර්යේෂණ , විමර්ශන සිදුකිරීම
- අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (C) සහ රේගු අධ්‍යක්ෂක (CIDA) මගින් අදාල ජාත්‍යන්තර සංවිධාන - මූලාශ්‍ර සමග රේගු මිල පිරික්සුම් කරුණු සම්බන්ධව සම්බන්ධතාවයන් ඇති කර ගැනීම.

| ප්‍රධාන ක්‍රියාකාරකම | ඉලක්කය | තත්‍ය | ඉටු නොකරන ලද්දේ නම් ඊට හේතු |
|---|---|---|---|
| 1.1 මිල පිරික්සුම් සංවේදී භාණ්ඩ හඳුනාගැනීම. | වරණය අරමුණු සඳහා පිරික්සුම් සංවේදී භාණ්ඩවල HS අංක හඳුනාගැනීම සහ RMU වෙත වාර්තා කිරීම. | සාර්ථක ලෙස ඉටුකරන ලදී (එමෙන්ම නිරන්තරයෙන්ම වාර්තා කිරීම සිදුවේ. | |

| | | | |
|---|---|---|---|
| 1.2 තාක්ෂණික තොරතුරු ලබාගැනීම සඳහා පෞද්ගලික අංශය හා රාජ්‍ය ආයතන සමඟ හවුල්කාරත්වය වර්ධනය කිරීම. (නිමි නිෂ්පාදන, නිෂ්පාදන ක්‍රියාවලිය අමුද්‍රව්‍ය යනාදිය භාවිතය) | සමහර නිශ්චිත අයිතමයන් සඳහා අවම මිල නිර්ණය කිරීම සඳහා වෙනස් නොවන සහ පිළිගත හැකි ක්‍රමවේදයක් පවත්වාගෙන යාම | වෙළඳ භාණ්ඩ කිහිපයක ඒකීයත්වය යොදාගැනීමට හැකිවිය. (එනම් භාවිත කළ වාහන කොටස් සංගමය, ෆෙලෙක්සිබල් පැකින් ඇසෝසියේෂන් දැව ආනයනකරුවන්ගේ සංගමය විසින් සිදුකරන ලද ආනයන) | |
| 1.3 මිල පිරික්සුම් තීරණ ආරවුල් බවට පත්වන අවස්ථාවේදී අවශ්‍ය පර්යේෂණ සඳහා VRU වෙත යොමු කිරීම | පිළිගත හැකි මිලගණන් යොදා ගැනීම සඳහා | සාර්ථකව ඉටු කරන ලදී. | |
| ප්‍රධාන කාර්යය : **2. පිරික්සුම් සංවේදී භාණ්ඩවල අවම මිල තක්සේරු කිරීම සඳහා ක්‍රමවේදයක් වැඩිදියුණු කර පවත්වාගෙන යාම.** | | | |
| 2.1 ආදායම් සංවේදී අයිතමයන් සඳහා අවම මිලගණන් පර්යේෂණ කිරීම සහ හඳුනාගැනීම (එනම් දේශීය කර්මාන්තවලට මෙන්ම ආදායමට අහිතකර ලෙස බලපෑ හැකි ) | අමුද්‍රව්‍ය මිල ගණන් පදනම් කරගෙන අවම පරිශීලන මිලක් ස්ථාපිත කිරීම | අවම පරිශීලන මිලක්, මිල පදනමක් වැඩිදියුණු කර ඇත. | |
| 2.2 නිෂ්පාදන ක්‍රියාවලිය සහ අමුද්‍රව්‍ය සංයුතිය හඳුනා ගැනීම | විවිධ මට්ටම්වලදී නිෂ්පාදනවල වටිනාකම් වෙන් වෙන් වශයෙන් දැක්වීම (උදා : මූලික, අර්ධ නිමි සහ නිමි ආදි වශයෙනි. | දැව, නම්‍යශීලි ඇසුරුම් කිරීම, වීදුරු භාණ්ඩ නිෂ්පාදනය, Diaper ආදි වැනි නිෂ්පාදන ක්‍රියාවලින් පිළිඳඹ කලින් කල සමාලෝචනය සිදුකරනු ලබයි. | |
| 2.3 අවම මිල පිළිබඳ තීරණ රේගු අධ්‍යක්ෂ / නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂක වෙත වාර්තා කිරීම සහ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (C) වෙත දැනුම් දීම. | දේශීය නිෂ්පාදකයින් ආරක්ෂා කරමින් අපේක්ෂිත ආදායම් ඉලක්කක සපුරා ගැනීම | සාර්ථකව ක්‍රියාත්මක වේ. (අමුද්‍රව්‍යවල ලෝක වෙළඳපලේ මිලගණන් වලට අනුව මිලගණන් නිතර වෙනස් වන නිසා කාලානුරූපීව යාවත්කාලීන කිරීමට යටත්ව) | |
| 3. ප්‍රධාන කාර්යය : මිල පිරික්සුම් දත්ත පද්ධතියක් වැඩිදියුණු කිරීම | | | |
| 3.1 ඉහළ සහ වටිනාකම අනුව බදු අනුපාතවලට අදාල අයිතමයන් හඳුනාගැනීම (ඉහළ ආදායම්) | එවැනි භාණ්ඩවල ප්‍රමාණික වටිනාකම් ලබාගැනීම (ආනුෂංගික සහ සමාන භාණ්ඩ හඳුනාගැනීම | HS සංකේත ලේඛන කාලීනව RMU වෙත යොමු කෙරේ | |

| | | | |
|---|---|---|---|
| 3.2 මිල සත්‍යාක්ෂණ, නව පරිපූර්ණ ආකෘතියක් නිර්මාණය කිරීම (එනම් විද්‍යුත් VDF) | රේගු ප්‍රකාශනවල (සමාන සහ අනුෂාංගික භාණ්ඩවල මිළ) පිළිගත හැකි මිළ ස්වයංක්‍රීයව ලබාගැනීම සඳහා කාර්යක්ෂම පද්ධතියක් වැඩිදියුණු කිරීම සහ මිල පිරික්සුම් පද්ධතියේ ස්ථාපිත කිරීම. | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ සහයෝගයෙන් මූලික පියවරක් වශයෙන් E-VDF ක්‍රියාත්මක කිරීම ආරම්භ කරන ලදී. | තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ අංශයට තනි වින්ඩෝස් එකක් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමුඛත්වය ලබාදීමට සිදුවිය. |
| 3.3 රේගු අධිකාරිවරුන් / තක්සේරුකරුවන් විසින් රේගු සටහන්කර පරීක්ෂා කිරීම මගින් සහ VRU කාර්ය මණ්ඩලය විසින් සිද්ධි සම්බන්ධයෙන් ලබාදෙන තීරණ මගින් භාණ්ඩ ප්‍රමාණික වටිනාකම් රැස්කිරීම. | යාවත්කාලීන කරන ලද අවම පරිශීලන වටිනාකමක් තබාගැනීම | කලින් කල යාවත්කාලීන කිරීම් සහ ස්වයංක්‍රීය මිළ පිරික්සුම් D-V ස්ථාපිත කිරීම තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශයේ සිදුකෙරෙමින් පවති. | |
| 4. නිත්‍යානුකූල වෙළඳාමට පහසුකම් සැලසීම සඳහා පියවර ගැනීම. | | | |
| 4.1 ආනයනකරුවා සමඟ විධිමත්ව සාකච්ඡා කිරීමෙන් පසුව මිල පිරික්සුම් තීරණ ගැනීම. | රේගු ආඥා පනතේ 51 වගන්තියේ විධිවිධාන අදාල කරගැනීම | නව පිරික්සුම් මිල සත්‍යාක්ෂණය කිරීම ක්‍රියාත්මක කිරීම මගින් සාක්ෂාත් කරගන්නා ලදී. (VVF) | |
| 4.2 අභියාචනය කිරීමේ යාන්ත්‍රණය | ආනයනකරුවන්ගේ දුක්ගැනිවිලිවලට පිළියම් යෙදීම | සාර්ථක ලෙස ඉටුකරන ලදි | |
| 4.3 ලෝක රේගු සංවිධානයේ අධ්‍යයන වාර්තාවට අනුව පියවර ගැනීම. | නිශ්කාෂණය සීඝ්‍රව සිදුකරන ලදී. | ඉටු කරන ලදී. | |
| 4.4 මිළ පිරික්සුම් නියමයන්ට අනුව ඇප මත භාණ්ඩ නිදහස් කිරීම | ආනයනකරුවන්ගේ දුක්ගැනිවිලිවලට පිළියම් යෙදීම | සාර්ථක ලෙස ඉටුකරන ලදි | |

මධ්‍යම මිල පිරික්සුම් අංශයේ මාසික සංඛ්‍යා - **2015**

| මාසය | ලැබුණු මුළු සටහන්කර සංඛ්‍යාව | වටිනාකම සංශෝධනය කළ සටහන්කර සංඛ්‍යාව | මිල ගැලපුම්වල ප්‍රතිශතය | අයකරගත් මුදල |
|---|---|---|---|---|
| ජනවාරි | 1531 | 676 | 44.00% | 54,449,710.00 |
| පෙබරවාරි | 1743 | 979 | 56.00% | 91,402,400.00 |
| මාර්තු | 1359 | 588 | 34.00% | 63,774,886.00 |
| අප්‍රේල් | 1260 | 545 | 31.00% | 51,392,966.00 |
| මැයි | 1523 | 673 | 44.00% | 64,329,233.00 |
| ජූනි | 1844 | 832 | 45.00% | 87,569,600.55 |
| ජූලි | 1504 | 707 | 47.00% | 78,257,088.00 |
| අගෝස්තු | 1420 | 662 | 47.00% | 65,483,265.00 |
| සැප්තැම්බර් | 1380 | 673 | 49.00% | 84,140,105.00 |
| ඔක්තෝබර් | 1484 | 732 | 49.00% | 79,746,391.00 |
| නොවැම්බර් | 1711 | 924 | 54.00% | 106,194,920.00 |
| දෙසැම්බර් | 1512 | 793 | 52.00% | 93,567,883.00 |
| මුළු එකතුව | **18271** | **8784** | **46.00%** | **920,308,447.55** |

| කාර්යසාධන සැසඳීම 2014 - 2015 | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| මාසය | යොමු කරනු ලැබූ සටහන්කර සංඛ්‍යාව | | වටිනාකම සංශෝධනය කළ සටහන්කර සංඛ්‍යාව | | මිල පිළිගත් මුළු සටහන්කර සංඛ්‍යාව | | මිල සංශෝධනයන්ගේ ප්‍රතිශතය | | අමතර සටහන්කර මගින් අයකර ගත් මුදල | |
| | 2014 | 2015 | 2014 | 2015 | 2014 | 2015 | 2014 | 2015 | 2014 | 2015 |
| ජන | 2550 | 1531 | 695 | 676 | 1855 | 855 | 27.00% | 44.00% | 57,224,493.00 | 54,449,710.00 |
| පෙබ | 2202 | 1743 | 673 | 979 | 1529 | 764 | 31.00% | 56.00% | 66,208,615.00 | 91,402,400.00 |
| මාර්තු | 2267 | 1359 | 679 | 588 | 1588 | 771 | 30.00% | 34.00% | 65,694,110.00 | 63,774,886.00 |
| අප්‍රේල් | 2153 | 1260 | 737 | 545 | 1416 | 715 | 34.00% | 31.00% | 61,577,199.00 | 51,392,966.00 |
| මැයි | 2087 | 1523 | 607 | 673 | 1480 | 850 | 29.00% | 44.00% | 43,792,269.00 | 64,329,233.00 |
| ජූනි | 2244 | 1844 | 649 | 832 | 1595 | 1012 | 29.00% | 45.00% | 50,771,482.00 | 87,569,600.55 |
| ජූලි | 2300 | 1504 | 807 | 707 | 1493 | 797 | 35.00% | 47.00% | 65,188,511.00 | 78,257,088.00 |
| අගෝ | 2114 | 1420 | 725 | 662 | 1389 | 758 | 34.00% | 47.00% | 54,970,957.00 | 65,483,265.00 |
| සැප්. | 2020 | 1380 | 752 | 673 | 1268 | 707 | 37.00% | 49.00% | 60,165,713.00 | 84,140,105.00 |
| ඔක්. | 2104 | 1484 | 885 | 732 | 1219 | 752 | 42.00% | 49.00% | 73,967,692.00 | 79,746,391.00 |
| නොවැ | 2093 | 1711 | 824 | 924 | 1269 | 787 | 39.00% | 54.00% | 71,542,811.00 | 106,194,920.00 |
| දෙසැ | 2223 | 1512 | 1036 | 793 | 1187 | 719 | 47.00% | 52.00% | 93,500,943.00 | 93,567,883.00 |
| **එකතුව** | **26357** | **18271** | **9069** | **8784** | **17288** | **9487** | **34.50%** | **46.00%** | **764,604,795.00** | **920,308,447.55** |

| | 2015 | 2014 |
|---|---|---|
| දිගු කාමරයේ සිදු කරනු ලැබූ මුළු රේගු සටහන්කර සංඛ්‍යාව | 213257 | 185933 |
| මධ්‍යම තක්සේරු අංශයට යොමුකරන ලද රේගු සටහන්කර ප්‍රතිශතය. | 8.6% | 14% |

**2015 වර්ෂයේ මිල පිරික්සුම් විමර්ශණ (Investigation) අංශයේ කාර්ය සාධනය.**

| | | |
|---|---|---|
| 1 | 2015 01 01 සිට දක්වා 201512.31ලියාපදිංචි වූ )Cases) සිද්ධි සංඛ්‍යාව | 106 |
| 2 | අවසන් වූ සිද්ධි සංඛ්‍යාව. | 90 |
| 3 | වැරදි ලෙස තහවුරු කළ සහ රාජසන්තක කළ .වදඩ ගැසූ කාරණ සංඛ්‍යා / | 44 |
| 4 | සාර්ථක වූ (effect) සිද්ධි ප්‍රතිශතය. | 41.5% |
| 5 | 2015.01.01 සිට 2015 12.31.දක්වා අය කර ගන්නා ලද මුළු දඩ හා රාජසන්තක කළ ප්‍රමාණය (රු.) | 116,783,778.00 |
| 6 | රාජසන්තක කළ භාණ්ඩවල මුළුවටිනාකම | Nil |
| 7 | 2015 01.01.සිට 2015 12.31.දක්වා සම්පූර්ණ නොකරන ලද සිද්ධිවල මුළු සංඛ්‍යාව. | 16 |

**මිල පිරික්සුම් විමර්ශණ ඒකකයේ කාර්යසාධන සැසඳීම 2014 - 2015**

| | | 2014 | 2015 |
|---|---|---|---|
| **1** | ලියාපදිංචි වූ සිද්ධි) Cases) සංඛ්‍යාව | 95 | 106 |
| **2** | අවසන් වූ සිද්ධි සංඛ්‍යාව. | 85 | 90 |
| **3** | වැරදි ලෙස තීරණය වූ සහ රාජසන්තක කළ දඩ ගැසූ /සිද්ධි සංඛ්‍යාව. | 48 | 44 |
| **4** | ඉටු කරන ලද මුළු දඩ රාජසන්තක කළ සංඛ්‍යාව (.රු) | 252,961,343.04 | 116,783,778.00 |
| **5** | අසම්පූර්ණ මුළු සිද්ධි ලිපිගොනු සංඛ්‍යාව | 10 | 16 |

කෙටි යෙදුම් :

RMU - අවදානම් කළමනාකරණ ඒකකය
VIU - මිල පිරික්සුම් විමර්ශන ඒකකය
VRU - මිල පිරික්සුම් පර්යේෂණ ඒකකය

# විශේෂ සේවා අංශය

## හැඳින්වීම

විශේෂ සේවා අංශය මගින් රේගු දෙපාර්තමේන්තුවට සහ රේගු සේවය ලබාගන්නා අනෙකුත් ආයතනවලට විවිධ සේවාවන් සපයයි. ඒ අතර ආනයන/අපනයන භාණ්ඩ වර්ගීකරණය ආනයන/අපනයන රසායන ද්‍රව්‍ය විශ්ලේෂණය මැණික් හා ස්වර්ණාභරණ තක්සේරුකරණය, රේගු නියෝජිතයින්ට බලපත්‍ර නිකුත් කිරිම, ආනයන අපනයන රේගු ප්‍රකාශන ක්‍රියාකරවීම පහසු කිරිම සඳහා මෙම ආසිකුඩා ක්‍රමයෙන් ආනයන/අපනයනකරුවන් ලියාපදිංචි කිරීම වැනි සේවාවන් සපයනු ලබයි.

**ප්‍රධාන කාර්යයන්**

1. භාණ්ඩ වර්ගීකරණය
2. රසායනික සහ ඊට අයත් නිෂ්පාදන හඳුනා ගැනීම සහ වර්ගීකරණය
3. මැණික්, වටිනා ලෝහ හා ස්වර්ණාභරණ හඳුනාගැනීම, වර්ගීකරණය හා වටිනාකම තක්සේකරු කිරීම.

රේගු දෙපාර්තමේන්තුවේ සහය සේවා පර්ෂදය යටතේ ක්‍රියාත්මක වන විශේෂ සේවා අංශය ශාඛා හතරකින් සමන්විත වේ.

### භාණ්ඩ වර්ගීකරණ අංශය

ආනයන/අපනයන භාණ්ඩ සඳහා වඩාත් සුදුසු වන සංයෝජිත වර්ගීකරණ කේත ක්‍රම ( HS) නිර්ණය කිරීම මෙම අංශයේ වගකීම වේ. රේගු ප්‍රකාශන ක්‍රියාකාරි ඒකකය හෝ බඩු පරික්ෂා කිරීමේ ඒකකය විසින් එක් භාණ්ඩයකට වර්ගීකරණ කේත අංක ( HS) තීරණය කිරීමේදී ගැටලුවක් මතුවුවහොත් එය මෙම අංශය වෙත යොමු කරනු ඇත.

වෙළඳාම පහසු කරන මිනුමක් ආකාරයට මෙම අංශය ආනයන/අපනයන කළ යුතුව ඇති භාණ්ඩවලට වර්ගීකරණය ඉදිරි තීරණ නිකුත් කරනු ඇත. ආනයන අපනයනකරුවන් රේගු වෙබ් අඩවියේ ඇති ඉල්ලුම් පත්‍ර සම්පූර්ණ කර ඉදිරිපත් කිරීමේදී මෙම තීරණය ගත යුතුව ඇත

.

- **2015** කාර්යසාධනය

| **01.** වර්ගීකරණයේ ඉදිරි තීරණ | |
|---|---|
| ලැබුණු අයඳුම්පත් සංඛ්‍යාව | 300 |
| නිකුත් කරන ලද තීරණ සංඛ්‍යාව | 251 |
| වෙනස | 49 |
| **02.** වර්ගීකරණ ගැටලු | |
| ලැබුණු වර්ගීකරණ ගැටලු සංඛ්‍යාව | 643 |
| අවසන් කරන ලද වර්ගීකරණ ගැටලු සංඛ්‍යාව | 625 |
| වෙනස | 18 |

- පසුගිය වර්ෂ හා සංසන්දනය කිරීම

**01.** වර්ගීකරණ ඉදිරි තීරණ

| | ලැබුණු අයදුම්පත් සංඛ්‍යාව | නිකුත් කරන ලද තීරණ සංඛ්‍යාව | සම්පූර්ණ කිරීමේ ප්‍රතිශතය |
|---|---|---|---|
| **2013** | 627 | 514 | 82% |
| **2014** | 497 | 490 | 99% |
| **2015** | 300 | 251 | 84% |




**02.** වර්ගීකරණ ගැටළු

| | ලැබුණු වර්ගීකරණ ගැටලු සංඛ්‍යාව | අවසන් කරන ලද ගැටලු සංඛ්‍යාව | සම්පූර්ණ කිරීමේ අනුපාතය |
|---|---|---|---|
| **2013** | 792 | 785 | 99% |
| **2014** | 920 | 912 | 99% |
| **2015** | 643 | 625 | 97% |



# රේගු විද්‍යාගාර අංශය

ආනයන හා අපනයන කරන රසායනික ද්‍රව්‍ය හා ඊට සමාන ද්‍රව්‍ය හඳුනා ගැනීම සඳහා රේගුවට හා පාර්ශවකරුවන්ට සහායවීමට මෙම අංශය පිහිටුවන ලදී. ආනයනික හා අපනයනික රසායන ද්‍රව්‍ය හා ඒ සම්බන්ධ භාණ්ඩවල හඳුනාගැනීම පිළිබඳ සැකයක් මතුවූ අවස්ථාවලදී ඒවා පරීක්ෂා කිරීම සඳහා ඒවායේ නියැදි රේගු විද්‍යාගාරය වෙත යවනු ලැබේ. එවැනි ද්‍රව්‍යවල වර්ගීකරණය පිළිබඳව මතභේද මතු වූ අවස්ථාවලදී ද එම බදු හා ලිපිලේඛන මෙම අංශයේ තීරණය සඳහා යොමු කරයි.

කාර්මික ඒකකයක් ආකාරයට මෙම අංශය විවිධ සම්මුතීන් සහ පවත්නා රෙගුලාසි ක්‍රියාත්මක කිරීමේදී අනෙකුත් අදාල පාර්ශව සමඟ සම්බන්ධීකරණය සිදුකරනු ලබයි.

- **මුළු රේගු අණකර සංඛ්‍යාව - 2015**

| | | ලැබී ඇති සංඛ්‍යාව | අවසන් කර ඇති සංඛ්‍යාව | සම්පූර්ණ කිරීමේ අනුපාතය |
|---|---|---|---|---|
| මුළු රේගු අණකර සංඛ්‍යාව | හඳුනා ගැනීම සඳහා පමණක් රේගු අණකර විශ්ලේෂණය | 8 | 8 | 100% |
| | වර්ගීකරණය සඳහා පමණක් රේගු අණකර විශ්ලේෂණය | 7 | 7 | 100% |
| | වර්ගීකරණය සඳහා පමණක් රේගු අණකර | 152 | 150 | 99% |
| මුළු තීරණ හා සිද්ධි ලිපිගොනු සංඛ්‍යාව | 'CC'ශාඛාවෙන් යොමු කරන ලද තීරණ ලිපිගොනු | 41 | 41 | 100% |
| | අනෙකුත් ශාඛාවලින් යොමු කරන ලද සිද්ධි ලිපිගොනු | 39 | 39 | 100% |
| | එකතුව | **247** | **245** | **99%** |

රේගු සටහන්කරයේ පරිදි 2015 වර්ෂයේ අයවිය යුතු මුදල (රු.) :- 15,599,038



- පසුගිය වර්ෂ හා සංසන්දනය කිරීම

රේගු සටහන්කර, තීරණ සහ සිද්ධි ලිපිගොනු

| | ලැබී ඇති සංඛ්‍යාව | අවසන් කර ඇති සංඛ්‍යාව | සම්පූර්ණ කිරීමේ අනුපාතය |
|---|---|---|---|
| **2013** | 488 | 488 | 100% |
| **2014** | 357 | 357 | 100% |
| **2015** | 247 | 245 | 99% |

ලැබිය යුතු තීරුබදු ප්‍රමාණය අයකර ගැනීම

| | 2013 | 2014 | 2015 |
|---|---|---|---|
| අතිරේක රේගු සටහන්කර පරිදි තීරු බදු ප්‍රමාණය | 47,726,951 | 7,460,417 | 15,599,038 |







## මැණික් ශාඛාව

මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ ප්‍රවීනත්වයක් ලැබූ නිලධාරීන් විසින් මැණික්, වටිනා ලෝහ හා ස්වර්ණාභරණ යනාදිය ආනයන/අපනයන ලේඛන සකස් කිරීම මෙම අංශය විසින් සිදුකරනු ලබයි. ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ නිලධාරීන් සමඟ සම්බන්ධීකරණය සිදු කරමින් මෙම නිලධාරීන් විසින් ඒවා තක්සේරු කිරීම සිදු කරයි.

- **2015** වර්ෂයේ කාර්යසාධනය

ආනයන හා අපනයන

| අපනයන | රු. |
|---|---|
| මැණික් | 20,316,475,525 |
| දියමන්ති ස්වර්ණාභරණ | 319,772,066 |
| වෙනත් ස්වර්ණාභරණ | 2,189,441,012 |
| දියමන්ති | 19,699,950,499 |
| ගෙවුඩ සහ ඛනිජ ද්‍රව්‍ය | 101,545,926 |
| රත්තරන් ප්‍රති අපනයනය | 0 |

| ආනයන හා ප්‍රතිආනයන | රු. |
|---|---|
| දියමන්ති | 9,756,034,901 |
| මැණික් | 5,783,035,532 |
| රිදී | 87,021,514 |
| රත්තරන් | 4,894,877,223 |
| ස්වර්ණාභරන හා සොයාගැනීම් | 2,614,769,890 |
| පරිභෝජන ද්‍රව්‍ය | 100,511,647 |
| ප්‍රතිආනයන | 7,922,137,583 |







**සකස් කරන ලද ප්‍රකාශන**

| | |
|---|---|
| මුළු අපනයන ප්‍රකාශන | **: 6902** |
| මුළු ආනයන ප්‍රකාශන | : 4701 |

- පසුගිය වර්ෂ හා සැසඳීම






මෙම අංශය මගින් රේගු නියෝජිතයන්ට රේගු බලපත්‍ර නිකුත් කරනු ලබයි. රේගු ආඥා පනතේ 115(1) වගන්තිය ප්‍රකාරව රේගු නියෝජිතයන් වශයෙන් අවශ්‍යතා සඳහා ක්‍රියාකරලීමට බලපත්‍ර නිකුත් කිරීම සඳහා රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාට බලය ලබාදී ඇත. ශ්‍රී ලංකාව තුළ ඕනෑම වරායක හෝ ස්ථානවල පිවිසුම් හෝ යම් නෞකාවක් හෝ යම් භාණ්ඩ හෝ ගමන් මළු ලබාගැනීම හෝ නිෂ්කාශනය කිරීමට අදාලව ගනුදෙනු කටයුතු සඳහා නියෝජිතයෙකු වශයෙන් පමණක් බලයලත් රේගු නියෝජිතවරු ක්‍රියාකළ යුත්තේය. බලපත්‍රය වසරක කාලයක් වලංගුව පවතින අතර එම කාලපරිච්ඡේදය අවසානයේ දී අළුත් කරගත හැකිය.

## රේගු නියෝජිතයන් ලියාපදිංචි කිරීමේ ඒකකය

- **2015 වර්ෂයේ කාර්ය සාධනය**

**2015 වර්ෂයේ රේගු නියෝජිතයන් ලියාපදිංචි කරන ඒකකයේ ප්‍රගතිය**

| සංකේත අංකය | මාසය | නව ලියාපදිංචි කිරීම | | අළුත් කිරීම | | අවලංගු කිරීම් | | තාවකාලික අවසරපත්‍ර නිකුත් කිරීම |
|---|---|---|---|---|---|---|---|---|
| | | රේගු නියෝජිත | වාප්පු සහකයන් | රේගු නියෝජිත | වාප්පු සහයකයන් | රේගු නියෝජිත | වාප්පු සහයකයන් | |
| **1** | ජනවාරි | 11 | 9 | 138 | 424 | 18 | 1 | 28 |
| **2** | පෙබරවාරි | 7 | 9 | 91 | 307 | 21 | 0 | 24 |
| **3** | මාර්තු | 14 | 17 | 155 | 572 | 22 | 3 | 38 |
| **4** | අප්‍රේල් | 7 | 9 | 72 | 245 | 22 | 1 | 24 |
| **5** | මැයි | 6 | 6 | 143 | 304 | 0 | 21 | 21 |
| **6** | ජූනි | 7 | 14 | 32 | 65 | 0 | 11 | 12 |
| **7** | ජූලි | 6 | 12 | 78 | 153 | 0 | 10 | 14 |
| **8** | අගෝස්තු | 7 | 8 | 78 | 196 | 0 | 20 | 21 |
| **9** | සැප්තැම්බර් | 9 | 5 | 78 | 238 | 6 | 44 | 25 |
| **10** | ඔක්තෝබර් | 11 | 6 | 145 | 439 | 3 | 34 | 33 |
| **11** | නොවැම්බර් | 4 | 2 | 138 | 396 | 0 | 30 | 27 |
| **12** | දෙසැම්බර් | 7 | 6 | 213 | 648 | 2 | 37 | 29 |
| එකතුව | | 96 | **103** | **1361** | **3987** | **94** | **212** | **296** |









## TIN/VAT ලියාපදිංචි කිරීමේ අංශය

රේගු ආඥා පනතේ 115(අ) වගන්තියට අනුව ලියාපදිංචි ආනයනකරුවකු හෝ අපනයකරුවකු නොවන කිසිවකු විසින් කිසිදු භාණ්ඩයක් ලංකාවට ආනයනය.අපනයන නොකළ යුතුයි/ ඔවුන් ලියාපදිංචි කිරීමේදී වෙබ් අඩවියේ ඇති අන්දමට ඉල්ලුම් පත්‍රවල ඇති විස්තරවලට අදාලව සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍ර ආනයනකරුවන් හා අපනයනකරුවන් විසින් ඉදිරිපත් කල යුතුය. ඉල්ලුම්පත් ආකෘතිපත්‍ර සහ උපදෙස් රේගු වෙබ් අඩවියෙන් ලබාගත හැක.

- **2015** වර්ෂයේ TIN/VAT කාර්ය සාධනය

| | | ජන | පෙබ | මාර්තු | අප්‍රේ | මැයි | ජුනි | ජුලි | අගෝ | සැප් | ඔක් | නොවැ | දෙසැ | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **1** | ලියාපදිංචි කරන ලද බලපත්‍ර සංඛ්‍යාව | 187 | 290 | 469 | 411 | 428 | 546 | 413 | 648 | 364 | 433 | 426 | 346 | 4961 |
| **2** | පෞද්ගලික අපනයන සංඛ්‍යව | 776 | 952 | 733 | 578 | 638 | 696 | 975 | 1191 | 872 | 1181 | 679 | 248 | 9519 |
| **3** | ලියාපදිංචි කරන ලද පෞද්ගලික සමාගම් සංඛ්‍යාව | 130 | 131 | 150 | 121 | 118 | 148 | 127 | 140 | 171 | 162 | 145 | 153 | 1696 |
| **4** | ලියාපදිංචි කරන ලද තනි පුද්ගලක හවුල් ව්‍යාපාර | 76 | 61 | 76 | 69 | 62 | 106 | 104 | 110 | 117 | 101 | 106 | 85 | 1073 |
| **5** | ලියාපදිංචි කරන ලද හවුල් ව්‍යාපාර | 26 | 34 | 44 | 25 | 36 | 40 | 54 | 54 | 55 | 69 | 47 | 47 | 531 |
| **6** | වෙනත් ලේඛන, (VAT බදු යාවත්කාලීන, Carnet, CDU වාහන, ප්‍රකාශකයා ලියාපදිංචි කිරීම | 1555 | 1905 | 2048 | 1904 | 2126 | 2486 | 2187 | 2180 | 2249 | 2417 | 2425 | 2801 | 26283 |
| **7** | ලැබුණු මුළු ලේඛන සංඛ්‍යාව | 2750 | 3373 | 3520 | 3108 | 3408 | 4022 | 3860 | 4323 | 3828 | 4363 | 3828 | 3680 | 44063 |




| | |
|---|---|
| ලියාපදිංචි කරන ලද බලපත්‍ර සංඛ්‍යාව | 4961 |
| පෞද්ගලික අපනයන සංඛ්‍යව | 9519 |
| ලියාපදිංචි කරන ලද පෞද්ගලික සමාගම් සංඛ්‍යාව | 1696 |
| ලියාපදිංචි කරන ලද තනි පුද්ගලක හවුල් ව්‍යාපාර | 1073 |
| ලියාපදිංචි කරන ලද හවුල් ව්‍යාපාර | 531 |
| වෙනත් ලේඛන **(VAT** බදු යාවත්කාලීන, **Carnet, CDU Vehicle, Declarant Reg.**) | 26283 |
| ලැබුණු මුළු ලේඛන සංඛ්‍යාව | 44063 |



# මානව සම්පත්
# පර්ෂදය

# මානව සම්පත් කළමනාකරණ අංශය

## හැඳින්වීම

මානව සම්පත් කළමනාකරණ අංශය දෙපාර්තමේන්තුවේ මානව ප්‍රාග්ධනයේ ආයෝජන වෙනුවෙන් උපරිම ප්‍රතිඵල ළඟාකර ගැනීමට අපේක්ෂා කරන අතර මූල්‍ය අවදානම අඩු කරගැනීමටද කටයුතු කරයි. මෙම අංශය මෙකී අරමුණු ඉටුකර ගැනීමට අපේක්ෂා කරන්නේ නිපුණතාවයෙන් යුත් හා සුදුසුකම් සපුරා ලූ පුද්ගලයන් එක්කර ගැනීම හා දැනට සිටින ශ්‍රම බලකායේ හැකියාවන් දෙපාර්තමේන්තුවේ උපාය මාර්ගික සැලැස්ම සහ ආයෝජනයට අනුරූපීව ලැබෙන ප්‍රතිඵල උපරිම කිරීම හා අනාගත පැවැත්ම හා සාර්ථකත්වය යන කරුණු සමඟ එකට ගැලපීම තුළිනි. එම අරමුණු ඉටු කර ගැනිම සහතික කිරීම පිණිස මානව සම්පත් කළමනාකරණ අංශය විසින්, සේවාදායක අභිප්‍රේරණය, කැපවීම හා ඵලදායිතාවය හැකිතාක් උපරිම ආකාරයට වර්ධනය කිරීම සඳහා රජයේ කම්කරු නීති හා රෙගුලාසි, සදාචාර සම්පන්න ව්‍යාපාර විධි සහ දළ වියදම, සැලකිල්ලට ගනිමින් දෙපාර්තමේන්තුවේ මානව සම්පත් අවශ්‍යතා ඵලදායි ලෙස ප්‍රයෝජනයට ගනු ලබයි .

රාජ්‍ය සේවා කොමිෂන් සභාව සහ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය විසින් රේගු අධ්‍යක්ෂ ජනරාල්ට පහත මට්ටම් වන මාණ්ඩලික හා මාණ්ඩලික නොවන මට්ටම්වල මානව සම්පත් කළමනාකරණයට අදාළ සියලු කරුණු සම්බන්ධව අවශ්‍ය අවස්ථාවලදී මාර්ගෝපදේශ නියම කිරීම සහ අනුමැතිය ලබාදීම සිදු කරයි. මානව සම්පත් කළමනාකරණ අංශය, රාජ්‍ය සේවා කොමිෂන් සභාව සහ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය විසින් බඳවා ගැනීම්, උසස් කිරීම්, කාර්ය සාධන කළමනාකරණය ආදිය මෙන්ම ආයතන සංග්‍රහය, රේගු ආඥාපනත හා මුදල් රෙගුලාසි ආදිය සම්බන්ධයෙන් වරින් වර දැනුම් දෙන රීතිවලට අනුව කටයුතු කරයි. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ආයතන සංග්‍රහයේ II මාරු කිරීම්, විනය කටයුතු පැවැත්වීම, රේගු අධ්‍යක්ෂ ජනරාල් වෙත මාණ්ඩලික නිලධාරීන් සම්බන්ධව ආයතන සංග්‍රහයේ II වන කොටසේ දෙවන උපලේඛණයේ සඳහන් වැරදි සම්බන්ධව විනයානුකූලව කටයුතු කිරීමට සහ ස්ථාන මාරුකිරීමටත් බලය පවරා ඇති අතර අනෙක් සියලු නිලධාරීන්ගේ සියලුම විනය හා ස්ථාන මාරු සම්බන්ධව බලය පවරා ඇත. (රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනා කිරීමේ අයිතියට යටත්ව) එසේම රාජ්‍ය සේවයේ පවත්නා රෙගුලාසිවලට අනුගතවෙමින් කාර්යසාධන ආකෘති හා උසස් කිරීමේ නිර්ණායක ද ඇතුළුව මානව සම්පත් කළමනාකරණ සැලසුම, රේගු දෙපාර්තමේන්තුවේ මානව සම්පත් අවශ්‍යතා සඳහා සරිලන ආකාරයට සකස් කරගැනීමට රේගු දෙපාර්තමේන්තුවට නිදහස ඇත.

### ප්‍රධාන කාර්යයන්

දෙපාර්තමේන්තුවේ දැක්ම ළඟා කර ගැනීම සඳහා මානව සම්පත් කළමනාකරණ අංශය ඉතා වැදගත් කාර්යයක් ඉටු කරයි;

1. බඳවාගැනීම්, තෝරා ගැනීම් හා සම්පත් භාවිතා කිරීම.
2. සේවක වාර්තා තබා ගැනිම හා රහස්‍යභාවය.
3. ආයතනික සැලසුම් හා සංවර්ධනය .
4. ප්‍රතිව්‍යුහගතකරණය හා වෙනස්වීම් කළමනාකරණය,
5. කාර්ය සාධනය, හැසිරීම හා චර්යා කළමනාකරණය.
6. පාරිභෝගික හා සේවක සම්බන්ධතා.
7. මානව සම්පත්, (මිනිස්බල) විග්‍රහය හා මිනිස්බල පෞද්ගලික දත්ත කළමනාකරණය.
8. වන්දි ගෙවීම හා සේවක ප්‍රතිලාභ කළමනාකරණය.
9. සේවක අභිප්‍රේරණ හා ධෛර්යය ගොඩනැගීම.

| ප්‍රධාන ක්‍රියාකාරකම් | ඉලක්කය | තත්‍ය | ඉටු නොකරන ලද්දේ නම් ඊට හේතු |
|---|---|---|---|
| **2014 කාර්යසාධන ඇගයීම් සම්පූර්ණ කිරීම**<br>1. මධ්‍යකාලීන හා අවසන් ඇගයීම් සම්පූර්ණ කිරීම. | 1 වන කාර්තුවේදී අවසන් කිරීම | 1 වන කාර්තුවේදී අවසන් විය | |
| **මානව සම්පත් සැලසුම සකස් කිරීම** | | | |
| 1. මානව සම්පත් අවශ්‍යතා විශ්ලේෂණය සිදු කිරීම | 2 සහ 4 කාර්තුවේදී අවසන් කිරීම | 2 වන කාර්තුවේදී අවසන් විය. | |
| 2. මානව සම්පත් සැලසුම සකස් කිරීම | 2 වන හා 4 වන කාර්තුවලදී අවසන් කිරීම | ඉලක්ක සංශෝධනය කරන ලදී. | පැවති තත්ත්වයන් සැලකිල්ලට ගෙන ඉලක්ක සංශෝධනය කිරීමට තීරණය කරන ලදී.<br><br>මානව සම්පත් කළමනාකරණ අංශයේ පවත්නා කටයුතු ඇගයීමට සහ සොයා බැලීම සඳහා අධ්‍යයනයක් සිදුකරන ලදී.<br><br>අවශ්‍ය වෙනස්කිරීම් හඳනා ගනු ලැබූ අතර, මානව සම්පත් කළමනාකරණ අංශය ප්‍රතිව්‍යුහගත කරණය කිරීම සඳහා රාමුවක් සකස් කරන ලදී. |
| 3. මානව සම්පත් තොරතුරු දත්ත පද්ධතිය සකස් කිරීම හා පවත්වාගෙන යාම | වසර පුරාම | | |
| 2015 කාර්යසාධන ඇගයීම් සම්පූර්ණ කිරීම | | | |
| 1. මධ්‍ය කාලීන ඇගයීම සම්පූරණ කිරීම | 3 වන කාර්තුවේදී අවසන් කිරීම | 3 වන කාර්තුවේදි අවසන් කරන ලදී. | |
| **සහකාර රේගු අධිකාරිවරුන් 269 දෙනෙකු, රේගු පරීක්ෂකවරුන් 137 දෙනෙකු හා රේගු ආරක්ෂකයින් 100 දෙනෙකු බඳවා ගැනීම** | | | |
| 1. රේගු ආරක්ෂකයින් සඳහා විභාගය පැවැත්වීම | 1 වන කාර්තුවේදි අවසන් කිරීම | 2 වන කාර්තුවේදි අවසන් කරන ලදී | විභාග දෙපාර්තමේන්තුව විසින් නියම කරන ලද කාලසටහනට අනුව තරමක් ප්‍රමාද වුවද අපේක්ෂිත ඉලක්ක සපුරා ඇත.<br><br>**විවෘත දහරාවෙන්** සහකාර රේගු අධිකාරි සහ රේගු පරීක්ෂක බඳවා ගැනීමේදී අපේක්ෂිත අයඳුම්කරුවන් සංඛ්‍යාවකට සුදුසුකම් ලබාගැනීමට නොහැකි විය. |
| 2 සහකාර රේගු අධිකාරි II 269 ක් සහ රේගු පරීක්ෂක II 137 ක් බඳවා ගැනීම | 2 වන කාර්තුවේදි අවසන් කිරීම | ජනවාරි මාසයේදී කුසලතා පදනමින් සහකාර රේගු අධිකාරිවරුන් 13 දෙනෙකු බඳවා ගන්නා ලදී.<br><br>අප්‍රේල් මාසයේදී **සීමිත දහරාවෙන්** සහකාර රේගු අධිකාරිවරුන් 41 දෙනෙකු බඳවා ගන්නා ලදී. | |

| | | | |
|---|---|---|---|
| | | ජුනි මාසයේදී **විවෘත දහරාවෙන්** රේගු පරීක්ෂකවරුන් 77 දෙනෙකු බඳවා ගන්නා ලදී.<br><br>ජුලි මාසයේදී **විවෘත දහරාවෙන්** සහකාර රේගු අධිකාරිවරුන් 83 දෙනෙකු බඳවා ගන්නා ලදී | |
| 3. රේගු ආරක්ෂකයින් 100 දෙනෙකු බඳවා ගැනීම | 4 වන කාර්තුවේදී අවසන් කිරීම | මැයි මාසයේදී විභාගය පවත්වන ලදී.<br><br>දෙසැම්බර් මාසයේදී ප්‍රතිඵල නිකුත් කරන ලදී. | 2016 පළමු වන කාර්තුවේදී බඳවා ගැනීම් සම්පූර්ණ කිරීමට හැකිවනු ඇත. |
| 4. සහකාර රේගු අධිකාරි සහ රේගු පරීක්ෂකවරුන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාගය පැවැත්වීම | වසර පුරාම | සහකාර රේගු අධිකාරිවරුන් සඳහා විභාග 3 ක් පවත්වන ලදී.<br><br>රේගු පරීක්ෂකවරුන් සඳහා විභාග 3 ක් පවත්වන ලදී.<br><br>රේගු ආරක්ෂකයන් සඳහා විභාග 2 ක් පවත්වන ලදී. | • පරණ සහ නව විෂය නිර්දේශය යටතේ විභාග පවත්වන ලදී.<br>• 2016 ජනවාරි මාසයේදී තවත් විභාග 4 ක් පැවැත්වීමට සැලසුම් කර ඇත.<br>• විභාග දෙපාර්තමේන්තුව විසින් නියම කරනු ලබන කාලසටහනකට අනුව කටයුතු කිරීමට අවශ්‍ය වේ. |
| **උසස්වීම් නියමානුකූල කිරීම** | | | |
| 1. උසස් වීම් ලේඛනයක් සකස් කිරීම හා පවත්වා ගෙන යාම | වසර පුරාම | සැලසුම් කළ පරිදි අවසන් විය | |
| 2. අදාල උසස්වීම් මට්ටම සැලකිල්ලට ගනිමින් සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම හා රා.සේ.කො. සභාව වෙත නිර්දේශ කිරිම | වසර පුරාම | මාර්තු මාසයේදී, නියෝජ්‍ය රේගු අධිකාරිවි සඳහා වන උසස්වීමේ සම්මුඛ පරීක්ෂණ පවත්වනු ලැබූ අතර,අදාල නිර්දේශ රා.සේ.කො. වෙත ඉදිරිපත් කරන ලදී.<br><br>නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂකරුන් සහ රේගු අධිකාරිවරුන් සඳහා වන සම්මුඛ පරීක්ෂණ අප්‍රේල් මාසයේදී පවත්වනු ලැබූ අතර, අදාල නිර්දේශ රාජ්‍ය සේවා කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලදී. | |

# මානව සම්පත් සංවර්ධන අංශය

**පරමාර්ථ**

- දෙපාර්තමේන්තුවේ ගුණාත්මක භව හා ඵලදායිතාව වැඩිදියුණු කිරිම සඳහා ක්‍රියාශීලි ඉදිරිය දකින නිලධාරින් පිරිසක් ගොඩනැඟීම.
- දෙපාර්තමේන්තු අවශ්‍යතාවයන්ට අනුව අනාගත අභියෝගවලට මුහුණු දීම සඳහා නිලධාරීන්ගේ කුසලතාව හා දැනුම වැඩිදියුණු කිරීම.
- සේවකයන්ට ඉතා නවීන පුහුණුව ලබාදීමේදී ලෝක රේගු සංවිධනය සහ ලෝක වෙළඳ සංවිධානය ඇතුළුව දේශීය හා ජාත්‍යන්තර ආයතන සමඟ සහයෝගයෙන් කටයුත් කිරීම.
- සුදුසු පුහුණු අවස්ථා හඳුනා ගැනීම සඳහා නිලධාරීන්ට පහසුකම් සැලසීම.
- ස්වකීය උසස් අධ්‍යාපනය ඉදිරියට කරගෙන යාම සඳහා රේගු කාර්ය මණ්ඩලයට මූල්‍ය ආධාර ඇතුළුව පහසුකම් සැලසීම
- ස්වකීය අවශ්‍යතා සඳහා බාහිර ආයතනවලට සහ පාර්ශවකරුවන්ට පුහුණුව ලබාදීම
- දෙපාර්තමේන්තු අපේක්ෂාවන් සපුරාලීම සඳහා විශේෂ පුහුණු වැඩසටහන් සකස් කිරීම සහ පවැත්වීම.
- කුසලතා පූර්ණ විනය ගරුක රේගු නියෝජිතයින් හඳුන්වාදීම සඳහා රේගු නියෝජිත පුහුණු වැඩසටහන් පැවැත්වීම.

**2015 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්ම සමඟ කාර්ය සාධනය සංසන්දනය කිරීම.**

| ප්‍රධාන ක්‍රියාකාරකම් | ඉලක්කය | තත්‍ය | ඉටු නොකරන ලද්දේ නම් ඊට හේතු |
|---|---|---|---|
| **1. නේවාසික සහ බාහිර පුහුණු වැඩසටහන් පැවැත්වීම** | (නිලධාරින්) 1475 | (නිලධාරින්)1407 | ඉලක්කය සපුරා ඇත |
| **2. විදේශීය පුහුණු අවස්ථා ලබාදීම** | පුහුණු අවස්ථා සංඛ්‍යාව මත තීරණය වේ. | වැඩසටහන් 142 | ඉටුකර නොමැත |
| **3. රේගු නියෝජිත වැඩසටහන පැවැත්වීම** | අයදුම්කරුවන් 200 | අයදුම්කරුවන් 197 | ඉලක්කය සපුරා ඇත |

| **ප්‍රධාන ක්‍රියාකාරකම 1: නේවාසික සහ බාහිර පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම** | | | | | |
|---|---|---|---|---|---|
| **ප්‍රධාන පියවර** | **1 වන කාර්තුව** | **2 වන කාර්තුව** | **3 වන කාර්තුව** | **4 වන කාර්තුව** | **ඉලක්කකය සපුරා ඇත/නත** |
| **1.1** විමර්ශනය, තක්සේරු කිරිම, වර්ගීකරණය, ශාක හා සතුන් නිරෝධන පශ්චාත් විගණනය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් | X | X | X | X | ඉලක්කය සපුරා ඇත |
| **1.2** තක්සේරුකරුවන් සඳහා කුසලතා සංවර්ධන වැඩසටහන | X | | | X | එම |
| **1.3** අළුතින් බඳවා ගන්නා ලද සහකාර රේගු නිලධාරීන්ගේ කාර්යභාරය | | X | | X | එම |
| **1.4** නිවාරණ අංශයේ වෙනස් වන කාර්යයන් සඳහා නව ශිල්පීය ක්‍රම | | X | | X | නව |

**2)** ආදායම් අරමුණු යටතේ ප්‍රධාන ක්‍රියාකාරකම්

| ප්‍රධාන ක්‍රියාකාරකම : නේවාසික සහ බාහිර පුහුණු වැඩසටහන් පැවැත්වීම | | | | | ඉලක්කකය සපුරා ඇත/නත |
|---|---|---|---|---|---|
| ප්‍රධාන පියවර | 1 වන කාර්තුව | 2 වන කාර්තුව | 3 වන කාර්තුව | 4 වන කාර්තුව | |
| **1.5** ගෝලීය නිවාරක වැඩසටහන් | | | X | | ඉලක්කය සපුරා ඇත |
| **1.6** පරිගණක අධිකරණ විද්‍යාව | | | X | | ලෝක රේගු සංවිධානය විසින් එම වැඩසටහන පිරිනමා නොමැත. |
| **1.7** අවදානම් කළමනාකරණය | | X | | | ඉලක්ක සපුරා නැත. |

| ප්‍රධාන ක්‍රියාකාරකම : රේගු නියෝජිත වැඩසටහන පැවැත්වීම | | | | | |
|---|---|---|---|---|---|
| ප්‍රධාන පියවර | 1 වන කාර්තුව | 2 වන කාර්තුව | 3 වන කාර්තුව | 4 වන කාර්තුව | ඉලක්කකය සපුරා ඇත/නත |
| **1.8** **HS** සංකේත පද්ධතිය හඳුන්වා දීම සහ **HS** සම්මුතියේ හරය | X | X | X | X | ඉලක්ක ඉටුවී නොමැත |
| **1.9** මැණික් පාඨමාලාව පිළිබඳ ඩිප්ලෝමාව | | X | X | X | එම |
| **1.10** අපරාධ විද්‍යාව පිළිබඳ පාඨමාලාව | | | | X | මහ බැංකුව විසින් එම වැඩසටහන පිරිනමා නොමැත. |
| **1.11** ප්‍රධානරේගු පරීක්ෂක දැනුවත් වීමේ වැඩසටහන් | X | X | X | X | එම |
| **1.12** නවීන රේගු කටයුතු පිළිබඳ දැනුවත් වීමේ වැඩසටහන් | | | X | X | එම |
| **1.13** රේගු නිලධාරින්, ප්‍රධාන රේගු පරික්ෂවරුන්, රේගු ආරක්ෂකයන් සඳහා ස්වයං පාලන පාඨමාලා | X | X | X | X | එම |
| **1.14** ශරිර භාෂාව සහ සුක්ෂ්ම ප්‍රකාශනු**128** | | | X | | එම |
| **1.15** අළුතින් බඳවා ගන්නා ලද රේගු අධිකාරිවරුන් සඳහා සේවාරම්භක පුහුණුව | | | X | | එම |
| **1.16** අළුතින් බඳවා ගන්නා ලද ප්‍රධාන රේගු පරීක්ෂකවරුන් සඳහා හඳුන්වා දීමේ පුහුණුව. | | X | | | ඉලක්කය සපුරා ඇත |
| **1.17** අළුතින් පත්කරන ලද රේගු ආරක්ෂකයන් සඳහා හඳුන්වාදීමේ පුහුණුව | | X | | | වර්ෂය තුළ බඳවා ගෙන නොමැත |
| **1.18** ජෛව විවිධත්ව සහ සංස්කෘතික උපරුමයන් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් | | X | | X | ඉටුකර ඇත |
| **1.19** රේගු විමර්ශන ක්‍රියාපටිපාටිය පිළිබඳ මාණ්ඩලික නිලධාරින් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් | | | X | X | ඉටුකර නැත |
| **1.20** භාෂා පන්තිය | X | X | X | X | ඉලක්කය සපුරා ඇත |

## මානව සම්පත් සංවර්ධනය

| ප්‍රධාන කාර්යය 2<br>වැඩිවශයෙන් පරිශීලන කිරිමට අවශ්‍ය දෑ සහ පොත්පත් මිලදී ගනිමින් පුස්තකාලය උසස් තත්ත්වයට පත් කිරීම / තවදුරටත් වැඩිදියුණු කිරිම | | | | | |
|---|---|---|---|---|---|
| | **1 වන කාර්තුව** | **2 වන කාර්තුව** | **3 වන කාර්තුව** | **4 වන කාර්තුව** | **ඉලක්කකය සපුරා ඇත/නත** |
| **2.1 පරිශීලන කිරිමට අවශ්‍ය දෑ පරිත්‍යග කිරීමට කාර්ය මණ්ඩලයට (සේවයේ සිටින මෙන්ම විශ්‍රාම ගිය ) කාර්ය මණ්ඩලයට ආයාචනා කිරීම** | X | X | X | X | පොත් 66 ක් පරිත්‍යාග වශයෙන් ලැබුණි |
| **2. 2 පරිශීලන කිරිමට අවශ්‍ය දෑ ලබාගත හැකි මූලාශ්‍ර සොයා ගැනීම සහ එවැනි පොත් ලබාගැනීමට ආයාචනා කිරිම** | X | X | X | X | කටයුතු කරමින් පවති. |
| **2.3 බැහැර දෙන පොත් මිලදී ගැනිම** | X | X | X | X | පොත් 653 ක් මිලදී ගෙන ඇත |
| **2.4 රිඩර්ස් ඩයිජස්ට් නැෂනල් ජෝග්‍රොෆි වැනි වටිනා මාසික සගරා ලබාගැනීමට කටයුතු කිරීම** | X | X | X | X | කටයුතු කරමින් පවති. |

| ප්‍රධාන ක්‍රියාකාරකම් 3<br>විදේශ පුහුණු අවස්ථා ලබාදීම | | | | | |
|---|---|---|---|---|---|
| | **1 වන කාර්තුව** | **2 වන කාර්තුව** | **3 වන කාර්තුව** | **4 වන කාර්තුව** | **ඉලක්කකය සපුරා ඇත/නත** |
| **1. විදේශ සම්මන්ත්‍රණ, වැඩමුළු, වැඩසටහන්, පුහුණු පාඨමාලා, රැස්වීම්, පශ්චාත් උපාධි පාඨමාලා, සමුළු සහ වෙනත් දෑ** | X | X | X | X | විදේශ වැඩසටහන් 142 කට නිලධාරීන් 226 දෙනෙක් සහභාගි විය. |

| ප්‍රධාන ක්‍රියාකාරකම් 4<br>රේගු නියෝජිත වැඩසටහන | | | | | |
|---|---|---|---|---|---|
| | **1 වන කාර්තුව** | **2 වන කාර්තුව** | **3 වන කාර්තුව** | **4 වන කාර්තුව** | **ඉලක්කකය සපුරා ඇත/නත** |
| | | X | X | | අයඳුම්කරුවන් 197 දෙනෙකුගෙන් රේගු නියෝජිතවරු වශයෙන් 176 දෙනෙක් සුදුසුකම් ලැබූහ. |

# කාර්ය මණ්ඩල සේවා අංශය

**පරමාර්ථ**

සේවකයන් හට දෙපාර්තමේන්තුමය අරමුණු ඉටුකර ගැනීමේ ක්‍රියාවලියේදී නිර්මාණාත්මකව හා ප්‍රයෝජනවත් ආකාරයට දායක විය හැකි පරිසරයක් සැපයීම.

**ප්‍රධාන ක්‍රියාකාරකම්**

**i. ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම**

රේගුවේ සියළුම මට්ටම්වල නිලධාරීන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම සහ ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලයේ උපදෙස් අනුගමනය කරමින් ඵලදායිතා ප්‍රවර්ධන තත්ත්ව ළඟා කර ගැනීමට අවශ්‍ය ක්‍රමවේද හා තාක්ෂණික ක්‍රම ක්‍රියාත්මක කිරීම .

**ii. රජයේ විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම**

සියලු අංශ සම්බන්ධීකරණය කරමින් විගණකාධිපති විසින් විමසන ලද විමසුම් සඳහා පිළිතුරු සැපයීම.

**iii. සුභසාධන කළමනාකරණය:**

දැනට සැපයෙන සුභසාධක සේවා හා ඒවායේ ප්‍රමිතිය හඳුනාගෙන ගුණාත්මක සුභ සාධක සේවාවක් සැපයීම පිණිස පියවර ගැනීම.සෑම මට්ටමකම සේවකයන්ගේ උපදෙස් ලබාගෙන සුභසාධන සැලසුම් සකස් කර ක්‍රියාත්මක කිරීම.

**iv. විනය පිළිබඳ කළමනාකරණය:**

අදාළ නිලධාරීන්ට විරුද්ධව චෝදනා ඉදිරිපත් වන්නේ නම් ඒ පිළිබඳව මූලික විමර්ශන හා විනය පරීක්ෂණපැවැත්වීම. රේගු දෙපාර්තමේන්තුවේ විනය ක්‍රියාපටිපාටියට අන්තර්ගත කොට ආචාර ධර්ම පද්ධතියක් ක්‍රියාත්මක කිරීම. සේවකයින් ආචාර ධර්ම පද්ධතිය අනුගමනය කරන්නේද යන්න නිරීක්ෂණය කිරීම හා ආචාර ධර්ම පද්ධතිය අනුගමනය නොකරන්නේ නම්, ඔවුන්ට විරුද්ධව විනය ක්‍රියාපටිපාටිය හැකිතාක් දුරට අනුගමනය කොට ආචාර ධර්ම පද්ධතිය ඵලදායී බවට පත් කිරීම.

**v. දුක්ගැනවිලි කළමනාකරණය**

සේවකයන් තුළ තෘප්තිය වර්ධනය කිරීමටත්, කළමනාකරණය කෙරෙහි අසංතෘප්තිය අවම කිරීමටත් හැකි වන පරිදි දුක්ගැනවිලි සම්බන්ධයෙන් කටයුතු කිරීම. පිළිගත් වෘත්තීය සමිති සමඟ මනා සම්බන්ධතාවයක් ගොඩනඟා ගැනීමේ අපේක්ෂාවෙන් නිරන්තර සාකච්ඡා පැවැත්වීම. අර්බුදකාරී කරුණු සම්බන්ධයෙන්

**2015 ක්‍රියාකාරී සැලසුමේ ඇති කාර්යසාධනය සැසඳීම**

| ප්‍රධාන කාර්යය | | ඉලක්කය | තත්‍ය | ඉටු නොකරන ලද්දේ නම් ඊට හේතු |
|---|---|---|---|---|
| 1. | **රජයේ විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම** | 1-4 දක්වා කාර්තු | 1-4 දක්වා කාර්තාව | |
| 2. | **ඵලදායිතාවය ඉහළ නැංවීමේ වැඩසටහන ක්‍රියාතමක කිරීම** | | | |
| | i. විගණනය හා පුහුණු කමිටු සාමාජිකයින් නැවත පත්කිරීම හා තත්ත්ව කව ක්‍රියාත්මක කිරීම | 1 වන කාර්තුව | 1 වන කාර්තුව | |
| | ii. දෙපාර්තමේන්තුවේ 55 වන කාර්ය සංග්‍රහය සකස් කිරීම | 1 වන කාර්තුව | 1 සහ 2 කාර්තුව | ප්‍රායෝගික අපහසුතා නිසා ඉදිරියට ගෙනයාම නැවති ඇත |
| | iii. ගොනුකිරීමේ ක්‍රමයක් ස්ථාපිත කිරීම | 1 සහ 2 කාර්තුව | | ගොනු කිරීමේ ක්‍රමයක් ස්ථාපිත කිරීම |
| | iv. නාමපුවරු ස්ථානීය මඟ පෙන්වීම් පිළිගැනීමේ නාමපුවරු යනාදිය සකස් කිරීම. | 1 සහ 2 කාර්තුව | 1 සහ 4 කාර්තුව | සැපයුම් ගැටළු නිසා ප්‍රමාද වී ඇත. |
| | v. ගෘහ භාණ්ඩ පිළිවෙලකට අංක කිරීම සහ සැකසීම. | 2 කාර්තුව | 2 සහ 4 කාර්තුව | ප්‍රායෝගික අපහසුතා නිසා ප්‍රමාදවිය. |
| | vi. ජාතික ඵලදායිතා සම්මානය සඳහා ඉල්ලුම් කිරිම. | 1 වන කාර්තුව | | ප්‍රායෝගික අපහසුතා නිසා ඉදිරියට ගෙනයාම නැවති ඇත. |
| | vii. පුහුණු වැඩසටහන් පැවැත්වීම සහ හරිත ඵළදායිතාවය සහ පූර්ණ ඵලදායිතා කළමනාකරණය ක්‍රියාත්මක කිරිම. | 3 වන කාර්තුව | | ඉහත කාර්යයන් සම්පූර්ණ නොකළ නිසා ඉදිරියට ගෙනයාම නැවති ඇත. |
| **3.** | ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට අනුව මූලික විමර්ශන සහ විනය පරීක්ෂණ සිදු කිරිම. | 1-4 දක්වා කාර්තු | 1-4 දක්වා කාර්තුව | |

# සේවා හා සැපයීම් අංශය

## හැඳින්වීම

ඵලදායී ලෙස හා විනිවිදභාවයෙන් රේගුවේ සියලුම අංශයන් සඳහා සියලු අවශ්‍යතා සැපයීම, නඩත්තු කිරීම හා සේවා කටයුතු සිදු කිරීම සේවා හා සැපයීම් අංශයේ ප්‍රධාන පරමාර්ථය වේ.

**ප්‍රධාන කාර්යයන්**

1. දෙපාර්තමේන්තුවේ කාර්යයන් අඛණ්ඩව පවත්වාගෙන යාම පිණිස ගුණාත්මකභාවය ආරක්ෂා කරමින් නියමිත වෙලාවට අදාළ අංශ වෙත සේවා හා සැපයීම් ලබාදීම.
2. ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ හා භාණ්ඩාගාර චක්‍රලේඛ අනුව යමින් විනිවිද භාවයෙන් යුක්ත ආකාරයට භාණ්ඩ හා සේවා මිලදී ගැනිම.
3. විධිමත් ආකාරයේ තොග පාලනයක් හා කාර්යක්ෂම ගබඩා පාලන ක්‍රමයක් පවත්වාගෙන යාම සහතික කිරීමත්, මිලදී ගන්නා භාණ්ඩවල ආරක්ෂාව හා උපරිම ප්‍රයෝජන ලැබෙන ඒවා ගබඩා කිරීම හා ඉන්වෙන්ට්‍රි පවත්වාගෙන යාම.
4. රේගු දෙපාර්තමේන්තුවේ චංචල හා නිශ්චල වත්කම් කළමනාකරණය
5. විධිමත් පරිශ කළමනාකරණ සැලැස්මක් ක්‍රියාත්මක වන බවට සහතික වීම.

2015 වර්ෂයේ දී මෙම අංශය විසින් සිදු කරන ලද ප්‍රධාන කාර්යයන් පහත වගුවෙන් දැක්වේ

| ප්‍රධාන ක්‍රියාකාරකම | ඉලක්කය | තත්‍ය | ඉටු නොකරන ලද්දේ නම් ඊට හේතු |
|---|---|---|---|
| අවශ්‍ය භාණ්ඩ , වැඩ සහ සේවා මිළදී ගැනීම | අවශ්‍ය භාණ්ඩ , වැඩ සහ සේවා මිළදී ගැනීම | 80% අවසන් | - |
| මූලස්ථාන ගොඩනැගිල්ලේ නඩත්තු කිරීමේ කටයුතු | දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය සඳහා පිරිසිදු සහ සුවදායි පරිසරයක් පවත්වාගෙන යාම. | 100% අවසන් | - |
| නිසි ගබඩා පාලනය සහ වත්කම් කළමනාකරණ පද්ධතියක් ඇති කිරීම. | පද්ධතිය හරහා සියළු ඉන්වෙන්ටරි භාණ්ඩ පවත්වාගෙන යාම හා අධීක්ෂණය | 80% අවසන් | දැනට ක්‍රියාත්මකයි |
| 2014 වර්ෂය සඳහා වාර්ෂික භාණ්ඩ සත්‍යාක්ෂණය | නිසි වත්කම් කළමනාකරණයක් පවත්වාගෙන යාම | 50% අවසන් | දැනට ක්‍රියාත්මකයි |
| බහාලුම් පරිලෝකන (Scan) පද්ධතියක් මිළට ගැනීම. | සියලුම ආනයන අපනයන බහාලුම් නිසි පරිදි පරිලෝකනය කිරීම. | 50% අවසන් | මිළ දී ගැනීමට කටයුතු කරමින් පවති. |
| ශ්‍රී ලංකා රේගුවේ වාහන සමූහය පවත්වාගෙන යාම | නිතිපතා සේවා කිරීම මගින් වාහන හොඳ ධාවන තත්වයෙන් පවත්වා ගෙන යාම, ආර්ථික වශයෙන් අවාසිදායක හා පැරණි වාහන ඉවත් කිරීම සහ මුදල් අමාත්‍යාංශයෙන් නව වාහන ඉල්ලුම් කර ඇත. | 95% අවසන් | - |

# පළාත් පරිෂදය

# මගී සේවා (කටුනායක) කාර්යාංශය

**පරමාර්ථ**

- ගුවන් මගීන්ට නිදහස් සංචලනය පහසුකම් සපයමින් රජයේ ආදායම සහ සමාජ වගකීම සුරක්ෂණය වන බවට සහතික වීම.
- රේගු ආඥා පනතේ හා අනෙකුත් අදාල නීති යටතේ පවරා දී ඇති නීති බලාත්මක කිරීමේ කටයුතු සිදු කිරීම
- ගුවන් සංචලන සම්බන්ධ දේශසීමා පාලන මෙහෙයුම් නියාමනය හා අධික්ෂණය කිරීම
- ගුවන්යානා සංචලන පාලනයේදී කැපී පෙනෙන කාර්යභාරයක් ඉටු කිරීම.
- ආදායම් අහිමිවීම් / විදේශ විනිමය අහිමිවීම් අවම කිරීම, එවන් අවස්ථා හඳුනාගැනීම හා ඊට එරෙහි කඩිනම් පියවර ගැනීම.
- ආරක්ෂක අමාත්‍යාංශය, TRC, SLSI, CDDA, ආනයන පාලන දෙපාර්තමේන්තුව, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය ආදී වෙනත් ආයතන හා අධිකාරි වලට අදාල පනත් හා රෙගුලාසි මගින් රේගුව වෙත පවරා දී ඇති බලතල ක්‍රියාත්මක කිරීම.
- ආගමන හා විගමන දෙපාර්තමේන්තුව, ගුවන්තොටුපොල හා ගුවන් සේවා, නිරෝධායන දෙපාර්තමේන්තුව, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව, පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය ආදී ගුවන් තොටුපොල පරිශ්‍රයේ පිහිටි අනෙකුත් රජයේ ආයතන සමග ඵලදායී සන්නිවේදනයක් පවත්වා ගෙන යාම.

මෙම කාර්යාංශයේ ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා විවිධ මට්ටමේ විවිධ තනතුරු දරන නිලධාරීන් විසින් පහත දැක්වෙන ප්‍රධාන කාර්යයන් ඉටු කරනු ලබයි

**ප්‍රධාන කාර්යයන්**

1. රට තුළට පැමිණෙන හා රටින් පිටවන මගින්ගේ හා ඔවුන්ගේ ගමන් මළු අපහසුවකින් තොරව එහා මෙහා ගෙන යාම සඳහා පහසුකම් සැලසීම.
2. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොලේ ප්‍රභූ ගමන් බිමන් සඳහා පහසුකම් සැලසීම.
3. ශ්‍රී ලංකාවට පැමිණෙන හා ඉන් පිටවන ගුවන් යානා හා ඒවායේ කාර්යමණ්ඩල සැලසුම් කිරීම.
4. මගී ගමන් මළු සඳහා තීරුබදු රහිත ගමන් මළු දීමනාව ප්‍රදානය කිරීම හා එවන් පහසුකම් අපහරණය කිරීම, අධීක්ෂණය කිරීම සහ ඒ සම්බන්ධයෙන් පියවර ගැනීම.
5. අවශ්‍ය අවස්ථාවලදී ATA කාඩ් පත්, ඇපකර හා විශේෂ තැන්පතු මත භාණ්ඩ මුදා හැරීම
6. රේගුව / ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය විසින් අනුමත කරන ලද මැණික් / ස්වර්ණාභරණ පාර්සල් හැසිරවීම
7. රට තුළට පැමිණෙන / ඉන් පිටවන මගීන්ගේ විදේශ මුදල් ප්‍රකාශ පරීක්ෂා කිරීම හා අනුමත කිරීම
8. මගියා පිට වූ පසු ඔහු විසින් රැගෙන නොගිය මළු ඇටෝර්නි බලපත්‍ර සහිත බලයලත් පුද්ගලයෙකු හට ඉතිරි ගමන් මළු දීමනාව ලබා දීම පිටසන් කිරීම.
9. සැකසහිත අවස්ථාවක හෝ අවශ්‍ය වෙනත් අවස්ථාවක කැටුව රැගෙන එන ගමන් මළු පරීක්ෂා කිරීම.
10. අවශ්‍ය විටකදී පුද්ගලයින් පරීක්ෂා කිරීම
    - වැරදි අනාවරණය කරගැනීම විමර්ශනයන් සිදු කිරීම හා අනාවරණය කොටගත් රේගු සිද්ධි පිළිබඳ විමර්ශනය කිරීම
    - රටින් පිටතට යන ගුවන් යානා සඳහා නිෂ්කාශන නිකුත් කිරීම
